77 වන කාණ්ඩය
16 වන කලාපය

ඉරිදා
1968 අප්‍රේල් 7

# පාර්ලිමේන්තු විවාද

(හැන්සාඩ්)

## නියෝජිත මන්ත්‍රී මණ්ඩලයේ

## නිල වාර්තාව

(අශෝධිත පිටපත)

### අන්තර්ගත ප්‍රධාන කරුණු

ප්‍රශ්නවලට වාචික පිළිතුරු

[පෞද්ගලිකව දැනුම්දීමෙන්]—

ප්‍රජාතන්ත්‍රවාදී වියට්නාමයට බෝම්බ හෙළීම සම්බන්ධව ඇමරිකන් ජනාධිපතිතුමාගේ ප්‍රකාශය ගැන ලංකාණ්ඩුව දරන මතය

ශෝක ප්‍රකාශය : රාජ නීතිඥ සිරිල් ඊ. එස්. පෙරේරා මහතා

ලංකා ඉංජිනේරු ආයතනය පනත් කෙටුම්පත :
පළමුවන වර කියවන ලදී

රජයේ විදුලි දෙපාර්තමේන්තුව සඳහා සංචිත අරමුදලක්

මුදල් සංචිත ආඥාපනත : සම්මතිය

කොළඹ (පහත් බිම් ප්‍රදේශ) ගොඩ කිරීමේ සහ සංවර්ධනය කිරීමේ මණ්ඩලය පනත් කෙටුම්පත :
දෙවන වර කියවීම—විවාදය අවසන් කරන ලදී

කල් තැබීමේ යෝජනාව

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

தொகுதி 77
இல. 16

ஞாயிற்றுக்கிழமை
7 ஏப்பிரல் 1968

# பாராளுமன்ற விவாதங்கள்

(ஹன்சாட்)

## பிரதிநிதிகள் சபை

அதிகார அறிக்கை

(பிழை திருத்தப்படாதது)

பிரதான உள்ளடக்கம்

வினாக்களுக்கு வாய்மூல விடைகள்

[தனி அறிவித்தல் மூலம்]—வியட்நாம் ஜனநாயகக் குடியரசின் மீது குண்டுவீசுவது முதலானவை சம்பந்தமாக ஐக்கிய அமெரிக்க ஜனாதிபதியின் அறிக்கைபற்றி இலங்கை அரசாங்கத்தின் நிலை

அனுதாபத் தீர்மானம் : திரு. சிறில் ஈ. எஸ். பெரேரா, கியு. சி.

இலங்கை எந்திரவியலாளர் நிறுவன மசோதா :
முதன் முறை மதிப்பிடப்பட்டது

அரசினர் மின்சார முயற்சிகள் திணைக்களத்திற்கான நிதி ஒதுக்கம்

நிதி ஒதுக்கற் கட்டளைச் சட்டம் : தீர்மானம்

கொழும்பு (தாழ்ந்த இடப்பரப்புக்கள்) மீட்டல், அபிவிருத்தி செய்தற் சபை மசோதா :
இரண்டாம் மதிப்பு—விவாதம் ஒத்திவைக்கப்பட்டது

ஒத்திவைப்புப் பிரேரணை

---

Volume 77
No. 16

Sunday,
7th April 1968

# PARLIAMENTARY DEBATES

(HANSARD)

## HOUSE OF REPRESENTATIVES

OFFICIAL REPORT

(Uncorrected)

PRINCIPAL CONTENTS

ORAL ANSWERS TO QUESTIONS

[By Private Notice]—Ceylon Government's Position on U. S. President's Statement on Bombing of Democratic Republic of Vietnam, etc.

VOTE OF CONDOLENCE : MR. CYRIL E. S. PERERA, Q.C.

INSTITUTE OF ENGINEERS, CEYLON BILL :
Read the First time

FINANCIAL RESERVE FOR DEPARTMENT OF GOVERNMENT ELECTRICAL UNDERTAKINGS

FINANCIAL RESERVES ORDINANCE : RESOLUTION

COLOMBO (LOW-LYING AREAS) RECLAMATION AND DEVELOPMENT BOARD BILL :
Second Reading—Debate adjourned

ADJOURNMENT MOTION

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

# නියෝජිත මන්ත්‍රී මණ්ඩලය

## பிரதிநிதிகள் சபை

## House of Representatives

1968 අප්‍රේල් 7 වන ඉරිදා

ஞாயிற்றுக்கிழமை, 7, ஏப்றில் 1968.

*Sunday, 7th April 1968*

---

අ. භා. 2 ට මන්ත්‍රී මණ්ඩලය රැස් විය. කථානායකතුමා [ගරු එස්. සී. ෂර්ලි කොරයා] මූලාසනාරූඪ විය.

சபை பி.ப. 2 மணிக்குக் கூடியது. சபாநாயகர் அவர்கள் [கௌரவ எஸ். சி. ஷேளி கொறயா] தலைமை தாங்கினார்கள்.

*The House met at 2* P.M., MR. SPEAKER [THE HON. S. C. SHIRLEY COREA] *in the Chair.*

---

## ලිපි ලේඛනාදිය පිළිගැන්වීම

### சமர்ப்பிக்கப்பட்ட பத்திரங்கள்

### PAPERS PRESENTED

Treaty Series No. 2 of 1967.—[*The Hon Dudley Senanayake*]

සභාමේසය මත තිබිය යුතුයයි නියෝග කරන ලදී.

சபாபீடத்தில் இருக்க கட்டளையிடப்பட்டது.

*Ordered to lie upon the Table.*

**කථානායකතුමා**

*(சபாநாயகர் அவர்கள்)*

(Mr. Speaker)

Does the Hon. Prime Minister wish to make a statement now ?

**ගරු ඩඩ්ලි සේනානායක (අග්‍රාමාත්‍ය, ආරක්ෂක හා විදේශ කටයුතු පිළිබඳ ඇමති, ක්‍රම සම්පාදක හා ආර්ථික කටයුතු පිළිබඳ ඇමති සහ ප්‍රචාරණ හා ගුවන් විදුලි ඇමති)**

*(கௌரவ டட்ளி சேனநாயக்க—பிரதம அமைச்சரும் பாதுகாப்பு, வெளிவிவகார அமைச்சரும் திட்ட அமைப்பு, பொருளாதார விவகார அமைச்சரும் தகவல், ஒலிபரப்பு அமைச்சரும்)*

(The Hon Dudley Senanayake—Prime Minister ; Minister of Defence & External Affairs, Minister of Planning & Economic Affairs and Minister of Information & Broadcasting)

Yes, Sir, I can make it now.

## ලංකාව හා ජර්මන් ෆෙඩරල් ජනරජය අතර ආයෝජනවල වර්ධනය සහ අන්‍යොන්‍ය ආරක්ෂාව සඳහා ගිවිසුමයි

### இலங்கைக்கும் ஜேர்மன் சமஷ்டிக் குடியரசுக்குமிடையே, முதலீடுகளைக் காப்பாற்றவும் அவற்றுக்கு ஊக்கமளிக்கவும் செய்யப் பட்ட உடன்படிக்கை

### TREATY BETWEEN CEYLON AND THE FEDERAL REPUBLIC OF GERMANY FOR THE PROMOTION AND RECIPROCAL PROTECTION OF INVESTMENTS

An Agreement was signed in November 1963, between the Government of Ceylon and the Federal Republic of Germany providing for promotion and reciprocal protection of investments.

The Agreement was intended to promote and protect investments by nationals and companies of either State in the territory of the other State.

The main provisions in the Agreement are :

(i) The contracting parties would admit and promote in their countries investments by each other, subject to prevailing legislation and regulations.

(ii) Such investments shall not be subjected to discriminatory treatment. They shall enjoy full protection and shall not be expropriated except for public purposes and against full compensation, such compensation being realizable and transferable.

The investments of either party shall be accorded treatment no less favourable than that accorded to the nationals of any third State, as regards restitution, indemnification, etc. in regard to losses resulting from war or other armed conflict and so on.

(iii) Transfer of profits and repatriation of capital and, in the event of liquidation, of the proceeds of such liquidation, shall be permitted by both parties.

(iv) If either contracting party makes payment to any of its nationals or companies under a guarantee issued by such party, the transfer to the contracting party of the rights and claims of such party of the rights and claims of such nationals or companies to whom payment has been made, shall be recognized by the other party.

(v) If a dispute arises concerning the interpretation or application of the Agreement, which cannot be settled by

2——එච12857—1,300 (68/4)

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[ගරු ඩඩ්ලි සේනානායක]

the Government of the contracting parties, it shall, upon the request of either party be submitted to an arbitral tribunal.

This Agreement applies to all investments made on or after November 8 1963, by nationals or companies of either contracting party in the territory of the other, consistent with the latter's legislation.

The Agreement was ratified by both Governments in the latter part of 1966.

## ලිපි ලේඛනාදිය පිළිගැන්වීම

### சமர்ப்பிக்கப்பட்ட பத்திரங்கள்

### PAPERS PRESENTED

ශ්‍රී ලංකා මහ බැංකුවේ මුදල් මණ්ඩලයේ 1967 වර්ෂයේ වාර්ෂික වාර්තාව—[ගරු වන්නිනායක]

**සභාමේසය මත තිබිය යුතුයයි නියෝග කරන ලදී.**

*சபாபீடத்தில் இருக்க கட்டளையிடப்பட்டது.*

*Ordered to lie upon the Table.*

200 වැනි අධිකාරය වන දුම්රිය ආඥා පනතේ 3 වැනි වගන්තිය යටතේ පනවනු ලැබූ ව්‍යවස්ථාවක්—[ගරු හුරුල්ලේ]

**සභාමේසය මත තිබිය යුතුයයි නියෝග කරන ලදී.**

*சபாபீடத்தில் இருக்க கட்டளையிடப்பட்டது.*

*Ordered to lie upon the Table.*

## 51 (4) වන ස්ථාවර නියෝගය යටතේ පිළිගන්වන ලද වාර්තාව

### நிலையற் கட்டளை இல. 51 (4) இன் படி சமர்ப்பிக்கப்பட்ட அறிக்கைகள்

### REPORT PRESENTED UNDER STANDING ORDER No. 51 (4)

Report on the Bill intituled "An Act to incorporate an Association known as the Ceylon Moor Ladies' Union."—[*The Hon. M. D. H. Jayawardena, Minister of Scientific Research and Housing, on behalf of the Minister of Social Services.*]

**පනත් කෙටුම්පත 1968 අප්‍රේල් 8 වන සඳුදා දෙවන වර කියවිය යුතුයයි නියෝග කරන ලදී.**

*மசோதா 1968 ஏப்ரில் 8, திங்கட்கிழமை இரண்டாம் முறை மதிப்பிடப்படக் கட்டளையிடப்பட்டது.*

*Bill ordered to be read a Second time upon Monday, 8th April 1968.*

## ප්‍රශ්නවලට වාචික පිළිතුරු

### வினாக்களுக்கு வாய்மூல விடைகள்

### ORAL ANSWERS TO QUESTIONS

#### පළාත් පාලන විශ්‍රාම වැටුප් ලාභීන්

#### உள்ளூராட்சி இளைப்பாற்றுச் சம்பளம் பெறுவோர்

#### LOCAL GOVERNMENT PENSIONERS

2. ටී. බී. ඉලංගරත්න මයා. (කොලොන්නාව)

*(திரு. ரீ. பி. இலங்கரத்ன—கொலொன்னுவ)*

(Mr. T. B. Ilangaratne—Kolonnawa)

පළාත් පාලන ඇමතිගේ පාර්ලිමේන්තු ලේකම් සහ ප්‍රවෘත්ති හා ගුවන් විදුලි ඇමතිගේ පාර්ලිමේන්තු ලේකම්ගෙන් ඇසූ ප්‍රශ්නය: (අ) පළාත් පාලන සේවා ආඥාපනතේ (264 වැනි පරිච්ඡේදයේ) 56 වැනි වගන්තිය යටතේ විශ්‍රාම වැටුප් සහිතව විශ්‍රාම ලැබීමට සිය කැමැත්තෙන් තෝරාගත් අයට හැර අනෙක් සියළු පළාත් පාලන සේවා විශ්‍රාම ලාභීන්ටත් 1968.10.10 දින දරණ ගැසට් පත්‍රයේ පළ කරන ලද දැන්වීමෙන් අනුමත කරන ලද රජයේ විශ්‍රාම වැටුප් ලාභීන්ගේ පොදු විශ්‍රාම වැටුප් වැඩි කිරීම ගෙවනු ලැබූ බව එතුමා දන්නවා ද? (ආ) මෙයට අදාල ව්‍යවස්ථාවෙන් (1961 අංක 59 දරන පනත) මෙම පොදු විශ්‍රාම වැටුප් වැඩිකිරීම නිලය අහෝසි කිරීම හේතුකොටගෙන විශ්‍රාම ලැබූ පළාත් පාලන සේවා විශ්‍රාම ලාභීන්ටද අනුමත වූ බව එතුමා දන්නවාද? (ඉ) පළාත් පාලන සේවා ආඥාපනතේ 56 වැනි වගන්තිය යටතේ විශ්‍රාම ගත් අය නිළය අහෝසි කිරීම හේතුකොටගෙන විශ්‍රාම ගත් අය හා සමානවිය යුතුයයි පනතේ 57 වැනි වගන්තියෙන් පැහැදිලිවම පනවා තිබියදී 56 වැනි වගන්තිය යටතේ විශ්‍රාම ගත් අය මෙම පොදු විශ්‍රාම වැටුප් වැඩි කිරීමට අහිමි කරන ලද්දේ මන්ද? (ඊ) මෙම වැඩි කිරීම අවුරුදු නවයකට වැඩි කාලයක් මෙකී විශ්‍රාම වැටුප් ලාභීන්ට ලැබිය යුතුව තිබුණ හෙයින්ද මෙම කාලය තුළ මොවුන්ගෙන් බොහෝ දෙනෙක් මියගොස් ඇති හෙයින්ද මෙම වැඩි කිරීම වහාම ලබාදීමට එතුමා ක්‍රියාකරනවාද?

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

உள்ளூராட்சி அமைச்சரினதும், தகவல் ஒலி பரப்பு அமைச்சரினதும் பாராளுமன்றக் காரியதரிசியைக் கேட்ட வினா:

(அ) 10.10.1958 அன்றைய வர்த்தமானி அறிவித்தலின்படி, அரசாங்கத்தில் பணியாற்றி இளைப்பாறியவர்களுக்கு இளைப்பாற்றுச் சம்பளத்தில் ஏற்படுத்தப்பட்ட பொதுவான இளைப்பாற்றுச் சம்பள உயர்வு தொகை, உள்ளூராட்சிச் சேவைக் கட்டளைச் சட்டத்தின் (264 ஆம் தலைப்பில்) 56 ஆம் பிரிவின்படி இளைப்பாற்றுச் சம்பளத்துடன் தாமாக விரும்பி இளைப்பாறியவர்களைத் தவிர, உள்ளூராட்சிச் சேவையிலிருந்து இளைப்பாறிய மற்றவர்கள் அனைவருக்கும் வழங்கப்பட்டு விட்டதென்பதை அவர் அறிவாரா? (ஆ) பதவிகளை அகற்றியதன் காரணமாக உள்ளூராட்சிச் சேவையிலிருந்து இளைப்பாறியவர்களுக்குப் இப்பொதுச் சம்பள உயர்வு வழங்கப்படுவதற்குச் சட்டமொன்று (1961 ஆம் ஆண்டு 59 ஆம் இலக்கச்சட்டம்) இசைவாணை அளித்ததை அவர் அறிவாரா? (இ) உள்ளூராட்சிச் சேவைக் கட்டளைச் சட்டத்தின் 56 ஆவது பிரிவின்படி இளைப்பாறியவர்கள், பதவியை அகற்றியதன் காரணமாக இளைப்பாறியவர்களுடன் சரிசமமாக வைத்து மதிக்கப்பட வேண்டுமென 57 ஆவது பிரிவு தெளிவாகக் குறிப்பிட்டுள்ளபோதிலும், 56 ஆவது பிரிவின்படி இளைப்பாறியவர்களுக்கு இப்பொதுச் சம்பள உயர்வு மறுக்கப்பட்டுள்ளதேன்? (ஈ) இச்சம்பள உயர்வு ஒன்பது ஆண்டுகளுக்கு மேலாக மேற்குறிப்பிட்ட, இளைப்பாற்றுச் சம்பளத்துடன் இளைப்பாறியவர்களுக்கு வழங்கப்படாதிருப்பதனாலும், இக்கால எல்லைக்குள், இவர்களில் பலர் இயற்கை எய்திருப்பதனாலும், மேற்கூறப்பட்ட சம்பள உயர்வை உடலும், மேற்கூறப்பட்ட சம்பள உயர்வை உடவடிக்கை எடுப்பாரா?

asked the Parliamentary Secretary to the Minister of Local Government and to the Minister of Information and Broadcasting: (*a*) Is he aware that the general increase of pensions sanctioned by notification in the Gazette of 10.10.58 in respect of government pensioners was paid to all local government service pensioners as well, except those who had opted to retire on pension under Section 56 of the Local Government Service Ordinance (Cap. 264)? (*b*) Is he aware that the relevant legislation (Act No. 59 of 1961) sanctioned this general increase even to those local government service pensioners who had retired on account of abolition of office? (*c*) Why were the pensioners who retired under Section 56 of the Local Government Service Ordinance denied this general increase when Section 57 of the ordinance clearly lays down that such pensioners should be on a par with those retired on account of abolition of office? (*d*) Will he see that these pensioners are granted the increase immediately since it has been due to them for over nine years, many of whom have meanwhile passed away?

**ආර්. ප්‍රේමදාස මයා. (පළාත් පාලන ඇමතිගේ සහ ප්‍රවෘත්ති හා ගුවන් විදුලි ඇමතිගේ පාර්ලිමේන්තු ලේකම්)**

(திரு. ஆர். பிரேமதாச—உள்ளூராட்சி அமைச்சரதும், தகவல் ஒலிபரப்பு அமைச்சரதும் பாராளுமன்றக் காரியதரிசி)

(Mr. R. Premadasa—Parliamentary Secretary to the Minister of Local Government and to the Minister of Information & Broadcasting)

(අ) ඔව්. (ආ) ඔව්. (ඉ) පළාත් පාලන සේවා ආඥාපනතේ 56 වැනි වගන්තියේ විධිවිධාන යටතේ විශ්‍රාම ලැබූ අයට ගෙවීම් කරනු ලැබීම සඳහා 1961 කේ 59 වැනි පනතෙහි විධිවිධානයක් යොදා නැති නිසාය. (ඊ) ඔව්. මෙය ක්‍රියාත්මක කිරීම සඳහා ගරු ඇමතිතුමා විසින් රෙගුලාසි සකසනු ලැබීමට පිළිවන් අභිනව පළාත් පාලන සේවා කෙටුම්පත් පනත නියෝජිත මන්ත්‍රීමණ්ඩලය විසින් සම්මත කරනු ලැබූ වහාම.

**ඉලංගරත්න මයා.**

(திரு. இலங்கரத்ன)

(Mr. Ilangaratne)

කෙටුම්පත් පනත නැතිව මේ වැරද්ද හරිගස්සන්නට බැරිද? මෙය දැනටමත් අතපසු වී තිබෙන දෙයක්. ඒ නිසා මෙය හදන්නට බැරිද?

**ප්‍රේමදාස මයා.**

(திரு. பிரேமதாச)

(Mr. Premadasa)

එය න්‍යාය පත්‍රයේ සඳහන් වෙලා තිබෙනවා. පනත යටතේ රෙගුලාසි පන

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[ප්‍රේමදාස මයා.]

වන්නට විධිවිධාන සලසා තිබෙනවා. එය වහාම කරන්නටත් බලාපොරොත්තු වෙනවා.

### බ. දොන් දියස් මහතා, උඩපුස්සැල්ලාව

திரு. ப. டொன் டயஸ், உடபுசல்லாவை.

MR. B. DON DIAS, UDAPUSSELLAWA

4. ටී. බී. එම්. හේරත් මයා. (වලපනේ)
(திரு. ரி. பி. எம். ஹேரத்—வளப்பனை)
(Mr. T. B. M. Herath—Walapane)

මුදල් ඇමතිගෙන් ඇසූ ප්‍රශ්නය: (අ) තැපැල් හා විදුලි සංදේශ අංශයේ උඩපුස්සැල්ලාව ටැලිපෝන් මධ්‍යස්ථානයේ සේවක අංක එම් 677 දරණ බ. දොන්. දියස් මහතාට ලිපි අංක පී ඇෆ්/ඇල්ඊ/3838/114025 යටතේ 1964.12.29 දින හා අංක 6505082 දරණ චෙක් පතින් රාජ්‍යය සේවා අර්ථසාධක කාර්යාලය මඟින් රු. 125 යවන ලද බව එතුමා දන්නවාද? (ආ) එම චෙක් පත තවමත් අයිතිකරුට නොලැබුනු බව එතුමා දන්නවාද? (ඉ) බ. දොන් දියස් මහතා 65.11.23 හා 67.3.7 යන දිනවල කරන ලද විමසීම් වලට පිළිතුරු නොඑවන ලද්දේ මන්ද? (ඊ) මෙම කරුණ ඉක්මණින් සමථයකට පත් කිරීමට එතුමා ක්‍රියා කරනවාද? (උ) නොඑසේ නම්, ඒ මන්ද?

நிதி அமைச்சரைக் கேட்ட வினா: (அ) தபால், தந்திப் போக்குவரத்துப் பகுதியில் உடபுசல்லாவை தொலைபேசி மாற்று நிலையத்தில் பணியாற்றுபவரும் எம் 677 என்ற இலக்கத்தையுடையவருமான திரு. ப. டொன் டயஸ் என்பவருக்கு, பீஎவ்/எல்ஈ/3838/114025 இலக்கமிடப்பட்ட கடிதத்தோடு 29.12.64 திகதியிடப்பட்டதும் 6505082 என்ற இலக்கத்தைக் கொண்டதுமான 125 ரூபாய்க் காசோலை ஒன்றை அரசாங்கச் சேவைச் சகாயநிதி அலுவலகம் அனுப்பியதை அவர் அறிவாரா? (ஆ) உரியவருக்கு இக் காசோலை இதுவரை கிடைக்கவில்லையென்பதை அவர் அறிவாரா? (இ) 23.11.65 இலும் 7.3.67 இலும் திரு. பி. டொன் டயஸ் செய்த விசாரணைகளுக்கு இதுவரை பதில்கள் அனுப்பப்படாததேன்? (ஈ) இவ்விடயத்தில் விரைவில் முடிவுகாண அவர் நடவடிக்கை எடுப்பாரா? (உ) அன்றேல், ஏன்?

asked tthe Minister of Finance: (*a*) Is he aware the Public Service Provident Fund Office sent a cheque bearing No. 6505082 dated 1964.12.29 for a sum of Rs. 125 under cover of letter number PF/LE/3838/114025 to Mr. B. Don Dias—M 677 of the Udapussellawa telephone exchange in the Post and Telecommunication division? (*b*) Is he aware that the owner has not yet received this cheque? (*c*) Why is it that no replies have been sent to inquires made on 23.11.65 and 7.3.67 by Mr. B. Don Dias? (*d*) Will he take steps to settle this matter early? (*e*) If not, why?

ගරු යූ. බී. වන්නිනායක (මුදල් ඇමති)
(கௌரவ யூ. பி. வன்னிநாயக்க—நிதி அமைச்சர்)
(The Hon. U. B. Wanninayake—Minister of Finance)

(අ) නුවරඑළිය දිස්ත්‍රික්කයේ විදුලි සංදේශ පරීක්ෂක යටතේ සේවය කළ, අංක 114025 යටතේ රාජ්‍ය සේවා අර්ථසාධක අරමුදලට දායක මුදල් ගෙවූ බී. ඩී. දියස් මහතාට රු. 125 ක් සඳහා අංක ඒ. 505082 හා 64.12.29 දතම දරණ මධ්‍යම බැංකුවේ චෙක්පත යැවූ බව මම දනිමි. (ආ) ඔහු රාජ්‍ය සේවා අර්ථසාධක අරමුදලේ ලේකම් වෙත මෙම චෙක්පත නොලැබුණු බවට පැමිණිලි කර ඇත. මේ පැමිණිල්ල ගැන අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුව විමර්ශනයක් පවත්වාගෙන යනු ලැබේ. (ඉ) ඔහුගේ 1965.11.23 දිනැති චෙක්පත නොලැබීම ගැන පැමිණිල්ලට වාචික පිළිතුරක් 1967.3.7 දින එවකට සිටි ලේකම් මහතා විසින් දැන්විය. අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවට මේ පැමිණිල්ල ගැන පරීක්ෂා කරන ලෙසද දැන්විය. (ඊ) ඩයස් මහතාට චෙක්පත නොලැබුණු වග අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවට විමර්ශනය කිරීම සඳහා රිපෝර්තු කරන ලදි. මේ ගැන මෙතෙක් පරීක්ෂණ පවත්වා ගෙන යයි. මේ පරීක්ෂණ අවසානවී මෙම චෙක්පත කවරෙකු විසින් මාරු කරන ලද දැයි දැන ගන්නා තුරු මේ කාරණය බේරුම් කළ නොහැක. (උ) ඉහත (ඊ) බලන්න.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

ටී. බී. එම්. හේරත් මයා.
*(திரு. ரி. பி. எம். ஹேரத்)*
(Mr. T. B. M. Herath)

අවුරුදු තුනකට කිට්ටු කාලයක් ගත වී තිබෙන නිසා ගරු ඇමතිතුමාට බැරිද ඒ සම්බන්ධයෙන් තමන්ගේ අවධානය යොමු කර ඒ මුදල් ලබා දෙන්නට ක්‍රියා මාර්ගයක් ගන්නට. එතුමා එවැනි ක්‍රියා මාර්ගයක් සකස් කරනවාදැයි දැන ගන්නට කැමතියි.

ගරු වන්නිනායක
*(கௌரவ வன்னிநாயக்க)*
(The Hon. Wanninayake)

පරීක්ෂණ ප්‍රමාද වීමට හේතු තිබෙන්නට පුළුවනි. ඒවා ගැන පරීක්ෂා කර බලා හැකි තරම් ඉක්මණින් නිරාකරණය කරන්නට කටයුතු කරනවා.

කථානායකතුමා
*(சபாநாயகர் அவர்கள்)*
(Mr. Speaker)

Question No. 5.

ගරු ආචාර්ය ඩබ්ලිව්. දහනායක (ස්වදේශ කටයුතු පිළිබඳ ඇමති)
*(கௌரவ கலாநிதி டபிள்யூ. தகநாயக்க—உள்நாட்டு விவகார அமைச்சர்)*
(The Hon. Dr. W. Dahanayake—Minister of Home Affairs)

I want two weeks' time to answer this Question.

ප්‍රශ්නය මතු දිනකදී ඉදිරිපත් කිරීමට නියෝග කරන ලදී.

*வினாவை மற்றொரு தினத்துக்குச் சமர்ப்பிக்கக் கட்டளையிடப்பட்டது.*

*Question ordered to stand down.*

කථානායකතුමා
*(சபாநாயகர் அவர்கள்)*
(Mr. Speaker)

Question No. 6.

ගරු ආචාර්ය දහනායක
*(கௌரவ கலாநிதி தகநாயக்க)*
(The Hon. Dr. Dahanayake)

I want two weeks' time to answer this Question too.

ප්‍රශ්නය මතු දිනකදී ඉදිරිපත් කිරීමට නියෝග කරන ලදී.

*வினாவை மற்றொரு தினத்துக்குச் சமர்ப்பிக்கக் கட்டளையிடப்பட்டது.*

*Question ordered to stand down.*

කථානායකතුමා
*(சபாநாயகர் அவர்கள்)*
(Mr. Speaker)

Question No. 7.

ගරු එම්. ඩී. එච්. ජයවර්ධන (විද්‍යාත්මක පර්යේෂණ හා නිවාස ඇමති)
*(கௌரவ எம். டீ. எச். ஜயவர்தன—விஞ்ஞான ஆய்வு, வீடமைப்பு அமைச்சர்)*
(The Hon. M. D. H. Jayawardena—Minister of Scientific Research and Housing)

I want two weeks' time to answer this Question.

ප්‍රශ්නය මතු දිනකදී ඉදිරිපත් කිරීමට නියෝග කරන ලදී.

*வினாவை மற்றொரு தினத்துக்குச் சமர்ப்பிக்கக் கட்டளையிடப்பட்டது.*

*Question ordered to stand down.*

## අ. පො. ස. (සාමාන්‍ය පෙළ) විභාගය : ඉංග්‍රීසි භාෂාව ප්‍රශ්න පත්‍රය, 1967 අගෝස්තු

பொ. க. த. (சாதாரணதர)த் தேர்வு, ஆகஸ்ட் 1967 : ஆங்கில மொழி வினாத்தாள்.

## ENGLISH LANGUAGE PAPER, G. C. E. (ORDINARY LEVEL) EXAMINATION, AUGUST 1967

8. ලෙස්ලි ගුණවර්ධන මයා. (පානදුර)
*(திரு. லெஸ்லி குணவர்தன—பாணந்துறை)*
(Mr. Leslie Goonewardene—Panadura)

අධ්‍යාපන හා සංස්කෘතික කටයුතු ඇමතිගෙන් ඇසූ ප්‍රශ්නය : (අ) 1967 අගෝස්තු මාසයේ පවත්වන ලද අධ්‍යාපන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගයේ ඉංග්‍රීසි භාෂාව ප්‍රශ්න පත්‍රයේ 5 වැනි ප්‍රශ්නයෙන්, "to take French leave" යන වාක්‍ය ඛණ්ඩය වෙනුවට තනි වචනයක් සඳහන් කරන ලෙස අපේක්ෂක සිසුන්ගෙන් ඉල්ලා තුබූ බව එතුමා දන්නවාද? (ආ) "to take French leave" යන වාක්‍ය ඛණ්ඩයට තනි වචනයක් ඉංග්‍රීසි

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[ලෙස්ලි ගුණවර්ධන මයා.]
භාෂාවේ නොමැති බව එතුමා දන්නවාද? (ඉ) නෝ එසේනම්, එම තනි වචනය එතුමා මෙම සභාවට දන්වනවාද?

கல்வி, கலாச்சார விவகார அமைச்சரைக் கேட்ட வினா: (அ) 1967, ஆகஸ்டு மாதம் நடைபெற்ற பொதுக் கல்வித் தராதர (சாதாரண தர)த் தேர்வின் ஆங்கில மொழி வினாத்தாளில் 5 ஆம் இலக்கக் கேள்வியில் "to take french leave" என்ற சொற் களுக்கு ஒரு சொல் தரும்படி மாணவர் கேட் கப்பட்டதை அவர் அறிவாரா? (ஆ) "to take french leave", என்ற சொற்களுக்குத் தனிச்சொல் எதுவும் ஆங்கில மொழியில் இல்லை என்பதை அவர் அறிவாரா? (இ) அன்றேல், அவர் அந்தச் சொல்லை இச் சபைக்கு அறியத் தருவாரா?

asked the Minister of Education and Cultural Affairs: (*a*) Is he aware that in the English Language paper in the General Certificate of Education (Ordinary Level) Examination held in August 1967, question number 5 required the student to give one word for the phrase "to take French leave"? (*b*) Is he aware that there is no single word in the English language for the phrase "to take French leave"? (*c*) If not, will he inform this House of that word.

**ගාමිණී ජයසූරිය මයා. (අධ්‍යාපන හා සංස්කෘතික කටයුතු පිළිබඳ පාර්ලිමේන්තු ලේකම්)**

*(திரு. காமனி ஜயசூரிய—கல்வி, கலாசார விவகார அமைச்சரின் பாராளுமன்றக் காரிய தரிசி)*

(Mr. Gamani Jayasuriya—Parliamentary Secretary to the Minister of Education and Cultural Affairs)

(*a*) Yes. (*b*) There is a single word. (*c*) "Abscond" or "decamp"

**ලෙස්ලි ගුණවර්ධන මයා.**

*(திரு. லெஸ்லி குணவர்தன)*

(Mr. Leslie Goonewardene)

Is he aware that, according to the Oxford English Dictionary, neither "abscond" nor "decamp" completely answers the meaning of the phrase "to take French leave"?

**ජයසූරිය මයා.**

*(திரு. ஜயசூரிய)*

(Mr. Jayasuriya)

I bow to the hon. Member's superior knowledge of French matters.

Webster's Dictionary states, "to take French leave" equals to depart secretly, to abscond, to depart clandestinely".

Concise Oxford Dictionary says, "to abscond" equals "to go away secretly."

Thesaurus' English Words and Phrases says, "to take French leave" equals "to decamp".

Readers Digest Dictionary says, "to decamp" equals "to abscond".

**ලෙස්ලි ගුණවර්ධන මයා.**

*(திரு. லெஸ்லி குணவர்தன)*

(Mr. Leslie Goonewardene)

In any case, I should like to ask the hon. Parliamentary Secretary whether he considers it a fair question to ask from a student who is sitting for an English Paper in the G. C. E. (Ordinary Level) Examination?

**ජයසූරිය මයා.**

*(திரு. ஜயசூரிய)*

(Mr. Jayasuriya)

That is a question I cannot answer. It is a matter decided by the examiners.

**ටී. බී. එම්. හේරත් මයා.**

*(திரு. ரி. பி. எம். ஹேரத்)*

(Mr. T. B. M. Herath)

මේ ප්‍රශ්න පත්‍ර හැදීමේ කටයුතුවල නියුක්ත, ස්නායු දුර්වල, විශ්‍රාම ලත් නිලධාරීන් වෙනුවට අළුත් අය පත් කරන්නට ක්‍රියා කරනවාද?

**ජයසූරිය මයා.**

*(திரு. ஜயசூரிய)*

(Mr. Jayasuriya)

දැන් එම කටයුතුවල නියුක්තව සිටින් නේ එවැනි දුර්වල අය යැයි අප පිළි ගන්නේ නැහැ.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

## අනුරාධපුර කොට්ඨාශයේ පාසල්

அனுராதபுரத் தொகுதிப் பாடசாலைகள்

## SCHOOLS IN ANURADHAPURA ELECTORATE

9. **කේ. බී. රත්නායක මයා.** (අනුරාධපුර)

*(திரு. கே. பி. ரத்ணயக்க—அனுராதபுரம்)*

(Mr. K. B. Ratnayake—Anuradhapura)

අධ්‍යාපන හා සංස්කෘතික කටයුතු ඇමතිගෙන් ඇසූ ප්‍රශ්නය : පහත සඳහන් විස්තර සහිතව, අනුරාධපුර ඡන්ද කොට්ඨාශයේ පාඨශාලාවල නම් එතුමා සඳහන් කරනවාද ? (i) පාඨශාලාවේ නම සහ ශ්‍රෙණිය ; (ii) ශිෂ්‍ය සංඛ්‍යාව ; (iii) ගැහැණු හා පිරිමි ගුරුවරුන්ගේ සංඛ්‍යාව හා ඔවුන්ගේ සුදුසුකම් ; (iv) මුල් ගුරුවරයාගේ/මුල් ගුරුවරියගේ නම හා ඔහුගේ/ඇගේ ශ්‍රෙණිය.

*கல்வி, கலாசார விவகார அமைச்சரைக் கேட்ட வினு : கீழ்க்காணும் விவரங்களுடன் அனுராதபுரத் தேர்தல் தொகுதியிலே உள்ள பள்ளிக்கூடங்களின் பெயர்களை அவர் தருவாரா :—(i) பள்ளிக்கூடத்தின் பெயரும் அதன் தரமும் ; (ii) வரவேட்டில் உள்ள மாணவர் எண்ணிக்கை ; (iii) ஆசிரியர்களதும், ஆசிரியைகளதும் எண்ணிக்கை, அவர்களின் கல்வித் தகைமைகள் ; (iv) தலைமை ஆசிரியரின்/ஆசிரியையின் பெயரும் அவர் தரமும்.*

asked the Minister of Education and Cultural Affairs : Will he state the names of the schools in the Anuradhapura Electorate giving the following particulars : (i) the name of the school and its grade ; (ii) the number of pupils on roll ; (iii) the number of teachers, (males and females) and their qualifications ; and (iv) the name of the head teacher and his/her grade ?

**ජයසූරිය මයා.**

*(திரு. ஜயசூரிய)*

(Mr. Jayasuriya)

It is a long Answer. I shall table it.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

සභාමේසය මත තබන ලද පිළිතුර මෙසේ සි :

சபாபீடத்தில் வைக்கப்பட்ட விடை வருமாறு :

The Answer tabled is as follows :

| අනු අංකය | (i) පාසැලේ නම<br>(ii) මුල්ගුරුවරයාගේ/වරියගේ නම<br>(iii) ඔහුගේ/ඇයගේ ශ්‍රේණිය | පාසැලේ ශ්‍රේණිය | මුළු ශිෂ්‍ය සංඛ්‍යාව | සම්පූර්ණ ගුරු සංඛ්‍යාව | | පුහුණු උපාධි ධාරීහු | | උපාධි ධාරීහු | | උපාධි අපේක්ෂක | | ද්විතීය පුහුණු | | සාමාන්‍ය පුහුණු | | නුපුහුණු ගුරු සහතික ලත් | | සහතික නොලත් ගුරු | | ශිෂ්‍ය ගුරු | | නැටුම් | | සංගීත | | චිත්‍ර | | ශා.අ.උ. | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| | | | | පි. | ගැ. | පි. | ගැ. | පි. | ගැ. | පි. | ගැ. | පි. | ගැ. | පි. | ගැ. | පි. | ගැ. | පි. | ගැ. | පි. | ගැ. | පි. | ගැ. | පි. | ගැ. | පි. | ගැ. | පි. | ගැ. |
| 1. | (i) අ/අනුරාධපුර කණිෂ්ඨ වි.<br>(ii) ටී. ඩී. බී. දිසානායක මයා.<br>(iii) I ශ්‍රේණියේ මුල්ගුරු | I | 1,322 | 12 | 27 | – | – | – | – | – | – | – | – | 9 | 9 | 1 | 4 | 2 | 12 | – | 2 | – | – | – | – | – | – | – | – |
| 2. | (i) අ/අනුරාධපුර මධ්‍ය මහා වි.<br>(ii) ටී. බී. වන්නිනායක මයා. ම.ම.වි.<br>(iii) I ශ්‍රේණියේ විදුහල්පති | I | 1,213 | 35 | 19 | 1 | – | 10 | 8 | – | – | 14 | 6 | 6 | 4 | – | 1 | – | – | – | – | 1 | – | 1 | – | 1 | – | 1 | – |
| 3. | (i) අ/අනුරාධපුර මහාබොධි වි.<br>(ii) පී. සී. උග්ගල්දෙනිය මයා.<br>(iii) II ශ්‍රේණියේ මුල්ගුරු | I | 555 | 5 | 11 | – | – | – | – | – | – | – | – | 3 | 4 | 0 | 1 | 1 | 6 | – | – | – | – | – | – | 1 | – | – | – |
| 4. | (i) අ/අඩම්පනේ වි.<br>(ii) යූ. බී. නවරත්න<br>(iii) II ශ්‍රේණියේ මුල්ගුරු | II | 170 | 3 | 4 | – | – | – | – | – | – | – | – | 2 | – | – | 1 | 1 | 2 | – | 1 | – | – | – | – | – | – | – | – |
| 5. | ( ) අඹගස්වැව වි.<br>(ii) ඩී. එස්. රාජපක්ෂ මයා.<br>(iii) I ශ්‍රේණියේ මුල්ගුරු | II | 159 | 4 | 1 | – | – | – | – | – | – | – | – | 3 | – | 1 | 1 | – | – | – | – | – | – | – | – | – | – | – | – |
| 6. | (i) අ/අලුත්වැව කුමාර වි.<br>(ii) එම්. ඇන්ටනි පිරිස් මයා.<br>(iii) II ශ්‍රේණියේ මුල්ගුරු | II | 150 | 2 | 3 | – | – | – | – | – | – | – | – | 2 | 1 | – | 1 | – | 1 | – | – | – | – | – | – | – | – | – | – |

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

| අනු අංකය | (i) පාසැලේ නම<br>(ii) මුල්ගුරුවරයාගේ/වරියගේ නම<br>(iii) ඔහුගේ/ඇයගේ ශ්‍රේණිය | පාසැලේ ශ්‍රේණිය | මුළු ශිෂ්‍ය සංඛ්‍යාව | සම්පූර්ණ ගුරු සංඛ්‍යාව | | පුහුණු උපාධි ධාරීහු | | උපාධි ධාරීහු | | උපාධි අපේක්ෂක | | ද්විතීය පුහුණු | | සාමාන්‍ය පුහුණු | | නුපුහුණු සහතික ලත් | | සහතික නොලත් ගුරු | | ශිෂ්‍ය ගුරු | | නැටුම් | | සංගීත | | චිත්‍ර | | ශා.අ.උ. | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| | | | | පි. | ගැ. | පි. | ගැ. | පි. | ගැ. | පි. | ගැ. | පි. | ගැ. | පි. | ගැ. | පි. | ගැ. | පි. | ගැ. | පි. | ගැ. | පි. | ගැ. | පි. | ගැ. | පි. | ගැ. | පි. | ගැ. |
| 7. | (i) අ/ඉට්ටිකුලම වි.<br>(ii) ඩබ්. එම්. විජේසුන්දර මයා.<br>(iii) වැඩ බලන මුල්ගුරු | II | 72 | 2 | 1 | – | – | – | – | – | – | – | – | 2 | – | – | – | – | 1 | – | – | – | – | – | – | – | – | – | – |
| 8. | (i) අ/ඉලන්ගහවැව වි.<br>(ii) එන්. දිසානායක මයා.<br>(iii) II ශ්‍රේණියේ මුල්ගුරු | II | 121 | 2 | 2 | – | – | – | – | – | – | – | – | 1 | 1 | – | 1 | – | 1 | – | – | – | – | – | – | – | – | – | – |
| 9. | (i) අ/ඉසුරුමුණි වි.<br>(ii) කේ. එල්. සිරිසේන මයා.<br>(iii) I ශ්‍රේණියේ මුල්ගුරු | I | 158 | 2 | 6 | – | – | – | – | – | – | – | – | 1 | 1 | 1 | 2 | – | 2 | – | – | – | – | – | – | – | – | – | – |
| 10. | (i) ඉ/ඉහළ කෙඩිතේක්කුව වි.<br>(ii) කේ. ඒ. පී. පෙරේරා මයා.<br>(iii) II ශ්‍රේණියේ මුල්ගුරු | II | 55 | 2 | 1 | – | – | – | – | – | – | – | – | 1 | – | 1 | – | – | – | – | 1 | – | – | – | – | – | – | – | – |
| 11. | (i) අ/ඔත්තප්පුව වි.<br>(ii) අයි. එස්. එම්. අබේරත්න මයා.<br>(iii) II ශ්‍රේණියේ මුල්ගුරු | II | 84 | 2 | – | – | – | – | – | – | – | – | – | 2 | – | – | – | – | – | – | – | – | – | – | – | – | – | – | – |
| 12. | (i) අ/කලුවිලසේන ද්විතීය වි.<br>(ii) ටී. බී. කුලසේකර මයා.<br>(iii) III ශ්‍රේණියේ විදුහල්පති | ද්විතියික | 233 | 9 | 1 | – | – | 3 | – | – | – | 3 | – | 1 | 1 | – | – | – | – | – | – | 1 | – | – | – | 1 | – | – | – |
| 13. | (i) කලුවිල කණිෂ්ඨ වි.<br>(ii) එච්. වී. තිසේරා මයා.<br>(iii) II ශ්‍රේණියේ මුල්ගුරු | I | 501 | 7 | 7 | – | – | – | – | – | – | – | – | 5 | 2 | 1 | 1 | 1 | 2 | – | 2 | – | – | – | – | – | – | – | – |

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

| අනු අංකය | (i) පාසැලේ නම<br>(ii) මුල්ගුරුවරයාගේ/වරියගේ නම<br>(iii) ඔහුගේ/ඇයගේ ශ්‍රේණිය | පාසැලේ ශ්‍රේණිය | මුළු ශිෂ්‍ය සංඛ්‍යාව | සම්පූර්ණ ගුරු සංඛ්‍යාව | | පුහුණු උපාධි ධාරීහු | | උපාධි ධාරීහු | | උපාධි අපේක්ෂක | | ද්විතීය පුහුණු | | සාමාන්‍ය පුහුණු | | නුපුහුණු සහතික ලත් | | සහතික නොලත් | | ශිෂ්‍ය ගුරු | | නැටුම් | | සංගීත | | චිත්‍ර | | ශා.අ.උ. | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| | | | | පි. | ගැ. | පි. | ගැ. | පි. | ගැ. | පි. | ගැ. | පි. | ගැ. | පි. | ගැ. | පි. | ගැ. | පි. | ගැ. | පි. | ගැ. | පි. | ගැ. | පි. | ගැ. | පි. | ගැ. | පි. | ගැ. |
| 14. | (i) අ/අනුරාධපුර කණිෂ්ඨ බාලිකා වි.<br>(ii) මේරි ඇතල් රීඩා කන්‍යා සහෝදරිය<br>(iii) I ශ්‍රේණියේ මුල් ගුරු | I | 1,116 | – | 33 | – | – | – | – | – | – | – | – | – | 15 | – | 6 | – | 9 | – | 3 | – | – | – | – | – | – | – | – |
| 15. | (i) අ/අනුරාධපුර කණිෂ්ඨ බා. දෙමළ<br>(ii) මේරි ඇතල් රීඩා කන්‍යා සහෝදරිය<br>(iii) I ශ්‍රේණියේ මුල්ගුරු | I | 371 | – | 14 | – | – | – | – | – | – | – | – | – | 11 | – | – | – | 3 | – | – | – | – | – | – | – | – | – | – |
| 16. | (i) අ/කදුරුපිටිය කුඩාතම් මැන්නාව වි.<br>(ii) ආර්. එම්. ටිකිරිබංඩා මයා.<br>(iii) වැඩ බලන මුල්ගුරු | II | 30 | 1 | – | – | – | – | – | – | – | – | – | 1 | – | – | – | – | – | – | – | – | – | – | – | – | – | – | – |
| 17. | (i) අ/කටුපත්වැව වි.<br>(ii) එස්. ඒ. කරුණාරත්න මයා.<br>(iii) පාසැල භාර උප ගුරු | II | 58 | 1 | – | – | – | – | – | – | – | – | – | 1 | – | – | – | – | – | – | – | – | – | – | – | – | – | – | – |
| 18. | (i) අ/කුඩානෙලුබැව වි.<br>(ii) අසෝක ජයරත්න මයා.<br>(iii) I ශ්‍රේණියේ මුල්ගුරු | I | 464 | 7 | 8 | – | | – | – | – | – | – | – | 4 | – | 1 | 3 | 1 | 4 | 1 | 1 | – | – | – | – | – | – | – | – |
| 19. | (i) අ/කුකුල්කටුව වි.<br>(iii) ටී. එම්. දිසානායක මයා.<br>(iii) වැඩ බලන මුල්ගුරු | II | 66 | 1 | – | – | – | | – | – | – | – | – | 1 | – | – | – | – | – | – | – | – | – | – | – | – | – | – | – |

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

| අනු අංකය | (i) පාසැලේ නම (ii) මුල්ගුරුවරයාගේ වරියගේ නම (iii) ඔහුගේ/ඇයගේ ශ්‍රේණිය | පාසැලේ ශ්‍රේණිය | මුළු ශිෂ්‍ය සංඛ්‍යාව | සම්පූර්ණ ගුරු සංඛ්‍යාව | | පුහුණු උපාධි ධාරීහු | | උපාධි ධාරීහු | | උපාධි අපේක්ෂක | | ද්විතීය පුහුණු | | සාමාන්‍ය පුහුණු | | නුපුහුණු සහතික ගුරු | | සහතික නොලත් ගුරු | | ශිෂ්‍ය ගුරු | | නැටුම් | | සංගීත | | චිත්‍ර | | ශා.අ.උ. | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| | | | | පි. | ගැ. | පි. | ගැ. | පි. | ගැ. | පි. | ගැ. | පි. | ගැ. | පි. | ගැ. | පි. | ගැ. | පි. | ගැ. | පි. | ගැ. | පි. | ගැ. | පි. | ගැ. | පි. | ගැ. | පි. | ගැ. |
| 20. | (i) ගාලදිවුල්වැව වි. (ii) පි. රුයිනිස් මයා. (iii) I ශ්‍රේණියේ මුල්ගුරු | I | 171 | 5 | 1 | – | – | – | – | – | – | – | – | 4 | – | – | – | 1 | – | – | 1 | – | – | – | – | – | – | – | – |
| 21. | (i) අංතල්ගස්වැව වි. (ii) ආර්. පි. ජයරත්න මයා. (iii) II ශ්‍රේණියේ මුල්ගුරු | II | 82 | 1 | 2 | – | – | – | – | – | – | – | – | 1 | – | – | – | – | 1 | – | 1 | – | – | – | – | – | – | – | – |
| 22. | (i) අංදිවුල්වැව වි. (ii) එම්. බී. දිසානායක මයා. (iii) I ශ්‍රේණියේ මුල්ගුරු | I | 190 | 3 | 2 | – | – | – | – | – | – | – | – | 1 | 2 | 1 | – | 1 | – | – | – | – | – | – | – | – | – | – | – |
| 23. | (i) දුනුපොතගම වි. (ii) ඒ. එම්. ආර්. බංඩාර මයා. (iii) II ශ්‍රේණියේ මුල්ගුරු | II | 76 | 2 | 1 | – | – | – | – | – | – | – | – | 2 | – | – | – | – | – | – | 1 | – | – | – | – | – | – | – | – |
| 24. | (i) අ/දුනුමඩලාව වි. (ii) ඩී. එම්. ඩී. දසනායක මයා. (iii) කාර්යභාර මුල්ගුරු | II | 138 | 3 | 1 | – | – | – | – | – | – | – | – | 1 | – | – | – | 1 | 1 | 1 | – | – | – | – | – | – | – | – | – |
| 25. | (i) අංනිවත්තකචේතිය ද්වි.වි. (ii) සී. සුහසිංහ මයා. (iii) වැඩ බලන විදුහල්පති | ද්වි | 326 | 7 | 5 | – | – | 2 | 1 | 2 | – | – | – | – | 2 | 1 | – | – | 2 | – | – | 1 | – | – | – | 1 | – | – | – |
| 26. | (i) නිවත්තකචේතිය කණිෂ්ඨ වි. (ii) කේ. ඒ. පි. කරුණාරත්න මයා. (iii) I ශ්‍රේණියේ මුල්ගුරු | I | 555 | 3 | 10 | – | – | – | – | – | – | – | – | 3 | 3 | – | – | – | 5 | – | 2 | – | – | – | – | – | – | – | – |

Digitized by Noolaham Foundation. noolaham.org | aavanaham.org

| අනු අංකය | (i) පාසැලේ නම (ii) මුල්ගුරුවරයාගේ/වරියගේ නම (iii) ඔහුගේ/ඇයගේ ශ්‍රේණිය | පාසැලේ ශ්‍රේණිය | මුළු ශිෂ්‍ය සංඛ්‍යාව | සම්පූර්ණ ගුරු සංඛ්‍යාව | | පුහුණු උපාධි ධාරීහු | | උපාධි ධාරීහු | | උපාධි අපේක්ෂක | | ද්විතීය පුහුණු | | සාමාන්‍ය පුහුණු | | නුපුහුණු ගුරු සහතික ලත් | | සහතික නොලත් | | ශිෂ්‍ය ගුරු | | නැටුම් | | සංගීත | | චිත්‍රකම් | | ශා.අ.උ. | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| | | | | පි. | ගැ. | පි. | ගැ. | පි. | ගැ. | පි. | ගැ. | පි. | ගැ. | පි. | ගැ. | පි. | ගැ. | පි. | ගැ. | පි. | ගැ. | පි. | ගැ. | පි. | ගැ. | පි. | ගැ. | පි. | ගැ. |
| 27. | (i) අ/නොච්චියාගම විද්‍යා ද්වි දර්ශ ද්වි.<br>(ii) බී. පී. විල්ප්‍රඩ් මයා.<br>(iii) වැඩ බලන මුල්ගුරු | ... | 241 | 11 | 2 | – | – | 4 | – | – | – | 7 | – | – | 2 | – | – | – | – | – | – | – | – | – | – | – | – | – | – |
| 28. | (i) අ/නොච්චියාගම කණිෂ්ඨ වි.<br>(ii) පී. පී. බංඩාර මයා.<br>(iii) වැඩ බලන මුල් ගුරු | I | 527 | 11 | 7 | – | – | – | – | – | – | – | 1 | 5 | – | – | 1 | 2 | 2 | 2 | 2 | 1 | – | – | 1 | 1 | – | – | – |
| 29. | (i) අ/පහළ හල්මිල්ලෑව වි.<br>(ii) ග. මු. සිරිසේන මයා.<br>(iii) 1 ශ්‍රේණියේ මුල්ගුරු | I | 285 | 5 | 1 | – | – | – | – | – | – | – | – | 4 | – | – | – | 1 | 1 | – | – | – | – | – | – | – | – | – | – |
| 30. | (i) අ/පහළ මාරගහවැව වි.<br>(ii) එස්. පී. සමරක්කොඩි මයා.<br>(iii) I ශ්‍රේණියේ මුලගුරු | I | 322 | 7 | 2 | – | – | – | – | – | – | – | – | 6 | 2 | – | 1 | – | – | – | – | – | – | – | – | – | – | – | – |
| 31. | (i) අ/පොතුපිටිගම වි.<br>(ii) එස්. ඩී. ජයසේන මයා.<br>(iii) II ශ්‍රේණියේ මුල්ගුරු | II | 64 | 1 | 1 | – | – | – | – | – | – | – | – | 1 | – | – | – | – | 1 | – | – | – | – | – | – | – | – | – | – |
| 32. | (i) අ/පහළවැටියාව වි.<br>(ii) එච්. සී. පෙරේරා මයා.<br>(iii) II ශ්‍රේණියේ මුල්ගුරු | II | 36 | 1 | 1 | – | – | – | – | – | – | – | – | 1 | – | – | – | – | 1 | – | – | – | – | – | – | – | – | – | – |
| 33. | (i) අ/පොතානගම වි.<br>(ii) එල්. පී. සිරිසේන මයා.<br>(iii) I ශ්‍රේණියේ මුල්ගුරු | I | 215 | 2 | 4 | – | – | – | – | – | – | – | – | 1 | – | 1 | 2 | – | 2 | – | – | – | – | – | – | – | – | – | – |

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

| අනු අංකය | (i) පාසැලේ නම (ii) මුල්ගුරුවරයාගේ/වරියගේ නම (iii) ඔහුගේ/ඇයගේ ශ්‍රේණිය | පාසැලේ ශ්‍රේණිය | මුළු ශිෂ්‍ය සංඛ්‍යාව | සම්පූර්ණ ගුරු සංඛ්‍යාව | | පුහුණු උපාධි ධාරීහු | | උපාධි ධාරීහු | | උපාධි අපේක්ෂක | | ද්විතීය පුහුණු | | සාමාන්‍ය පුහුණු | | නුපුහුණු සහතික ලත් | | සහතික නොලත් | | ශිෂ්‍ය ගුරු | | නැටුම් | | සංගීත | | චිත්‍රකම් | | ශා.අ.උ. | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| | | | | පි. | ගැ. | පි. | ගැ. | පි. | ගැ. | පි. | ගැ. | පි. | ගැ. | පි. | ගැ. | පි. | ගැ. | පි. | ගැ. | පි. | ගැ. | පි. | ගැ. | පි. | ගැ. | පි. | ගැ. | පි. | ගැ. |
| 34. | (i) අ/පුලියන්කුලම හතරුස් වල වි. (ii) සරත් අදිකාරි මයා. (iii) 1 ශ්‍රේණියේ මුල්ගුරු | 1 | 318 | 2 | 8 | – | – | – | – | – | – | – | – | 2 | 3 | – | 2 | – | 3 | – | – | – | – | – | – | – | – | – | – |
| 35. | (i) අ/බෝගහවැව වි. (ii) බී. ඒ. පී. අබේවර්ධන මයා. (iii) වැඩ බලන මුල්ගුරු | 11 | 52 | 1 | 1 | – | – | – | – | – | – | – | – | 1 | – | – | – | – | 1 | – | – | – | – | – | – | – | – | – | – |
| 36. | (i) අ/මහපලාඩිකුලම වි. (ii) එම්. බී. දිසානායක මයා. (iii) 11 ශ්‍රේණියේ මුල්ගුරු | 11 | 95 | 3 | – | – | – | – | – | – | – | – | – | 3 | – | – | – | – | – | – | – | – | – | – | – | – | – | – | – |
| 37. | (i) අ/මහලච්චිය වම් ඉවුරයාය 1 (ii) කේ. පී. එම්. බී. පෙරේරා මයා. (iii) 11 ශ්‍රේණියේ මුල්ගුරු | 1 | 271 | 4 | 2 | – | – | – | – | – | – | – | – | 4 | – | – | 1 | – | 1 | – | – | – | – | – | – | – | – | – | – |
| 38. | (i) අ/මහලච්චිය යාය 3 ගාමිණී වි. (ii) යූ. එම්. ධර්මසේන මයා. (iii) වැඩ බලන මුල් ගුරු | 1 | 289 | 6 | 1 | – | – | – | – | – | – | – | – | 5 | – | – | – | 1 | 1 | – | – | – | – | – | – | – | – | – | – |
| 39. | (i) අ/නුවරවැව මහින්ද ද්වි. වි. (ii) ආර්. සේනානායක මයා. (iii) වැඩ බලන විදුහල්පති | ද්විතියික | 185 | 6 | 4 | – | – | 1 | 2 | – | – | 2 | 1 | 1 | – | – | – | – | – | – | – | 1 | – | – | – | 1 | – | – | 1 |

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

| අනු අංකය | (i) පාසැලේ නම (ii) මුල්ගුරුවරයාගේ/වරියගේ නම (iii) ඔහුගේ/ඇයගේ ශ්‍රේණිය | පාසැලේ ශ්‍රේණිය | මුළු ශිෂ්‍ය සංඛ්‍යාව | සම්පූර්ණ ගුරු සංඛ්‍යාව | | පුහුණු උපාධි ධාරීහු | | උපාධි ධාරීහු | | උපාධි අපේක්ෂක | | ද්විතීය පුහුණු | | සාමාන්‍ය පුහුණු | | නුපුහුණු සහතික ගුරු | | සහතික නොලත් | | ශිෂ්‍ය ගුරු | | නැටුම් | | සංගීත | | චිත්‍රකම් | | ශා.අ.උ. | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| | | | | පි. | ගැ. | පි. | ගැ. | පි. | ගැ. | පි. | ගැ. | පි. | ගැ. | පි. | ගැ. | පි. | ගැ. | පි. | ගැ. | පි. | ගැ. | පි. | ගැ. | පි. | ගැ. | පි. | ගැ. | පි. | ගැ. |
| 40. | (i) අ/නුවරවැව මහින්ද කණිෂ්ඨ වි. (ii) ඩබ්ලිව්. ඒ. ආර්. වනිගසූරිය මයා. (iii) වැඩ බලන මුල්ගුරු | 1 | 499 | 2 | 11 | – | – | – | – | – | – | – | – | 1 | 2 | – | 2 | 1 | 7 | – | – | – | – | – | – | – | – | – | – |
| 41. | (i) අ/මහමාන්කඩවල වි. (ii) දි. මු. ටී. බී. දිසානායක මයා. (iii) ii ශ්‍රේණියේ මුල්ගුරු | 11 | 140 | 3 | 1 | – | – | – | – | – | – | – | – | 2 | – | – | 1 | 1 | – | – | – | – | – | – | – | – | – | – | – |
| 42. | (i) අ/මහබුලන්කුලම ද්වි. වි. (ii) එම්. ඩී. සේමසිංහ මයා. (iii) වැඩ බලන විදුහල්පති | ද්විතීයික | 88 | 4 | 2 | – | – | 2 | 1 | – | – | 1 | – | – | 1 | – | – | – | – | – | – | 1 | – | – | – | – | – | – | – |
| 43. | (i) අ/මහබුලන්කුලම කණිෂ්ඨ වි. (ii) එන්. සී. මැන්දිස් මයා (iii) වැඩ බලන මුල්ගුරු | 1 | 313 | 4 | 5 | – | – | – | – | – | – | – | – | 2 | 3 | 1 | 1 | | 1 | 1 | – | · | › | – | – | – | – | – | – |
| 44. | (i) අ/මහවිලච්චිය දකුණු ඉවුර යාය 2 (ii) ඩබ්. යූ. ඩිංගිරි බණ්ඩා මයා. (iii) ii ශ්‍රේණියේ මුල්ගුරු | 1 | 378 | 6 | 1 | – | – | – | – | – | – | – | – | 4 | 1 | 1 | – | – | – | 1 | – | · | · | – | – | – | – | – | – |
| 45. | (i) අ/මහවිලච්චිය සිද්ධාර්ථ ද්වි. වි. (ii) එච්. පී.ජයවර්ධන මයා. (iii) වැඩ බලන විදුහල්පති | ද්විතීයික | 153 | 6 | – | – | – | 3 | – | – | – | 1 | – | 1 | – | – | – | – | – | – | – | · | · | 1 | – | – | – | – | – |
| 46. | (i) අ/මහවිලච්චිය සිද්ධාර්ථ කණිෂ්ඨ වි. (ii) එස්. එම්. උක්කුබණ්ඩා මයා. (iii) වැඩ බලන විදුහල්පති | 1 | 449 | 7 | 5 | – | – | – | – | – | – | 1 | – | 5 | 2 | – | 2 | 1 | 1 | – | – | – | – | – | – | – | – | – | – |

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

| අනු අංකය | (i) පාසැලේ නම<br>(ii) මුල්ගුරුවරයාගේ/වරියගේ නම<br>(iii) ඔහුගේ/ඇයගේ ශ්‍රේණිය | පාසැලේ ශ්‍රේණිය | මුළු ශිෂ්‍ය සංඛ්‍යාව | සම්පූර්ණ ගුරු සංඛ්‍යාව | | පුහුණු උපාධි ධාරීහු | | උපාධි ධාරීහු | | උපාධි අපේක්ෂක | | ද්විතීය පුහුණු | | සාමාන්‍ය පුහුණු | | නුපුහුණු ගුරු සහතික ලත් | | සහතික නොලත් ගුරු | | ශිෂ්‍ය ගුරු | | නැටුම් | | සංගීත | | චිත්‍රකම් | | ශා.අ.උ | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| | | | | පි. | ගැ. | පි. | ගැ. | පි. | ගැ. | පි. | ගැ. | පි. | ගැ. | පි. | ගැ. | පි. | ගැ. | පි. | ගැ. | පි. | ගැ. | පි. | ගැ. | පි. | ගැ. | පි. | ගැ. | පි. | ගැ. |
| 47. | (i) අ/මහනෙලුබැව වි.<br>(ii) කේ. ඩී. එච්. ඒ. ජාතිරත්න මයා.<br>(iii) I ශ්‍රේණිය මුල්ගුරු | I | 262 | 5 | 2 | – | – | – | – | – | – | – | – | 5 | 1 | – | – | – | – | – | 1 | – | – | – | – | – | – | – | – |
| 48. | (i) අ/රත්මලේ ද්වි. වි.<br>(ii) එල්. එම්. ගුණවර්ධන මයා.<br>(iii) II ශ්‍රේණියේ විදුහල්පති | ද්විතීයික | 133 | 7 | 2 | – | – | 3 | – | – | – | 1 | 1 | 1 | 1 | – | – | 1 | – | – | – | – | – | – | – | – | – | 1 | – |
| 49. | (i) අ/රත්මලේ කණිෂ්ඨ වි.<br>(ii) ආර්. පී. පී. රාජපක්ෂ මයා.<br>(iii) II ශ්‍රේණියේ මුල්ගුරු | I | 623 | 3 | 13 | – | – | – | – | – | – | – | – | 1 | 4 | – | 5 | 1 | 3 | 1 | 1 | – | – | – | – | – | – | – | – |
| 50. | (i) අ/රනෝරාව වි.<br>(ii) ඊ. එස්. එදිරිසිංහ මයා.<br>(iii) II ශ්‍රේණියේ මුල්ගුරු | II | 90 | 1 | 3 | – | – | – | – | – | – | – | – | – | 1 | 1 | 1 | – | 1 | – | – | – | – | – | – | – | – | – | – |
| 51. | (i) අ/රලපනාව වි.<br>(ii) ඩබ්. ජී. ආර්. එෆ්. පෙරේරා මයා.<br>(iii) II ශ්‍රේණියේ මුල්ගුරු | I | 154 | 3 | 2 | – | – | – | – | – | – | – | – | 2 | 1 | 1 | – | – | 1 | – | – | – | – | – | – | – | – | – | – |
| 52. | (i) අ/රාජාංගන යාය 15 පහල මාරගහවැව<br>(ii) එස්. එම්. එස්. බංඩා මයා.<br>(iii) II ශ්‍රේණියේ මුල්ගුරු | I | 153 | 5 | 1 | – | – | – | – | – | – | – | – | 4 | – | 1 | – | – | 1 | – | – | – | – | – | – | – | – | – | – |
| 53. | (i) අ/රාජාංගන යාය 13/14 වි<br>(ii) කේ. ඒ. ජේ. පියදස මයා.<br>(iii) II ශ්‍රේණියේ මුල්ගුරු | II | 158 | 1 | 2 | – | – | – | – | – | – | – | – | 1 | – | – | – | – | 2 | – | – | – | – | – | – | – | – | – | – |

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

| අනු අංකය | (i) පාසැලේ නම (ii) මුල්ගුරුවරයාගේ/වරියගේ නම (iii) ඔහුගේ/ඇයගේ ශ්‍රේණිය | පාසැලේ ශ්‍රේණිය | මුළු ශිෂ්‍ය සංඛ්‍යාව | සම්පූර්ණ ගුරු සංඛ්‍යාව | | පුහුණු උපාධි ධාරීහු | | උපාධි ධාරීහු | | උපාධි අපේක්ෂක | | ද්විතීය පුහුණු | | සාමාන්‍ය පුහුණු | | නුපුහුණු සහතික ගුරු | | සහතික නොලත් | | ශිෂ්‍ය ගුරු | | නැටුම් | | සංගීත | | චිත්‍ර කර්ම | | ශා.අ.උ. | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| | | | | පි. | ගැ. | පි. | ගැ. | පි. | ගැ. | පි. | ගැ. | පි. | ගැ. | පි. | ගැ. | පි. | ගැ. | පි. | ගැ. | පි. | ගැ. | පි. | ගැ. | පි. | ගැ. | පි. | ගැ. | පි. | ගැ. |
| 54. | (i) අ/රාජාංගන යාය 8 ශ්‍රී රාහුල වි.<br>(ii) ඩී. ආර්. වැලිවිට මයා.<br>(iii) I ශ්‍රේණියේ මුල්ගුරු | I | 336 | 7 | 4 | – | – | – | – | – | – | – | – | 6 | – | – | 2 | 1 | 1 | – | 1 | – | – | – | – | – | – | – | – |
| 55. | (i) අ/තම්බියාව වි.<br>(ii) ජේ. අමරසිංහ මයා.<br>(iii) වැඩ බලන මුල්ගුරු | II | 34 | 1 | 1 | – | – | – | – | – | – | – | – | – | – | 1 | – | – | 1 | – | – | – | – | – | – | – | – | – | – |
| 56. | (i) අ/ලිඳවැව වි.<br>(ii) එච්. එම්. ප්‍රේමරත්න මයා.<br>(iii) II ශ්‍රේණියේ මුල්ගුරු | II | 118 | 3 | 1 | – | – | – | – | – | – | – | – | 1 | – | 2 | – | – | 1 | – | – | – | – | – | – | – | – | – | – |
| 57. | (i) අ/වන්නිතම්මැන්නාව ද්වි වි.<br>(ii) කේ. ඒ. ජයවික්‍රම මයා.<br>(iii) වැඩ බලන විදුහල් පති | ද්වි | 197 | 4 | 3 | – | – | 2 | 1 | – | – | – | – | – | – | 1 | 2 | – | – | 1 | – | – | – | – | – | – | – | – | – |
| 58. | (i) අ/වන්නිතම්මැන්නාව කණිෂ්ඨ වි.<br>(ii) පී. දයාරත්න මයා<br>(iii) I ශ්‍රේණියේ මුල්ගුරු | I | 552 | 10 | 10 | – | – | – | – | – | – | – | – | 8 | 1 | 1 | 2 | 1 | 3 | – | 4 | – | – | – | – | – | – | – | – |
| 59. | (i) අ/වන්නිහැලඹැව වි.<br>(ii) ඩී. ඒ. තිලකරත්න මයා.<br>(iii) II ශ්‍රේණියේ මුල්ගුරු | II | 41 | 1 | 1 | – | – | – | – | – | – | – | – | 1 | – | – | 1 | – | – | – | – | – | – | – | – | – | – | – | – |

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

| අනු අංකය | (i) පාසැලේ නම (ii) මුල්ගුරුවරයාගේ/වරියගේ නම (iii) ඔහුගේ/ඇයගේ ශ්‍රේණිය | පාසැලේ ශ්‍රේණිය | මුළු ශිෂ්‍ය සංඛ්‍යාව | සම්පූර්ණ ගුරු සංඛ්‍යාව | | පුහුණු උපාධි ධාරීහු | | උපාධි ධාරීහු | | උපාධි අපේක්ෂක | | ද්විතීය පුහුණු | | සාමාන්‍ය පුහුණු | | නුපුහුණු සහතික ගුරු සහතික ලත් | | සහතික නොලත් | | ශිෂ්‍ය ගුරු | | නැටුම් | | සංගීත | | චිත්‍ර | | ශා.අ.උ. | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| | | | | පි. | ගැ. | පි. | ගැ. | පි. | ගැ. | පි. | ගැ. | පි. | ගැ. | පි. | ගැ. | පි. | ගැ. | පි. | ගැ. | පි. | ගැ. | පි. | ගැ. | පි. | ගැ. | පි. | ගැ. | පි. | ගැ. |
| 60. | (i) අ/විජේපුර වි. (ii) එස්. ඩී. එස්. කුමාරදස මයා. (iii) I ශ්‍රේණියේ මුල්ගුරු | I | 462 | 5 | 8 | – | – | – | – | – | – | – | – | 3 | 1 | 1 | 2 | – | 3 | 1 | 2 | – | – | – | – | – | – | – | – |
| 61. | (i) අ/විහාරපාලුගම වි. (ii) එච්. ඒ. පි. ජෝසප් මයා. (iii) වැඩ බලන මුල්ගුරු | II | 174 | 1 | 1 | – | – | – | – | – | – | – | – | 1 | – | – | – | – | – | – | 1 | – | – | – | – | – | – | – | – |
| 62. | (i) අ/යහලේගම වි. (ii) සී. ජේ. එම්. ප්‍රනාන්දු මයා. (iii) II ශ්‍රේණියේ මුල්ගුරු | II | 42 | 1 | 1 | – | – | – | – | – | – | – | – | 1 | 1 | – | – | – | – | – | – | – | – | – | – | – | – | – | – |
| 63. | (i) අ/හොරුවිල වි. (ii) පී. පලිස්කාර මයා. (iii) II ශ්‍රේණියේ මුල්ගුරු | I | 231 | 5 | – | – | – | – | – | – | – | – | – | 1 | – | 2 | – | 2 | – | – | – | – | – | – | – | – | – | – | – |
| 64. | (i) අ/අනුරාධපුර බාලිකා ද්විතියික විදුහල (ii) සේන්ට් පිලිප් ද නේරි කන්‍යා සහෝදරිය (iii) III ශ්‍රේණියේ විදුහල් පතිණිය | I | 412 | – | 19 | – | – | – | 3 | – | 1 | – | 5 | – | 4 | – | 2 | – | 1 | – | – | – | 1 | – | 1 | – | – | – | 1 |
| 65. | (i) අ/අනුරාධපුර බාලිකා දෙමළ වි. (ii) සේන්ට් පිලිප් ද නේරි කන්‍යා සහෝදරිය (iii) III ශ්‍රේණියේ විදුහල් පතිනිය | I | 72 | – | 3 | – | – | – | – | – | – | – | – | – | 3 | – | – | – | – | – | – | – | – | – | – | – | – | – | – |



Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

| අනු අංකය | (i) පාසැලේ නම (ii) මුල්ගුරුවරයාගේ/වරියගේ නම (iii) ඔහුගේ/ඇයගේ ශ්‍රේණිය | පාසැලේ ශ්‍රේණිය | මුළු ශිෂ්‍ය සංඛ්‍යාව | | සම්පූර්ණ ගුරු සංඛ්‍යාව | | පුහුණු උපාධි ධාරීහු | | උපාධි ධාරීහු | | උපාධි අපේක්ෂක | | ද්විතීය පුහුණු | | සාමාන්‍ය පුහුණු | | නුපුහුණු සහතික ලත් | | සහතික නොලත් ගුරු | | ශිෂ්‍ය ගුරු | | නැටුම් | | සංගීත | | චිත්‍ර | | ශා.අ.උ. |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| | | | පි. | ගැ. | පි. | ගැ. | පි. | ගැ. | පි. | ගැ. | පි. | ගැ. | පි. | ගැ. | පි. | ගැ. | පි. | ගැ. | පි. | ගැ. | පි. | ගැ. | පි. | ගැ. | පි. | ගැ. | පි. | ගැ. | |
| 66. | (i) අ/විවේකානන්ද දෙමළ ද්විතියික ද්වි. වි. | | 149 | 6 | 7 | 1 | 1 | 2 | 3 | – | – | – | 3 | 2 | – | – | – | – | – | – | – | – | – | – | – | – | – | – | 1 (වෙනත් ගුරුවරු පිරිමි) |
| | (ii) කේ. ජෙගනා:න් මයා. | | | | | | | | | | | | | | | | | | | | | | | | | | | | |
| | (iii) II ශ්‍රේණියේ විදුහල්පති | | | | | | | | | | | | | | | | | | | | | | | | | | | | |
| 67. | (i) අ/විවේකානන්ද දෙමළ කණිෂ්ඨ වි. | I | 448 | 7 | 7 | – | – | – | – | – | – | – | – | 6 | 3 | – | 1 | – | 2 | – | 1 | – | – | 1 | – | – | – | – | – |
| | (ii) එස්. කුලසේකරම් මයා. | | | | | | | | | | | | | | | | | | | | | | | | | | | | |
| | (iii) I ශ්‍රේණියේ මුල්ගුරු | | | | | | | | | | | | | | | | | | | | | | | | | | | | |
| 68. | (i) අ/අනුරාධපුර මුස්ලිම් කණිෂ්ඨ වි. | II | 140 | 4 | 1 | – | – | – | – | – | – | – | – | 3 | 1 | – | – | 1 | – | – | – | – | – | – | – | – | – | – | – |
| | (ii) එස්. සී. අයුනුල් හක් මයා. | | | | | | | | | | | | | | | | | | | | | | | | | | | | |
| | (iii) වැඩ බලන මුල්ගුරු | | | | | | | | | | | | | | | | | | | | | | | | | | | | |
| 69. | (i) අ/නොච්චියාගම මුස්ලිම් වි. | II | 72 | 3 | 1 | – | – | – | – | – | – | – | – | 3 | – | – | – | – | 1 | – | – | – | – | – | – | – | – | – | – |
| | (ii) එම්. බී. එස්. අබ්දුල් කාදර් මයා. | | | | | | | | | | | | | | | | | | | | | | | | | | | | |
| | (iii) වැඩ බලන මුල්ගුරු | | | | | | | | | | | | | | | | | | | | | | | | | | | | |
| 70. | (i) අ/රැලපනාව ජනපද වි. | II | 71 | 2 | 1 | – | – | – | – | – | – | – | – | 1 | – | 1 | – | – | 1 | – | – | – | – | – | – | – | – | – | – |
| | (ii) ඩී. පී. වාහලතන්ත්‍රී මයා. | | | | | | | | | | | | | | | | | | | | | | | | | | | | |
| | (iii) වැඩ බලන මුල්ගුරු | | | | | | | | | | | | | | | | | | | | | | | | | | | | |

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

## රුහුණු-කුමාරි දුම්රිය

"றுஹுனு குமாரி" தொடர் வண்டி

THE "RUHUNU-KUMARI" TRAIN

11. ආර්. ජේ. ජී. ද මෙල් මයා. (දෙවිනුවර)
(திரு. ஆர். ஜே. ஜீ. டி மெல்—தெவிநுவர)
(Mr. R. J. G. de Mel—Devinuwara)

ප්‍රවාහණ ඇමතිගෙන් ඇසූ ප්‍රශ්නය: (අ) කොළඹ සිට මාතරට යන "රුහුණු-කුමාරි" දුම්රියේ තදබදය ඉතාම අධික බවත් ඒ නිසා මගීන්ට නොයෙක් හිරිහැර කරදරවලට මුහුණ පාන්නට සිදු වන බවත් එතුමා දන්නවාද? (ආ) අළුත්ගම හා අම්බලන්ගොඩ පමණක් නොව ගාල්ල දක්වාම මගීන් විශාල ගණනකට සමහර දිනවලදී සිට ගෙන ඉන්නට සිදු වන බව එතුමා දන්නවාද? (ඉ) මගීන්ගේ දුෂ්කරතා මග හරිනු පිණිස මෙම දුම්රියට දැනට තිබෙන ගණනට අමතර ව මගීන් ගෙන යන රිය පෙට්ටි යෙදවීමට එතුමා වහාම ක්‍රියා කරනවාද? (ඊ) එසේ නම්, කවදාද?

போக்குவரத்து அமைச்சரைக் கேட்ட வினா: (அ) கொழும்பிலிருந்து மாத்தறை செல்லும் "றுஹுனு குமாரி" எனும் தொடர்வண்டி மிகவும் சன நெருக்கடி உடையதாகவும், பிரயாணிகளுக்குப் பெருமளவு வசதிக்குறைவையும், பெருந்துன்பத்தையும் விளைவிப்பதாகவும் உள்ள தென்பதை அவர் அறிவாரா? (ஆ) சில நாட்களில் அளுத்கம வரை அல்லது அம்பலாங்கொடை வரை அல்லது காலி வரை கூட நின்ற வண்ணமே பெருந்தொகையான பிரயாணிகள் பிரயாணம் செய்வதை அவர் அறிவாரா? (இ) பிரயாணிகளை இத்துன்பத்தினின்று விடுவிப்பதற்காக இத்தொடர்வண்டியில் மேலதிகப் பிரயாணிகள் பெட்டிகளை இணைப்பதற்கு அவர் உடனடியாக நடவடிக்கைகள் எடுப்பாரா? (ஈ) அங்ஙனமாயின், எப்போது?

asked the Minister of Communications: (*a*) Is he aware that the "Ruhunu-Kumari" train from Colombo to Matara is completely over-crowded and causes considerable inconvenience and hardship to passengers? (*b*) Is he aware that a large number of passengers stand all the ways to Aluthgama, Ambalangoda or even Galle on some days? (*c*) Will he take immediate steps to provide additional passenger coaches on this train to relieve this hardship to travellers? (*d*) If so, when?

**ගරු ඊ. එල්. බී. හුරුල්ලේ (ප්‍රවාහණ ඇමති)**
(கௌரவ ஈ. எல். ஹுருல்ல—போக்குவரத்து அமைச்சர்)
(The Hon. E. L. B. Hurulle—Minister of Communications)

(*a*) No. It is incorrect to state that the train is "completely over-crowded." (*b*) Yes. (*c*) On week days 11 coaches form this train, while on pre-poya days and poya days it is formed with 12 coaches. A further increase of coaches on this train will adversely affect the time-keeping, and consequently result in delays to other trains. (*d*) It has been the practice to run an additional train to Galle whenever there is sufficient traffic. This will be made a permanent feature if the increased traffic load also becomes permanent.

ආර්. ජේ. ජී. ද මෙල් මයා. (දෙවිනුවර)
(திரு. ஆர். ஜே. ஜீ. டி மெல்—தெவிநுவர)
(Mr. R. J. G. de Mel—Devinuwara)

දුම්රිය දෙපාර්තමේන්තුවේ නිලධාරීන් වාර්තා කරන හැටියට "රුහුණු-කුමාරි" දුම්රියේ තදබදයක් නැතැයි ඇමතිතුමා කිවත් සිය ගණන් මගීන් එම දුම්රියේ හිටගෙන යන බව එහි ගමන් කරන කවුරුනුත් දන්නවා. එම නිසා, ඒ පිළිබඳව වහාම ක්‍රියා කරනවා ඇයි අහන්න කැමැතියි.

ඒ වාගේම, "රුහුණු-කුමාරි" දුම්රියෙන් රජයෙ නිලධාරීන් සිය ගණන් වැඩට එනවා. එහෙත් උදේ 9ට කොළඹට ළඟා විය යුතු එම දුම්රිය සාමාන්‍යයෙන් පැය භාගයක් පමණ ප්‍රමාද වෙලායි, කොළඹට එන්නේ. මාත් එම දුම්රියේ ආ එක්

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[ද මැල් මයා.]
දිනෙක එය කොළඹට පැමිණියේ දාවල් 11 ට පමණයි. ඒ ගැනත් නිසි වැඩ පිළිවෙලක් යොදනවා දැයි දැන ගන්න කැමැතියි.

**ගරු හුරුල්ලේ**
*(கௌரவ ஹுருல்ல)*
(The Hon. Hurulle)
දැනට තිබෙන දුම්රිය එන්ජින්වල ඇති දුර්වලතාවන් නිසා වැඩිපුර පෙට්ටි අමුණන්නට අපහසුයි. මේ අවුරුද්ද අවසානයේදී බලාපොරොත්තු වන අළුත් එන්ජින් ලැබුණාට පසුව හොඳ සේවයක් ලබා දෙන්නට හැකි වේ යැයි අප කල්පනා කරනවා.

**ටී. බී. එම්. හේරත් මයා.**
*(திரு. ரி. பி. எம். ஹேரத்)*
(Mr. T. B. M. Herath)
කන්කසන්තුරේ දක්වා දිවෙන සීඝ්‍රගාමී දුම්රියවලට සලසා ඇති සැපපහසුකම් රුහුණට හා මහනුවර, බදුල්ල යන පළාත්වලට යැවෙන දුම්රියවලටත් සපයන්නට කට යුතු කරනවාද? නැත්නම්, ඒ ඇයි?

**ගරු හුරුල්ලේ**
*(கௌரவ ஹுருல்ல)*
(The Hon. Hurulle)
දැනටමත් සලසා තිබෙනවා. ඉදිරියටත් වැඩි වැඩියෙන් සලසනවා.

**කථානායකතුමා**
*(சபாநாயகர் அவர்கள்)*
(Mr. Speaker)
Question No. 12.

**ජයසූරිය මයා.**
*(திரு. ஜயசூரிய)*
(Mr. Jayasuriya)
Two weeks' time is required to answer this Question.

**ප්‍රශ්නය මතු දිනකදී ඉදිරිපත් කිරීමට නියෝග කරන ලදී.**

*வினவை மற்றொரு தினத்துக்குச் சமர்ப்பிக்கக் கட்டளையிடப்பட்டது.*

*Question ordered to stand down.*

## ගංගා නිම්න සංවර්ධන මණ්ඩලය : වෙල්ලස්ස හා මඩුල්ල සංවර්ධනය

*ஆற்றுப்பள்ளத்தாக்கு அபிவிருத்திச்சபை: வெல்லஸ்ஸ, மாதுளை அபிவிருத்தி*

**RIVER VALLEYS DEVELOPMENT BOARD : DEVELOPMENT OF WELLASSA AND MADULLA**

**1. එන්. ඩෙන්සිල් ප්‍රනාන්දු මයා.** (මීගමුව—ආර්. එම්. ධර්මදාස බණ්ඩා මයා.—බිබිලෙ—වෙනුවට)
*(திரு. என். டென்சில் பெர்னாண்டோ—நீர்கொழும்பு—திரு. ஆர். எம். தர்மதாச பண்டா—பிபிலை சார்பாக)*
(Mr. N. Denzil Fernando—Negombo—on behalf of Mr. R. M. Dharmadasa Banda—Bibile)

ඉඩම්, වාරිමාර්ග හා විදුලිබල ඇමතිගෙන් ඇසූ ප්‍රශ්නය: (අ) ගංගා නිම්න මණ්ඩලය මොනරාගල දිස්ත්‍රික්කය තුළ තිබෙන වෙල්ලස්ස හා මඩුල්ල ප්‍රාදේශීය ආදායම් පාලක කොට්ඨාශවලට අයත් ප්‍රදේශ දියුණු කිරීමට උත්සාහයක් ගෙන නොමැති බව එතුමා දන්නවාද? (ආ) මෙම ප්‍රදේශවල සංවර්ධනය මෙතරම් ප්‍රමාදවීමට හේතු එතුමා දක්වන්නේද?

(ඉ) මෙම ප්‍රදේශ තුළ සිටින අසරණ ගොවි පවුල් සඳහා සහනයක් සැලසීමට හෝ අඩුවශයෙන් ජනපදයක් වත් මෙතෙක් ආරම්භ කිරීමට කටයුතු කර නොමැති බව එතුමා දන්නවාද? (ඊ) මෙම නොදියුණු ප්‍රදේශ දියුණු කිරීම පිණිස වෙල්ලස්ස සංවර්ධනය නමින් වෙනම අංශයක් පිහිටුවා අවශ්‍ය යාන වාහන හා යන්ත්‍ර සූත්‍ර නිලධාරීන් යනාදිය සපයා කටයුතු කිරීමට එතුමා සලස් වන්නේද? (උ) නොඑසේ නම්, ඒ මන්ද?

*காணி, நீர்ப்பாசன, மின்விசை அமைச்சரைக் கேட்ட வினா: (அ) மொனருகலை மாவட்டத்திலே வெல்லஸ்ஸ, மாதுளை ஆகிய அரசிறை மாவட்ட அதிபர்களின் பகுதிகளை அபிவிருத்தி செய்வதற்கு எவ்வகையான நடவடிக்கையும் ஆற்றுப் பள்ளத்தாக்கு அபிவிருத்திச் சபை எடுக்கவில்லை என்பதை அவர் அறிவாரா? (ஆ) இப்பகுதிகளை அபிவிருத்தி செய்வதில் நீண்டகால தாமதம் ஏன் ஏற்படுகின்றது என்பதை அவர் கூறுவாரா? (இ) இப்பகுதிகளிலே வாழ்கின்ற கதியற்ற சிங்களப் பாமரக் குடும்பங்களுக்கு நிவாரணம் தரக்கூடிய நட—*

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

வடிக்கை எதுவும் எடுக்கப்படவில்லை என் பதையும், குறைந்த பட்சம் ஒரு குடியேற்ற திட்டந்தானும் ஆரம்பிக்கப்படவில்லை என் பதையும் அவர் அறிவாரா? (ஈ) விருத்தி யற்ற இப்பகுதியை அபிவிருத்தி செய்வதற் கென "வெல்லச அபிவிருத்திப் பகுதி" என்று ஒன்றைத் தொடக்கவும் அதற்கெனத் தேவைப்படும் வாகனங்கள், பொறித் தொகு திகள் ஆகியவற்றையும், உத்தியோகத்தர்களை யும் கொடுத்துதவவும் அவர் நடவடிக்கை எடுப்பாரா? (உ) அன்றேல், ஏன்?

asked the Minister of Land, Irrigation and Power: (*a*) Is he aware that the River Valleys Development Board has not made an effort to develop the areas that come under the Wellassa and Madulla Revenue Divisions in the Moneragala District? (*b*) Will he state why there has been such a long delay in the development of these areas? (*c*) Is he aware that so far steps have not been taken to grant relief to the helpless Sinhalese peasant families who live within these areas and at least to start a colonisation scheme for them? (*d*) Will he take steps to set up a separate unit called the Wellassa Development Unit for the purpose of developing these undeveloped areas and to provide that unit with necessary vehicles, machinery and officers? (*e*) If not, why?

**ගරු සී. පී. ද සිල්වා (ඉඩම්, වාරිමාර්ග හා විදුලිබල ඇමති හා සභානායක)**

*(கௌரவ சி. பீ. டி சில்வா—காணி, நீர்ப் பாசன, மின்விசை அமைச்சரும் சபை முதல் வரும்)*

(The Hon. C. P. de Silva—Minister of Land, Irrigation and Power and Leader of the House)

(අ) මෙම ප්‍රදේශයේ දියුණුව සඳහා ගංගා නිම්න භූමි සංවර්ධන මණ්ඩලය විසින් සෑහෙන වැඩ ප්‍රමාණයක් කර ඇත. (ආ) පැන නොනගී. (ඉ) පැන නොනගී. (ඊ) නැත. (උ) ගංගා නිම්න භූමි සංවර්ධන මණ්ඩලයේ ගල්ඔය ශාඛාව 1968 සැප්තැම්බර් වන විට වසා දමා එහි වැඩ කටයුතු රජයේ දෙපාර්තමේන්තුවලට භාර දෙනු ලැබේ. ඉන්පසුව තවදුරටත් අවශ්‍ය සංවර්ධන කටයුතු ඒ ඒ රජයේ දෙපාර්තමේන්තු මගින් කළ හැකිය.

**බී. වයි. තුඩාවේ මයා. (මාතර)**

*(திரு. பி. வை. துடாவ—மாத்தறை)*

(Mr. B. Y. Tudawe—Matara)

උඩවලවේ ව්‍යාපාරයේ වම් ඉවුරේ පදිංචිව සිටින ගොවීන්ට, තමුන්නාන්සේ පොරොන්දු වූ අන්දමට පඩිනඩි නොලැබෙන බව දන්නවාද?

**ගරු සී. පී. ද සිල්වා**

*(கௌரவ சி. பீ. டி சில்வா)*

(The Hon. C. P. de Silva)

මුල් ප්‍රශ්නය අසා තිබෙන්නේ, ගල්ඔය සම්බන්ධයෙන්. අතුරු ප්‍රශ්නය අහන්නේ උඩවලවේ ව්‍යාපාරය සම්බන්ධයෙන්. ඒ වුණත්, පොරොන්දු සියල්ලම ඉෂ්ට කරන ලෙස මා නියෝග කර තිබෙන බව කියන්න කැමැතියි. ඒවා ඉෂ්ට වෙනවා දැයි පරීක්ෂා කරන්නම්. [බාධා කිරීමක්]

**කථානායකතුමා**

*(சபாநாயகர் அவர்கள்)*

(Mr. Speaker)

I do not know why supplementary questions that do not arise on Answers given are answered.

**තුඩාවේ මයා.**

*(திரு. துடாவ)*

(Mr. Tudawe)

මගේ අතුරු ප්‍රශ්නයෙන් පැන නැගුණු තවත් අතුරු ප්‍රශ්නයක් අහන්න කැමැතියි.

**ගරු ඩඩ්ලි සේනානායක**

*(கௌரவ டட்ளி சேனநாயக்க)*

(The Hon. Dudley Senanayake)

තමුන්නාන්සේ කලින් ඇසූ ප්‍රශ්නය නියම අතුරු ප්‍රශ්නයක් නොවෙයි. ඒක ගල්ඔය; මේක වලවේ.

**කථානායකතුමා**

*(சபாநாயகர் அவர்கள்)*

(Mr. Speaker)

ඒ අතුරු ප්‍රශ්නය මේකට අදාල නැහැ.

**ටී. බී. එම්. හේරත් මයා.**

*(திரு. ரி. பி. எம். ஹேரத்)*

(Mr. T. B. M. Herath)

වෙල්ලස්ස සහ මඩුල්ල ප්‍රාදේශීය කොට්ඨාශවල මහජනයා ගංගා නිම්න සංවර්ධන මණ්ඩලයේ ක්‍රියාකාරිත්වය නිසා අවුරුදු



Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[පී. බී. එම්. හේරත් මයා.]
ගණනාවක් පස්සට තල්ලු වී සිටිනවා. ඒ නිසා දිසාපතිවරුන්ගේ හෝ ආණ්ඩුවේ ක්‍රියා මාර්ගයන් යොදා ඔවුන්ගේ නැති වූ අයිතිවාසිකම් ඉක්මණින් ලබාදීමට ඇමති තුමා නැත්නම් ආණ්ඩුව ඉතා ඉක්මණින් ක්‍රියාත්මක වෙනවාද කියා දැන ගන්නට කැමතියි.

**ගරු සී. පී. ද සිල්වා**
*(கௌரவ சீ. பீ. டி சில்வா)*
(The Hon. C. P. de Silva)
එසේ කරනවා.

**3. ලෙස්ලි ගුණවර්ධන මයා.** (පී. බී. විජයසුන්දර මයා.—කිරිඇල්ල වෙනුවට)

தபாற் கந்தோர் பரிசோதகர் ; அரசகரும மொழித்தேர்ச்சி

**POST OFFICE INSPECTORS : PROFICIENCY IN OFFICIAL LANGUAGE**

3. **ලෙස්ලි ගුණවර්ධන මයා. පී. බී. විජය සුන්දර මයා.—කිරිඇල්ල** (වෙනුවට)
*(திரு. லெஸ்லி குணவர்தன—திரு. பீ. பி. விஜயசுந்தர—கிரியல்ல—சார்பாக)*
(Mr. Leslie Goonewardene)—on behalf of Mr. P. B. Wijesundara—Kiriella)

රජයේ වැඩ, තැපැල් සහ විදුලි සංදේශ ඇමතිගෙන් ඇසූ ප්‍රශ්නය: (අ) තැපැල් කාර්යාල පරීක්ෂක වරුන් බඳවා ගැනීමේදී රාජ්‍ය භාෂාව දැනීම අවශ්‍ය කාරණයක් හැටියට නොසලකන බව එතුමා දන්නවාද? (ආ) එය බලවත් විෂමතාවයක් බවත් එතුමා දන්නවාද? (ඉ) තැපැල් කාර්යාල පරීක්ෂකවරුන් තෝරා ගැනීම සඳහා 27.3.65 දින පවත්වන ලද විභාග යේ ප්‍රතිඵල තවමත් පිට නොකර 16.2.67 දින පවත්වන ලද විභාගයේ ප්‍රතිඵල අනුව පත්කිරීම් කිහිපයක් දී ඇති බව එතුමා දන්නවාද? (ඊ) මෙයින් රාජ්‍ය භාෂාව නොදත් අයට විශාල වාසියක්වූ බව එතුමා දන්නවාද? (උ) මේ ඇතිවූ විෂම තාවය නැති කිරීමට 27.3.65 විභාගයෙන් සමත් වූවන්ටද පත්වීම් දීමට එතුමා ක්‍රියා කරනවාද?

*அரசாங்கக் கட்டுவேலை, தபால், தந்திப் போக்குவரத்து அமைச்சரைக் கேட்ட வினு: (அ) தபாற்கந்தோர் பரிசோதகர்களைச் சேவையில் சேர்க்கும்போது அரசகரும மொழித் தேர்ச்சி தேவையான தகைமை யெனக் கருதப்படுவதில்லையென்பதை அவர் அறிவாரா? (ஆ) அது மிகவும் முறைகேடான செயல் என்பதையும் அவர் அறிவாரா? (இ) தபாற்கந்தோர் பரிசோதகர்களைத் தெரிவு செய்வதற்காக 27.3.65 இல் நடத்திய தேர்வின் பெறுபேறுகளை இன்னும் வெளியிடாமல் 16.12.67 இல் நிகழ்த்திய தேர்வின்படி பல நியமனங்கள் கொடுக்கப்பட்டிருப்பதை அவர் அறிவாரா? (ஈ) இதனுல், அரசகருமமொழித் தேர்ச்சியற்றவருக்குப் பெரும் நன்மையேற் பட்டதென்பதை அவர் அறிவாரா? (உ) இங்கு ஏற்பட்ட முறைகேட்டை நீக்குவதற்கு 27.3.65 இல் நடைபெற்ற தேர்வில் சித்தி யெய்தியவர்களுக்கும் நியமணங் கொடுப்ப தற்கு அவர் நடவடிக்கை எடுப்பாரா?*

asked the Minister of Public Works, Posts and Telecommunications: (*a*) Is he aware that proficiency in the Official Language is not considered a necessary qualification for the recruitment of Post Office Inspectors? (*b*) Is he aware that this is a grave anomaly? (*c*) Is he aware that a few appointments have been made on the results of the examination held on 16.2.67 while the results of the examination for the recruitment of Post Office Inspectors held on 27.3.65 have still not been declared? (*d*) Is he that as a result of this, those who were not proficient in the Official Language benefited in a large way? (*e*) In order to eliminate this anomaly, will he take steps to give appointments to those who passed the examination held on 27.3.65 as well?

**විජයපාල මෙන්ඩිස් මයා.** (රජයේ වැඩ, තැපැල් හා විදුලි සන්දේශ ඇමතිගේ පාර්ලිමේන්තු ලේකම්)
*(திரு. விஜயபால மெண்டிஸ்—அரசாங்கக் கட்டுவேலை, தபால் தந்திப் போக்குவரத்து அமைச்சரின் பாராளுமன்றக் காரியதரிசி)*
(Mr. Wijayapala Mendis—Parliamentary Secretary to the Minister of Public Works, Posts and Telecommunications)

(අ) නැත. විභාග අපේක්ෂකයින් සිංහල සහ දෙමළ පහසුවෙන් කථා කළ හැකිවීම සහ එම භාෂාවලින් සාක්ෂි දෙන පුද්ගල යින් භාෂා පරිවර්තකයෙකුගේ සහාය

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

නොමැතිව තෝරුම් ගත හැකිවීම කොන්දේසියකි. (ආ) පැන නොනඟියි. (ඉ) ඔව්. තැපැල් කාර්යාල විමර්ෂණ පරීක්ෂකයින් තෝරා ගැනීම සඳහා 65. 3. 27 වැනි දින පවත්වන ලද විභාගය අවලංගු කරන ලදී. අළුත් විභාගයක් 67. 2. 16 වැනි දින පවත්වා එම විභාගයේ ප්‍රතිඵල අනුව ඇබෑර්තු පුරවන ලදී. (ඒ) නැත. තෝරා ගනු ලැබූ සියලුම අපේක්ෂකයෝ (අ) ප්‍රශ්නයට මගේ පිළිතුරෙහි සඳහන් කොන්දේසි සම්පූර්ණ කළහ. (උ) පැන නොනඟියි.

**ලෙස්ලි ගුණවර්ධන මයා.**
*(திரு. லெஸ்லி குணவர்தன)*
(Mr. Leslie Goonewardene)
1965 මාර්තු මාසයේ පැවැත්වූ විභාගයේ ප්‍රතිඵල අවලංගු කරන්නට යෙදුණේ කුමන හේතුවක් නිසා ද කියා දැන ගන්නට කැමතියි.

**විජයපාල මෙන්ඩිස් මයා.**
*(திரு. விஜேபால மெண்டிஸ்)*
(Mr. Wijayapala Mendis)
රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ නියෝගයක් අනුව.

**ලෙස්ලි ගුණවර්ධන මයා.**
*(திரு. லெஸ்லி குணவர்தன)*
(Mr. Leslie Goonewardene)
ඒක තේරෙනවා. කුමන හේතුවක් නිසාද කියා දන්නවාද කියලයි අහන්නේ.

**ගරු ඩඩ්ලි සේනානායක**
*(கௌரவ டட்லி சேனநாயக்க)*
(The Hon. Dudley Senanayake)
එය රාජ්‍ය සේවා කොමිෂන් සභාවෙනුයි අහන්න ඕනෑ.

**ලෙස්ලි ගුණවර්ධන මයා.**
*(திரு. லெஸ்லி குணவர்தன)*
(Mr. Leslie Goonewardene)
රාජ්‍ය සේවා කොමිෂන් සභාවෙන් අහන්න අපට බලයක් නැහැ. ඒ නිසා රාජ්‍ය සේවා කොමිෂන් සභාව මේ විභාග ප්‍රතිඵල අවලංගු කළේ කුමන හේතුවක් නිසාද කියා ගරු ඇමතිතුමාගේ මාර්ගයෙන් දැනගන්නට කැමතියි.

**විජයපාල මෙන්ඩිස් මයා.**
*(திரு. விஜேபால மெண்டிஸ்)*
(Mr. Wijayapala Mendis)
හේතුව දැනගෙන කියන්නම්.

**ටී. බී. එම්. හේරත් මයා.**
*(திரு. ரி. பி. எம். ஹேரத்)*
(Mr. T. B. M. Herath)
මේ විභාගයේ ප්‍රතිඵල අනුව සුදුසු අය නොතෝරා නැවත නැවතත් ඉල්ලුම් පත්‍ර කැඳවන්නට රජයට සිදු වන්නේ තමන්ගේ පක්ෂයේ උදවිය තෝරා ගැනීමට ඉඩ නොලැබුණු නිසා ද?

**විජයපාල මෙන්ඩිස් මයා.**
*(திரு. விஜேபால மெண்டிஸ்)*
(Mr. Wijayapala Mendis)
එය මේ ආණ්ඩුවේ නැහැ. කලින් තිබුණු ආණ්ඩුවේ වෙන්න පුළුවන්.

## පීඩා විඳි පක්ෂවල ප්‍රකාශවල සහතික පිටපත් චූදිතයාට දීම

துன்புறுத்தலுக்கான காட்சிகளின் முறைப்பாடுகளின் உறுதிப்படுத்திய பிரதிகளைக் குற்றஞ்சாட்டப்பட்டோர்க்கு வழங்கல்

## ISSUE OF CERTIFIED COPIES OF STATEMENTS OF AGGRIEVED PARTIES TO ACCUSED

10. **ලෙස්ලි ගුණවර්ධන මයා.** (චම්ලි ගුණවර්ධන මයා.—කළුතර—වෙනුවට)
*(திரு. லெஸ்லி குணவர்தன—திரு. சம்லி குணவர்தன—களுத்துறை—சார்பாக)*
(Mr. Leslie Goonewardene—on behalf of Mr. Cholomondeley Goonewardene—Kalutara)
අධිකරණ ඇමතිගේ පාර්ලිමේන්තු ලේකම්ගෙන් ඇසූ ප්‍රශ්නය: (අ) මහෙස්ත්‍රාත් උසාවියක සංඥේය නඩු සඳහා නඩු පැවරීමක් කළ විට, මුල් ඇනුම්දීමේ සහතික පිටපතක් 1961 කේ අංක 42 දරණ අපරාධ නඩු සංවිධාන සංග්‍රහ (සංශෝධන) පනත ප්‍රකාර හා පීඩා විඳි පක්ෂවල ප්‍රකාශවල සහතික පිටපතක් ද නියම බලධරයාගෙන් ලබා ගැනීමේ අයිතිය චූදිතයා හෝ ඔහුගේ නීතිඥයා හෝ සතු බව එතුමා දන්නවාද? (ආ) අසංඥේය වරදක් පිළිබඳ ව චෝදනා කරනු ලැබූ විට, මෙම අයිතිය චූදිතයා සතු නො වන බව එතුමා දන්නවාද? (ඉ) මේ හේතුවෙන් තදබල අසාධාරණ සිදු විය හැකි බව එතුමා

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[ලෙස්ලි ගුණවර්ධන මයා.]

දන්නවාද ? (ඊ) සියලුම අපරාධ නඩුවලදී මුල් දැනුම්දීමේ සහතික පිටපතක් හා පීඩා විඳි පක්ෂවල ප්‍රකාශවල සහතික පිටපත් ද ලබා ගැනීමේ අයිතිය චූදිතයා හෝ ඔහුගේ නීතිඥයා සතු වන පරිදි නීතිය සංශෝධනය කරනු පිණිස එතුමා වහාම ක්‍රියා කරනවාද ?

*நீதி அமைச்சரின் பாராளுமன்றக் காரியதரிசியைக் கேட்ட வினா: (அ) விசாரணைக் குட்படத்தக்க வழக்குகளின் விடயத்தில், நீதவான் கோடொன்றில் வழக்கு நடவடிக்கைகளுக்கு ஏற்பாடு செய்யப்படும்போது துன்புறுத்தலுக்காளான கட்சிகளின் முதல் தகவதும் முறைப்பாட்டினதும் உறுதிப்படுத்திய பிரதியொன்றை அதற்கெனவுள்ள சரியான அதிகாரியிடமிருந்து எதிரி அல்லது அவரது வழக்கறிஞர் பெற்றுக் கொள்வதற்கு 1961 ஆம் ஆண்டின் 42 ஆம் இலக்கக் குற்றவியல் வழக்கு நடைமுறைச் சட்டக்கோவை (திருத்தம்) உரிமையளிக்கிறது என்பதை அவர் அறிவாரா? (ஆ) இந்த உரிமை விசாரணைக்குட்படத் தகாத குற்றங்களுக்காகக் குற்றஞ் சாட்டப்படும் எதிரிகளுக்கு இல்லை என்பதை அவர் அறிவாரா? (இ) இது பெரும் அநீதியை விளைவிக்கும் என்பதை அவர் அறிவாரா? (ஈ) எல்லாக் குற்றவியல் வழக்குகளின் விடயத்திலும் துன்புறுத்தலுக்குள்ளான கட்சிகளின் முதல் தகவலதும், முறைப்பாட்டினதும் உறுதிப்படுத்திய பிரதியை எதிரிகள் அல்லது அவர்களின் வழக்கறிஞர்கள் பெற்றுக் கொள்ளத்தக்க உரிமையை அளிக்கும் வகையில் சட்டத்தைத் திருத்துவதற்கு அவர் உடனடியாக நடவடிக்கைகளை எடுப்பாரா?*

asked the Parliamentary Secretary to the Minister of Justice: (*a*) Is he aware that under the Criminal Procedure Code (Amendment) Act, No. 42 of 1961, the accused or his Proctor is entitled to obtain from the proper authority, a certified copy of the first information and the statements of aggrieved parties when proceedings are instituted in a magistrate's court in cognizable cases? (*b*) Is he aware that this right does not extend to accused when they are charged with non-cognizable offences? (*c*) Is he aware that this could cause grave injustice? (*d*) Will he take immediate steps to amend the law so as to make accused or their proctors in all criminal cases entitled to certified copies of the first information and the statements of the aggrieved parties.

**එම්. එච්. එම්. නයිනා මරික්කාර් මයා. (අධිකරණ ඇමතිගේ පාර්ලිමේන්තු ලේකම්)**

*(ஜனாப் எம். எச். எம். நயினா மரிக்கார்—நீதி அமைச்சரின் பாராளுமன்றக் காரியதரிசி)*

(Mr. M. H. M. Naina Marikkar—Parliamentary Secretary to the Minister of Justice)

(*a*) Yes. (*b*) Yes. (*c*) No. (*d*) As this proposal entails the amendment of a longstanding law in an important respect, a decision will be taken after carefully considering all aspects of the matter.

## පෞද්ගලිකව දැන්වීමෙන්

*தனி அறிவித்தல் மூலம்*

## *BY PRIVATE NOTICE*

**ප්‍රජාතන්ත්‍රවාදී වියට්නාමයට බෝම්බ හෙළීම සම්බන්ධව අමෙරිකන් ජනාධිපතිතුමාගේ ප්‍රකාශය ගැන ලංකාණ්ඩුව දරන මතය**

*வியட்நாம் ஜனநாயகக் குடியரசின் மீது குண்டு வீசுவது முதலியவை சம்பந்தமாக ஐக்கிய அமெரிக்க ஜனாதிபதியின் அறிக்கை பற்றி இலங்கை அரசாங்கத்தின் நிலை*

CEYLON GOVERNMENT'S POSITION RE U. S. PRESIDENT'S STATEMENT ON THE BOMBING OF THE DEMOCRATIC REPUBLIC OF VIETNAM, ETC.

**මෛත්‍රීපාල සේනානායක මයා.** (මැදවච්චිය)

*(திரு. மைத்திரிபால சேனநாயக்க—மதவாச்சி)*

(Mr. Maithripala Senanayeke—Medawachchiya)

ගරු කථානායකතුමනි, විරුද්ධ පාර්ශ්වයේ නායකතුමා ගරු අගමැතිතුමාට කල් දුන් පරිදි පුද්ගලිකව දැනුම්දීමේ ප්‍රශ්නයක් වශයෙන් පහත සඳහන් ප්‍රශ්නය මා ඉදිරිපත් කරනවා :

1. ප්‍රජාතන්ත්‍රවාදී වියට්නාම් සමූහාණ්ඩුවේ ඇතැම් ප්‍රදේශවල බෝම්බ හෙළීම නැවැත්වීමට තමා විසින් නියෝග කර ඇතැයි අමෙරිකා එක්සත් ජනපදයේ

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

ජනාධිපතිතුමා විසින් මෑතදී කරන ලද ප්‍රකාශය සම්බන්ධයෙන් ලංකාණ්ඩුව දරන මතය කුමක්ද යන්නත්, විශේෂයෙන්ම, ප්‍රජාතන්ත්‍රවාදී වියට්නාම් සමූහාණ්ඩුවට අයත් මුළු ප්‍රදේශයටම බෝම්බ හෙලීම සහ වෙනත් ආක්‍රමණකාරී ක්‍රියා නැවැත්වීම සහ දකුණු වියට්නාමයේ සිටින අමෙරිකානු සහ මිතුරු හමුදා ඉවත් කර ගැනීම ලාංකික ජනතාවගේ අපේක්ෂාව බව අමෙරිකානු ජනාධිපතිතුමාට සහ අමෙරිකානු ආණ්ඩුවට දන්වා සිටින්නේද යන්නත් ගැන ගරු අගමැතිතුමා ප්‍රකාශයක් කරනවාද? (ii) නොඑසේ නම්, ඒ මන්ද?

ගරු ඩඩ්ලි සේනානායක
(கௌரவ டட்லி சேனநாயக்க)
(The Hon. Dudley Senanayake)

මම 4.30 ට ප්‍රකාශයක් කරනවා.

## නොපැමිණීමේ අවසරය: චම්ලි ගුනවර්ධන මයා.

வராதிருக்க அனுமதி :
திரு. சம்லி குணவர்தன

## LEAVE OF ABSENCE: MR. CHOLOMONDELEY GOONEWARDENE

ලෙස්ලි ගුණවර්ධන මයා.
(திரு. லெஸ்லி குணவர்தன)
(Mr. Leslie Goonewardene)

පහත සඳහන් යෝජනාව මා ඉදිරිපත් කරනවා:

"1946 ලංකා (ආණ්ඩුක්‍රම) රාජ සභා ආඥාවේ 24 (1) (ඊ) ඡේදය යටතේ කළුතර මන්ත්‍රීවර චම්ලි ගුණවර්ධන මහතාට 1968 අප්‍රේල් මස 7 වැනි දින සිට මාස 3 ක් තුළ මන්ත්‍රී මණ්ඩලයේ රැස්වීම් වලට නොපැමිණීමට අවසර දිය යුතුය."

වෛද්‍යාචාර්ය එස්. ඒ. වික්‍රමසිංහ (අකුරැස්ස)
(டாக்டர் எஸ். ஏ. விக்கிரமசிங்ஹ—அக்குறஸ்ஸ)
(Dr. S. A. Wickremasinghe—Akuressa)
විසින් ස්ථිර කරන ලදී.

அனுவதித்தார்.

*Seconded.*

ප්‍රශ්නය විමසන ලදින්, සභාසම්මත විය.

வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.

*Question put, and agreed to.*

## ශෝක ප්‍රකාශය: රාජ නීතිඥ සිරිල් ඊ. එස්. පෙරේරා

அனுதாபத் தீர்மானம் : திரு. சிறில் ஈ. எஸ். பெரேரா கியூ. ஸி.

## VOTE OF CONDOLENCE: MR. CYRIL E. S. PERERA, Q.C.

අ. භා. 2.20

ගරු සී. පී. ද සිල්වා
(கௌரவ சீ. பீ. டி சில்வா)
(The Hon. C. P. de Silva)

Mr. Speaker, with your permission I wish to refer to the passing away of Mr. Cyril E. S. Perera, Q.C., who was a Member of this House representing Colombo North from 1952 to 1956.

Mr. Perera had his early education at St. Anthony's College, Kandy, and won a series of scholarships. He went to teach in his old school, and one of his many illustrious pupils was the present Governor-General. He founded the first Teachers' Association of Ceylon in Kandy and was its Secretary till he left for Malaya in 1920. He spent four years in Malaya from where he proceeded to England and obtained a First Class in the Bar Final and Bachelor of Laws at the London University. He was called to the Bar from Gray's Inn. He first practised in Kandy and then came to Colombo. After a varied practice in the original and appeal courts, he was made a Queen's Counsel in 1953 in recognition of his eminence at the Bar.

In 1952 he successfully contested the Colombo North seat in Parliament. He gave up politics after four years, and returned to business and law. Mr. Perera was associated in founding the Ceylon Insurance Company, Limited, and the Finance Company of Ceylon, Limited. At the time of his death he was either chairman or on the directorate of several mercantile and finance organizations. He had varied interests, other than his profession, ranging from the Co-operative Movement to drama. He was a keen member of the Roman

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

Catholic Church, and was recently honoured by His Holiness the Pope with a Papal Knighthood.

The large attendance at his funeral from all sections of society was a testimony to the esteem in which he was held by both rich and poor.

I wish, on behalf of the Members of this House, to record our regret on his passing away and request you, Mr. Speaker, to direct the Clerk of the House to send a copy of these proceedings to the bereaved members of his family.

අ. භා. 2.22

**මෛත්‍රීපාල සේනානායක මයා.**

*(திரு. மைத்திரிபால சேனநாயக்க)*

(Mr. Maithripala Senanayake)

ගරු කථානායකතුමනි, විරුද්ධ පාර්ශ්වය වෙනුවෙන්, ගරු සභානායකතුමා ඉදිරිපත් කළ යෝජනාව ස්ථිර කිරීමටයි මා නැගී සිටියේ. 1952 සිට අවුරුදු 4ක පමණ කාලයක් තිස්සේ මේ ගරු සභාවේ මන්ත්‍රීවරයෙක් වශයෙන් සිට ළඟදී අභාවප්‍රාප්ත සිරිල් ඊ. එස්. පෙරේරා රාජ්‍යනීතිඥ තුමා ගැන විශෙෂයෙන් කිය යුතුව තිබෙන්නේ එතුමා කොපමණ හොඳ ගතිගුණ ඇති තිවුණු කෙනෙක්ද කියන එක එතුමා අඳුණන කෙනෙකුට මනාව අවබෝධ වන බවයි. 1952 සිට 1956 දක්වා එතුමා මේ ගරු සභාවේ මන්ත්‍රීවරයකු වශයෙන් කට යුතු කළ කාලයේදී ඉතාමත්ම උනන්දු වෙන් තමාගේ කොට්ඨාශය වන උතුරු කොළඹ කොට්ඨාශය සම්බන්ධවත් පොදුවේ මහජනතාවගේ කටයුතු සම්බන්ධවත් ක්‍රියා කළ කෙනෙක් බව මට මතකයි. එමෙන්ම එය අප කවුරුත් දන්නවා. බාල වියසෙන් ගුරු වෘත්තියට ඇතුළු වුණු ඒ මහතා ප්‍රථම ගුරු සමිතිය පිහිටුවීමට ක්‍රියා කළා. ඊට පසු 1920 දී මලයාවට ගොස් නැවත එංගලන්තයට ගිය එතුමා දක්ෂ ලෙස විභාග සමත් වෙමින් නීතිඥ වෘත්තියට ඇතුළුව ලංකාවට පැමිණ 1935 සිට ඒ වෘත්තියෙහි යෙදී සිටි බව කවුරුනුත් දන්නවා. එතුමා නීතිඥ වෘත්තියෙහි යෙදී සිටියදී ක්‍රියා කළ දක්ෂ ආකාරය අනුව 1953 දී එතුමාට රාජ්‍යනීතිඥ තත්ත්වයට පත් වන්නට පුළුවන් වුණා.

එතුමාට වෙළහෙළදාම් කටයුතු සම්බන්ධයෙන්ද විශේෂ දක්ෂතාවක් තිබුණා. ගරු සභානායකතුමා කීවාක් මෙන් එතුමා ලංකා රක්ෂණ කොම්පැනියත්, ලංකා ෆිනෑන්ස් කොම්පැනියත් ගොඩනංවා ඒ ආයතන දෙකේම ඉතාමත්ම උනන්දුවෙන් ක්‍රියා කළා.

තවත් වැදගත් කාරණයක් කියන්නට තිබෙනවා. පසුගිය ආණ්ඩුව පාඨශාලා රජයට ගත් අවස්ථාවේදී මතු වී තිබුණු ප්‍රශ්න නිරාකරණය කර ගැනීමට හොඳ කතෝලික බැතිමතකු හැටියට ගරු අගමැතිනියත් කැබිනට් මණ්ඩලයත් සමඟ සාකච්ඡා කළ කෙනකු වශයෙනුත් සිරිල් ඊ. එස්. පෙරේරා මහතා ගැන සඳහන් කරන්නට පුළුවනි. එතුමා සමග ඒ ප්‍රශ්න සම්බන්ධයෙන් කටයුතු කළ පුද්ගලයකු වශයෙන් එතුමා එදා ක්‍රියා කළ දක්ෂ ආකාරය ගැන සඳහන් නොකළහොත් එය ලොකු අඩුපාඩුවක් වන නිසයි, මේ අවස්ථාවේදී කෘතඥ පූර්වකව එදා එතුමා විසින් දෙන ලද ආධාරය ගැන මා සඳහන් කරන්නේ. එම නිසා මෙම ගරු සභාවේ හිටපු මන්ත්‍රීවරයකු වන සිරිල් ඊ. එස්. පෙරේරා මහතා ගැන ගරු සභානායකතුමා විසින් ඉදිරිපත් කරන ලද ශෝක ප්‍රකාශ යෝජනාව ස්ථිර කරන ගමන්ම මෙම ගරු සභාවේ ශෝකය ඒ මහතාගේ ඥාතීන් වෙත දැනුම් දෙන ලෙස ගරු කථානායක තුමාගෙන් ඉල්ලා සිටිනවා.

**කථානායකතුමා**

*(சபாநாயகர் அவர்கள்)*

(Mr. Speaker)

I wish to associate myself with the sentiments expressed by both sides of the House on the death of Mr. Cyril E. S. Perera, Q.C., ex-Member of Parliament.

I shall request the Clerk of the House to make a minute of the proceedings of the Meeting today and send a copy thereof to the members of the bereaved family.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

## කෙටුම්පත් පණත් පිළිගැන්වීම

### சமர்ப்பிக்கப்பட்ட மசோதாக்கள்

### BILLS PRESENTED

### ලංකා ඉංජිනේරු ආයතනය

### இலங்கை எந்திரவியலார் நிறுவனம்

### INSTITUTION OF ENGINEERS, CEYLON

"to incorporate the Institution of Engineers, Ceylon".

පිළිගන්වන ලද්දේ රජයේ වැඩ, තැපැල් හා විදුලි සන්දේශ ඇමතිගේ පාර්ලිමේන්තු ලේකම් විජයපාල මෙන්ඩිස් මයා. විසිනි. 1968 අප්‍රියෙල් 8 වන සඳුද

දෙවන වර කියවිය යුතුයයිද, එය මුද්‍රණය කළ යුතුයයිද නියෝග කරන ලදී.

அரசாங்கக் கட்டுவேலை, தபால் தந்திப் போக்குவரத்து அமைச்சரின் பாராளுமன்றக் காரியதரிசி திரு. விஜயபால மெண்டிஸ் அவர்களால் சமர்ப்பிக்கப்பட்டது. 1968 எப்ரில் 8 ம் தேதி திங்கட்கிழமை இரண்டாம் முறையாக மதிப்பிடப்பட வேண்டுமெனவும் அச்சிடப்பட வேண்டுமெனவும் ஆணையிடப்பட்டது.

*Presented by Mr. Wijayapala Mendis, Parliamentary Secretary to the Minister of Public Works, Posts and Telecommunications; to be read a Second time upon Monday, 8th April 1968, and to be printed.*

## රජයේ විදුලි දෙපාර්තමේන්තුව සඳහා සංචිත අරමුදලක්

### அரசாங்க மின்சார முயற்சிகள் திணைக்களத்துக்கான நிதி ஒதுக்கம்

### FINANCIAL RESERVE FOR THE DEPARTMENT OF GOVERNMENT ELECTRICAL UNDERTAKINGS

අ. භා. 2.28

**ගරු සී. පී. ද සිල්වා**
*(கௌரவ சி. பீ. டி சில்வா)*
(The Hon. C. P. de Silva)

ගරු කථානායකතුමනි, අද දින න්‍යාය පත්‍රයේ අංක 1 වශයෙන් දැක්වෙන යෝජනාව මා දැන් ඉදිරිපත් කරනවා. එනම් :

"වර්‍ෂ 1966 ඔක්තෝබර් මස 1 වැනි දින ආරම්භ වූ, 1967 සැප්තැම්බර් මස 30 වැනි දින අවසන් වන, මුදල් වර්‍ෂය අවසානයේදී රජයේ විදුලි දෙපාර්තමේන්තුවේ ශුද්ධ ලාභය වශයෙන් දක්වා ඇති රුපියල් අසූ නව ලක්ෂ පනස් හතර දහස් එකසිය හතලිස් තුනකුත් ශත තිස් හතක් වූ (රු. 89,54,143.37) මුදල, එම දෙපාර්තමේන්තුවේ කාර්‍යයන් සඳහා, සංචිත අරමුදලක් වශයෙන් වෙන් කොට තැබිය යුතුයයි, මෙම මන්ත්‍රී මණ්ඩලය යෝජනා කරයි."

හැම අවුරුද්දකදීම දෙපාර්තමේන්තුවට ලැබෙන මෙම මුදල් මේ සංචිත අරමුදල සඳහා වෙන් කරනවා. මෙම සංචිත විස්තාරණ හා නවීකරණ අරමුදල—Renewals, Extensions and Renewals Fund—පිළිබඳව කියන්නට කැමතියි. පසුගිය සැප්තැම්බර් මස 28 වන දින රුපියල් කෝටි 30කුත් ලක්ෂ 83ක් මෙම අරමුදලට තිබුණා. විදුලි දෙපාර්තමේන්තුවේ සංවර්ධන වැඩවලටයි, එම මුදල් යොදවන්නේ. 1967-68 සංවර්ධන වැඩ සඳහා දැනටම රු. 1 කෝටි 31 ලක්ෂ 329 දහස් ගණනක් යොදවා තිබෙනවා. ඊට කලින් භාරගෙන ඇති තවම අවසන් නොවූ වැඩ සඳහා වෙන් වී ඇති මුදල රු. 39 ලක්ෂ 25 දහස් ගණනක් වෙනවා. මේ අවුරුද්දේ භාරගත් අළුත් වැඩ සඳහා රු. ලක්ෂ 42 යි. අද ඉදිරිපත් කරන්නට තිබෙන දෙවන යෝජනාව අනුව විදුලි බල සංවර්ධන වැඩ සඳහා රුපියල් 70 ලක්ෂයක් වෙන් කෙරෙනවා.

**ඉලංගරත්න මයා.**
*(திரு. இலங்கரத்ன)*
(Mr. Ilangaratne)

යෝජනා දෙකම ගැන කතා කරන විද ?

**ගරු සී. පී. ද සිල්වා**
*(கௌரவ சி. பீ. டி சில்வா)*
(The Hon. C. P. de Silva)

යෝජනා දෙකම එක සැරේට ගන්නවා නම් හොඳයි. මෙම සභාවේ අනුමැතිය ඇතුව එසේ කරන්නට මා යෝජනා කරනවා. එය පහසුයි.

**කථානායකතුමා**
*(சபாநாயகர் அவர்கள்)*
(Mr. Speaker)

We can discuss both and take the vote separately, if the House agrees.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

**ගරු සී. පී. ද සිල්වා**
*(கௌரவ சீ. பீ. டி சில்வா)*
(The Hon. C. P. de Silva)

දෙවන යෝජනාව අනුව රු. ලක්ෂ 70ක් වියදම් කරන්නට රජය අදහස් කරනවා. මුළු වැඩේටම රු. කෝටි 2කුත් 50 ලක්ෂයක් යනවා. එම නිසයි, ගිය අවුරුද්දේ ලාබය වූ රු. 89 ලක්ෂය මේකට ඇතුළත් කරන්නය කියන්නේ. මේ ග්‍රාමීය වැඩ පිළිවෙළවල් මන්ත්‍රී මණ්ඩලය භාර ගතහොත් එන අවුරුද්දේ වියදම සඳහා එම රු. 89 ලක්ෂය වුව මනා කරනවා. Repairs and renewals වැඩ සඳහා මෙම මුදල් අවශ්‍යයි.

ගරු කථානායකතුමනි, මෙම යෝජනා දෙක පිළිබඳව එක පාරට සාකච්ඡා කරන්නට පුළුවන් බව තමුන්නාන්සේ කීවා. තමුන්නාන්සේ දන්නවා, ගම්බද ප්‍රදේශවලට විදුලි බලය ඉතාමත් අවශ්‍ය කරන බව. විදුලි බලය ලැබුණාම එම ප්‍රදේශවල කර්මාන්ත ව්‍යාපාරාදිය දියුණු කරන්නට පුළුවනි. කුඩා කර්මාන්ත මෙන්ම විශාල කර්මාන්තත් දියුණු කරන්නට පුළුවනි, විදුලි බලය ලැබුණම. ගම්බද ප්‍රදේශවල කම්කරුවන්ට එම fැක්ටරිවල සේවය කොට තමන්ගේ ජීවන තත්ත්වය උසස් කර ගන්නට පුළුවන්කම ලැබෙනවා. විදුලි බලය ලැබුණු පසු ග්‍රාමීය ගෘහ කර්මාන්ත අංශය විශෙෂයෙන් දියුණුවට පත් වෙනවා ඇති. ගොඩ ඉඩම් යනාදියට අවශ්‍ය වතුර සපයා ගැනීමටත් පහසු වෙනවා. සාමාන්‍ය ජීවිත පවා විදුලි බලය උපයෝගි කොටගෙන තරමක් දුරට පහසු තත්ත්වයකට හරවා ගන්නට පුළුවන් වෙනවා.

1960 අවුරුද්දේ රජය මගින් ගම් 50 කට විදුලි බලය දෙන්නට නියම කළා. එම කටයුතු සඳහා රජයට අයත් විදේශ විනිමය මෙන්ම ඇමෙරිකන් ආණ්ඩුවෙන් ලැබෙන රු. ලක්ෂ 17ක ආධාර මුදලකුත් වියදම් කරන්නට තීරණය කර ගත්තා. ඇමෙරිකන් ආණ්ඩුව මගින් දෙන ලද පොරොන්දුව පරිදි ලැබුණු එම ආධාර මුදල රු. ලක්ෂ 4 ක් වැය කළායින් පසු යම් යම් ආරාවුල් හේතුකොටගෙන ලැබීම නැවතුණු නිසා එම වැඩ කටයුතු ඇනහිටියා. විදේශ විනිමය අඩුකම නිසා දෙපාර්තමේන්තුවට අවශ්‍ය කරන බඩු ලබා ගැනීම පවා අවුරුදු 3කින් පමණ ඇනහිටියා. දැන් ග්‍රාමීය ක්‍රම 50න් 40ක වැඩ අවසන් කරන්නට කටයුතු කරගෙන යනවා.

**ටී. බී. එම්. හේරත් මයා.**
*(திரு. ரி. பி. எம். ஹேரத்)*
(Mr. T. B. M. Herath)

කොහේද ඒ ?

**ගරු සී. පී. ද සිල්වා**
*(கௌரவ சீ. பீ. டி சில்வா)*
(The Hon. C. P. de Silva)

මම කියන්නම්. දෙම්පේ, උඩුපිල, පරණගොඩ, දෙල්ගොඩ, දෙකටන, කඳුබොඩ, සියඹලාගොඩ, කහටදූව, වැතර, පොල්ගස්ඕවිට, හෝමාගම, තලවතුගොඩ, මාදිවෙල, තලපත්පිටිය, පොතුවිල, බලපිටිය, ඉඳුරුව, කොස්ගොඩ, අහුන්ගල්ල, මීතොටමුල්ල, මාරවිල, කළුකොඳයාව, වල්ගම, මල්වාන, උඩුනුවර, අලපලාවල, දස්කර, ගෙලිඔය, වේරපිටිය, හන්දෙස්ස, කොස්සින්න, මැණික්බෝව, නාරංවල, පෙතියාගොඩ, කැටකුඹුරු, ගම්පහ, මාකෙවිට, මාබිම, වත්තල, බෝපිටිය, උස්වැටකෙයියාව, පල්ලේවත්ත, දික්ඕවිට. දැන් වැඩ අවසාන වන්නට ළංවී තිබෙන ස්ථාන මේවායි : තෙල්දෙනිය, උඩිස්පත්තුව, අකුරණ, හල්ලොලුව, හිඳගල, කොත්මලේ, සංගිලිපාලම, නියම්ගම්දෙර, කුඹල්ඔලුව, හැඳුණුවැව, ගම්පහ, වැලිවේරිය, වැබොඩ, ඇඹරළුව. මේ ස්ථානවල දැන් පාරේ කම්බි ඇද ගෙවල් ඇතුලේ කම්බි ඇදීම කරගෙන යනවා.

**ගරු මන්ත්‍රීවරයෙක්**
*(கௌரவ அங்கத்தவர் ஒருவர்)*
(An hon. Member)

හොරෙව්පතාන ?

**ගරු සී. පී. ද සිල්වා**
*(கௌரவ சீ. பீ. டி சில்வா)*
(The Hon. C. P. de Silva)

හොරොව්පතාන නෑ.

ග්‍රාමීය විදුලි බලය දෙන්නේ ඇමති මණ්ඩලය අනුමත කර තිබෙන කොන්දේසි වගයක් අනුවයි. විදුලි බලය දීමට

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

යන වියදමෙන් සියයට 12 ක් අවුරුද්දකට අය විය යුතුයි. ඒකයි මිම්ම. ඒ අනුව එක් ප්‍රදේශයකට " හයි වොල්ටේජ් ට්‍රාන්ස්මිෂන් ලයින් " හැතැප්ම එකහමාරක පමණ සවි කරන්නට පුළුවනි. " ග්‍රිඩ් සබ් ස්ටේෂන් " " හයි ටෙන්ෂන් වොල්ටේජ් " 11 දහක් නැත්නම් 33 දහක් යොදන විට එය කරන්නට පුළුවනි. " ට්‍රාන්ස්පෝමර් සබ් ස්ටේෂන් " එකකින් හැතැප්ම එක හමාරකට පමණ " ත්‍රී ෆේස් ඕර් වන් ෆේස් ඩිස්ට්‍රිබියුෂන් ලයින්ස් ", ඒ කියන්නේ, " ලෝ ටෙන්ෂන් 230 කරන්ට් එක දෙන්නට පුළුවනි. මේ විධියට විදුලි බලය සැපයීම සඳහා ගෙවල් 42 කට වැඩි යෙන් තිබෙනවා නම් ආණ්ඩුවේ වියදමෙන් ගෙවල් ඇතුළේ කම්බි අදිනවා. හැබැයි, එසේ කරන්නේ පිනට නොවෙයි. කම්බි ඇදීමේ වියදමත් " කනෙක්ෂන් " එකේ වියදමත් මාසික කොටස් මුදල් 36 කින් අය කර ගන්නවා. අන්න ඒ ක්‍රමයටයි මේව කරන්නෙ. දැනට කිලොවාට්ස් 33 කම්බි ඇද තිබෙන ප්‍රදේශවලට පමණයි විදුලිය දෙන්නට පුළුවන් වෙන්නෙ. හොරොව්පතානෙ දැනට එහෙම කම්බි ඇද නැහ.

**ටී. බී. එම්. හේරත් මයා.**
*(திரு. ரீ. பி. எம். ஹேரத்)*
(Mr. T. B. M. Herath)
තබ්බෝව ?

**ගරු සී. පී. ද සිල්වා**
*(கௌரவ சி. பீ. டி சில்வா)*
(The Hon. C. P. de Silva)
එහෙත් නැහැ.

ගරු කථානායකතුමනි, ලක්ෂපාන දෙවන පියවර අනුව දකුණු පළාතට විදුලි කම්බි ඇද තිබෙනවා. කිලොවොට්ස් 132 කම්බි බලන්ගොඩ සිට අක්මීමන, ගාල්ල දක්වා ඇද තිබෙනවා. අක්මීමන සිට බූස්ස දක්වා කිලොවොට්ස් 33 කම්බි ඇද තිබෙනවා. බූස්සට එසේ විදුලිය සපයා තිබෙන්නේ තුනී ලැලි කම්මාන්ත ශාලාවත් තවත් කම්මාන්ත ශාලා කීපයකුත් තිබෙන නිසයි.

ඒ සමගම බෙන්තර, අහංගම, මාතර, තංගල්ල සහ දෙනියාය ප්‍රදේශ දක්වාත් කිලොවොට්ස් 33 කම්බි ඇද අවසානයි. ඒ අනුව දැන් ඒ ප්‍රදේශවලට විදුලි බලය සපයන්නට පුළුවනි.

මස්කෙලිඔය පළමුවන පියවරත් සමගම මා ළඟ තිබෙන මේ ලැයිස්තුවේ සඳහන් වන අන්දමට විදුලි බල කම්බි ඇද විදුලිය බෙදා හැර තිබෙනවා. මේවා කරන්නට ජාත්‍යන්තර වශයෙන් ටෙන්ඩර් කැඳවා කොන්ත්‍රාත් දී තිබෙනවා. මා කියවන්නම් මේ ලැයිස්තුව. මේ ඇද තිබෙන්නෙ කිලොවොට්ස් 132 කම්බි.

| | | | |
|---|---|---|---|
| " පොල්පිටිය | — | කොලොන්නාව | සැතපුම් 45 යි |
| පොල්පිටිය | — | හබරන | සැතපුම් 71 යි |
| හබරන | — | අනුරාධපුරය | සැතපුම් 29 යි |
| අනුරාධපුරය | — | චුන්නාකම් | සැතපුම් 120 යි |
| රුවන්වැල්ල | — | තුල්හිරිය | සැතපුම් 16 යි |
| කොළොන්නාව | — | හපුගස්කන්ද | සැතපුම් 5 යි |
| කොළොන්නාව | — | රත්මලාන | සැතපුම් 8 යි " |

මේ කටයුතුවලට රු. කෝටි 2 කුත් ලක්ෂ 78 ක් වැය වෙනවා. මුදල් වෙන් කර දැන් කොන්ත්‍රාත් දී අවසානයි. විදේශ විනිමය ලබාගෙන අවසානයි. දැනට මේ වැඩ කරගෙන යනවා.

**ටී. බී. එම්. හේරත් මයා.**
*(திரு. ரீ. பி. எம். ஹேரத்)*
(Mr. T. B. M. Herath)
කාටද කොන්ත්‍රාත් දී තිබෙන්නේ ?

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

**ගරු සී. පී. ද සිල්වා**
*(கௌரவ சி. பீ. டி சில்வா)*
(The Hon. C. P. de Silva)
මම හිතන්නෙ ජපන් රටට.

ඒ සමගම, බලන්ගොඩ, අක්මීමන, ගාල්ල යන ස්ථානවල සබ්ස්ටේෂන්ස් තිබෙන බව මා මතක් කරන්නට සතුටුයි. එවැනිම ලොකු මධ්‍යස්ථාන අනුරාධපුරය, චුන්නාකම්, දෙනියාය, හබරන, කිලිනොච්චි, හපුගස්කන්ද, තුල්හිරිය, රත්මලාන, යන ස්ථානවලත් තිබෙනවා. මේවාට වැය වන මුදල රු. කෝටි 2 කුත් ලක්ෂ 14 ක් වෙනවා.

කිලොවොට්ස් 33 කම්බි සැතපුම් 520 ක් තුළ ඇද තිබෙනවා. මා කියවන්නම් ඒ ලැයිස්තුව :

| | | | | |
|---|---|---|---|---|
| " 1. | නිට්ටඹුව | — වරකාපොල | සැතපුම් | 10 යි |
| 2. | උඩුගොඩ | — කෑගල්ල | ,, | 8.6 යි |
| 3. | බෝගල | — ගලිගමුව | ,, | 10.1 යි |
| 4. | වතුපිටිවල | — රුවන්වැල්ල | ,, | 12.5 යි |
| 5. | සිංහපිටිය | — හෙම්මාතගම | ,, | 4 යි |
| 6. | හෙම්මාතගම | — දිප්පිටිය | ,, | 3 යි |
| 7. | කිතුල්ගල | — පොල්පිටිය | ,, | 3.9 යි |
| 8. | දැරනියගල | — මාලිබොඩ | ,, | 5.9 යි |
| 9. | බානගල | — දොලොස්බාගෙ | ,, | 1.8 යි |
| 10. | කුලියාපිටිය | — හෙට්ටිපොල | ,, | 9.75 යි |
| 11. | කුරුණෑගල | — වාරියපොල | ,, | 16.1 යි |
| 12. | වාරියපොල | — නිකවැරටිය | ,, | 12.5 යි |
| 13. | නිකවැරටිය | — මාහෝ | ,, | 10.0 |
| 14. | ඉබ්බන්ගමුව | — ගලේවෙල | ,, | 17.0 |
| 15. | දොඩන්ගස්ලන්ද | — රත්තොට | ,, | 13.0 |
| 16. | මාතලේ | — රත්තොට | ,, | 5.25 |
| 17. | පොතුහැර | — පොල්ගහවෙල | ,, | 6.5 |
| 18. | අලව්ව | — ගිරිඋල්ල | ,, | 8.5 |
| 19. | වැඋඩ | —ගලගෙදර-හල්ලොලුව | ,, | 11.25 |
| 20. | ඇල්ල | —බලගල ඇල්ල | ,, | 5.0 |
| 21. | දඹුල්ල | — පැල්වැහැර | ,, | 1.5 |
| 22. | පැල්වැහැර | — හබරන | ,, | 12.0 |
| 23. | හබරන | — මරදන්කඩවල-කැකිරාව | ,, | 19.5 |
| 24. | මරදන්කඩවල | — මහඉලුප්පලම | ,, | 8.0 |
| 25. | හබරන | — මින්නේරිය-පොලොන්නරුව | ,, | 20.0 |
| 26. | අනුරාධපුර | — මැදවච්චිය | ,, | 18.0 |
| 27. | මැදවච්චිය | — වවුනියා | ,, | 16.0 |
| 28. | හබරන | — ත්‍රිකුණාමලය | ,. | 48.0 |
| 29. | කිලිනොච්චි | — පල්ලෙයි-චාවකච්චේරි | ,. | 31.0 |
| 30. | ඩාටන් ෆිල්ඩ් | — පැලවත්ත | ,, | 9.5 |
| 31. | පැලවත්ත | — කුරුඳුගහ හැතැක්ම | ,, | 13.8 |
| 32. | තංගල්ල | — දික්වැල්ල-මාතර | ,, | 18.0 |
| 33. | තංගල්ල | — රන්න | ,, | 7.5 |
| 34. | හම්බන්තොට | — තිස්සමහාරාම | ,, | 15.5 |
| 35. | තිස්සමහාරාම | — කතරගම | ,, | 10.0 |
| 36. | බටදූව | — ජුබිලිපයින් | ,, | 3.0 |
| 37. | ජුබිලිපයින් | — නාකියාදෙනිය | ,, | 6.8 |
| 38. | ජුබිලිපයින් | — සිට්රස් | ,, | 4.0 |
| 39. | චුන්නාකම් | — තෙල්ලිප්පලෙයි නැගෙනහිර කන්කසන්තුරෙයි සිමෙන්ති කම්හල | ,, | 7.0 |
| 40. | කුලියාපිටිය | — නාරම්මල | ,, | 13.0 |
| 41. | කැටකුඹුර | — හියාරාපිටිය-පමුණුව | ,, | 3.0 |
| 42. | කැටකුඹුර | — ඇම්බැක්කෙ-වැල්ලම්බොඩ | ,, | 4.0 |
| 43. | තෙල්දෙනිය | — මහියන්ගනය | ,, | 28.0 |
| 44. | අනුරාධපුර | — හොරොව්පතාන | ,, | 30.0 |

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

**ගරු මන්ත්‍රීවරයෙක්**
(கௌரவ அங்கத்தவர் ஒருவர்)
(An hon. Member)
ඔය තියෙන්නෙ.

**ගරු සී. පී. ද සිල්වා**
(கௌரவ சீ. பீ. டி சில்வா)
(The Hon. C. P. de Silva)
ඔව්, ඒකත් තියෙනව. මම කිව්වෙ ග්‍රාමීය විදුලි බල ක්‍රමයට ඇතුළත් කරල නැහැ කියායි. දැන් කොන්ත්‍රාත් දීල හදාගෙන යන "හයි ටෙන්ෂන්" මාගී හැදුවට පස්සෙයි මේව පටන් ගන්නෙ. එහෙත් පසු ගිය අවුරුද්දෙ දකුණු පළාතේ සාදාගෙන ගිය "හයිටෙන්ෂන්" මාගී සෑම එකක් ම වගේ ග්‍රාමීය විදුලි බල ක්‍රමයට අහු වෙනව. ගාළු දිස්ත්‍රික්කය හා මාතර දිස්ත්‍රික්කය සම්පූර්ණයෙන්ම වගේත් හම්බන්තොට දිස්ත්‍රික්කයෙන් වැඩි හරියකුත් ග්‍රාමීය විදුලි බලය ක්‍රමයට ඇතුළත් වෙනව.

**වෛද්‍යාචාර්ය එස්. ඒ. වික්‍රමසිංහ**
(டொக்டர் எஸ். ஏ. விக்கிரமசிங்ஹ)
(Dr. S. A. Wickremasinghe)
හැම තැනම අහු වෙනවද?

**ගරු සී. පී. ද සිල්වා**
(கௌரவ சீ. பீ. டி சில்வா)
(The Hon. C. P. de Silva)
හැම තැනම කියා කියන්ට අමාරුයි. මට එහෙම පොරොන්දු වෙන්ට බැහැ. ඉතා විශාල ප්‍රදේශයක් අහු වෙනව. මම පසුව කියෙව්ව ලැයිස්තුවෙ සඳහන් ප්‍රදේශවල වැඩ කටයුතු ආරම්භ කරන්නෙ දැනට කර ගෙන යන කටයුතු අවසාන කළාට පස්සෙයි. ඒ වැඩ පිළිවෙළට රුපියල් එක් කෝටි පනස්හය ලක්ෂයක් වියදම් වෙනව. ඒ සමගම කොන්තරාත් නොදී විදුලි බල දෙපාර්තමේන්තුව මගින් කිලෝවොට් 33 හා කිලොවොට් 11 විදුලි බල මාර්ග හැතැප්ම 300 ක් විතර නොයෙක් ප්‍රදේශවල දික් කරගෙන යනව. ඒ කටයුත්තට ඉංග්‍රීසියෙන් කියන්නෙ "Spur Line" කියලයි. ඒ මාර්ග දික් කරල ශාඛා ස්ථාන 600 ක් තැනීම සඳහා දැනටමත් රුපියල් ලක්ෂ 130. 3 ක් වෙන් කර තිබෙනව. කොළඹ නගරය ඇතුළත ශාඛා විදුලි බල ස්ථාන 40 ක් ඇති කරන්න රුපියල් ලක්ෂ 7 ක මුදලක් වෙන් කර තිබෙනව.

ගරු කථානායකතුමනි, ඉඩම් උඩින් කම්බි ඇදීමෙදිත්, කම්බිවල ගෑවෙන ගස් ආදිය කපන්ට යාමෙදිත් නොයෙක් අවහිර කම් දෙපාර්තමේන්තුවට ඇති වෙනව. ට්‍රාන්ස්ෆෝමර් එකක් සවි කරන්න ඉඩම් කැබැල්ලක් ලබා ගැනීම බොහොම අමාරුයි සමහර විට මේ සඳහා ශ්‍රේෂ්ඨාධිකරණය ඉදිරියටත් යන්ට සිද්ධ වෙනව. විශේෂයෙන් මේ කරදර වැඩිපුර ඇතිවෙන්නෙ කොළඹ නගරයේ ඉඩම් කැබැල්ලක් ගන්ට යන අවස්ථාවලදීයි. මේ කාරණය නිසා ශාඛා ස්ථාන කිපයක් සෑදීම ඇනහිට තිබෙනව.

දැන් මේ දෙවැනි යෝජනාවෙන් කියා තිබෙන අන්දමට රුපියල් 70 ලක්ෂයක මුදලක් වියදම් කිරීමට අදහස් කරනවා.

1967 සහ 1968 අවුරුදු සඳහා වැය කරන්න බලාපොරොත්තු වන්නේ ස්වදේශීය මුදලින් දශ ලක්ෂ 43.8 යි. විදේශීය මුදලින් දශ ලක්ෂ 44.5 යි. ඊළඟ දෙවෙනි අවුරුද්දට විදේශීය මුදලින් දශ ලක්ෂ 3.75 යි. ස්වදේශීය මුදලින් 4.92 යි. තුන්වෙනි අවුරුද්දට විදේශීය මුදලින් 3.18 යි. ස්වදේශීය මුදලින් 3.26 යි. 4 වෙනි අවුරුද්දට විදේශීය මුදලින් පෙන්වා නැහැ. ස්වදේශීය මුදලින් දශ ලක්ෂ 2.7 යි. මුළු ගණන විදේශීය මුදලින් 11.38 යි. ස්වදේශීය මුදලින් 13.83 යි. දැන් පළමුවෙනි අවුරුදු දෙකට බඩු භාණ්ඩ ගෙන්වීම සඳහා ටෙන්ඩර් කැඳවා තිබෙනවා. ඒ කැඳවීම කර තිබෙන්නේ මෙන්න මේ විධියටයි. ප්‍රථමයෙන්ම ඒ බඩුවල ලැයිස්තුවක් සකස් කරනවා. ඊළඟට ඒ බඩුවලට කොයි තරම් මුදලක් අය කරනවාද? ඒ සඳහා කොයි තරම් මුදලක් වෙන් කරවනවාද? කොයිතරම් ප්‍රමාණයක ණය මුදලක් ලබා දෙනවාද? ඒ සඳහා අය කරන පොලී ප්‍රමාණය කොතෙක්ද? අවුරුදු කීයකින් ගෙවා නිම කළ යුතුද? ආදී කරුණු ගැන සොයා නලනවා.

මා දන්නවා කලින් ඇති කරන ලද වැඩ පිළිවෙළ අවසාන වන තෙක් මෙය ක්‍රියාත්මක වන්නේ නැති බව. එතෙක් මේ යෝජනාව වලංගු වන්නේ නැහැ. නමුත් කාලය ඉතිරි කර ගැනීම සඳහා ඇමති මණ්ඩලය විසින් කර ගන්නා ලද තීරණයක් ... ටෙන්ඩර් කැඳවා තිබෙනවා. අපි

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[ගරු සී. පී. ද සිල්වා]

එසේ කර තිබෙන්නේ විදේශීය බඩු ලබා ගැනීමේ පහසුව ඇති කරගැනීම සඳහායි. එහෙම නැත්නම් ඒ බඩුවල මිල වැඩි වෙන්න ඉඩ තිබෙනවා. ඒ අපහසුව මග හැර ගැනීම සඳහායි මේ විධියට ටෙන්ඩර් කැඳවා තිබෙන්නේ. ඒ සමගම අවශ්‍ය කරන හුඟක් දේවල් අපේ රටෙන්ම ලබා ගන්නත් පුළුවනි. අපේ කර්මාන්ත ශාලා වල දැන් පියන් සෑදීම කෙරෙනවා. මණ්ඩලයත් සමග සාකච්ඡා කර හුඟක් දුරට දැන් ඒ වැඩ කෙරී ගෙන යනවා ඔය ස්විච් වලට යටින් නැත්නම් ෆෑන්වලට යටින් ගසනපියන් මෙහිම හදා ගන්නවා. එයින් අපට මුදල් කොටසක් ඉතිරි කර ගන්න පුළුවන් වෙනවා. ඒ වගේම අපට කරන්න පුළුවන් තරමක් කර්මාන්ත මෙහිම කර ගන්න අප මහන්සි ගන්නවා. එවිට අපේ විදේශීය මුදල් ඉතිරි කර ගන්න පුළුවන් වෙනවා. අනිකුත් අවශ්‍ය භාණ්ඩ සඳහායි අපි ටෙන්ඩර් කැඳවා තිබෙන්නෙ. අපි දැන් හොඳ පාඩමක් ඉගෙණ ගෙන තිබෙනවා. ඒ අනුවයි අපි දැන් කටයුතු කර ගෙන යන්නෙ. පුළුවන් තරම් අපට ලාභ ලැබෙන පිළිවෙලටයි වැඩ කර ගෙන යන්නෙ. අපි විදේශීය බඩු ලබා ගත්විට ඒ සඳහා යම් කිසි පොලියකුත් ගෙවන්න සිදු වෙනවා.

ගරු කථානායකතුමනි, අපේ සංවර්ධන ව්‍යාපාරයට අවශ්‍ය කරුණු රාශියක්ම තිබෙනවා. අපි මේ ගැන සොයා බලා වාර්තා කිරීම සඳහා විරුද්ධ පක්ෂයත් සමග සාකච්ඡා කර මණ්ඩලයක් පත් කර සිටිනවා. ඒ මණ්ඩලයෙ මෙන්න මේ අයත් ඉන්නවා.

Mr. J. N. Goswami of the Colombo Plan Power Project Adviser to the Department of National Planning—Chairman.

Mr. Josef Snizek, U.N.T.A., Adviser to the Department of Government Electrical Undertakings.

Mr. S. W. Peiris, General Manager, Dpeartment of Government Electrical Undertakings.

Mr. E. L. P. Jayatillaka, Acting Deputy Director, Department of National Planning.

Mr. R. G Gomez, Assistant Director, Supply and Cadre.

Mr. H. S. Subasinghe, Assistant Secretary, Ministry of Land, Irrigation and Power.

Mr. D. Ramanayake (Co-opted member), Research Officer, Department of National Planning.

Mr. V. R. Charavanapawan (Member and Secretary), Chief Commercial Officer, Department of Government Electrical Undertakings.

මෙම කාරක සභාව විසින් පළමුවැනි වරට 1966 නොවැම්බර් මාසයේදී රපෝර්තුවක් ඉදිරිපත් කර තිබෙනවා. එනම්; Sessional Paper XXII of 1966—Report of the Committee on Power Cost and Power Development in Ceylon. විදුලි කර්මාන්තය බොහෝ දුරට දියුණු කිරීම පිණිස මොන අන්දමේ සංවිධානයක් ඇති කළ යුතුද යන විස්තර යයි පළමු වෙනි වාර්තාවේ සඳහන් වන්නේ. එය 1966, 22 වෙනි සැසි වාර්තාව වශයෙන් මුද්‍රණය කර තිබෙනවා. දෙවැනි වාර්තාව නිකුත් කර තිබෙන්නේ 1966 නොවැම්බර් මාසයේදියි. ලොකු කුඩා කර්මාන්ත සියල්ලටම අවශ්‍ය විදුලි බලය පිළිබඳව ලංකාව පුරාම ඇනට කරන දේවල්, කළ දේවල් ආදිය ගැනත් සකස් කර තිබෙන ප්ලෑන් ගැනත්, මොන මොන අන්දමට ඒවා කළ යුතුද යන්නත් ඒ දෙවැනි වාර්තාවෙන් විස්තර කර තිබෙනවා. එය 1966, 23 වෙනි සැසි වාර්තාව වශයෙන් මුද්‍රණය කර තිබෙනවා. Sessional Paper XXIII of 1966—Report of the Committee on Power Requirements for Industries ඊට පසුව තුන්වෙනි වාර්තාව නිකුත් කරනු ලැබුවේ 1967 දියි. එය 1967, 20 වෙනි සැසි වාර්තාව වශයෙන් මුද්‍රණය කර තිබෙනවා. Sessional Paper XX of 1967—Report of the Committee on Power Costs and Power Development in Ceylon—Rationalization of the Power Tariffs. " පවර් ටැරිෆ් " ගැන සම්පූර්ණ විස්තරයක් එහි තිබෙනවා. කර්මාන්තවලට, නිවෙස්වලට, වෙළඳ ව්‍යාපාර වලට, ගෘහ කර්මාන්තවලට, මේ රටේ " ටැරිෆ් " ප්‍රමාණය කොපමණද, පිටරට වල " ටැරිෆ් " ප්‍රමාණය කොපමණද කියා විස්තරයක් එහි ඇතුලත් වී තිබෙනවා. ඔය විධියට අප ඒ කාරක සභා පත් කර ඔය කරුණු සම්බන්ධයෙන් රපෝර්තුවක් අර ගෙන තිබෙනවා. ඒ අනුව අවුරුදු 8 කදී අපේ රටේ පාවිච්චි කරන විදුලිබල ප්‍රමාණය දැන් පාවිච්චි කරනවා වාගේ දෙපංගුවක්

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

වෙනවා. ඒ සඳහා අපේ විදුලි බල දෙපාර්තමේන්තුවත් බොහෝ දුරට දියුණු කරන්නට ඕනෑ.

ඒ එක්කම මේ දෙපාර්තමේන්තුව "බෝඩ්" එකක් බවට පත් කිරීමට අපට සිදු වී තිබෙනවා. ඒ සඳහා පනතක් දැනටමත් සකස් කර තිබෙනවා. තමුන්නාන්සේට මතක ඇති පසුගිය ආණ්ඩු කාලයේ ඒ සඳහා පනතක් ඒකච්ඡන්දයෙන් මෙහිදී සම්මත වුණ බව. එහෙත් එයින් යම් යම් කරදර ඇති වූ නිසා එය ක්‍රියාත්මක වුණේ නැහැ. දැන් ඒ සේවකයන්ගේ අදහස් බොහෝ දුරට වෙනස් වී තිබෙනවා. එහි තවත් අඩු පාඩු තිබෙන නිසා ඒවාත් හරි ගස්සා ඒ පිළිබඳව ඉක්මනින් ක්‍රියා කිරීමට බලාපොරොත්තු වෙනවා.

විශෙෂයෙන්ම විදුලි කර්මාන්තය දියුණු කිරීමේ අදහසින් ග්‍රාම්‍ය පෙදෙස්වලට විදුලි බලය දීමට ආණ්ඩුවේ යෝජනාවක් පරිදි වැඩ පිළිවෙළක් යොදා තිබෙනවා. සීමා සහිත විධියටයි එය සකස් කර තිබෙන්නේ. ඒ මොකද? ලංකාවේ සෑම තැනකටම දෙන්න පුළුවන්කමක් නැහැ. දැනට කම්බි ඇද තිබෙන පෙදෙස්වලට පමණයි දෙන්නෙ. එයිනුත් ඒ ප්‍රදේශවල සංවිධාන අනුව, සියයට 12කට වැඩි ආදායමක් ලැබෙන ගම් භාර ගන්නවා ඇති. ඒ සඳහා අපි අයවැය ලේඛනයෙන් මුදල් ගන්නේ නැතිව මෙසේ ලාභ මුදල්වලින් ගැනීමටයි බලාපොරොත්තු වන්නේ. මේ පළමුවෙනි සහ දෙවෙනි යෝජනා දෙක ඉදිරිපත් කර තිබෙන්නේ ඒ අදහස අනුවයි.

**ලෙස්ලි ගුණවර්ධන මයා.**
*(திரு. லெஸ்லி குணவர்தன)*
(Mr. Leslie Goonewardene)
සංයුක්ත මණ්ඩලයක් කරන්නේ කවද්ද?

**ගරු සී. පී. ද සිල්වා**
*(கௌரவ சி. பி. டி சில்வா)*
(The Hon. C. P. de Silva)
වෘත්තීය සමිති සමග තව වරක් දෙකක් සාකච්ඡා කරන්නට තිබෙනවා.

**ලෙස්ලි ගුණවර්ධන මයා.**
*(திரு. லெஸ்லி குணவர்தன)*
(Mr. Leslie Goonewardene)
දැන් අවුරුදු ගණනාවක් තිස්සේ සාකච්ඡා කරනවා.

**ගරු සී. පී. ද සිල්වා**
*(கௌரவ சி. பி. டி சில்வா)*
(The Hon. C. P. de Silva)
මෙය බලෙන් කිරීමට මා සූදානම් නැහැ. ඒ මහත්වරුන් සමග සාකච්ඡා කරන්නේ ඒ නිසයි. ඒ මොකද? මෙය ක්‍රියාත්මක කිරීමෙන් ඒ අයගේ ජීවන තත්ත්වය සම්පූර්ණයෙන්ම අමුතු වෙනවා. ජීවන තත්ත්වයටත් වඩා ඒ අයගේ හැඩ ගැස්ම ගැනයි පැමිණිලි කර තිබෙන්නේ. වෙන අමුත්තක් නැහැ.

**ප්‍රශ්නය සභාභිමුඛ කරන ලදී.**
வினா எடுத்தியம்பப் பெற்றது.
*Question proposed.*

අ. භා. 2.57

**ප්‍රින්ස් ගුණසේකර මයා.** (හබරාදූව)
*(திரு. பிறின்ஸ் குணசேக்கர—ஹபருதுவ)*
(Mr. Prins Gunasekera—Habaraduwa)
ගරු කථානායකතුමනි, ගරු ඇමතිතුමා පැයක් තිස්සේ—

**කථානායකතුමා**
*(சபாநாயகர் அவர்கள்)*
(Mr. Speaker)
පැය භාගයයි.

**ප්‍රින්ස් ගුණසේකර මයා.**
*(திரு. பிறின்ஸ் குணசேக்கர)*
(Mr. Prins Gunasekera)
—ගඟක් ගලන්නා වාගේ මොනවාදෝ ගොඩක් කියාගෙන ගියා. ගරු ඇමතිතුමාගේ කථාව අසාගෙන සිටියදී ඉංගිරිසි කාව්‍ය කියමනක් මට මතක් වුණා. ඒ මොකක්ද? "මිනිස්සු එනවා, මිනිස්සු යනවා, මම නම් හැමදාම මෙතැන ඉන්නවා.............."

**ගරු වන්නිනායක**
*(கௌரவ வன்னிநாயக்க)*
(The Hon. Wanninayake)
කොහොමද ඒක ඉංගිරිසියෙන් කියන්නේ?

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

ප්‍රින්ස් ගුණසේකර මයා.
(திரு. பிறின்ஸ் குணசேக்கர)
(Mr. Prins Gunasekera)
ඇයි, ඉංගිරිසි දන්නේ නැද්ද? එච්චරවත් ඉගෙන ගන්නෙ නැතුවද ඔය විධියට ඇඳුම් ඇඳගෙන මෙතැන ඉංග්‍රීසි යෙන් කථා කරන්නෙ?

ගරු ඇමතිතුමාගේ මේ කථාව අවුරුද්ද කට වරක් කැළණි ගඟ ගලා මුළු රටම විනාශ වෙලා යන්න වගේ—

ගරු සී. පී. ද සිල්වා
(கௌரவ சி. பி. டி சில்வா)
(The Hon. C. P. de Silva)
මේක අවුරුද්දකට සැරයක් එනවා.

ප්‍රින්ස් ගුණසේකර මයා.
(திரு. பிறின்ஸ் குணசேக்கர)
(Mr. Prins Gunasekera)
අවුරුද්දකට දෙතුන් වරක් ඉඩෝරය ඇවිත් මුළු රටම විනාශ වෙලා යන්නා වගේ, අවුරුදු දෙක තුනකට වරක් ගරු කථානායකතුමනි, පසුගිය දවස්වල තමුන්නාන්සේගේ ප්‍රදේශයේ සිදු වුණු අන්දමට මහා කුණාටුවක් හමා සියල් ලක්ම නැති භංග වෙලා යන්න වගේ ගරු ඉඩම්, වාරි මාර්ග හා විදුලි බල ඇමති තුමාගෙන්, වාරි මාර්ගයකින් වැහෙන්නා වගේ කෙරුණු මේ කථාව වචනවලට සීමා වූ එකක් මිස අතැනින් එහා ගොස් අපේ පළාතේ නම් ක්‍රියාවට පරිවර්තනය නොවූ බව මේ මන්ත්‍රී මණ්ඩලයේදී කිය යුතුයි.

ගරු සී. පී. ද සිල්වා
(கௌரவ சி. பி. டி சில்வா)
(The Hon. C. P. de Silva)
33,000 ක එකක් යනවා, අභංගමට.

ප්‍රින්ස් ගුණසේකර මයා.
(திரு. பிறின்ஸ் குணசேக்கர)
(Mr. Prins Gunasekera)
උඩින් යනවා, ඔය කම්බි.

ගරු සී. පී. ද සිල්වා
(கௌரவ சி. பி. டி சில்வா)
(The Hon. C. P. de Silva)
ඒක ඉස්සෙල්ලා සවි කරන්නම්.

ප්‍රින්ස් ගුණසේකර මයා.
(திரு. பிறின்ஸ் குணசேக்கர)
(Mr. Prins Gunasekera)
අද අහසේ ජීවත් වන තමුන්නාන්සේ ලාව ළඟදීම මහා පොළවට පහත් කරනවා. තමුන්නාන්සේ කී අන්දමට විදුලි කම්බි ඒ ගම් උඩින් ඈතට යනවා ඇති. එහෙත් ඒ ගම්වලට නම් කණාමැදිරියකුගේ එළි යක් තරම් එළියක්වත් දීලා නැහැ.

ගරු සී. පී. ද සිල්වා
(கௌரவ சி. பி. டி சில்வா)
(The Hon. C. P. de Silva)
උඩින් යන කම්බිවලින් පහතට ගන්න ටයි, දෙවැනි යෝජනාව තිබෙන්නේ.

ප්‍රින්ස් ගුණසේකර මයා.
(திரு. பிறின்ஸ் குணசேக்கர)
(Mr. Prins Gunasekera)
ගරු ඇමතිතුමාගේ දෙවැනි යෝජනා වෙන් කියැවෙන කාරණය පිළිබඳව, මා හිතන හැටියට පසුගිය මාසයේදී, විදුලි දෙපාර්තමේන්තුව ගරු මන්ත්‍රීවරුන්ට චක්‍ර ලේඛයක් එවා තිබුනා. ගම්වලට විදුලි බලය දෙන්නට යනවාය කියා ඒ චක්‍ර ලේඛයේ බොහොම ලක්ෂණට විස්තර කර තිබුණා. ඒ චක්‍ර ලේඛය ලියා තිබුණු භාෂාව තරම් හොඳ භාෂාවෙන් උත්තර යක් ලියන්නට මට බැරි වුණත් ඊට ටිකක් කිට්ටු වන විධියට උත්තරයක් ලියා මා යැව්වා. අද අන්ධකාරයේ තිබෙන අපේ ගම්වලටත් පුළුවන් තරම් ඉක්මනින් ඇවිත්, ඒ දෙන්නට යන විදුලි ආලෝක යෙන් පොඩි ආලෝකයක්වත් ඒ ගම්වල ටත් උදා කර දෙන්නටය කියා මා ලියා යැව්ව. ඒ ලියුම් එව්වා පමණයි, එතැනින් එහාට අදවන තුරු ඒ සම්බන්ධයෙන් කිසිම පියවරක් අරගෙන නැහැ. ගම් 510 කට විදුලි බලය සැපයීම සඳහා මූලික වියදමක් හැටියට රුපියල් 70,00,000 ක ඇස්ත මේන්තුවක් ඉදිරිපත් කර තිබෙන දෙවැනි යෝජනාව යටතේ වූ වැඩ පිළි වෙළට මගේ ආසනයේ ගම් හත අටකුත් ඇතුළත් වී තිබෙන බව මා දැක්කා.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

**ගරු සී. පී. ද සිල්වා**
*(கௌரவ சி. பீ. டி சில்வா)*
(The Hon. C. P. de Silva)

මා කිව්ව ගම් හතළිහ 1960 ඒවා, අද ඒවා නොවෙයි. ඒ බව මන්ත්‍රීවරු දන්නවා.

**ප්‍රින්ස් ගුණසේකර මයා.**
*(திரு. பிறின்ஸ் குணசேக்கர)*
(Mr. Prins Gunasekera)

අළුත් ගම් කීපයකටත් දෙන්නට යන වාය කියායි, අපට කියා ඒවා තිබුනේ. පරණ ඒවා වගයක් ගැන නොවෙයි, ඒකෙ කියා තිබුනේ. ගරු ඇමතිතුමා කියන විධියට තවමත් විදුලි බලය ලැබී නැත්තේ 1960 දී ඉදිරිපත් කළ ලැයිස්තු වට මේ 1968 දී ඉදිරිපත් කළ ලැයිස්තුවට කවදා ආලෝකයක් කියා අපට සිතන්නට වත් බැහැ.

වාර්ෂික ආදායම, නැන්පත් කරන මුදලෙන් සියයට 12 කට වඩා අඩු නම්, ඒ ගම් මේ යෝජනා ක්‍රමවලට ඇතුලත් වන්නෙ නැත කියා ගරු ඇමතිතුමා කිව්වා. මා දන්නවා, මගේ ප්‍රදේශයෙ බොහොම යක් ගම්වලට විදුලි බලය සැපයීම සම්බන්ධයෙන් විදුලි බල දෙපාර්තමේන්තුව මගින් පරීක්ෂණ පවත්වා නැති බව. ගම්වලට විදුලි බලය සැපයීමෙන් සියයට පහ ලොවකට වැඩි ප්‍රමාණයක් ආදායම ලැබී ඇති බව වාර්තාවල සඳහන් වෙනවා.

**ගරු සී. පී. ද සිල්වා**
*(கௌரவ சி. பீ. டி சில்வா)*
(The Hon. C. P. de Silva)

ඒවා සේරම අරගන්නවා.

**ප්‍රින්ස් ගුණසේකර මයා.**
*(திரு. பிறின்ஸ் குணசேக்கர)*
(Mr. Prins Gunasekera)

අර ගන්නවාය කියන නමුත් අර ගත් ඒවායින් එක කනුවක්වත් සවි කළ තැනක් නැහැ.

**ගරු සී. පී. ද සිල්වා**
*(கௌரவ சி. பீ. டி சில்வா)*
(The Hon. C. P. de Silva)

කනු සිටුවන්න ඉදිරිපත් කර ඇති යෝජනා අනුමත කර මුදල් ලබාගන්න ඕනෑ. හබරදුව ආසනයේ ගම් ගණනාවක නම් මන්ත්‍රීතුමා සඳහන් කර තිබෙනවා. එයින් සමහරක් නම්, ඉමදුව, කතලුව, හීනටිගල, තල්පේ, මිහිරිපැන්න, දොරපේ අගුලුගහ—

**ප්‍රින්ස් ගුණසේකර මයා.**
*(திரு. பிறின்ஸ் குணசேக்கர)*
(Mr. Prins Gunasekera)

නමුත්නාන්සේ දන්නවා ඇති, ඉමදුව නගරයෙ විදුලි බලය ලබාගැනීමට කැමැත්ත පළකොට ඇති පාරිභෝගිකයින් ඒ සඳහා මුදල් තැන්පත් කොට සෑහෙන කලක් ගත වී ඇතත් ඒ අයට විදුලි එළිය සපයා නැති බව. එසේ වුණත් පෞද්ගලික ව්‍යාපාරිකයින්ට, සොයා ගන්න බැරි යයි කියන පරිවර්තක-ට්‍රාන්ස්ෆෝමර් සවි කොට විදුලි බලය සපයා දී තිබෙනවා. අහසෙ ඉහළ දුවන විදුලි බල කම්බිවලින් විදුලිය ලබාගෙන, පරිවර්තක සවි කොට නගරයෙ මැද්දෙ ඇති තේ පැක්ටරි තුන හතරකට විදුලි බලය සපයා දී තිබෙනවා. නමුත් මුළු නගරයම අද වනතුරුත් අන්ධකාරයෙ.

**ගරු සී. පී. ද සිල්වා**
*(கௌரவ சி. பீ. டி சில்வா)*
(The Hon. C. P. de Silva)

කර්මාන්තවලට විදුලි බලය සපයා තිබෙනවා.

**ප්‍රින්ස් ගුණසේකර මයා.**
*(திரு. பிறின்ஸ் குணசேக்கர)*
(Mr. Prins Gunasekera)

නගරයෙ පාරිභෝගිකයින් ඉන්නවා, විදුලි බලය ලබාගැනීමේ අපේක්ෂාවෙන්. හබරාදුව ප්‍රදේශය දියුණු වන්න නම් විදුලි බලය ලබාදීම අත්‍යවශ්‍යයි. ඉමදුව නගර යත් බොහොම ඉඩකඩ තිබෙන නගරයක් විශාල කඩපොලක් තිබෙනවා. නගරය විශාල වුණත් විදුලි බලය නොමැති කම නිසා සවස හය පසුවන විට නගරයට යන්න බැහැ. තේ පැක්ටරියට නගරයේ සිට දුර යාර හාර සියයක් නැහැ. ආණ්ඩුවෙන් සපයන විදුලි බලයෙනුයි එම පැක්ටරිය වැඩ කෙරෙන්නෙ. එහෙම නම්, පරිවර්තකයක් සපයා එතැනට විදුලි බලය දෙන්න පුළුවන් නම්, නගරයට විදුලි

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[ප්‍රින්ස් ගුණසේකර මයා.]

බලය ඒ අන්දමින්ම සපයන්නට බැරි මන්ද කියා තමුන්නාන්සේගෙන් ප්‍රශ්න කරන්න කැමතියි.

**ගරු සී. පී. ද සිල්වා**
*(கௌரவ சி. பி. டி சில்வா)*
(The Hon. C. P. de Silva)

ඒක කරන්න තමයි යෝජනා ඉදිරිපත් කර තිබෙන්නෙ.

**ප්‍රින්ස් ගුණසේකර මයා.**
*(திரு. பிறின்ஸ் குணசேக்கர)*
(Mr. Prins Gunasekera)

මුදල් නැන්පත් කර අවුරුදු තුනක් ගත වී තිබුණත් තවමත් විදුලි බලය සපයන්න හැකි වුණේ නැහැ. මා මෙයට කලිනුත් කීවා වාගේ, ඇමතිතුමාට විදුලි බලය මෙන් වේගයෙන් වැඩ කරන්න බැරි නම්, අඩු ගණනෙ බරකරත්ත වේගයෙන් වත් වැඩ කරන්න බැරි මන්ද කියා දැනගන්න කැමතියි. මුදල් තැන්පත් කර අවුරුදු තුනක් තිස්සේ බලා සිටිනවා. මේකද සංවර්ධනය කියන්නෙ? විදුලි බලය ගෙන යන්නට යොදවා ඇති මේ මළකඩ කෑ පරණ කම්බිය ඉවත් කරන්න, පරණ වයරය වෙනස් කරන්න, සිදු වී තිබෙනවා. මේ පරණ කම්බියෙන් විදුලි බලය ගෙන යන්න බැහැ. ගරු ඉඩම්, වාරිමාර්ග සහ විදුලි බලය පිළිබඳ ඇමතිතුමා කෙරෙහි පෞද්ගලිකව නගන චෝදනාවක් නොවෙයි මෙය. මළකඩ කෑ පරණ කම්බියක් යොදවා මුළු රටටම විදුලි බලය දෙන්න පුළුවන්කමක් නැහැ. තමුන්නාන්සේ යෝජනා කර ඇති අන්දමට ගිය අවුරුද්දේ ලබාගන්නා ලද ලාභයෙන්—රුපියල් අසූනව ලක්ෂයෙන්—රුපියල් හැත්තෑ ලක්ෂයක් වෙන් කරවා ගෙන මේ වැඩ කටයුතු පටන් ගන්න යනවා නම් මේ ගරු සභාවෙ දෙපැත්තේම සිටින මන්ත්‍රීවරුන් බොහොම කැමැත්තෙන් එම මුදල් අනුමත කරනවා ඇති. නමුත් අප දෙපක්ෂයේම මන්ත්‍රීන් තුළ පවත්නා සැකය නම්, මෙම මුදල් වියදම් කර කවදා එළිය දකින්නට ලැබේවිද කියන කාරණය ගැනයි.

ගරු කථානායකතුමනි, මට මතකයි ගිය අවුරුද්දේදීත් පාර්ලිමේන්තුව තුළ පැවති මෙබඳු විවාදයකදී දෙපාර්තමේන්තුවෙ ඇති අඩුපාඩුකම් රාශියක් ගැන ගරු මන්ත්‍රීවරුන් සඳහන් කළ බව. වෙනෙකක් තබා අවුරුදු ගණනාවකට පෙර අහස ඉහළින් කම්බි ඇදීමට, කම්බි ගමන් ගන්නා මාර්ගය අවට තිබුණු ගස් කපා දැමූ නමුත් අද වනතුරු ඇතැම් අයට කැපූ ගස් වෙනුවෙන් වන්දි මුදල් ගෙවා නැහැ. ඒ පිළිබඳව පැමිණිලි රාශියක් ලැබී තිබෙනවා. ඔබතුමාට මතක ඇති පසුගිය දවස්වල මා මෙම කාරණය ගැන ගරු සභාවේදී ප්‍රශ්නයක් මතු කළ බව. මා හොඳින්ම දන්නවා, සමහර පළාත්වල කැපූ ගස්වලට දෙපාර්තමේන්තුව මගින් අද වනතුරුත් මුදල් ගෙවා නැති බව.

ආරාවුලක් තිබෙනවාය, ඉල්ලුම්කරුවන් දෙදෙනකු ඉදිරිපත් වුණාය යනාදී වශයෙන් මොකක් නමුත් දෙයක් දෙපාර්තමේන්තුව තමන්ගේ නිදහසට කියාවි. අයිතිය පිළිබඳ ප්‍රශ්නයක් නිරාකරණය කරන්නට අවුරුදු තුනක් අවශ්‍ය නැහැ. දිස්ත්‍රික් උසාවියට ඉදිරිපත් කළ නඩුවක් වැනි දෙයක් නොවෙයි මෙය. සමහර උසාවිවල අවුරුදු හත අටක් ගිහිල්ලත් ඇහෙන්නෙ නැති නඩු තිබෙනවා. එහෙත් ගහක් පිළිබඳ අයිතිය විසඳා ගැනීමට දෙපාර්තමේන්තුවට අවුරුදු ගණනාවක් ගතවිය යුතු නැහැ. අයිතිය පිළිබඳ ප්‍රශ්නය ළඟට තක්සේරුව පිළිබඳ ප්‍රශ්නයත් එනවා. ඒ විධියට ගොළුබෙලි වේගයෙන් තමයි වැඩ කෙරෙන්නේ. තමන්ගේ පළාත් පාලන ආයතනයට අයත් ප්‍රදේශයේ සිටින පාරිභෝගිකයන්ට විදුලි බලය සැපයීමට උනන්දුවක් දක්වන අය ඒ සඳහා අවශ්‍ය පියවර ගන්නැයි කරන ඉල්ලීමකට ගාල්ලේ කන්තෝරුවෙන් බොහෝ විට පිළිතුරක් පවා ලැබෙන්නේ මාස ගණනක් ගත වුණාට පස්සේ.

මා නියෝජනය කරන ප්‍රදේශයේ අලුත් යෝජනා ක්‍රමයට ඇතුළත් වූ ගම් පිළිබඳව ඇති වූ තත්ත්වය මට මතකයි. මේ පාර්ලිමේන්තුව පටන් ගත්තාට පසු මා පළමුවෙන්ම ගිය ආණ්ඩුවේ දෙපාර්තමේන්තුව විදුලි බල දෙපාර්තමේන්තුවයි. මා ගියේ ඒ ගම්වලට විදුලි බලය සපයන්නැයි කියනටයි. මගේ පළාතට ආලෝකයක් ලබා දෙන්නට ඕනෑයයි මා කල්පනා කළා. මා මැතිවරණයේදී තරඟ කළේ ආලෝකය පිළිබඳ සංකේතයක් මගේ මැතිවරණ සල

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

කුණ හැටියට පාවිච්චි කරමිනුයි. මගේ ලකුණ වූයේ ලාම්පුවයි. ලාම්පුවෙන් මගේ පළාතට ආලෝකයක් ගෙන එන්නෙමැයි මා එදා කියා සිටියා. ඒ අනුව, විදුලි බලය ලබා දීම වඩාත් උචිතයයි මා හිතුවා. අවුරුදු තුනකට ඉස්සර වෙලයි මා ගියේ. දෙපාර්තමේන්තුවේම තක්සේරු අනුව සියේට 19 ක් ලාභ උපදවන ප්‍රදේශයකටයි විදුලි එළිය ලබා දෙන ලෙස කියා සිටියේ. එහෙත් අද වන තුරු හොර ගහක් වත් හිටුවන්නට වළක් කපා නැහැ.

ක්‍රම තුන හතරකින් මෙම වැඩ කොටස කරන්නට පුළුවන්නැයි කිව්වා. මට ඒ කොයි ක්‍රමයෙන් නමුත් වුවමනා කළේ වැඩේ කෙරෙන්නටයි. ඒ නිසා මොන ක්‍රමයෙන් හෝ වැඩේ කර දෙන්නැයි මා කියා සිටියා. කතලුව ගම්කාර්ය සභාව ගැනයි මා කියන්නේ. පාරිභෝගිකයින් එකතුවෙලා මුදල් තැන්පත් කරන ක්‍රමයට හෝ ලබා දෙන ලෙස මා ඉල්ලුවා. එයිනුත් දුන්නේ නැහැ. ඒ නිසා මොකක්ද වේලා තියෙන්නේ කියා ගරු ඇමතිතුමා කරුණා කර සොයා බලන්න. මුදලුත් ගෙවා විදුලි බලය ලබා ගන්නා බලාපොරොත්තුවෙන් ඉන්නවා. එහෙත් දෙපාර්තමේන්තුවේ තිබෙන සෝමාරි ගතිය නිසා කිසිම දෙයක් ඉටු වී නැහැ. Local Loans and Development Fund නමින් හඳුන්වන දෙයිනුත් ලැබී නැහැ. වෙන ක්‍රමයිනුත් ලැබී නැහැ. පෞද්ගලික කර්මාන්තකාරයින්ට නම් විදුලි බලය සපයා ඉවරයි. මෙය සම්පූර්ණයෙන්ම වැරදි ප්‍රතිපත්තියක්. තමුන්නාන්සේලා පෞද්ගලික අංශයට උදවු කරනවාය කියනවා. මේ ගමටත් විදුලි බලය ලබාදෙන්නැයි මා කියනවා.

**ගරු සී. පී. ද සිල්වා**
*(கௌரவ சி. பி. டி சில்வா)*
(The Hon. C. P. de Silva)

ලැයිස්තුවේ තිබෙනවා කතලුව ආධාර ලබන එකක් හැටියට.

**ප්‍රින්ස් ගුණසේකර මයා.**
*(திரு. பிரின்ஸ் குணசேக்கர)*
(Mr. Prins Gunasekera)

අවුරුදු තුනක් තිස්සේ කිසිම දෙයක් කර නැහැ.

**ගරු සී. පී. ද සිල්වා**
*(கௌரவ சி. பி. டி சில்வா)*
(The Hon. C. P. de Silva)

තිස්තුන් දහේ කම්බි ඇවිල්ලා තියෙනවා.

**ප්‍රින්ස් ගුණසේකර මයා.**
*(திரு. பிரின்ஸ் குணசேக்கர)*
(Mr. Prins Gunasekera)

ඇවිල්ලා අවුරුදු දෙකකටත් වැඩියි. මේක තිස්තුන් කෝටියක් දෙවි දේවතාවුන්ටවත් කියලා ඉටු කර දෙන්න.

**ගරු සී. පී. ද සිල්වා**
*(கௌரவ சி. பி. டி சில்வா)*
(The Hon. C. P. de Silva)

දන් කරගෙන යනවා.

**ප්‍රින්ස් ගුණසේකර මයා.**
*(திரு. பிரின்ஸ் குணசேக்கர)*
(Mr. Prins Gunasekera)

එකක් නම් සිදු වී තිබෙනවා. කොහෙන්දෝ ගෙනා, හරියට වැඩ කරන්නට බැරි යන්ත්‍රයක් මඟින් කණා මැදිරි එළිය සපයන විදුලි බල මධ්‍යස්ථානයක් අහංගම සුළු නගර සභාව සතුව තිබෙනවා. කිලෝ වෝල්ට 33,000 කම්බි ඇද්දට පස්සේ, අහංගම සුළු නගර සභාවේ ඉතාමත් සීමාසහිත කොටසකට පරිවර්තක මඟින් විදුලි බලය සැපයුණු බව හැබැයි. එහෙත් කිලෝවෝට් 33,000 කම්බි යන ප්‍රදේශයක් තුළ ඇති අහංගම සුළු නගර සභාවට අයත් හැතැප්ම 1½ ක් නැත්නම් 2 ක් පමණ වන ප්‍රදේශයකට විදුලි බලය සැපැයීමෙන් පමණක් මේ රජය තෘප්තිමත් වෙනවා නම් එය රජයේ අදක්ෂකම එළිදරව් කිරීමක්. අඩුම තරමින්, අහංගම සුළු නගර සභා ප්‍රදේශය තුළ වෙසෙන, විදුලි බලය ඉල්ලුම් කරන්නන්ට විදුලි බලය ලබා දීම සඳහා උපකාර කරන්න. එම නගර සභා ප්‍රදේශයට සෑහෙන තරම් විදුලි බල ප්‍රමාණයක් සැපැයීමට රජය අපොහොසත් වී තිබීම ගැන ප්‍රශ්නයක් නැහැ. ඊට


Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[ප්‍රින්ස් ගුණසේකර මයා.]
හේතුව මොකක්ද? විදුලි බලය ඕනෑ තරම් තිබෙනවා. ප්‍රශ්නය වී තිබෙන්නේ, තිබෙන විදුලි බලය බෙදා හැරීමයි. ඒ සඳහා කටයුතු කරන්නට එම නගර සභාවට පුළුවන්කමක් නැත්තේ, එක්සත් ජාතික පාක්ෂික පාලනය යටතේ එය හොඳටම බංකොළොත් වී තිබෙන නිසායි.

**ගරු සී. පී. ද සිල්වා**
(கௌரவ சி. பி. டி சில்வா)
(The Hon. C. P. de Silva)
වී. සී. එක?

**ප්‍රින්ස් ගුණසේකර මයා.**
(திரு. பிரின்ஸ் குணசேக்கர)
(Mr. Prins Gunasekera)
නැහැ, වී. සී. එක. එම නගර සභාවේ කෙරුණු දූෂණ ක්‍රියා සම්බන්ධයෙන් එහි සභාපතිතුමාගෙන් කරුණු අසා යවා තිබෙන බව ආරංචියි. අඩු තරමින් මේ මුදල් වර්ෂය අවසානයේදීවත් මෙවැනි යෝජනාවක් නැවතත් ගෙනෙන්නට ඇමතිතුමාට සිදු වේ යැයි මා බලාපොරොත්තු වෙනවා.

**ගරු සී. පී. ද සිල්වා**
(கௌரவ சி. பி. டி சில்வா)
(The Hon. C. P. de Silva)
අය-වැය ලේඛන කාලයේදී—

**ප්‍රින්ස් ගුණසේකර මයා.**
(திரு. பிரின்ஸ் குணசேக்கர)
(Mr. Prins Gunasekera)
එදාටත් තමුන්නාන්සේ අද වාගේම සටහන් කර ගනීවි.

මේ කාරණයට අදාළ තවත් කරුණක් දෙකක් කියන්න කැමතියි. රජයේ විදුලි දෙපාර්තමේන්තුවට අළුත් කළමනාකරුවකු පත් වී සිටින බව ඊයේ පෙරේදා ප්‍රවෘත්ති පත්‍ර වාර්තාවක පළ වී තිබෙනවා මා දැක්කා. එය ඇත්තක්ද, නැත්තක්ද කියන්න මා දන්නේ නැහැ.

**ගරු සී. පී. ද සිල්වා**
(கௌரவ சி. பி. டி சில்வா)
(The Hon. C. P. de Silva)
කලින් හිටපු කළමනාකරුගේ වයස අවුරුදු හැට පැනලා.

**ප්‍රින්ස් ගුණසේකර මයා.**
(திரு. பிரின்ஸ் குணசேக்கர)
(Mr. Prins Gunasekera)
හැට පැන්න අය එළියට නොදමා ඒ තැන්වල තබා ගෙන සිටීම තමා වරද.

**ටී. බී. එම්. හේරත් මයා.**
(திரு. ரி. பி. எம். ஹேரத்)
(Mr. T. B. M. Herath)
පාර්ලිමේන්තුවේත්—

**ප්‍රින්ස් ගුණසේකර මයා.**
(திரு. பிரின்ஸ் குணசேக்கர)
(Mr. Prins Gunasekera)
තමුන්නාන්සේගේ කථාවේදී ඒ ගැන කියන්න පුළුවන් නොවැ?

විදුලි දෙපාර්තමේන්තුවේ අළුත් කළමනාකාර මහතා ලවාවත්, නිදි මත නැති කර ඩිංගක් අත ඉක්මන් කර වැඩ කරවා ගන්න ඇමතිතුමා උනන්දු වෙනවා නම් හොඳයි. තවමත් මේ රට පවතින්නේ, විදුලි බල සංවර්ධන කටයුතු පිළිබඳ මූලික අවස්ථාවකයි. වෙනත් වචනවලින් කියනවා නම්, තව අවුරුදු 50ක් 60ක් යන තුරු මේ රටේ විදුලි බල සංවර්ධන කටයුතු සඳහා පුහුණු, පළපුරුදු කම්කරුවන් යෙදවීමට ඕනෑ තරම් ඉඩකඩ තිබෙනවා. එහෙත් විදුලිබල අමාත්‍යාංශයත්, දෙපාර්තමේන්තුවත් අද ගෙන යන ප්‍රතිපත්තිය නිසා සිදු වී තිබෙන්නේ මොකක්ද?

යම්කිසි ගමකට නැත්නම් ගම් තුන හතරකට විදුලි බලය සැපයීම සඳහා අවශ්‍ය වැඩ කටයුතු වෙනුවෙන් තාවකාලික සේවකයන් බඳවා ගන්නවා. කණු හිටවා, කම්බි ඇද ඒ ගම්වලට විදුලි බලය සපයන්න අවුරුදු 2ක් නැත්නම් 3ක් විතර යනවා. මේ අවුරුදු දෙක හෝ තුන අවසානයේ දෙපාර්තමේන්තුව කරන්නේ කුමක්ද? විදුලි බල කටයුතු සම්බන්ධව අවුරුදු දෙක තුනක පුහුණුවක් ලැබූ ඒ කම්කරුවන් සියලු දෙනාම ඒ ගමේ වැඩ අවසාන වූ පසු තාවකාලික කම්කරුවන් වශයෙන් සලකා අස් කර දමනවා එය සම්පූර්ණයෙන්ම වැරදි වැඩක්. අවුරුදු දෙක තුනක් දෙපාර්තමේන්තුවේ පරීක්ෂකවරුන්, නිලධාරීන් හා කාර්මිකයින්ගේ පරීක්ෂාව යටතේ ඔවුන්ගේ අත යට වැඩ කර, කණු

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

සිටුවීම, කම්බි ඇදීම, විදුලි බලය සැපයීම ආදිය පිළිබඳව හොඳ පුහුණුවක් ලැබූ ඒ කම්කරු රොත්තම යම් ගමකට විදුලි බලය සැපයීමේ කටයුතු අවසාන වූ හැටියේම අස් කර දමනවා. එය වැරදි වැඩක්. විදුලි බලය සැපයිය යුතු තවත් ගම් කීපයක්ම ලංකාවේ තිබෙනවා. තවත් ගම් 510 කට පමණ විදුලි බලය සැපයීමට ගරු ඇමතිතුමාගේ යෝජනාවකුත් තිබෙනවා. එසේ තිබියදීත් අවුරුදු දෙක තුනක පුහුණුවක් විදුලි බලය සැපයීමේ කටයුතු සම්බන්ධව ලැබූ කම්කරුවන් මේ අන්දමට අස් කරන්නේ ඇයි? එය ජාතික පාඩුවක් නේද? එම කම්කරුවන්ගෙන් සීමිත ප්‍රමාණයක් වැඩ ගත් හැටියේ ඔවුන් අස් කර තවත් ගමකට විදුලි බලය සපයන විට ඒ ගමින් අලුතින් සේවකයින් බඳවා ගන්නවා.

මාස 6 කට වැඩි කාලයක් තාවකාලිකව වැඩ කළොත් ඔවුන් අස් කළ නොහැකියි කියා රජයේ නියමයක් තිබෙනවා. මේ දෙපාර්තමේන්තුව ඒ නීතියෙන් රිංගනවා. මාස 5 සති 3 ක් වැඩ කළාට පසු ඔවුන් අස් කර දවස් දෙක තුනකින් නැවත සේවයට බඳවා ගන්නවා. රජයේ සේවයෙන් මාස 6 කට වැඩි අඛණ්ඩ සේවයක් තිබුණොත් අස් කරන්න බැරිය කියා රජයෙන් පැනවූ නීතියක් තිබෙනවා. අර ඇමෙරිකන් "හයර් ඇන්ඩ් ෆයර්" ක්‍රමයට ගන්නවා, අස් කරනවා. 6 මාසයක් වැඩ කළොත් අර අයිතිවාසිකම ලැබෙන නිසා මාස පහකුත් දවස් කීපයක් වැඩ අර ගෙන සේවයෙන් අස් කර නැවත බඳවා ගන්නවා. එසේ කර එම ගමේ වැඩ නිම වූ පසු සේවයෙන් සම්පූර්ණයෙන්ම අස් කරනවා. විදුලි බලය සඳහා ඕනෑ තරම් ඉඩකඩ තිබෙන මෙවැනි රටක මෙය ජාතික ප්‍රශ්නයක් වශයෙන් සලකන්නට ඕනෑ. ඒ නිසා මේ විදුලි බල කටයුතු සඳහා බඳවා ගන්නා අය ස්ථිර සේවකයින් හැටියට බඳවා ගන්න. ගරු ඇමතිතුමා යෝජනා කර ඇති විදුලි බල සංයුක්ත මණ්ඩලය පිහිටුවීමේදී මේ ප්‍රශ්නය ගැන කල්පනා කර සුදුසු පරිදි කටයුතු කරනවා ඇත කියා අපි බලාපොරොත්තු වෙනවා.

ගරු කථානායකතුමනි, ගරු ඉඩම් ඇමතිතුමා ඉල්ලන මුදල් අපි සන්තෝෂයෙන් අනුමත කරනවා. [බාධාකිරීමක්] මෙහෙම දේවල් තමුන්නාන්සේලාට කියලත් වැඩක් නැහැ නේද? අපේ ප්‍රාර්ථනාව මීළඟ අවුරුද්දේදී මෙවැනි පැමිණිලි කරන්නට අපට අවස්ථාවක් නොලැබේවා කියන එකයි.

අ. භා. 3.22

**ටී. බී. එම්. හේරත් මයා.**

*(திரு. ரி. பி. எம். ஹேரத்)*

(Mr. T. B. M. Herath)

ගරු කථානායකතුමනි, ගරු ඉඩම්, වාරිමාර්ග සහ විදුලිබල ඇමතිතුමා යෝජනා දෙකක් අප හමුවේ තබා තිබෙනවා. එකක් රජයේ විදුලි බල දෙපාර්තමේන්තුවෙන් ලැබී ඇති ලාභය ඒ විදුලි බල දෙපාර්තමේන්තුවේ සංවර්ධනය සඳහා සංචිතයක් වශයෙන්—තැන්පත් මුදලක් වශයෙන්—එම දෙපාර්තමේන්තුවට හැරවීමට ගෙනැවිත් ඇති යෝජනාවක්. අනික ගම්බද විදුලි බල යෝජනා ක්‍රම වඩ වඩාත් සංවර්ධනය කිරීම සඳහා මුදල් ඉල්ලීමේ යෝජනාවයි. ඔය යෝජනා දෙක එතුමා මේ ගරු සභාවට ඉදිරිපත් කර තිබෙනවා. අහසින් කම්බි ගමන් කළ පමණින් විදුලි බල දෙපාර්තමේන්තුවට ආදායම් ලැබීමක් හෝ එම ප්‍රදේශවලට සේවයක් සිදුවීමක් හෝ නොවන බව අවුරුදු හත අටක් තිස්සේ නොයෙක් වර ඒ පැත්තේ සිට ගෙනත් මේ පැත්තේ සිට ගෙනත් අපි පෙන්වා දී තිබෙනවා; පැහැදිලි කර දී තිබෙනවා. දැනට ස්වල්ප වේලාවකට පෙර ගරු සභානායකතුමා ගම්වල නම් ලැයිස්තුවක් කියෙව්වා. ලංකාවේ ඉතාමත්ම නොදියුණු ප්‍රදේශයක් වූ වලපනේ කොට්ඨාශයේ එක ගමක්වත් ගරු සභානායකතුමා කියැවූ ඒ ලැයිස්තුවට ඇතුළත් නොවීම ගැන මා කනගාටු වෙනවා. උඩරට ගම්බද ප්‍රදේශවල ගැමි ජනතාවගේ අයිතිවාසිකම් සහ ඒ ප්‍රදේශයේ සංවර්ධන කටයුතු, පත් කරන ලද මන්ත්‍රී අන්නමලේ මහතාට භාර දී තිබෙන ආණ්ඩුවකින් බලාපොරොත්තු විය හැකි දෙයක් ඒ ජනතාවට නැහැ. ඔවුන්ගේ බලාපොරොත්තු සුන් වී තිබෙන බව සාමාන්‍ය ඇත්තක් වශයෙන් මෙම ගරු සභාවට මතක් කරන්නට කැමතියි.

ගරු කථානායකතුමනි, ලක්ෂපානින් හෝ වේවා, ගල්ඔයෙන් හෝ වේවා වෙනත් සංවර්ධන ව්‍යාපාරයකින් හෝ

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[පී. බී. එම්. හේරත් මයා.]

වේවා විදුලි බලය නිපදවීමට යම් රජයක් කල්පනා කළා නම් යම් පුද්ගලයකු කල්පනා කළා නම් ඒ රජය නැත්නම් ඒ පුද්ගලයා අදහස් කෙළේ විදුලි බලය නිපදවා ඒවා කම්බි දිගේ නැත්නම් අවුවල ගබඩා කර නැබීම නොව හැකි තරම් දුරට ඒවා බෙදා හැරීමයි හැකි තරම් දුරට විදුලි බලය බෙදා හැර රටේ සංවර්ධන කටයුතුවලට උදව් දෙන අතර හා ජනතාවට පහසුවක් සලසන අතර සැහෙන ධනයක් උපයා ගැනීම මෙහි නිර්මාතෘවරුන්ගේ අදහස වුණත් අද ඒ අදහස ඉෂ්ට වෙනවාද? රට ස්වයංපෝෂිත කිරීම සඳහා, ජනතාවට පහසුවක් සැලසීම සඳහා ශක්තිමත් විදුලි බල මධ්‍යස්ථාන මේ රටේ ඇති කළ ඒ නිර්මාතෘවරුන්ට ජනතාවගේ ගෞරවය හිමි විය යුතුයි. එහෙත් අද සිදු වන්නේ මොකක්ද? නිපදවනු ලබන විදුලි බලය ගබඩා කර තබා ගැනීමයි. නිපදවනු ලබන විදුලි බලය රටේ සංවර්ධන කටයුතුවලට යොදවන්නේ නැතිව, ගබඩා කර තබා ගන්නවා නම් ඉන් ඇති ප්‍රයෝජනය කුමක්ද? විදුලි බලය බෙදා හැරීම සම්බන්ධයෙන් අනුගමනය කරන ගොළුබෙලි ප්‍රතිපත්තිය අනුමත කරන්නට මේ රටේ ජනතාව සූදානම් නැහැ. එක අතකින් විදුලි බලය උපයෝගි කර ගනිමින් රටේ සංවර්ධන කටයුතු වඩ වඩාත් වේගයෙන් ක්‍රියාත්මක කළයුතු අතර අනෙක් අතින් විදුලි බලය නිපදවීම සඳහා යොදවන ලද මහජනතාවගේ ධනය හැකි තරම් ඉක්මනින් ආපසු ලබා දීමට ක්‍රියා කළ යුතුයි. මෙම න්‍යාය පිළිබඳව මේ ප්‍රතිපත්තිය පිළිබඳව පසුගිය අවුරුද්දේදීත් ඊට පෙර අවුරුදුවලදීත් මෙම ගරු සභාවේදී සඳහන් කරන ලද නමුත් තවමත් අපේ විදුලිබල ඇමතිතුමා ගමන් කරන්නේ පරණ ගොළුබෙලි පිළිවෙත අනුවම බව කියන්නට සිදු වීම ගැන කනගාටු වෙනවා.

මා නියෝජනය කරන වලපනේ කොට්ඨාශය උඩින් විදුලි කම්බි ගමන් කරනවා. එහෙත් ඒ කම්බි යට ජීවත් වන අයට විදුලි බලය ලැබෙන්නේ නැහැ. තේ කර්මාන්ත ශාලාවලට නම් ඕනෑ වේලාවක විදුලි බලය ලබා ගන්නට පුළුවනි. එහෙත් ගම්බද ජනතාවට විදුලි බලය ලබා දෙනවා තබා විදුලි බලය ලබා ගැනීම සම්බන්ධයෙන් ඉදිරිපත් කරන යෝජනාවලට පිළිතුරු ලබා ගැනීම පවා ඉතාමත්ම අමාරුයි. අද මේ විධියට කථා කළාම නව මාසයකින් පමණ අසත්‍ය පිළිතුරක් මගේ නමට තැපෑලෙන් ලැබේවි. සිරිතක් වශයෙන් ඒ විධියට සිදු වෙනවා. එහෙත් අපට වවුමනා කරන්නේ මොකක් හෝ පිළිතුරක් දී බේරෙන්නට නැත් කරන විදුලි දෙපාර්තමේන්තුවක් නොව කාර්යයන් ඉෂ්ට කරන විදුලි දෙපාර්තමේන්තුවක්. පළාත් පාලන දෙපාර්තමේන්තුවට පින් සිදු වන්නට, ගරු මුදල් ඇමතිතුමා විසින් පළාත් පාලන දෙපාතර්මේන්තුවට දෙනු ලබන ණය මුදල්වලට පින් සිදු වන්නට මා නියෝජනය කරන කොට්ඨාශයේ රාගල හා උඩපුස්සැල්ලාව යන නගර දෙකට විදුලි බලය ලැබෙනවා. එහෙත් නොදියුණු වලපනේ නගරයට හෝ එහි වෙනත් ප්‍රදේශයකට හෝ ගැමි යෝජනා ක්‍රම යටතේ විදුලි බලය ලබා දීම සඳහා පිළිගත හැකි කිසිම යෝජනාවක් අද දක්වා ඉදිරිපත් නොකර තිබීම ගැන ප්‍රදේශයේ මන්ත්‍රීවරයා වශයෙන් මගේ කනගාව ප්‍රකාශ කරන්නට ඕනෑ. නුවර එළිය දිස්ත්‍රික් සම්බන්ධීකරන කොමිටිය මගින් 1961, 1962 අවුරුදුවලදී එම දිස්ත්‍රික්කයේ වැඩ කටයුතු පිළිබඳ ප්‍රමුඛතා ලේඛනයේ පළමුවන අංකය හැටියට නිල්දණ්ඩාහින්න සහ හරස්බැද්ද යන නගර දෙක ඒකාබද්ධ කිරීම පිළිබඳ යෝජනාවක් ඇතුළත් කළා. අද වන තුරු ඒ පිළිබඳව යමක් කෙරී නැහැ. පාඩු විදින බව නිතරම කියනවා. එහෙත් නිල්දණ්ඩාහින්න සහ හරස්බැද්ද නගර දෙකට උඩින් මුල්හල්කැලේ වැනි වතු අයිතිකාර ධනපතියන්ගේ තේ fපැක්ටරිවලට විදුලි බලය සපයන්නට නම් ඇමතිතුමාට කිසිම පාඩුවක් සිදු වන බවක් පෙනෙන්නේ නැහැ. පාරිභෝගිකයන් සිය ගණනක් විදුලි බලය ඉල්ලන විට එය ලබා දෙන්නට ගියාම තමයි පාඩු සිදු වන්නේ. එක පාරිභෝගිකයකුට විදුලි බලය සැපයීම සඳහා සැතපුම් 10, 15 දුර අළුතින් කම්බි ගෙන යන්නට ඇමතිතුමාටත් විදුලි බල දෙපාර්තමේන්තුවටත් පුළුවනි. මෙවැනි කටයුතුවලදී අපේ සම්පූර්ණ විරුද්ධත්වය ප්‍රකාශ කළයුතුයි. තේ fපැක්ටරියකට වඩාත් කාර්යක්ෂම ලෙස සහ වඩාත් හොඳින් වැඩ කරන්නට සහාය දී වඩා හොඳ තේ නිපදවා ඒ මගින් වැඩිමනත්

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

ආදායමක් ලබා දෙනවාට අපේ කිසිම විරුද්ධතාවයක් නැහැ. එහෙත් එම ෆැක්ටරිය දක්වා වැටී ඇති කම්බි මාර්ගය යට ජීවත් වන සිය දහස් ගණන් පාරිභෝගිකයන්ට ඔවුන්ගේම සල්ලිවලින් විදුලි බලය ලබා දෙන්නට යාමේදී විදුලි බල දෙපාර්තමේන්තුව විරුද්ධතාවයක් දක්වනවා නම් එම ප්‍රතිපත්තියට විරුද්ධව මෙම සභාව ඉදිරියෙහි මෙතෙක් අප විසින් දක්වන ලද කිසිම විරුද්ධතාවයක් හෝ කිසිම අදහසක් පිලි නොගැනීම පිළිබඳව අපගේ බලවත් කනගාටුව මෙහිලා ප්‍රකාශ කිරීම මගේ යුතුකමයි.

මුල්හල්කැලේ ආරෝග්‍ය ශාලාවට විදුලි බලය ලබා දී තිබෙනවා. එහි සිට දම්වැල් 2ක් දුරින් පිහිටි වතුමුල්ල නගරයට විදුලි බලය ලබා දෙන්නට විදුලි දෙපාර්තමේන්තුව සූදානම් නැහැ. මතුරට ආරෝග්‍යශාලාවට විදුලිබලය ලබා දී තිබෙනවා. ඒවාගේම මතුරට පොලීසියටත් විදුලි බලය ලබා දී තිබෙනවා. මතුරට ආරෝග්‍යශාලාවටත් මතුරට පොලීසියටත් අතර පිහිටි මතුරට නගරයට විදුලි බලය ලබා දෙන්නට සූදානම් නැහැ. පළාත් පාලන දෙපාර්තමේන්තුවෙන් මතුරට නගරයට විදුලි බලය ඉල්ලා සිටින්නය කියනවා.

**ගරු සී. පී. ද සිල්වා**
*(கௌரவ சி. பீ. டி சில்வா)*
**(The Hon. C. P. de Silva)**

එම ආරෝග්‍යශාලාවටයි පොලීසියටයි විදුලි බලය සපයන්නේ එතන තියෙන එන්ජින්වලින් ද?

**ටී. බී. එම්. හේරත් මයා.**
*(திரு. ரி. பி. எம். ஹேரத்)*
**(Mr. T. B. M. Herath)**

නැහැ. අද නිල්දණ්ඩාහින්න කළුවරේ. අද වතුමුල්ල කළුවරේ. වතුමුල්ලට දම්වැල් 2 ක් පමණ එහායින් විදුලි බලය තිබෙනවා. මුල්හල්කැලේ ආරෝග්‍යශාලාවටත් මුල්හල්කැලේ වත්තේ තේ ෆැක්ටරියටත් විදුලි බලය තිබෙනවා. මතුරට නගරය කළුවරේ තිබෙන නමුත් එම නගරයට යාබදව ඇති පොලීසියට විදුලි බලය තිබෙනවා. ආරෝග්‍යශාලාවටත් විදුලි බලය තිබෙනවා. ඒ දෙක අතර තිබෙන නගරයට අවශ්‍ය කරන විදුලි බලය ලබා ගන්නට කියන්නේ කොහොමද? පළාත් පාලන දෙපාර්තමේන්තුවෙන් ණය මුදලක් අරගෙන සියයට කියක්ද පොලියත් ගෙවලා එම ණය මුදල මාර්ගයෙන් මතුරට නගරයට විදුලි බලය සපයා ගන්නට කියනවා.

**ගරු සී. පී. ද සිල්වා**
*(கௌரவ சி. பீ. டி சில்வா)*
**(The Hon. C. P. de Silva)**

මා ඒ ගැන බලන්නම්.

**ටී. බී. එම්. හේරත් මයා.**
*(திரு. ரி. பி. எம். ஹேரத்)*
**(Mr. T. B. M. Herath)**

රජය මගින් කෙළින්ම මෙම කටයුත්ත කරන්නට පුළුවන්කම තිබියදී එය නොකර ආණ්ඩුවේ සංවර්ධන අරමුදලින් ණයක් දීලා පළාත් පාලන ආයතනයක් මගින් ඒකට පොලියත් අය කර ගනිමින් වෙනත් ක්‍රමයකට විදුලි බලය සපයා දී වුවමනාවට වඩා මහජනතාව ලවා මුදල් වැය කර වන්නට සූදානම් වන්නේ මන්දැයි මා ප්‍රශ්න කරනවා. එයින් වන්නේ මහජනතාවට විදුලි බලය එපා වීමයි. විදුලි බලය සඳහා වැඩිපුර වැය කරන විට මහජනතාවට එය එපා වෙනවා. අපේ පැරණි විදුලි බල නිර්මාතෘවරුන් කවුරුන් හෝ වේවා මෙම වැඩ පිළිවෙලවල් ආරම්භ කළේ. කුමන පරමාර්ථයක් ඇතුවද? කිලෝවොට් ගණන් ආදිය විදුලි බල වාර්තාවල සටහන් කර කර සිටීමට නොවෙයි; විදුලි බලය හැකි පමණ රට තුල බෙදා හැර එමගින් රට සංවර්ධනය කිරීමේ පරම පවිත්‍ර චේතනාවෙනුයි. දැන් කිලෝවොට් 33,000 කම්බි උඩින් අදිනවා. ඒ කම්බිවලට යටින් ජීවත් වන මිනිසුන් කළුවරෙයි ඉන්නේ. මොකක්ද මේකේ තේරුම? මීට ප්‍රථම වතාවකත් මා මෙම ප්‍රශ්නය නැගුවා. මගේ ඒ ප්‍රශ්නයට පිළිතුරු වශයෙන් මට දැන්වූයේ, "ගරු මන්ත්‍රීතුමා කී කථාව වැරදියි, මන්ත්‍රීතුමාගේ කොට්ඨාශයේ රාගල, හරස්බැද්ද, මතුරට, රිකිල්ලගස් කඩ හරහා දැන් මහනුවරටත් කම්බි ඇද අවසානයි" යන බවයි. කම්බි ඇද අවසාන බව ඇත්ත. එහෙත්, ඒ කම්බි යට සිටින මිනිසුන් ජීවත් වන්නේ කළුවරේ. හැතැප්ම 61 ක ප්‍රදේශයේ මිනිසුන් සිටින්නේ කළුවරේ. කම්බි නම් රට පුරාම අදිනවා.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

**ගරු එන්. එච්. ඒ. එම්. කරුණාරත්න (සමාජ සේවා ඇමති)**
*(கௌரவ என். எச். ஏ. எம். கருணாரத்ன) —சமூக சேவை அமைச்சர்)*
(The Hon. N. H. A. M. Karunaratne—Minister of Social Services)

ඒ අයටත් දෙමු.

**ටී. බී. එම්. හේරත් මයා.**
*(திரு. ரி. பி. எம். ஹேரத்)*
(Mr. T. B. M. Herath)

තමුන්නාන්සේ විදුලිබල ඇමති වුණා නම්, "දෙමු" කිව්වොත් දෙන බව මා දන්නවා. එහෙත්, දැන් සිටින විදුලිබල ඇමතිතුමා 1960 සිටම "දෙනවා" කියනවා. දැන් 1967 ත් ඉවරයි. තවම දුන්නේ නැහැ. ගරු සමාජ සේවා කටයුතු පිළිබඳ ඇමතිතුමා විදුලිබල ඇමතිතුමාට වඩා කම්බි ගැන දැනීමක් තිබෙන කෙනකු බව මා හොඳාකාරම දන්නවා.

**ගරු වන්නිනායක**
*(கௌரவ வன்னிநாயக்க)*
(The Hon. Wanninayake)

මොන කම්බිද ?

**ටී. බී. එම්. හේරත් මයා.**
*(திரு. ரி. பி. எம். ஹேரத்)*
(Mr. T. B. M. Herath)

අප දෙදෙනා මිත්‍රයන් නිසා ඒවා වැඩිපුර විග්‍රහ කරන්නට මා සූදානම් වන්නේ නැහැ.

**ගරු මන්ත්‍රීවරයෙක්**
*(கௌரவ அங்கத்தவர் ஒருவர்)*
(An hon. Member)

කවු කම්බි.

**ටී. බී. එම්. හේරත් මයා.**
*(திரு. ரி. பி. எம். ஹேரத்)*
(Mr. T. B. M. Herath)

ඔව්. නොයෙක් වර්ගයේ කම්බි තිබෙනවා. අපට වුවමනා කරන්නේ, ගස් කොළත් කපා දමා කඳු උඩින් කම්බි ඇද විදුලිබල මාර්ග ඉදි කිරීම පමණක් නොවෙයි. කම්බි ඇදගෙන යන ගමන්ම ඒ ඒ ප්‍රදේශවල ජනතාවට විදුලි එළිය ලබා දීමටත් මහන්සි ගන්නට ඕනෑ. අපට වුවමනා කරන්නේ ඒයයි. ග්‍රාමීය විදුලි බල ක්‍රමය යටතේ, හඟුරන්කෙතට, රිකිල්ලගස්කඩට, පදියපැලැල්ලට, මතුරටට, වතුමුල්ලට, නිල්දණ්ඩාහින්නට, හරස්බැද්දට විදුලි බලය දෙන්නට තමුන්නාන්සේට බැරි ඇයි ? මේ විදුලිබල කම්බි යන්නේ ඒ ගම් උඩින් නේද ? ධනපතියකුගේ තේ ෆැක්ටරියකට විදුලි බලය ඉල්ලුවොත් තමුන්නාන්සේ කිසිම කථාවක් නැතිව එය පටස් ගාලා දෙනවා. [බාධා කිරීමක්] අක්මීමන ගරු මන්ත්‍රීතුමා (සුගතදාස අරඹවල මයා.) මොනා කිව්වත් එතුමා යුක්තිසහගත පැත්තේ මිස අයුක්තිය පැත්තේ නොවන බව මා දන්න නිසා එතුමාගේ කීම් ගැන මා වැඩි සැලකිල්ලක් දක්වන්නේ නැහැ.

කථානායකතුමනි, අප පසුගිය දා රජරටට ගියා. කැලේ මැදින් විදුලිබල කම්බි ඇද තිබෙන හැටි එහිදී අප දැක්කා. එහි තිබුණු තේක්ක, බුරුත, හල්මිල්ල ආදී ගස් කපා දමා, හරි කෙළින් විදුලි බල කම්බි ඇද තිබෙනවා.

**ගරු එන්. එච්. ඒ. එම්. කරුණාරත්න**
*(கௌரவ என். எச். ஏ. எம். கருணாரத்ன)*
(The Hon. N. H. A. M. Karunaratne)

ඇදේට කම්බි අදින්න බැහැනේ.

**ටී. බී. ම්. හේරත් මයා.**
*(திரு. ரி. பி. எம். ஹேரத்)*
(Mr. T. B. M. Herath)

ඇදේට යන්න එපා. ඒක හරි නැහැ. කම්බි නම් හරි කෙළින් ඇද තිබෙනවා. එහෙත් අපට විදුලි එළිය නැහැ. අපට එළිය දෙන්නට බැරි නම්, කැලේ සිටින වඳුරන්ට රිළවුන්ටවත් බල්බ් එකක් දෙකක් දමා දෙන්නකො. කම්බි ඇද තිබීමෙන් පමණක් කිසිවකුට ප්‍රයෝජනයක් නැහැ. එක් කොටසක ප්‍රධාන විදුලි කම්බි සවි කළ විට ඒ කොටසේ ජනතාවට විදුලි එළිය සපයා අවසාන වී ඊළඟ කොටසට යන ලෙසයි අප ඉල්ලා සිටින්නේ. දැන් තිබෙන තත්ත්වය අනුව, අතනත් නෑ, මෙතැනත් නෑ රජයට ලැබෙන්නට තිබෙන ආදායමකුත් මේ නිසා නැති වී යනවා. සල්ලි නෑ, සල්ලි නෑ කියමින් තමුන්නාන්සේලා කෑගසනවා ඒ අතරම, සල්ලි ලැබෙන මාර්ගයක් මේ විධියට අහුරා දමා තිබෙනවා. රට තුළ සල්ලි නැත්නම්, සල්ලි ලැබෙන මාර්ග අප හදා තිබෙනවා නම්, ඒ මාර්ගවලින් සල්ලි සොයාගෙන රට සංවර්ධනය කිරීම අපගේ

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

යුතුකමක් නොවෙයිද ? ඒ යුතුකම කරන්නට විදුලිබල ඇමතිතුමා ඉඩ දෙන්නේ නැත්නම්, එතුමා මේ රටේ සංවර්ධන ව්‍යාපාරයේ සතුරකු වශයෙන් හැඳින්වීම වරදක්ද ? [බාධා කිරීමක්] ඇයි යන්නේ නැත්තේ ? යනවා නම් අප පහර ගහන්නේ නැහැ. නොයන නිසා තමයි ගහන්නේ. කඩා බිඳගෙන හෝ ගිහින් මේ වැඩේ කරන්න අපට වුවමනා කරන්නේ ඒයයි. අප එතුමා සමග පෞද්ගලික විරුද්ධත්වයක් නැහැ. තේවතු හිමියකු තේ පැක්ටරියකට විදුලි බලය ඉල්ලුවොත් තමුන්නාන්සේ වහාම, බෙදා හැරීමේ යන්ත්‍රයක් සවිකොට ප්‍රධාන මාර්ගයෙන්ම, ප්‍රධාන කම්බියෙන්ම, විදුලි බය ඔහුට ලබා දෙනවා. එහෙත්, දුප්පත් මිනිසකු විදුලිය ඉල්ලුවොත් තමුන්නාන්සේ මොකක්ද කියන්නේ ? "බෑ, බෑ, ඒක මගේ සැලැස්මේ නැහැ, මගේ යෝජනා ක්‍රමයේ ඒ නම සඳහන් වෙලා නැහැ, ගම් 50 ට ඒ ගම ඇතුළත් වෙලා නැහැ, මා සටහන් කර තිබෙන ගම් 510 ක් ගම් සටහන් වී නැහැ." තමුන්නාන්සේ සැලැස්ම හැදුවා සැදූ මිනිසාට බැරිද ඒක වෙනස් කරන්නට ? තවත් ස්ථාන ඇතුළු කර අවශ්‍යතාවයන් අනුව එය සකස් කරන්නට සැදූ නැනැත්තාට බැරිද ? මේක වෙන කවුරුවත් සැදූ එකක් නොවෙයි. තමුන්නාන්සේමයි මේක සැදුවෙ ?

**ගරු සී. පී. ද සිල්වා**
*(கௌரவ சீ. பீ. டி சில்வா)*
(The Hon. C. P. de Silva)

පදියපැලැල්ල එක්ස්ටෙන්ෂන් කියා මෙහි සඳහන් වෙනවා. රුපියල් 21,850ක් දැනටම වෙන් කර තිබෙනවා.

**ටී. බී. එම්. හේරත් මයා.**
*(திரு. ரி. பி. எம். ஹேரத்)*
(Mr. T. B. M. Herath)

ඒ පළාත් පාලන දෙපාර්තමේන්තුවෙන්. විදුලි බල දෙපාර්තමේන්තුවෙන් නොවෙයි.

**ගරු සී. පී. ද සිල්වා**
*(கௌரவ சீ. பீ. டி சில்வா)*
(The Hon. C. P. de Silva)

ඒ අමාත්‍යාංශයෙන් කරනවා නම් අපි කරන්නේ නැහැ.

**ටී. බී. එම්. හේරත් මයා.**
*(திரு. ரி. பி. எம். ஹேரத்)*
(Mr. T. B. M. Herath)

තමුන්නාන්සේලා නොකළ නිසයි ඒ අය පළාත් පාලන දෙපාර්තමේන්තුවෙන් ණය මුදල ගත්තෙ. 1960 සිටම වලපනේ කොට්ඨාශයේ මන්ත්‍රීවරයා වශයෙන් කට යුතු කළේ මමයි. ඒ කාලයේ සිටම මම තමුන්නාන්සේගෙන් ඉල්ලීම් කළා. දිස්ත්‍රික් සම්බන්ධීකරණ කාරක සභාව මගින් ඉල්ලීම් කළා. ඒ හැම ඉල්ලීමක් ම ප්‍රතික්ෂේප කළා. එම නිසා තමයි ඒ ගම් කාරිය සභාවේ මගේ පක්ෂයේ සභාපතිවරයා මගින් පළාත් පාලන දෙපාර්තමේන්තුවෙන් මුදල් ලබා ගන්නට මා මහන්සි ගත්තෙ. තමුන්නාන්සේලා බැරිය කී නිසයි මා එහෙම කටයුතු කළේ. වගකීමක් ඇතිවයි මා මෙය කියන්නෙ. ඇයි තමුන්නාන්සේ බැරිය කිව්වෙ ? මොන හේතුවක් නිසා ද ? තමුන්නාන්සේට නොයෙක් නොයෙක් අය නොයෙක් විධියේ චෝදනා කරනවා. තමුන්නාන්සේ අර නම් ලැයිස්තුවක් කියවන විට අපත් සිනහ වුණා. බලපිටිය, කොස්ගොඩ ගැන සඳහන් කරන විට අපත් සිනහ වුණා. එහෙම ගමකින් ආවොත් බැරිය කියන්නේ නැහැ. නමුත් මේ ගම්වලින් එන විට බැරිය කියනවා. මේක තමුන්නාන්සේගේ වරදක් නොවෙන්නට පුළුවනි. සමහර විට තමුන්නාන්සේ අවඥාවට ලක් කරන්නට තමුන්නාන්සේට පහළින් සිටින උදවිය මේවා කරනවා ඇති. තමුන්නාන්සේ ලංකාවෙන් ගම් 510 ක් තෝරා තිබෙනවා. ලංකාවේ ඡන්දදායක කොට්ඨාශ 150ක් තිබෙනවා. ඒ කොට්ඨාශ 150න් ගම් 510 ක් තෝරනවා නම් අඩු වශයෙන් ගම් තුනක්වත් වලපනේ කොට්ඨාශයෙනුත් තෝරන්නට තමුන්නාන්සේට යුතුකමක් තිබුණා. නමුත් තමුන්නාන්සේ තෝරා තිබෙන ගම් 510 ට අපේ ගම් එකක්වත් නැහැ. ඒකයි මගේ චෝදනාව. කොස්ගොඩ, අනුරාධපුරය, මාතර ආදී ප්‍රදේශවලට විදුලිය සැපයීමට වැය වන මුදල වලපනේ කොට්ඨාශයේ තිබෙන තේ කර්මාන්තශාලාවලට නගරවලට විදුලිය සැපයීමට වැය වන්නේ නැහැ. ඊට වඩා ඉතාමත්ම අඩු මුදලක් වලපනේ කොට්ඨාශයේ මේ ස්ථානවලට විදුලිය සැපයීමට වැය වන්නෙ. මක්නිසාද ? මේවා නෝර්ටන් බ්‍රිජ් [illegible]ය ළඟම තිබෙන ප්‍රදේශ නිසයි.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[ටී. බී. එම්. හේරත් මයා.]

අවුරුද්දෙන් හය මාසයෙන් මේ ස්ථාන වලට විදුලිය සැපයීමට පුළුවන්කම තිබුණා. අවුරුදු දහයකට ප්‍රථමයෙන් මේ ස්ථාන වලට තමුන්නාන්සේ විදුලිය සැපයුවා නම් අද ඒවායින් ලැබුණු ආදායමෙන් මාතරට නිකම්ම විදුලිය සපයන්නට තිබුණා; කොස්ගොඩට නිකම්ම විදුලිය සපයන්නට තිබුණා. ළඟම සිටින මිනිසාට දෙන්නේ නැහැ. සුළු වියදමින් ළඟම සිටින මිනිසාට දී වැඩි ආදායමක් ලබා ගන්නට පුළුවනි. නමුත් ඒක කරන්නේ නැහැ. අනුරාධපුරය, යාපනය, කන්කසන් තුරේ, ත්‍රිකුණාමලය, හම්බන්තොට වැනි ඈත ප්‍රදේශවලට දීලයි මේ ආදායම් ගන්නට හදන්නෙ. ඇයි කිට්ටුම තැනැත්තාට දෙන්නේ නැත්තෙ? ඔහුට නො දෙන්නට හේතුව කුමක් ද? රාගල ගම් කාර්‍ය්‍ය සභාව විදුලි බල දෙපාර්තමේන්තුවෙන් ණය මුදල් ගන්නට කොයි තරම් සටන් කළා ද කියා තමුන්නාන්සේ දන්නවාද? නමුත් ලැබුණේ නැහැ. පසුව පළාත් පාලන දෙපාර්තමේන්තුව මාර්ගයෙන් ණය මුදලක් ලබා ගෙන දැන් රාගල නගරයේ විදුලිය සේවාවක් පවත්වා ගෙන යනවා. චුවමනා නම් පළාත් පාලන ඇමතිතුමාගෙන් අසා බලන්න. අද ලංකාවෙන්ම ඉතාමත්ම ලාභ සහිතව පවත්වාගෙන යන පළාත් පාලන විදුලි බල සේවාව රාගල නගරයේ තිබෙන ඒ විදුලි බල සේවාව බව මා සතුටින් මතක් කරනවා. නමුත් විදුලි බල දෙපාර්තමේන්තුව කියා සිටියේ එයින් පාඩු වෙනවාය, ණය මුදල දෙන්නට බැරිය යන්නයි. නමුත් අද ඒ ගම් කාර්ය සභාව පළාත් පාලන දෙපාර්තමේන්තුව මාර්ග යෙන් ණය මුදල් ලබාගෙන ඉතාමත් සතුටුදායක අන්දමින් විදුලි සේවාව පවත්වාගෙන යනවා.

**ගරු එන්. එච්. ඒ. එම්. කරුණාරත්න**
*(கௌரவ என். எச். ஏ. எம். கருணாரத்ன)*
(The Hon. N. H. A. M. Karunaratne)
ඇයි රඹුක්කන?

**ටී. බී. එම්. හේරත් මයා.**
*(திரு. ரீ. பி. எம். ஹேரத்)*
(Mr. T. B. M. Herath)
රඹුක්කනත් ලාභ තිබෙනවා. හොඳ තැනක්. මම දන්නවා. තමුන්නාන්සේටත් බොහොම ලාභ ලැබී තිබෙනවා. ඉදිරියටත් තමුන්නාන්සේ අවංකව ක්‍රියා කළොත් ලාභ ප්‍රයෝජන සියල්ලක්ම ලැබෙන්නට ඉඩ තිබෙනවා. ඒක වෙනම ප්‍රශ්නයක්. ලාභ උපදවන්නට පුළුවන් ස්ථානවලට ඉල්ලන විටත් දෙන්නට බැරිය කියා විදුලි බල දෙපාර්තමේන්තුව කියන බවයි මා කියන්නෙ. වියදමින් සියයට 12 ක් ලැබෙනවා නම්, විදුලි බලය සපයනවාය කියා තමුන්නාන්සේ කියනවා. අවුරුදු අටකින් වියදම කැපෙනවා නම් විදුලිය සපයනවාය කියා තමුන්නාන්සේ කියනවා. තමුන්නාන්සේ ඇයි එහෙම කල්පනා කරන්නෙ?

**ගරු සී. පී. ද සිල්වා**
*(கௌரவ சி. பீ. டி சில்வா)*
(The Hon. C. P. de Silva)
ඒක ආණ්ඩුවේ තීරණය.

**ටී. බී. එම්. හේරත් මයා.**
*(திரு. ரீ. பி. எம். ஹேரத்)*
(Mr. T. B. M. Herath)
තීරණයක් ගන්නට පෙර ආණ්ඩුවත් කල්පනා කරන්නට එපායැ. සමහර තැන් වලින් සියයට 12ක් ලැබේවි. සමහර තැන් වලින් සියයට 20 ක් ලැබේවි. සමහර තැන්වලින් සියයට 60 ක්, සියයට 50 ක් ලැබේවි. නමුත් ඔය ලක්ෂපානට ඉතාමත්ම නුදුරු ස්ථානවලට අවුරුදු දහයකට කලින් විදුලිය සැපයුවා නම් ඒ අයගෙන් ලැබෙන්නෙ සියයට 12 ක් නොවෙයි සියයට 5ක් වුණත් අද ඒ මුදල කැපී අවසාන බව තමුන්නාන්සේ දන්නවා ද? එහෙම කළා නම් අද ඒ වියදම් කැපී ඉවරයි. තමුන්නාන්සෙගෙ මේ ගණන අනුව මාතරටත් 12 යි, යාපනයටත් 12 යි, නුවර එළියටත් 12 යි, ලක්ෂපානටත් 12 යි. ඒක වැරදියි. මේ ගණන වියදමේ ආකාරයට බෙදන්නට ඕනෑ. එහෙම බෙදනවා නම් තමුන්නාන්සේගේ මේ ව්‍යාපාරය මීට වඩා සාර්ථක වන බවට කිසිම අඩමානයක් නැහැ. විදුලි බල ව්‍යාපාරය තව තවත් සාර්ථක විය යුතු බව අපි මේ අවස්ථාවේදී ගරු ඇමතිතුමාට මතක් කරන්ට කැමතියි. විදුලි බලය තව තවත් වැඩි වැඩියෙන් පාරිභෝගිකයන්ට ලැබිය යුතුයි. ලංකාව, මෙරට මිනිසුන්ගේ අවශ්‍යතා ඉෂ්ට කර ගන්ට තරම් කර්මාන්ත අතින් ස්වයංපෝෂිත රටක් බවට පත් කර ගැනීමට

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

පසුගිය රජය මගින් අඩිතාලමක් දමා තිබෙනව. තමුන්නාන්සේලා මොන තරම් වර්ණනාත්මක ප්‍රකාශ කළත්, මොන තරම් අතිරේක පළ කළත්, ගුවන් විදුලි යෙන් කොයිතරම් කෑ කෑසුවත් කර්මාන්ත අතින් මේ රටට යම්කිසි සේවයක් සිදු වුණා නම් ඒ සේවය සිදු වුණේ පසුගිය රජයෙන් බව තමුන්නාන්සේටවත් වෙන කිසිවෙකුටත් අමතක කරන්ට බැහැ. එය එසේ නොවේ යයි කාටවත් කියන්ට බැහැ. ඒක ඇත්තක්. එසේ නම් ඒවා වඩාත් දියුණු කිරීමට, අද අතින් කරන කර්මාන්ත විදුලි බලයෙන් ක්‍රියා කරන කර්මාන්ත බවට පරිවර්තනය කිරීමට, උදව් දීම තමුන්නාන්සේගේ යුතුකමක්. ඒම නිසා විදුලි බල දෙපාර්තමේන්තුවේ මේ යල් පැනපු ප්‍රතිපත්ති කරුණාකර ජාතියේ සවංර්ධනයේ නාමයෙන් ඉවත් කර දමන්න.

ඇමතිතුමා දැන් කියවාගෙන ගිය ලැස්තුවේ සඳහන් වෙලා තිබෙන අන්දමට, සමහර ආසනවල හැම ගමකටම වගේ විදුලි බලය සපයන්ට යන අතර සමහර ආසනවල එකම ගමකටවත් විදුලි බලය ලැබෙන්නෙ නැහැ. ඒ නිසා මේ වැඩ පිළිවෙළ සකස් කළේ පක්ෂග්‍රාහිවද, නැත් නම් නොසැලකිල්වෙන් දැයි යන ප්‍රශ්න දෙක අපට අහන්ට සිදු වෙනව. සමහරවිට පක්ෂග්‍රාහීව කළා වන්ට පුළුවන්. නැත් නම් නොසැලකිල්ල නිසා වන්ට පුළුවන්.

**ගරු එන්. එච්. ඒ. එම්. කරුණාරත්න**
*(கௌரவ என். எச். ஏ. எம். கருணாரத்ன)*
(The Hon. N. H. A. M. Karunaratne)
මගේ යාළුව වෙලත් මට දීල නැහැ.

**ටී. බී. එම්. හේරත් මයා.**
*(திரு. ரி. பி. எம். ஹேரத்)*
(Mr. T. B. M. Herath)
මම කියන්නෙ ඒක වැරදියි කියලයි. කරුණාකරල නැගිටල ඇමතිතුමාට කියන්න.

**ගරු එන්. එච්. ඒ. එම්. කරුණාරත්න**
*(கௌரவ என். எச். ஏ. எம். கருணாரத்ன)*
(The Hon. N. H. A. M. Karunaratne)
පක්ෂග්‍රාහිව කළාය කියන්ට බැහැ.

**ටී. බී. එම්. හේරත් මයා.**
*(திரு. ரி. பி. எம். ஹேரத்)*
(Mr. T. B. M. Herath)
—තමුන්නාන්සේගේ ප්‍රතිපත්තිය හරි නැහැ කියල. කොයි පැත්තෙ හිටියත් අපි ඇත්ත කියමු. ප්‍රතිපත්තියක් අනුව වැඩ කෙරෙන්නට ඕනෑ. ග්‍රාමීය ක්‍රමය යටතේ සමහර ආසනවල හැම ගමකටම විදුලි බලය දී තිබෙනව. සමහර ආසනවල එක ගමකටවත් නැහැ. ගරු සමාජ සේවා ඇමතිතුමාටත් නැහැ ; මටත් නැහැ. කරුණාකර විදුලි බල දෙපාර්තමේන්තුවේ පවතින දරදඬු ප්‍රතිපත්තිය නැති කර දමා රටට ගැළපෙන විධියේ අළුත් වැඩ පිළිවෙළක් සකස් කරන මෙන් ගරු ඇමතිතුමාගෙන් ඉල්ලා සිටිනව. අර පරණ ලැයිස්තුව ඉරා දමන්න. අළුත් ලැයිස්තුවක් හදන්න. වුවමනා මිනිසුන්ට විදුලි බලය දෙන්න. මගේ ආසනයේ ප්‍රසිද්ධම නගරය වන නිල්දන්ඩාහින්නට විදුලි බලය දෙන්නේ නැහැ. එහෙත් සමහර ආසනවල කිසිම නාගරික තත්ත්වයක් නැති ප්‍රදේශවලට, විදුලි බලය නොගන්න ගම්වලට විදුලි බලය සපයනව. ඒ ගම්වල නම් මම මේ අවස්ථා වෙදි කියන්ට යන්නෙ නැහැ. එහෙම කිව්වොත් ඒ කොට්ඨාශවල මන්ත්‍රීවරුන් කියයි, අපේ කොට්ඨාශවලට ලැබීම ගැන ඊෂ්‍යාසහගතව ඒ මන්ත්‍රීතුමා කථා කළාය කියා. ඒ නිසා මා ඒවායේ නම් කියන්නෙ නැහැ. ඒ ගම් වෙළඳ හෝ කාර්මික ව්‍යාපාර වලට විදුලි බලය යොදා ගන්න ස්ථාන ඇති ගම් නොවෙයි. ඇත්ත වශයෙන්ම තමුන්නාන්සේගේ ව්‍යාපාරවරයට වැඩිපුර ලාභ උපදවන ස්ථාන හැටියට සලකන්ට පුළුවන්කම තිබෙන්නෙ වෙළඳාම හා කර්මාන්ත සඳහා විදුලි බලය යොදා ගන්න ස්ථානයි. එහෙම නම් ඇයි තමුන්නාන්සේ කල්පනා නොකළේ, වැඩි ලාභ උපදවන ස්ථානවලට වැඩි වැඩියෙන් විදුලි බලය සපයන්න ඕනෑය කියා. දියුණුවක් බලාපොරොත්තු වන ස්ථානවලට වැඩියෙන් ආධාර කරන්ට තමුන්නාන්සේ කල්පනා නොකළේ ඇයි? තමුන්නාන්සේගේ සැලැස්ම පරණ කඩදාසිවලටම සීමා කරන්නෙ ඇයි? 1960 දින් තමුන්නාන්සේ අපට කියෙව්වෙ ඔය කඩදාසිම නේද? කරුණාකරල ඒව ඉරල වීසි කරන්න. "ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේ ආණ්ඩුව කළ වැඩ වැරදියි. ඒ නිසා මම ඒ පක්ෂය අත්හැරල අළුත්

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[පී. බී. එම්. හේරත් මයා.]

ආණ්ඩුවට එක් වුණා" කියල තමුන්නාන්සෙ කිව්වනෙ. එහෙම නම් ඒ වැරදි කඩදාසි ඇයි ගෙනෙන්නෙ? ඕව ඉරල වීසි කරන්න. අළුත් එකක් ගෙනත් ප්‍රශ්නය විසඳන්න. එතකොට සමහරවිට වලපනේ වගේ දැනට විදුලි බලය නැති ආසනවල වත් ලැබෙයි. එහෙත් කරන්නෙ මොකක් ද? අපි විරුද්ධ පාර්ශ්වයේ ඉන්නට කියල, එළව එළව ගහනව. මොකද වෙන්නෙ? තිබුණ ටිකත් නැති වෙනවා. ඒ නිසා අපි කියන්නේ කරුණාකර 1960 නැත්නම් 1956 සිට ඔය තිබෙන ඔය පරණ කඩදාසි ඉරා දමා අළුත් එකක් හදන්න කියායි. මේ රටේ ජනතාවගේ අවශ්‍යතාව යන්ට අනුව විදුලි බලය සැපයීමේ ක්‍රමයක් සකස් කරන්න.

ඊළඟට මට තවත් කරුණු එකක් දෙකක් ගැන කතා කරන්න තිබෙනවා. එම දෙපාර්තමේන්තුවේ අය කිරීම් ක්‍රමය ගැනත් කියන්න සිදුවී තිබෙනවා. එම දෙපාර්තමේන්තුවේ අස් කිරීම් ක්‍රමය ඒ තරම් සාධාරණ නැති බව තමුන්නාන්සේත් පිළිගන්නවා. තමුන්නාන්සේලා පළාත් පාලන ආයතනවලට කියා තිබෙනවා පාරිභෝගිකයාගෙන් කෙරෙන අය කිරීම් කර ගන්නය කියා. "අපි වෙනුවට තමුන්නාන්සේලා එය කරන්නය" කියා පළාත් පාලන ආයතනවලට බලය දී තිබෙනවා. ඒක ඇත්තයි. නමුත් පළාත් පාලන ආයතන මේ තරම් පාඩු විඳින්නේ ඇයි? තමුන්නාන්සේලා පළාත් පාලන ආයතන වලින් ලබා ගන්නා ගාස්තුවත් පළාත් පාලන ආයතන පාරිභෝගිකයන්ගෙන් ලබා ගන්නා ගාස්තුවත් අතර ඇත්තේ ඉතාමත් සුළු වෙනසක් පමණයි. ඒ සුළු වෙනස නිසා නොවේද පළාත් පාලන ආයතන පාඩු විඳින්නෙ? පළාත් පාලන ආයතන අද පාඩු විඳිනවා නම් විඳින්නේ මේ හේතුව නිසයි. විදුලිබල දෙපාතීමේන්තුව නිකම්ම ඉඳ සතයක්වත් වියදම් කරන්නේ නැතුව ගාස්තුවක් අය කර ගන්නවා. පළාත් පාලන ආයතන පාරිභෝගිකයන්ගෙන් අය කර ගන්නා මුදල ඒ සඳහා ගෙවනවා. පළාත් පාලන ආයතන අමාරුවේ වැටී තිබෙන්නේ නිසයි. විදුලි බල දෙපාර්තමේන්තුව අය කරන වැඩි මුදල නිසයි. එවැනි තත්ත්වයක් ඇති වී තිබෙන්නෙ. මා කියන්නේ මේ දෙබිඩි ප්‍රතිපත්තිය අත් හැර දමන්න කියායි.

ගාස්තු අය කර ගැනීමේ කාර්යය විදුලි බල දෙපාර්තමේන්තුවට භාර ගන්න. පළාත් පාලන ආයතනවලට ඒ කාර්ය භාර නොදී විදුලි බල දෙපාතීමේන්තුව විසින් එය කෙලින්ම කර ගෙන යන්න. මෙය දෙගොල්ලකට කරන්න පුළුවන් වැඩක් නොවෙයි. එක්කෙනෙකුගේ අතට ගන්න ඕනෑ දෙයක්. එය පාලනය කිරීම පමණක් පළාත් පාලන ආයතනවලට පවරන්න. පාලනය කිරීමේ බලය එම ආයතනවලට පවරා වගකීම තමන්ගේ අතේම තබා ගන්න. මා තමුන්නාන්සේගෙන් අහන්නේ විදුලි බල දෙපාර්තමේන්තුවට මෙන් දක්ෂ ආයතනවලටත් ආදිය පළාත් පාලන ආයතනවලටත් සිටිනවාද කියන ප්‍රශ්නයයි. එම ආයතනවලට එවැනි දක්ෂ නිලධාරීන් නොමැති බව තමුන්නාන්සේ දන්නවා නේ. ඒ නිසා විදුලි බලය පාලනය කිරීමේ සම්පූර්ණ වගකීම භාර ගත යුත්තේ පළාත් පාලන ආයතන නොව, විදුලි බල දෙපාර්තමේන්තුව විසිනුයි. ඒ බව මා මේ අවස්ථාවේදී මතක් කර දිය යුතු කරුණක්. දෙගොල්ලකට මෙය කරන්න බැහැ. කරුණාකර එක් පැත්තක් විසින් මෙය භාර ගන්න. ඊටපසු හොඳ දක්ෂ අය පත් කරන්න. හැට පැන්න අය අස් කර දැමූ බවක් තමුන්නාන්සේ කිව්වා. හැට පැන්නත් නොපැන්නත් කමක් නැහැ. අදක්ෂ අය ඉන්නවා නම් අස් කර දමන්න.

මට මතකයි, 1963 දී මා මේ ගරු සභාවට පැමිණිල්ලක් ඉදිරිපත් කළා. රණාල උඩ පළාත ගම් කාර්ය සභාවට විදුලි බලය සැපයීම ගැන. ඒ සඳහා මුදලුත් බැඳලයි තිබෙන්නෙ. ඒ අයට දැනට විදුලි බලය බෙදා හැරීම සඳහා දී තිබෙන යන්ත්‍රයේ බලවේගය මදියි. අළුත් එකක් සවි කර දෙන්නය කියා ඉල්ලා මුදලුත් බැඳලයි තිබෙන්නෙ. නමුත් අද වන තෙක් අලුත් යන්ත්‍රයක් සවි කර දී නැහැ. 1963 දී මා මේ ගැන කිව්වා. දැන් 1968 දීත් කියන්නයි සිදුවී තිබෙන්නෙ. නමුත් විදුලි බල දෙපාර්තමේන්තුවට තවමත් එය කර දෙන්න බැරි වුණා. රණාල උඩ පළාත ගම් කාර්ය සභාවට විදුලි බලය සැපයීම සඳහා අලුත් යන්ත්‍රයක් සවි කර දීමට තමුන්

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

නාන්සේලාට තවමත් බැරි වුණා. ගරු කථානායකතුමනි, මේ දෙපාර්තමේන්තුවෙන් ඇති ප්‍රයෝජනය කුමක් ද? එහෙම අහනවාට වඩා හොඳයි ඒ ඇමතිතුමාගෙන් නැත්නම් එම අමාත්‍යාංශයෙන් ඇති ප්‍රයෝජනය මොකක්ද කියා ඇසීම. අපි මේ තරම් මේ ගැන කෑගසන්නෙ ඇයි? මේ කථාවල් හැන්සාඩ් වාර්තාවලත් පළ වෙනවා. තමුන්නාන්සේලා ඒවා කියවන්නේ නැද්ද? මේ පාර්ලිමේන්තුව තිබෙන්නේ දෙගොල්ලන් දෙපැත්තට වෙලා කථාවල් කර අත ඔසවා ගෙදර යන්න පමණක්ද? අපි මේ ස්ථානයේදී කියන දේවල් ඇමතිවරුන්ගේත් අනික් නිලධාරීන්ගේත් සැලකිල්ලට යොමු වන්නේ නැද්ද? ඒවා ඒ අයගේ සැලකිල්ලට යොමු වන්නේ නැත්නම් කාට ඇහෙන්නද අපි මේ විධියට කෑගහන්නෙ? අපි මෙසේ කථා කිරීමේ ප්‍රතිඵලයක් නැහැ නේද? ඒ නිසා මා ගරු ඇමතිවරුන්ගෙන් ඉල්ලා සිටිනවා කරුණාකර මේවා කියවන්නය කියා. තමුන්නාන්සේලාට බැරි නම් තමුන්නාන්සේලාගේ පාර්ලිමේන්තු ලේකම්වරුන්ට කියන්න. ඒ අය ඉන්නේ මොනවාටද? යුද්ධ හමුදාව ගැන කල්පනා කිරීම ටිකක් පැත්තකට දමා කරුණාකර මේ කරුණු ගැන සොයා බලා ඒවා ක්‍රියාත්මක කරවන්න.

ගරු කථානායකතුමනි, ඔය විදුලි බල දෙපාර්තමේන්තුව දූෂණයෙන් දූෂණයට පත්වී තිබෙන දෙපාර්තමේන්තුවක්. මා ඊයේ පෙරේදා ගරු ඇමතිතුමාගෙන් ප්‍රශ්නයක් ඇසුවා. මා ළඟ හැන්සාඩ් වාර්තාව තිබෙනවා. ඒ ප්‍රශ්නයට දෙන්නට තිබෙන උත්තරය බොහෝම දිග වැඩියි කියා උප ඇමතිතුමා එය සභා මේසය මත තබා යන්න ගියා. දැන් ඒ වාර්තාව මට ලැබී තිබෙන නිසා ඒ කාරණය ගැන මේ අවස්ථාවේදී කරුණක් සඳහන් කරන්න කැමතියි. මගේ කොට්ඨාශයේ මුල්හාල්කැලේ ආරෝග්‍යශාලාවේ තමුන්නාන්සේගේ විදුලි දෙපාර්තමේන්තුව යටතේ සේවය කරමින් සිටි ඩී. එම්. කිරිබණ්ඩා මහතා 1966 ජනවාරි මාසයේ සිට නුවරඑළියේ ප්‍රාදේශීය විදුලි බල කාර්යාලයට මාරු කළා. කොටින් කිව්වොත් ගෙදර සිට නගරයට මාරු කළා. ඒ අවස්ථාවේදී මා ඉදිරිපත් වී නුවරඑළියේ ප්‍රාදේශීය විදුලි බල නිලධාරියාට කිව්වා, මේ මනුෂ්‍යයා බොහොම සුළු පඩියක් ලබන කෙනෙක්ය, ඒ නිසා ඔහුට මුල්හාල්කැලේම ඉන්න ඉඩ දෙන්නය කියා. ඔහු වෙනුවට අම්බලන්ගොඩින් කෙනෙක් මුල්හාල්කැලේට මාරු කර තිබුණා. මා කිව්වා, මොහු මුල්හාල්කැලේම තබා අම්බලන්ගොඩින් මාරු කර ඇති තැනැත්තා නුවරඑළියට ගන්නය කියා. එවිට ඒ නිලධාරියා කිව්වා, ඩී. එම්. කිරිබණ්ඩා බොහොම දක්ෂ රියැදුරෙක්ය, මා ඔහු නුවරඑළියට ගත්තේ සෙල්ලමට නොවේය, බොහොම ඉක්මනින් එයාගේ තනතුර උසස් කරන්නය කියා. මා සන්තෝෂයට පත් වී කිරිබණ්ඩා මහතාටත් කිව්වා, තමුසේ නුවරඑළියට අරගෙන තිබෙන්නේ තමුසෙගෙ තනතුර උසස් කරන්නය කියා. එහෙත් මොකක්ද සිද්ධ වුණේ?

මා එදා ඇසූ ප්‍රශ්නය නියෝජිත මන්ත්‍රී මණ්ඩලයේ 1968 මාර්තු 23 වෙනිදා නිල වාර්තාවේ 77 වන කාණ්ඩයේ 12 වන කලාපයේ තිබෙනවා: ප්‍රශ්නයේ (අ) කොටස මෙසේයි:

(අ) නුවරඑළියේ විදුලි දෙපාර්තමේන්තුවේ කම්කරුවෙකු වන ඩී. එම්. කිරිබණ්ඩා මහතා පහත සඳහන් දිනවල සම්මුඛ පරීක්ෂණවලට කැඳවන ලද්දේද? (1) 1963. 12. 13, (2) 1964. 1. 8, (3) 1964. 12. 21, (4) 1965. 1. 7, (5) 1965. 1. 26. (6) 1965. 9. 9, (7) 1966. 6. 8, (8) 1966. 7. 5, (9) 1967. 9. 4.

තමුන්නාන්සේ සභා මේසය මත තබා තිබෙන පිළිතුරේ "ඔව්" කියා තිබෙනවා. එසේ නම් ඔහු සම්මුඛ පරීක්ෂණවලට කැඳවා තිබෙන බව ඇත්ත. ඊළඟට මගේ ප්‍රශ්නයේ (ආ) කොටසින් අසා තිබෙන්නේ මේකයි:

(ආ) මේ එක් එක් වාරයේ තෝරාගත් රියැදුරන්ගේ අධ්‍යාපන සහ වෘත්තීය සුදුසුකම් එතුමා වෙන වෙනම සඳහන් කරනවාද?

ඒ විස්තර සියල්ලම මෙහි තිබෙනවා. ඒ ඒ දිනවල තෝරාගත් රියැදුරන් සියලු දෙනාගේම වෘත්තීය හා අධ්‍යාපන සුදුසුකම් සියල්ලම මෙහි සඳහන් කර තිබෙනවා. ඒ නිසා අද මා තමුන්නාන්සේට කියනවා, අවුරුදු ගණනාවක් තිස්සේ මේ දෙපාර්තමේන්තුවේ කම්කරුවෙක් හැටියට සේවය කළ ඩී. එම්. කිරිබණ්ඩා නමැති කම්කරු මහතාට ඒ තනතුර නොදී ඒ සෑම පරීක්ෂණයකදීම පිටස්තර අය තෝරා ගැනීම පිළිබඳව කරුණාකර පරීක්ෂණයක් පවත්වන්නය කියා. සේවකයෙක් යම් කිසි දෙපාර්තමේන්තුවකට බැඳෙන විට ඔහු

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[ටී. බී. එම්. හේරත් මයා.]

ඒ දෙපාර්තමේන්තුව තුළ උසස්වීමේ අද හසක් ඇතිවයි බැදෙන්නේ. කම්කරුවෙක් වශයෙන් බැදෙන තැනැත්තා ඊට වඩා උසස් තනතුරකට උසස් වීමට නිතරම බලා පොරොත්තු වෙනවා. කම්කරුවන්ට උසස් වීම් ලබා ගැනීමට අවස්ථාව සැලසීම තමුන්නාන්සේලාගේ ප්‍රතිපත්තියක් යයි තමුන්නාන්සේලා ප්‍රසිද්ධියේම කියනවා. අද පත්‍රයෙන් මා එවැනි පුවතක් දැක්කා. ආණ්ඩුවේ සේවයේ සිටින සියලුම සේවකයන්ට උසස් වීමට ඉඩ පහසුකම් ලබා දෙනවා පමණක් නොව, සංයුක්ත මණ්ඩලවල සිටින කම්කරුවන්ට අධ්‍යක්ෂ මණ්ඩලය දක්වා උසස් වීමට අවස්ථාව ලබා දීමට ක්‍රියා කරනවාය කියා තමුන්නාන්සේලා කියනවා. එහෙත් මොකක්ද සිද්ධ වෙන්නෙ? නම වතාවක්ම සම්මුඛ පරීක්ෂණ පැවැත්වීමෙන් පසු ඩී. එම්. කිරිබණ්ඩා කම්කරු මහතා පැත්තකට දමා පිටස්තර උදවිය ඒ තනතුරට පත් කරගෙන තිබෙනවා. මා තමුන්නාන්සේගෙන් අහනවා ඒ ක්‍රියාව යුක්තිසහගතද කියා.

එපමණක් නොවෙයි, කථානායකතුමනි, මා තවත් කම්කරු මහත්මයෙකු ගැන ඒ නිලධාරියාගෙන්ම පසුගිය දවසකදී විමසීමක් කළා. මා ඒ නිලධාරියාගෙන් ඇසුවා අසුවලා මාරු කර තිබෙනවා නොවේද කියා. ඒ නිලධාරියා කිව්වා, "ඔව්, ඒක නම් කොහොමත් වෙනස් කරන්න බැහැ" කියා. මා ඇසුවා ඇයි එහෙම කියන්නේ කියා. ඒ නිලධාරියාගේ පිළිතුර වූයේ එම කම්කරුවාගේ කාල සීමාව ඉවරය, ඔහු අවුරුදු ගණනාවක් තිස්සේ මුල්හාල්කැලේ සේවය කර තිබෙනවාය, ඒ නිසා ඔහුගේ මාරුව වෙනස් කරන්න බැරිය යන බවයි. මා කිව්වා, හොඳයි, මේ මාරුව නිසා ඒ මනුෂ්‍යයා ලොකු අමාරුවකට පත් වී තිබෙනවාය, ඒ නිසා අඩුම ගණනේ තුන් මාසයක් කල් දෙන්නය, ඊට පස්සේ මාරු කිරීම අනුව එනවාය කියා. මගේ ඉල්ලීම පරිදි තුන් මාසයක් කල් දුන්නා. කල් දී කිව්වා, තුන් මාසෙකට පස්සෙ මාරුව වෙනස් කර ගන්න එන්න එපාය, එසේ ආවොත් ඔහු ගෙදර යවන්න සිද්ධ වේවිය කියා. එහෙත් අන්තිමට සිදු වුණේ මොකක්ද? ඒ කම්කරු මහත්මයා තවමත් එතැන ඉන්නවා. මම ඒ මහත්මයාගෙන් ඇහුවා, තමුසෙ තුන් මාසයෙන් පස්සෙ යන්න ඕනෑය කිව්වා නේද, දැන් ඉන්නෙ කොහොමද කියා. මා මීට කලින් ගියේ ඉස්සරහ දොරෙන්ය, දැන් පිටිපස්ස දොරෙන් ගිහින් තවමත් මුල්හල්කැලේ ඉන්නවය කියා ඒ මහත්මයා කිව්වා. කව්රුන් මේ රට ආණ්ඩු කළත්, මේ වගේ නිලධාරීන් මේ රටේ සිටින තුරු යුක්තිය ඉටු කරන්නට බැරි බවයි, අප කියන්නේ. අප ඒවා ඉගෙනගෙන තිබෙනවා. තමුන්නාන්සෙලත් ඉගෙන ගෙන ඇත කියා අප කල්පනා කරනවා.

**ගරු එන්. එච්. ඒ. එම්. කරුණාරත්න**
*(கௌரவ என். எச். ஏ. எம். கருணாரத்ன)*
(The Hon. N. H. A. M. Karunaratne)

කොයි ආණ්ඩුවද?

**ටී. බී. එම්. හේරත් මයා.**
*(திரு. ரி. பி. எம். ஹேரத்)*
(Mr. T. B. M. Herath)

කොයි ආණ්ඩුවත් ඉගෙන ගන්නට ඕනෑ. ඒ නිසයි, මා ගරු විදුලි බල ඇමතිතුමාට කියන්නේ, තමුන්නාන්සේ හිතා බලා තමුන්නාන්සේගේ ප්‍රතිපත්තිය ක්‍රියාවේ යොදවන්නය, කව්රුවත් තැපෑලෙන් එවන ඒවට එහෙයි කියන්නට ලෑස්ති වන්නට එපාය කියා. වැළඳී තිබෙන රෝගය ඒකයි. ඩී. එම්. කිරිබණ්ඩා මහත්මයාට, අවුරුදු හතක් අටක් කලින් හිටපු කම්කරු තත්ත්වයේම ඉන්නට සිදු වී තිබෙන්නෙ ඒ නිසයි. ඒ මහත්මයාටත් අර විධියට පිටිපස්ස දොරෙන් යන්නට ඉඩක් තිබුනානම් රියැදුරු වෙලා ඉවරයි. ඒ නිලධාරි මහත්මයා මට පොරොන්දුවක් දුන්නා, ඒ කම්කරු මහත්මයාව මුල්හල් කැලෙන් මාරු කළෝ ඔහුට උසස් වීමක් දෙන්නටය කියා.

**කථානායකතුමා**
*(சபாநாயகர் அவர்கள்)*
(Mr. Speaker)

Order, please! The Sitting is suspended for 30 minutes. On resumption, the hon. Deputy Speaker will take the Chair.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

රැස්වීම ඊට අනුකූලව තාවකාලිකව අත්හිටුවන ලදින්, අ. භා. 4.30 ට නියෝජ්‍ය කථානායකතුමාගේ [එම්. සිවසිතම්පරම් මයා.] සභාපතිත්වයෙන් නැවත පවත්වන ලදී.

இதன்படி அமர்வு பி. ப. 4.30 மணிவரை இடை நிறுத்தப்பட்டு மீண்டும் ஆரம்பமாயிற்று. உப சபா நாயகர் அவர்கள் [திரு. எம். சிவசிதம்பரம்] தலைமை தாங்கினார்கள்.

*Sitting accordingly suspended till 4.30* P.M. *and then resumed,* MR. DEPUTY SPEAKER [MR. M. SIVASITHAMPARAM] *in the Chair.*

## ප්‍රජාතන්ත්‍රවාදී වියට්නාමයට බෝම්බ හෙළීම සම්බන්ධව අමෙරිකන් ජනාධිපතිතුමාගේ ප්‍රකාශය ගැන ලංකාණ්ඩුව දරන මතය

## வியட்நாம் ஜனநாயகக் குடியரசின் மீது குண்டு வீசுவது முதலியவை சம்பந்தமாக ஐக்கிய அமெரிக்க ஜனாதிபதியின் அறிக்கை பற்றி இலங்கை அரசாங்கத்தின் நிலை

## CEYLON GOVERNMENT'S POSITION RE U.S. PRESIDENT'S STATEMENT ON THE BOMBING OF THE DEMOCRACIC REPUBLIC OF VIETNAM, ETC.

**ගරු ඩඩ්ලි සේනානායක**
*(கௌரவ டட்லி சேனநாயக்க)*
(The Hon. Dudley Senanayake)

Hon. Members will recall that I have on more than one occasion stated on the Floor of this House the position of the Government in regard to the tragic and unfortunate situation in Vietnam. I am glad to have this opportunity to restate the position in the light of the latest developments in regard to this matter.

Hon. Members will remember that the problem that had arisen up to now was to arrive at an understanding on the basis of which discussions could commence. The position of North Vietnam was that until there was an unconditional cessation of bombing and other acts of aggression by the United States against North Vietnam, there could be no discussions between the two parties. For its part, the United States' position was that it was prepared to stop the bombing of North Vietnam as a prior and unilateral act on the understanding, which could be conveyed either in private or in public, that there would be a reasonable measure of military reciprocity on the other side within a given interval of time. Though various efforts had been made to bridge the gap between these two positions, the outcome had remained a stalemate.

The latest decision of the U. S. Government is to unilaterally take certain steps to de-escalate the conflict. In practical form, the U . S. Government has announced that aircraft and naval vessels will, with effect from 31st March, make no attacks on North Vietnam, except in the area north of the Demilitarized Zone where the U. S. Government felt that their forward positions were threatened. This area had been subsequently defined as the area south of the 20th Parallel.

The Government of North Vietnam in a radio broadcast on 3rd April declared its readiness to send its representatives to make contact with the United States representatives, to decide with the U. S. side the unconditional cessation of bombing and all other acts of war against North Vietnam, so that talks could begin. This is the present position.

It is a matter of satisfaction that the United States Government has taken steps to de-escalate the war. I also take note of the encouraging response from the North Vietnam Government wherein they indicate their readiness to establish contact with the United States for the cessation of bombing, etc., which could lead to talks. Perhaps, the esential problem in this issue is that the basis for a dialogue between the two parties, which alone could lead to meaningful results, was hitherto non-existent. I sincerely hope that the

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[ගරු ඩඩ්ලි සේනානායක]

steps taken by the U. S. Government and the response of the North Vietnam Government will now lead to such a dialogue.

Hon. Members will recall that in April last year I made certain proposals for a resolution of this issue. On that occasion I suggested that the three Vietnamese parties to the issue should meet without interference from outside sources to discuss, in the first instance, the pre-conditions for a ceasefire. I suggested that the matters that could with advantage be discussed should be (1) the cessation of the bombing of North Vietnam; (2) the formulation of interim procedures for ensuring a status quo; (3) the cessation of belligerent activity by all parties; (4) the withdrawal of all foreign troops and military personnel; and (5) the suspension of military aid in any form.

I have been asked by the Leader of the Opposition whether I would inform the President of the U. S. and the American Government that the people of Ceylon expect that the United States should stop totally the bombing of entire North Vietnam and other aggressive activities, and also withdraw American and allied troops from South Vietnam. This House is well aware of the Government's position in this matter. I have always advocated the stoppage of the bombing of North Vietnam. We have supported the Geneva Agreements as the basis for a solution of the Vietnam problem, and we deplore all violations of this Agreement from whichever source these originate.

Hon. Members will also remember that when I made my proposals in April last year I indicated that whatever could be done by us for a fair and just resolution of the conflict we would be willing to do; and I made the offer of Ceylon as a venue for discussions, if it were felt that a neutral country would best suit the purpose. I have reiterated this offer.

## රජයේ විදුලි දෙපාර්තමේන්තුව සඳහා සංචිත අරමුදලක්

## அரசாங்க மின்சார முயற்சிகள் திணைக்களத் திற்கான நிதி ஒதுக்கம்

## FINANCIAL RESERVE FOR THE DEPARTMENT OF GOVERNMENT ELECTRICAL UNDERTAKINGS

අ. භා. 4.36

**ටී. බී. එම්. හේරත් මයා.**
(திரு. ரி. பி. எம். ஹேரத்)
(Mr. T. B. M. Herath)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මා සඳහන් කරමින් සිටියේ විදුලි බල දෙපාර්තමේන්තුවේ යම් යම් දූෂිත ක්‍රියා මාර්ගයන් නිසා ඒ දෙපාර්තමේන්තුව කෙරෙහි මහජනතාවගේ විශ්වාසය දිනෙන් දින අඩු වීම ගැන පමණක් නොව ඒ දූෂිත ක්‍රියා මාර්ගය නිසා මේ රටට ලබාගත හැකි විශාල ආදායමක් නැති වී යාම ගැනත් මේ ගරු සභාවේත්, ගරු ඇමතිතුමාගේත් අවධානය යොමු විය යුතු බවයි.

මගේ ආසනයේ සිටින ඩී. එම්. කිරිබණ්ඩා මහතාගේ රියැදුරු පත්වීම පිළිබඳව අයුත්තක් සිදු වුණු බව මා විශේෂයෙන් සඳහන් කළා. මා විසින් නගන ලද චෝදනාව, මගේ ප්‍රශ්නයට තමුන්නාන්සේ විසින් දී තිබෙන පිළිතුරෙන් ඔප්පු කරන්නට පුළුවන් බව මා තමුන්නාන්සේට පෙන්වා දෙන්නට කැමතියි. කිරිබණ්ඩා මහත්මයාගේ සුදුසුකම් මොනවාද යන්න තමුන්නාන්සේගේ පිළිතුරේ සඳහන් කර තිබෙනවා. 1968 මාර්තු 23 වැනිදා හැන්සාඩ් වාර්තාවේ 1785 වැනි තීරුවේ සඳහන් වී තිබෙනවා, කිරිබණ්ඩා මහත්මයා, සිංහල 7 වැනි ප්‍රමාණය සමත්, සාමාන්‍ය ඉංග්‍රීසි දැනීමක් ඇති, දෙමළ කිථා කළ හැකි 1963.7.19 වැනි දින ලබා ගත් රිය පැදවීමේ බල පත්‍රයක් ඇති කෙනකු බව. කිරිබණ්ඩා මහතාව කැඳවූ සම්මුඛ පරීක්ෂණයේදී තෝරා ගනු ලැබූ අය අතර කිරිබණ්ඩා මහත්මයාට වඩා නුසුදුසු—ඒ මහත්මයාගේ සුදුසුකම්වලට වඩා අඩු සුදුසුකම් ඇති—අය රාශියක් සිටි බව මා තමුන්නාන්සේට පෙන්වා දෙන්නට ලෑස්තියි.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

කිරිබණ්ඩා මහත්මයා සිංහල 7 වැනි ප්‍රමාණය සමත්. එහෙත් 1963.12.13 වැනි දින තෝරා ගනු ලැබූ අය අතර සිටින ජී. ඇස්. ප්‍රනාන්දු මහත්මයාත් සමත් සිංහල 7 වැන්නමයි. ඒ මහත් මයා දෙමළ දන්නෙත් නැහැ. ඉංග්‍රීසි දන් නෙත් නැහැ. එහෙත් කිරිබණ්ඩා මහත් මයාට ඉංග්‍රීසි සාමාන්‍ය දැනීමකුත් තිබෙ නවා. ඒ මහත්මයා දෙමළත් දන්නවා.

එම්. එම් පීරිස් මහත්මයා නුපුහුණු කම්කරුවෙක්. 5 වැනි ප්‍රමාණය පමණයි සමත් වී තිබෙන්නෙ. දෙමළ දන්නෙත් නැහැ, ඉංග්‍රීසි දන්නෙත් නැහැ. 5 වැන්න සමත් එම්. එම්. පීරිස් මහත්මයාව තෝරා ගත්තා. 7 වැන්න සමත් ඉංග්‍රී සිත් දන්න, දෙමළත් දන්න කිරිබණ්ඩා මහත්මයාව තෝරා ගත්තෙ නැහැ. තවත් නිදර්ශනයක් තිබෙනවා. කේ. ඒ. අල්විස් මහත්මයා ලොරි පවිත්‍ර කරන් නෙක්. 6 වැනි ප්‍රමාණය පමණයි සමත් වී තිබෙන්නේ. ඔහුවත් තෝරාගෙන තිබෙනවා. එම්. ගෝපාල්, නුපුහුණු කම් කරු. ඔහු සිංහල දන්නෙ නැහැ. ඉංග්‍රීසි දන්නෙත් නැහැ. සමත් වී තිබෙන්නෙ දෙමළ හතර වන පංක්තිය පමණයි. නමුත් හත පාස් කළ කිරිබණ්ඩා මහතා තෝරා ගත්තෙ නැහැ, ගෝපාල් මහතා තෝරා ගෙන තිබෙනවා. මා කියවන්නෙ ගරු ඇමතිතුමා ගරු සභාවට ඉදිරිපත් කළ පිළිතුරෙන්.

**ගරු සී. පී. ද සිල්වා**
*(கௌரவ சி. பி. டி சில்வா)*
(The Hon. C. P. de Silva)

මා, සාමාන්‍යාධිකාරිතුමාට දන්නවා යවා තිබෙනවා, ඒ පිළිබඳව පරීක්ෂා කර බලා වාර්තාවක් සපයන ලෙස.

**ටී. බී. එම්. හේරත් මයා.**
*(திரு. ரி. பி. எம். ஹேரத்)*
(Mr. T. B. M. Herath)

මා බොහොම ස්තුතිවන්ත වෙනවා, ඇමතිතුමාට ඒ ගැන. එබඳු නියෝගයක් කිරීම ගැන ඇමතිතුමාට ගෞරව කරන නමුත්, ඒ නියෝගය අනුව ක්‍රියා කරන වාද කියා පරීක්ෂා කර බලනවා නම් හොඳයි. මන්ද? ඔය දෙපාර්තමේන්තුවට යවන කඩදාසි ආපසු එන්නෙ බොහොම කලාතුරකින්. ඒ බව මා වාගේම නමුන් නාන්සේත් හොඳින් දන්නවා ඇති. හැම දාමත් මතක් කළේ නැති නම් පිළිතුරු ලැබෙන එකක් නැහැ. දෙපාර්තමේන් තුවෙ තත්ත්වය එහෙමයි.

තව දුරටත් මේ අන්දමට පිළිතුරෙහි තිබෙනවා: කේ. ජී. සෝමපාල, ලොරි පවිත්‍ර කරන්නා. සමත් වී තිබෙන්නෙ සිංහල 5 වැන්න පමණයි. දෙමළ හෝ ඉංග්‍රීසි භාෂාව දන්නෙ නැහැ. නමුත් කිරි බණ්ඩා මහතාට සිංහල, දෙමළ සහ ඉංග්‍රීසි යන භාෂා තුන ගැන දැනීමක්, ඉගෙනීමක් තිබුණා.

කේ. ඇම්. පියසේන, වැඩ බලන වැන් රියදුරු—සමත් වී තිබෙන්නෙ සිංහල හත් වැන්න පමණයි. කේ. ඩී. ඒබ්‍රහම්, වැන් රියදුරු, සමත් වී තිබෙන්නෙ සිංහල හත් වැන්න පමණයි. ජේ. එම්. ආර්. අප්පුහාමි, අර්ධ පුහුණු II වන ශ්‍රේණියේ කම්කරු, සමත් වී තිබෙන්නෙ හත් වන ප්‍රමාණය පමණයි. මේ අයට දෙමළ හෝ ඉංග්‍රීසි දැනීමක් තිබුණෙ නැහැ. පී. ඩී. සෝමරත්න සමත් වී තිබෙන්නෙ සිංහල හය වැන්න පමණයි. එම්. එම්. පීරිස්, තාවකාලික වැන් රියදුරු, සමත් වී තිබෙන්නෙ 5 වන ප්‍රමාණය පමණයි. එන්. ආර්. සිල්වා, කේ. ඒ. අල්විස්, යන දෙදනා සමත්ව ඇත්තේ සිංහල හය වැන්න පමණයි. ඒ අයට ඉංග්‍රීසි හෝ දෙමළ භාෂා පිළිබඳ දැනීමක් ඇත්තෙ නැහැ.

කිරිබණ්ඩා මහතා සිංහල හත් වැන්න සමත් වී ඇති අතර ඔහුට ඉංග්‍රීසි හා දෙමළ භාෂාවන් පිළිබඳ දැනීමක් තිබුණා. ඒ මහතා අවුරුදු ගණනාවක් තිස්සෙ දෙපාර්තමේන්තුවෙ කම්කරුවකු හැටියට සේවය කර තිබුණා නම්, අවශ්‍ය සුදුසුකම් ඇත්නම්, එවැන්නකු පත් කර ගැනීම වඩාත් සුදුසු නැද්ද කියා නමුන්නාන්සේ ගෙන් ප්‍රශ්න කරන්න කැමතියි.

මේ වාගේ නිදර්ශන රාශියක් ඉදිරිපත් කළ හැකි නමුත් මා ඒ කාරණා ඉදිරිපත් කිරීමට දන් මහන්සි ගන්නෙ නැහැ. කෙසේ වුණත් ගරු ඇමතිතුමා සභාවට ඉදිරිපත් කළ පිළිතුරෙන් මෙහි තත්ත්වය එළිදරව් වුණා. එසේ එළිදරව් නොවුණු ප්‍රශ්න, නමුන්නාන්සේවත් නොදන්නා

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[ඩී. බී. එම්. හේරත් මයා.]

ප්‍රශ්න කොපමණ දෙපාර්තමේන්තුව තුළ ඇද්ද? මේවා තමුන්නාන්සේටවත් සොයන්න පුළුවන්ද? බැහැ. මෙවැනි දේවල් සිදු වන්නෙ, ඔය දෙපාර්තමේන්තුව තුළ අවුරුදු ගණනාවක් තිස්සේ අරක් ගෙන සිටින, දූෂණ කටයුතුවල යෙදී සිටින නිලධාරීන් නිසයි. එයින්, මොනොත කටවත් මා කියන්නෙ නැහැ, ඉතාම හොඳ, යුක්තිසහගතව, සාධාරණ අන්දමට වැඩ කරන නිලධාරීන් ඔය දෙපාර්තමේන්තුව තුළ නැතැයි කියා. ඕනෑ තරම් ඉන්නවා. එසේ වුණත් එබඳු අවංක උදවියටත් පහර ගසමින් දූෂණ අන්දමින් ක්‍රියා කරන නිලධාරීන් ඔය දෙපාර්තමේන්තුව තුළ සිටිනවා. එවැනි නිලධාරීන්ට විරුද්ධව ක්‍රියා කිරීමට කාලය දැන් එළඹී තිබෙනවා. එහෙම නොකොළහොත්, ප්‍රජාතන්ත්‍රවාදය හෝ සමාජවාදය හෝ මොන වාදයක්වත්, අඩු වශයෙන් ධනේශ්වර සමාජවාදයවත් මේ රටේ ක්‍රියාත්මක කරන්න බැරි බව, සාර්ථක කර ගන්න බැරි බව තමුන්නාන්සේට මතක් කර දෙන්න කැමතියි.

ඒ අතරම විදුලි බල දෙපාර්තමේන්තුවෙ පවතින අභ්‍යන්තර තත්ත්වය ගැන සොයා බැලීමට තමුන්නාන්සේලා හැම එකකටම පත් කරන, උදේ දහවල්, හැන්දෑවේ, ඉර හැරෙන වේලාවලට පත් කරන කොමිසමක්වත් පත් කරන ලෙස ඉල්ලා සිටිනවා. එසේ පත් කළොත් දෙපාර්තමේන්තුව තුළ අවුරුදු ගණනාවක් තිස්සෙ කර ගෙන ආ හොඳ හොඳ සෙල්ලම් ගැන තමුන්නාන්සේටම දැනගන්න ලැබේවි. එදට නියම තත්ත්වය හෙළි වේවි. එම නිසා, අපේ නොවෙයි, ඇමතිතුමාගේම පිරිසිදු භාවය ආරක්ෂා කර ගැනීමට, 1956 සිට 1968 දක්වා අවුරුදු දොළහක කාලය තුළ එම අමාත්‍යාංශය භාරව සිටි ඇමතිවරයා වශයෙන් තමුන්නාන්සේගේ පිරිසිදු භාවය ආරක්ෂා කර ගැනීමට, එම දෙපාර්තමේන්තුව තුළ කෙරීගෙන එන දූෂණ කටයුතු ගැන සොයා බැලීමට කොමිෂන් සභාවක් පත් කරන ලෙස මේ අවස්ථාවේදී ඉතා ඕනෑකමින් ඉල්ලා සිටිනවා.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, පළාත් පාලන ආයතන මාර්ගයෙන් විදුලි බලය සපයනවා. ඒ වාගේම කෙළින්ම විදුලි බල දෙපාර්තමේන්තුව මගින් විදුලි බලය සපයනවා. මේ නිසා උද්ගත වී ඇති තත්ත්වය මේකයි. සුළු නගර සභාව මගින් විදුලි බලය එක් පැත්තකට සපයන විට පාරෙන් එහා පැත්තෙ අනික් කොටසකට විදුලි බලය සපයන්නෙ විදුලි බල දෙපාර්තමේන්තුව මගින් වුණොත් මේ දෙක අතරේ අය කිරීම්වල විශාල වෙනසක් තිබෙනවා. එක් ආයතනයක් යුනිට් එකකට අය කරන මිලට වඩා වැඩි මිළක් අනික් ආයතනයෙන් සපයන විදුලි බලය සඳහා අය කරනවා. එහෙම නම් තමුන්නාන්සේට නියම කරන්න බැරි ඇයි, පළාත් පාලන ආයතනයට දෙපාර්තමේන්තුව විදුලි බලය සැපයූවාම, එම ආයතනය මගින් විදුලි බලය බෙදා හරිනවා නම් විදුලි බලය යුනිට් එකක්—ඒකකයක්—සඳහා අය කළ හැකි වැඩිම මිල මෙපමණය කියා? ඊට වඩා වැඩි මිළක් අය කරන්න බැරි යයි නියම කරන්න බැරි ඇයි? මහජනයා සූරා කරන්නට ඉඩ දෙන්නේ ඇයි? පළාත් පාලන ආයතන පොළියට ණයක් ගන්නවා නම්, කරුණා කර එය විදුලි බල දෙපාර්තමේන්තුවෙන් ලබා ගන්නට ඉඩ දෙන්න. නිකරුණේ මුදල් නැන්පත් කර සංචිත අරමුදලක් හැටියට නොතබා, ප්‍රයෝජන ගන්න. මුදල් ඇමතිතුමාගෙ—භාණ්ඩාගාරයෙන්—මුදල් ණයට ලබා ගන්නවා වෙනුවට විදුලි බල දෙපාර්තමේන්තුවෙන් මුදල් ණයට ගැනීමට පළාත් පාලන ආයතනවලට ඉඩ දෙන්න. එතකොට තමුන්නාන්සේට ආදායමක්—පොළියක්—ලබා ගන්නට පුළුවන් වෙනවා. එක් පැත්තකින් ආදායමක් ලබා ගන්න අතර අනෙක් අතින් පොළියකුත් ලැබෙනවා. ඒ නිසා ණයට මුදල් දෙන්න. තමුන්නාන්සේගේ අරමුදලින් පළාත් පාලන ආයතනවලට මුදල් ණයට දෙන්න. ඒ වාගේම පළාත් පාලන ආයතනවලින් සපයනු ලබන විදුලි බලය වෙනුවෙන් එක ගණනක් අය කරන්නට විධිවිධාන යොදන්න. එහෙම නැත්නම් සුළු නගර සභාවල සේවය කරන සභාපතිවරුන් නිකරුණේ විවේචනයට ලක් වෙනවා. එක තැනක අය කරන්නේ විදුලි බල ඒකකයකට ශත දහයක් පමණයි. ඒ අතර තවත් තැනක ශත පහළොවක් අය කරනවා. එහෙම තත්ත්වයක් ඇති වුණාම

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

අර නිකම් ඉන්න අහිංසක සභාපතිවරයා විවේචනයට ලක් වෙනවා. එය නතර කරන්න.

1968 වර්ෂයේදී පැවැත්වෙන වෙසක් උත්සවය සඳහා අවශ්‍ය විදුලි බලය ලබා ගැනීමට නොහැකි වන තත්ත්වයක් ඇති විය හැකි බව ගරු ඇමතිතුමා දන්නවාදැයි මා දන්නේ නැහැ. වෙසක් උත්සවය උසස් තැනක් ගන්නේ තමුන්නාන්සේගේ විදුලි බල දෙපාර්තමේන්තුව නිසා බව දන්නවා නොවෙයිද? මේ අවුරුද්දේ කොළඹ පිටකොටුවේ වෙසක් තොරණ් සැරසිලි කරන්නට සෑහෙන තරම් විදුලි බලය නැති බව ගරු ඇමතිතුමා දන්නවාද? දන්නේ නැත්නම් මම කියන්නම්. එකකින් විදුලි බලය කිලෝවෝට් දෙදහක් නිපදවන්නට පුළුවන් මර්ලිස් නැමැති මැෂින් හයක් තිබුණා, කොළඹ පිටකොටුවේ. එතැන දැන් කීයද තියෙන්නේ? දැන් එතැන තුනක් තිබෙනවා. එයිනුත් එකක් වැඩ කරන්නේ නැහැ. දෙකයි වැඩ කරන්නේ. ඉස්සර කිලෝවෝට් දොළොස් දහක් නිපදවුණු තැන දැන් නිපදවන්නේ කිලෝවෝට් හාරදහක් පමණයි. දොළොස් දහ, හාරදහට බැහැලා තියෙනවා. හය, දෙකට බැහැලා තියෙනවා. චුන්නාකම්වලට, යාපනයට, ඒවා යැවූ බව ගරු ඇමතිතුමා දන්නවාද?

**ගරු සී. පී. ද සිල්වා**
*(கௌரவ சி. பீ. டி சில்வா)*
(The Hon. C. P. de Silva)
සිමෙන්ති ෆැක්ටරියට.

**ටී. බී. එම්. හේරත් මයා.**
*(திரு. ரி. பி. எம். ஹேரத்)*
(Mr. T. B. M. Herath)
යාපනයට තමුන්නාන්සේලා වැඩි සැලකිල්ලක් දක්වන බව අප දන්නවා. කමක් නැහැ. මෙහෙ තිබුණු ඒවා එහාට යවන්නට තීරණය කළ තමුන්නාන්සේට තවත් යුතුකමක් ගැන හිතන්නට තිබුණා. දෙකක් යැව්වා නම් ඒ වෙනුවට දෙකක් පිටකොටුවට යවන්නට ගරු ඇමතිතුමාට යුතුකමක් තිබුණා.

**ගරු සී. පී. ද සිල්වා**
*(கௌரவ சி. பீ. டி சில்வா)*
(The Hon. C. P. de Silva)
අලුත් විදුලි බල මස්කෙළියෙන් එනවා.

**ටී. බී. එම්. හේරත් මයා.**
*(திரு. ரி. பி. எம். ஹேரத்)*
(Mr. T. B. M. Herath)
හොඳයි, හොඳයි. තමුන්නාන්සේසේ කියන ඒවා තමුන්නාන්සේටවත් තේරෙනවාද කියන්නට පුළුවන්කමක් මට නැහැ. මට නම් තමුන්නාන්සේ කියාපු දෙය තේරුණේ නැහැ.

**ගරු සී. පී. ද සිල්වා**
*(கௌரவ சி. பீ. டி சில்வா)*
(The Hon. C. P. de Silva)
මස්කෙළියෙන් ඊට වඩා බල ඒවා එනවා.

**ටී. බී. එම්. හේරත් මයා.**
*(திரு. ரி. பி. எம். ஹேரத்)*
(Mr. T. B. M. Herath)
ඊට වඩා බලය එනවා නම් හොඳයි. ඒක නිසා වෙන්නට ඇති කම්බි දිගේ එනවාය කියන්නේ. තමුන්නාන්සේටත් කම්බියේ යන්න වෙයි එහෙම කළොත්. දැන් මොකක්ද වෙලා තියෙන්නේ? ඉස්සර කිලෝවෝට් නවදාහ, දොළොස්දාහ, දහඅටදාහ ආදී වශයෙන් නිපදවන්නට පුළුවන්කමක් තිබුණේ පිටකොටුවේ මධ්‍යස්ථානයට දැන් පුළුවන් වන්නේ ඊට වඩා බෙහෙවින් අඩු ගණනක් නිපදවන්නටයි. ඒ නිසයි මා කියන්නේ තමුන්නාන්සේලාගේ හත්හවුල් ආණ්ඩුව පෙඩරල් බලපෑම්වලට යට වීම නිසා දැන් වෙසක් උත්සවයත් කඩාකප්පල් කරන බව. මා ඒ චෝදනාව කරනවා.

**ගරු සී. පී. ද සිල්වා**
*(கௌரவ சி. பீ. டி சில்வா)*
(The Hon. C. P. de Silva)
එහෙම වෙන්නේ නැහැ.

**ටී. බී. එම්. හේරත් මයා.**
*(திரு. ரி. பி. எம். ஹேரத்)*
(Mr. T. B. M. Herath)
එහෙම දෙන්නේ නැහැ කිව්වා?

**ගරු සී. පී. ද සිල්වා**
*(கௌரவ சி. பீ. டி சில்வா)*
(The Hon. C. P. de Silva)
එහෙම වෙන්නේ නැහැ කිව්වා.

6—එච 12857 (68/4)
Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

**ටී. බී. එම්. හේරත් මයා.**
*(திரு. ரி. பி. எம். ஹேரத்)*
(Mr. T. B. M. Herath)
මට ඇහුණේ එහෙම දෙන්නේ නැහැ කිව්වා වාගේ. එහෙම වෙන්නේ නැහැ. කියලයි තමුන්නාන්සේ හිතන්නේ. තමුන්නාන්සේ හිතන දේවල් හුඟක් එහෙම වුණේ නැහැ. තමුන්නාන්සේ නො හිතන දේවල් හුඟක් වෙලා තියෙනවා. වෙනවාය කී දේවල් නොවී තිබෙන අතර, නොවෙනවාය කී දේවල් හුඟ හරියක් වෙලා තියෙන නිසයි අපට බියක් තියෙන්නේ. මම තමුන්නාන්සේගෙන් පැහැදිලි ප්‍රශ්නයක් අහන්නම්. ඒකට කෙලින්ම උත්තරයක් බලාපොරොත්තු වෙනවා. ඉල්ලුම්කරුවන් සියලු දෙනාටම සෑහෙන තරම් විදුලි බලය සපයනවාද ?

**ගරු සී. පී. ද සිල්වා**
*(கௌரவ சீ. பீ. டி சில்வா)*
(The Hon. C. P. de Silva)
ඔව්.

**ටී. බී. එම්. හේරත් මයා.**
*(திரு. ரி. பி. எம். ஹேரத்)*
(Mr. T. B. M. Herath)
බොහොම සතුටුයි. හොඳයි, බලමු අපි කොළඹ නගරයේ පමණක් නොව ලංකාවේ අනෙක් නගරවල ඉල්ලුම්කරුවන්ටත් ඇමතිතුමා ඒ සැලකිල්ල දක්වනවාද ? කරුණාකර උත්තර දෙන්න.

**නියෝජ්‍ය කථානායකතුමා**
*(உப சபாநாயகர் அவர்கள்)*
(Mr. Deputy Speaker)
He will reply at the end.

**ගරු සී. පී. ද සිල්වා**
*(கௌரவ சீ. பீ. டி சில்வா)*
(The Hon. C. P. de Silva)
දැනට එහි නිෂ්පාදනය වන විදුලි බලය, ඉල්ලුමට වඩා හුඟාක් වැඩියි.

**නියෝජ්‍ය කථානායකතුමා**
*(உப சபாநாயகர் அவர்கள்)*
(Mr. Deputy Speaker)
Why does not the Hon. Minister reply at the end ?

**ටී. බී. එම්. හේරත් මයා.**
*(திரு. ரி. பி. எம். ஹேரத்)*
(Mr. T. B. M. Herath)
තමුන්නාන්සේ දන්නවා, ඇමතිතුමා පොඩි අමාරුවක වැටීගෙන යන බව.

**නියෝජ්‍ය කථානායකතුමා**
*(உப சபாநாயகர் அவர்கள்)*
(Mr. Deputy Speaker)
Otherwise it will not be a Debate.

**ටී. බී. එම්. හේරත් මයා.**
*(திரு. ரி. பி. எம். ஹேரத்)*
(Mr. T. B. M. Herath)
කොළඹට දෙනවා යැයි පොරොන්දු වෙනවා. කොළඹට වාගේම අනෙක් නගර වලටත් දෙනවා යැයි පොරොන්දු වෙනවා. කොළඹට දෙනවා නම්, ප්‍රත්‍යන්ත නගර වලටත් දෙනවා නම්, අපේ ගම්බදටත් දෙනවාද ? ඇමතිතුමාගේ බලවේග එන්න එන්න වැඩි වෙනවාද, එහෙම නැත්නම් අඩු වෙනවාද කියන්න මා දන්නේ නැහැ. ඒ ගැන පරීක්ෂණ කරන්න මට ශක්තියක් නැහැ.

පිටකොටුවේ විදුලි බල මධ්‍යස්ථානයෙන් මෙතෙක් ලැබුණු ලාභය දැන් අඩු වේගෙන යන බව ඇමතිතුමා දන්නවාද ? තම පිළිතුරු කථාවේදී 1964-65, 1965-66 සහ 1966-67 යන වර්ෂවල පිටකොටුවේ විදුලි බල මධ්‍යස්ථානයෙන් ලැබුණු ලාභය වෙන් වෙන් වශයෙන් ඉදිරිපත් කරන්නට ඇමතිතුමාට පුළුවන් නම්, ලැබුණු ලාභය පසුගිය වර්ෂයේදී පහත බැස තිබෙන බව එතුමාට පෙනේවි.

මේ සම්බන්ධයෙන් කථා කිරීමට තවත් ගරු මන්ත්‍රීවරුන් කිහිප දෙනකුම බලාපොරොත්තුවෙන් සිටින නිසා මගේ කථාව තවදුරටත් දීර්ඝ කරන්නට මා අදහස් කරන්නේ නැහැ. එහෙත් එක් දෙයක් මතක් කළ යුතුව තිබෙනවා. වෙන රටවල නම් මහජනයා එපා කියද්දීත් රජයෙන් විදුලි බලය සපයා දී වැඩි වැඩියෙන් ආදායම් ලබා ගන්නට කටයුතු කරනවා. එමගින් ගොවිතැන් සංවර්ධනය කරනවා ; කර්මාන්ත සංවර්ධනය කරනවා ; අවසානයේ ඒ හැමෙකකම උපකාරයෙන් රට

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

සංවර්ධනය කරනවා. එහෙත් අපේ රටේ සිදු වන්නේ එහි අනෙක් පැත්ත. මහ ජනයා විදුලි බලය ඉල්ලද්දීත් රජය "බැහැ, බැහැ" කියමින් 'බෑ කියන ව්‍යාපාර යක්' ගෙන යනවා. අපට ඕනෑ කරන්නේ නොදෙන විදුලි බලයක් නොවෙයි, දෙන විදුලි බලයක්. මුදල් නැතිකමින් අමාරුවේ වැටී සිටින මුදල් ඇමතිතුමාට වැඩි වැඩියෙන් විදුලි බලය සැපයීමෙන් මුදල් උපයා දී, එමගින් රට සංවර්ධනය කළා යැයි අවසන් හුස්මවත් හෙළන්නට විදුලි බල ඇමතිතුමාට පුළුවන්කම ලැබේවායි ප්‍රාර්ථනා කරමින් මගේ කථාව අවසාන කරනවා.

අ. භා. 4.52

**වෛද්‍යාචාර්ය එස්. ඒ. වික්‍රමසිංහ**
*(டொக்டர் எஸ். ஏ. விக்ரமசிங்ஹ)*
(Dr. S. A. Wickremasinghe)

නියෝජ්‍ය කථානායකතුමනි, දීර්ඝ කථාවක් කරන්නට මා බලාපොරොත්තු වන්නේ නැහැ. මේ ගරු සභාවට ඉදිරිපත් කර තිබෙන වාර්තාව කියවා බැලුවොත් ගරු මන්ත්‍රීවරුන් හා මහජනතාවත් වැරදි හැඟීම් ඇති කර ගන්නට පුළුවන් බව පළමුවෙන්ම මතක් කරන්නට ඕනෑ. සංචිත අරමුදලක් ඇති කිරීම සඳහා, විදුලි බල දෙපාර්තමේන්තුව ලැබූ ලාභවලින් රුපියල් 89,00,000 ක් යොදවනවා යැයි එම වාර්තාවේ සඳහන් වෙනවා. මේ ලාභ ලබා ගැනීමේ ප්‍රශ්නය සම්බන්ධයෙන් තමයි, ඇමතිතුමාගෙන් කරුණු කිපයක් අහන්නට මා බලාපොරොත්තු වන්නේ.

රජය විදුලි බලය බෙදා හරින්නේ ඒකාධිකාරී සවිංධානයක් හැටියටයි. අපේ රටේ එක් වැසියකුගේ වාර්ෂික පොදු ජාතික ආදායම රුපියල් 600ක් පමණ වෙනවා. ධනවාදී දියුණු බටහිර යුරෝපීය රටවල එක් වැසියකුගේ වාර්ෂික පොදු ජාතික ආදායම රුපියල් 15,000 ක් 20,000 ක් පමණ වෙනවා. අනෙක් අතින්, විදුලි බලය වෙනුවෙන් අපේ රටේත් ඒ රටවලත් අය කරන මුදල බැලුවොත්, පොදු ජාතික ආදායම අපේ මෙන් 25 ගුණයක් පමණ වන ඒ රටවල පාරිභෝගිකයකුගෙන් විදුලි බලය වෙනුවෙන් අය කරන්නේ අපේ රටේ අය කරන මුදලින් 1/4 ක් තරම් වන මුදලක් බව පෙනී යනවා ඇති. ඒ නිසා ඉතාමත්ම අධික අන්දමට විදුලි බලය මිල කර තිබෙන නිසා තමයි මේ අන්දමට ලාභයක් පෙන්වා තිබෙන්නේ. මේ සම්බන්ධව ආණ්ඩුව මහත් නින්දාවටත් ලජ්ජාවටත් පත් වන්නට ඕනෑ. නිෂ්පාදනයට විශාල මුදලක් වියදම් වන නිසා ලාභයට විදුලි බලය සැපයීමට මේ ආණ්ඩුවට නොහැකි වී තිබෙනවා. මේ කරුණ සම්බන්ධව දෙපාර්තමේන්තුවේ නිලධාරීන්ට දොස් කියන්නට මා බලාපොරොත්තු වන්නේ නැහැ. මෙයට හේතුව අධිරාජ්‍යවාදී යටත් විජිත ක්‍රමය අනුව එක්සත් ජාතික පක්ෂය ආණ්ඩු කරන කාලයේ මේ රටේ ලාභයට විදුලි බලය ලබා ගන්නා ක්‍රම යටපත් කර ඇමෙරිකන් ඒකාධිකාරී බලයක් ඇති කොම්පැනි මගින් කළුතෙල් මේ රටටම ගෙන්වා ඒ මගින් මැෂින් දුවවා විදුලි බලය නිපදවීමට කටයුතු යෙදීමයි. ඒක තමයි විදුලි බලය නිපදවීමේ යටත් විජිත ක්‍රමය. යටත් විජිත ක්‍රමයට වරං ගත් එක්සත් ජාතික පක්ෂයත් අනුගමනය කළේ එයයි. එයට නිදසුන් වශයෙන් මේ විධියේ ප්‍රකාශයක් 1952 ලෝක බැංකු වාර්තාවේ දක්වා තිබෙනවා. ප්‍රකාශය මේකයි:

"The total time of planning and construction is strongly in favour of thermal installations."

. .

ඒ වාර්තාව දිගටම කියවන්නට මා බලාපොරොත්තු වන්නේ නැහැ. ලෝක බැංකු වාර්තාවේ හැටියට නම් ජල විදුලි ක්‍රමය නොවෙයි ලංකාව වැනි රටවලට ප්‍රයෝජනවත්. ඒ වාර්තාවේ හැටියට ලංකාව වැනි රටවලට ප්‍රයෝජනවත් පිටරටින් කළුතෙල් ගෙන්වාගෙන "තර්මල් ඉලෙක්ට්‍රික්" හෙවත් තෙල්වලින් යන්ත්‍ර දුවවා විදුලි බලය නිපදවීමයි. 1956 වන තුරුම ලෝක බැංකුවට කීකරුව මේ රටත් ඒ ක්‍රමය අනුගමනය කළා. ඊට පසුවත් ඒ ක්‍රමයම ගෙන යන්නට එක්සත් ජාතික පක්ෂයේ ප්‍රතිපත්ති අනුගමනය කරන අපේ ඇමතිතුමා බොහොම මහන්සි ගත්තා. නැවතත් 1965 දී ලෝක බැංකුවේ බලපෑමට යටත්ව අර පරණ තත්ත්වයට ගන්නට ප්‍රයත්නයක් දැරූ නමුත් එය කරන්නට පුළුවන් වුණේ නැහැ. එහෙත් නියම අන්දමේ දියුණුවක් වළක්වන තත්ත්වයකට ගෙනාවා. ජල විදුලි ක්‍රමය මගින් විදුලිය සපයනවා නම් දැනට වඩා අඩු මිල

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[වෛද්‍යාචාර්ය එස්. ඒ. වික්‍රමසිංහ]

කට පාරිභෝගිකයින්ට විදුලි බලය සැපයීමට හැකි වන අතරම විශාල ලාභයක් ලබා ගන්නටත් පුළුවන්කම තිබෙනවා. එය කරන්නට බැරි වී තිබෙන්නේ ආණ්ඩුවේ ප්‍රතිපත්තියේ ඇති දුර්වලකම නිසයි. වර්තමාන ඇමතිවරයා පසුගිය ආණ්ඩුවෙන් මෙම ඇමති පදවියේම කටයුතු කරන කාලයේදී ලෝක බැංකුවේ කොටසක් වන ඇමෙරිකන් කොම්පැනිකාරයින් සමග එක් වී මහවැලි ගඟ ව්‍යාපාරයෙන් කිලෝවොට් ලක්ෂ 2 ක් ලබාගැනීමේ වැඩ පිළිවෙළක් ඇති කළා. එය ක්‍රියාවේ යොදවන්නටත් මහන්සි ගත්තා. වාසනාවකට වගේ, ඊට විරුද්ධ ක්‍රියාමාර්ගයක් ගෙන ගොස් උද්ඝෝෂණයක් ඇති කර ඒ වැඩ පිළිවෙළ නතර කර එක්සත් ජාතීන්ගේ මණ්ඩලය මගින් සමාජවාදී රටවල විශේෂඥයින් යොදවා පර්යේෂණ පවත්වා තිබෙනවා. ඔවුන්ගේ තාවකාලික වාර්තාව අනුව මහවැලි ගඟ යෝජනා ක්‍රමයෙන් ඇමෙරිකන්කාරයින් යෝජනා කළ කිලෝවොට් ලක්‍ෂ 2 වෙනුවට කිලෝවොට් ලක්‍ෂ 10 ක් නිපදවන්නට පුළුවන් බව කියා තිබෙනවා. ලෝක බැංකුවත්, අධිරාජ්‍යවාදී ආණ්ඩුත් එක්සත් ජාතික පක්ෂයත් එකම ප්‍රතිපත්තිය අනුගමනය කරන බව එයින් පේනවා. අඩු මිළට ලබා ගන්නට පුළුවන් විදුලි බලය නිෂ්පාදනය කිරීම සම්බන්ධයෙන් පුළුවන් තරම් දුරට බාධා කිරීමට ලෝක බැංකුවත් අධිරාජ්‍යවාදී ආණ්ඩුත් මෙතෙක් කල් ක්‍රියා කළා වාගේම දැනුත් ක්‍රියා කරගෙන යනවා.

ලක්ෂපාන සිට ගාල්ල දක්වාත්, ලක්ෂපාන සිට ත්‍රිකුණාමලය දක්වාත්, යනාදී වශයෙන් විශාල කම්බි නොයෙකුත් ප්‍රදේශවලට අදින බවක් ගරු ඇමතිතුමා ප්‍රකාශ කළා. විදුලි බලය නිපදවනවා නම් ඒවා බෙදා හැරීම සඳහා කම්බි ඇදීමත් අවශ්‍යයයි. එහෙත් ඒ තරම් දුර කම්බි අදින්නේ නැතිව ප්‍රාදේශීය වශයෙන් විදුලි බලය නිපදවා ගැනීමට කටයුතු කරන්නට පුළුවනි. මා නියෝජනය කරන ප්‍රදේශයේ තිබෙන නිල්වලා ගඟ අවුරුද්දකට හත් වාතාවක් පමණ ගලනවා. එසේ ගැලීම නිසා කුඹුරු අක්කර හැටහත් දාහක් පමණ විනාශ වෙනවා. වැසි කාලයට මේ ගඟේ ඇති වැඩි වතුර හම්බන්තොට ප්‍රදේශයට හරවා යවනවා නම් විශාල සෙතක් සැලසෙනවා. තවද මේ ගඟ ප්‍රයෝජනයට ගනිමින් විදුලි බලය කිලොවොට්ස් පණස් දාහක් පමණ නිපදවන්නට පුළුවන් බව විශේෂඥයන් පෙන්වා දෙනවා. නිල්වලා ගඟ හම්බන්තොට ප්‍රදේශයට හැරවීමටත්, විදුලි බලය නිපදවීමටත්, වැඩ පිළිවෙළක් ක්‍රියාත්මක කළහොත් කිසිම අපහසුවක් නැතිව දකුණු පළාතට විදුලි බලය ලබා ගන්නට පුළුවනි. එපමණක් නොව, ජල ගැල්මෙන් ජනතාවට සිදු වන හානියත් නැති වී යනවා. මේ පිළිබඳව කටයුතු කිරීම සම්බන්ධයෙන් දැනට ලෝක බැංකුවෙන් බාධා තිබෙනවා. ඇත්තෙන්ම හරි ප්‍රතිපත්තියක් අනුගමනය නොකරන නිසා විදුලි බලය ලබා ගැනීමට අද මහජනයාට ලොකු අපහසුවක් තිබෙනවා. අඩු කිලොවොට්ස් ප්‍රමාණයේ කම්බි තිබියදීත් තවමත් බූමිතෙල් කුප්පි පාවිච්චි කිරීමට මේ රටේ ජනතාවට සිදු වී තිබෙනවා.

තවද, විදුලි බලය නිපදවන වෙනත් බොහෝ රටවල විදුලිබල ගාස්තු ලංකාවට වඩා අඩුයි. ඉන්දියාවේ සාමාන්‍ය වැසියකුගේ පොදු ආදායම ලංකාවේ සාමාන්‍ය වැසියකුගේ පොදු ආදායමට වඩා දෙගුණයකින් අඩුයි. මේ අතර ඉන්දියාවේ විදුලි බලය ලංකාවේ විදුලි බලයට වඩා දෙගුණයකින් ලාභයි. මේ අනුව සලකා බලන විට ලංකාවේ විදුලි බල ගාස්තු ඉතාමත්ම අසාධාරණ බව කියන්නට සිදු වී තිබෙනවා. බූමිතෙල් කුප්පි පාවිච්චි කරනවාට වඩා විදුලි ආලෝකය ලබා ගැනීමෙන් සනීපාරක්ෂාව සැලසෙනවා. බූමිතෙල් කුප්පියෙන් මෙන් විදුලි ආලෝකයෙන් පිරිසිදු වාතය පිලිස්සී යන්නේ නැහැ. ඒ වාගේම විදුලි ආලෝකයෙහි දුම් ගැසිල්ලක් නැහැ. සුළු සුළු කර්මාන්ත සඳහාද විදුලි බලයෙන් ගත හැකි ප්‍රයෝජනය ඉතා විශාලයි. ධනය වැඩි කර ගැනීම සඳහා විදුලි බලය ප්‍රයෝජනයට ගෙන සුළු කර්මාන්ත දියුණු කර ගන්නට පුළුවනි. හැබැයි, මූලික වශයෙන් විදුලි බලය ඉතාමත් අඩු වියදමකින් ලබා ගැනීමට ජනතාවට පහසුකම් සලස්වන්නට ඕනෑ. අඩු මිළට විදුලි බලය සැපයිය යුතුයි.

ලෝක බැංකුව අණ කරන විධියට ක්‍රියා කිරීම මෙම ආණ්ඩුවේ ප්‍රතිපත්තියයි. පසුගිය ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේ ආණ්

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

බුව තෙල් වෙළඳාම ජනසතු කිරීමෙන් පසු සමාජවාදී රටවලින් කළු තෙල්, පැට්‍රල් ආදිය ලබා ගන්නට පහසුකම් ලැබුණා. විදුලි බලය නිපදවීමට කළු තෙල් ආදිය සපයා විශාල ආදායම් ලබා ගැනීමට බ්‍රිතාන්‍ය හා ඇමෙරිකානු අධිරාජ්‍යවාදී ආණ්ඩුවල ඒකාධිකාරී කොම්පැනිවලට අවස්ථාව සලසා දීමට වුවමනා නම් ජනසතු ව්‍යාපාර වෙනස් කරන්නට ඕනෑ. දැන් ඒ සඳහා විශාල කුමන්ත්‍රණයක් තිබෙනවා. දැන් විදුලි දෙපාර්තමේන්තුවක් සංස්ථාවක් බවට පත් කරන්නට යනවා. සංයුක්ත මණ්ඩලවල නිලතල දෙන්නේ ධනපති විදේශ කොම්පැනිවලට සම්බන්ධකම් තිබෙන, සමාජවාදී ප්‍රතිපත්තිවලට සම්පූර්ණයෙන්ම විරුද්ධ උග්‍ර ධනපතියන්ටයි. අද දවසේ තිබෙන විශාල මහජන ව්‍යාපාර, ජනසතු ව්‍යාපාර, ධනපතියන් අතට ගැනීම සඳහා ලංකාවේ පමණක් නොව වෙනත් රටවලත් මෙම උපක්‍රමය යොදනවා. කෙළින්ම ධනපති ක්‍රමය තහවුරු කරන්නට කටයුතු නොකර මෙවැනි සංයුක්ත මණ්ඩල ඇති කොට ධනපති ක්‍රමයට සේවය කරන සහචරයන් ඒවාට පත් කොට ඒවා මාර්ගයෙන් එම ජනසතු ව්‍යාපාර ඒකාධිකාරී ධනපති කොම්පැනිවලට අයත් වන ආකරයට කටයුතු කිරීමේ වැඩ පිළිවෙලක් හැටියට සඳහන් කළ හැකි මෙය, ඇමෙරිකාව තුළත් ක්‍රියාවේ යෙදවෙන ප්‍රතිපත්තියක්. ඇමෙරිකන් ආණ්ඩුව මාර්ගයෙන් ජනසතු ව්‍යාපාර පවත්වාගෙන යනවා. ඒවා පාලනය කරනු ලබන්නේ විශාල ධනපති කොම්පැනියි; මහජන ඡන්දය මත බිහි කරන සංස්ථාවලින් නොවෙයි. ඒ රටේ ආණ්ඩු බලය විශාල කොම්පැනි මගින් පාලනය කරන හෙයින්, මෙවැනි සංචිත අරමුදල් සඳහා පුද්ගලික ධනය යොදවන්නට අකමැති නිසා, ආදායම් බදුවලින් ලැබෙන මුදල් ඒ වෙනුවෙන් යොදවා සංවර්ධන කටයුතු කරනු ලබන අතර, ඒවායින් ලබන ප්‍රයෝජන විශාල ධනපති කොම්පැනිවලට ලබා ගැනීමේ ආයුධයක් වශයෙන් සංයුක්ත මණ්ඩල පවත්වාගෙන යන බව පෙනෙනවා. එම ප්‍රතිපත්තිය ක්‍රියාවේ යෙදවීම පිණිස මෙම රජය ඉතා දක්ෂ ලෙස වැඩ පිළිවෙළ යොදා ගෙන යනබව පෙනෙනවා. ප්‍රතිගාමී ධනපති කොම්පැනි වල කොටස්කාරයන් එම සංයුක්ත මණ්ඩවල පාලනයට යොදවාගෙන ඉතා භයානක අන්දමේ වැඩ පිළිවෙළක් ගෙන යන බව පෙනෙනවා.

විදුලි දෙපාර්තමේන්තුව එවැනි සංයුක්ත මණ්ඩලයකට ගැනීම වළක්වා ලනු සඳහා මහජනතාවගේත් විදුලි දෙපාර්තමේන්තුවේ නිලධාරීන්ගේත් සහයෝගය ඇතුව කටයුතු කරන්නට ගරු ඇමතිතුමාට පුළුවන් වේවිය කියා අප කල්පනා කරනවා. මහජනතාවට නියමාකාරයෙන් සේවය කරන සංයුක්ත මණ්ඩල හැටියට මේවායේ කටයුතු පවත්වාගෙන යනවා නම් අපට විරුද්ධ වන්නට වුවමනාවක් ඇත්තේ නැහැ. එහෙත් අද රටේ සෑම සංස්ථාවක්ම වාගේ ක්‍රියාවට යෙදවෙන්නේ දේශීය හා විදේශීය ධනපති කොම්පැනිකාරයන්ගේ අයිතිවාසිකම් ආරක්ෂා වන අන්දමේ ආර්ථික ක්‍රමයක් යටතේයි. රජයේ පාලනය තුළ ජනසතු ව්‍යාපාර පවත්වාගෙන යනවා වෙනුවට එම ජනසතු ව්‍යාපාරවලට පිටින් නිකම් රූකඩ වාගේ සංයුක්ත මණ්ඩල ඇති කොට ඒවායේ කටයුතු කොම්පැනිකාරයන්ගේ පාලනයට යටත් කිරීමේ පරමාර්ථයෙනුයි, එසේ ක්‍රියා කරන්නේ.

ගරු ඇමතිතුමා කිව්වා, ගම්වලට විදුලි බලය දීම සඳහා ක්‍රියාවේ යොදවන යෝජනා පිළිබඳව. මීට අවුරුදු 6කට පමණ පෙර විදුලි ආලෝකය ලබා ගැනීම සඳහා අකුරැස්ස නගරයේ යන්ත්‍රයක් සවි කිරීමේ වැඩ පිළිවෙළක් යෝජනා කොට එම ගම්සභා කොමිටිය මගින් ඒ සඳහා ණය මුදලක් ඉල්ලා සිටියා. ලක්ෂපානෙන් එය කිලෝවොට් 32,000 ක කම්බියක් අකුරැස්ස හරහා ගාල්ල දක්වා ඇදී යන හෙයින්, ඒ මගින් විදුලි බලය ලබා දීම සඳහා ට්‍රාන්ස්ෆෝමර් එකක් සවි කරන්නට පුළුවන් වන බව පෙනී යන හෙයින් යටකී අන්දමේ කළුතෙල්වලින් ක්‍රියා කරවන යන්ත්‍රයක් සවි කිරීම පිණිස අනුමැතියක් දෙන්නට බැරි බව ඊට පිළිතුරු වශයෙන් ප්‍රකාශ කරන්නට යෙදුණා. අප එම පිළිතුර සතුටින් භාරගත්තා. කිලෝවොට් 32,000 නැති නම් 16,000 ලොකු කම්බියක් ඒ මාර්ගයෙහි දුවන්නට වෙලා දැන් අවුරුදු 2 ක් පමණ වෙනවා. එම ප්‍රදේශයේ කොම්පැනිකාරයකුට අයිති කර්

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[වෛද්‍යාචාර්ය එස්. ඒ. වික්‍රමසිංහ]

මාන්ත ශාලාවකට ට්‍රාන්ස්ෆෝමර් එකක් සවි කර ගෙන විදුලි බලය ලබා ගන්නට පුළුවන් වී තිබෙනවා. අකුරැස්සේ නගරයට, අකුරැස්සේ ආරෝග්‍යශාලාව, මහ විද්‍යාලය වැනි මහජන සේවාවන් සලසන ස්ථානවලට අද විදුලි ආලෝකය ලබා ගන්නට බැහැ. ට්‍රාන්ස්ෆෝමර් එකක් නැතිකම නිසා, අකුරැස්ස ආසනයේ එකම ආරෝග්‍යශාලාව වන අකුරැස්සේ ආරෝග්‍යශාලාවට විදුලි එළිය ලබා ගන්නට පුළුවන්කමක් නැහැ. මෙම රෝහලට ජල පහසුකම් සැපයීම සඳහා පොම්ප ආදිය සවිකර තිබෙන නමුත් විදුලි බලය නැති නිසා එයින් ප්‍රයෝජනයක් නැතිවී ගොස් තිබෙනවා. ජල පහසුව සැපයීමේ වැඩ පිළිවෙළත් ඇනහිට තිබෙනවා. වෛද්‍යවරුන් ශල්‍යකර්ම කරන අවස්ථාවලදීත්, දරුවන් ලැබීම වැනි අවස්ථාවලදීත් කුප්පි ලාම්පු වෙනුවට විදුලි ආලෝකය පාවිච්චි කරන්නට පුළුවන්කමක් තිබෙනවා නම් ඒ කටයුතු හොඳින් පහසුවෙන් කරන්නට වෛද්‍යවරුන්ටත් අනෙක් සේවකයන්ටත් පුළුවන් වන බව අප කවුරුනුත් දන්නවා. එම නිසා. යන්ත්‍රයක් සවි කොට ඒ මගින් අකුරැස්සේ ආරෝග්‍යශාලාවට විදුලි එළිය ලබා ගැනීමට කටයුතු යෙදුවා නම් ඉතාම ප්‍රයෝජනවත් බව, අද ගම්වලට විදුලි එළිය දෙන්නට යන බවට පුරසාරම් කියන ඇමතිතුමා හොඳින් අවබෝධ කර ගන්නවා ඇතැයි මා අදහස් කරනවා. අවුරුදු 5 ක් තිස්සේ එය කර ගන්නට බැරි වුණා. වඩා හොඳ ක්‍රමයක් පිළිගන්නට අප කැමතියි. අකුරැස්සේ ගම්සභාව දැන් සුළු නගරසභාවක් වී තිබෙනවා. එහෙත් අද වනතුරුත් ට්‍රාන්ස්ෆෝමරයක් යොදවා ඊට විදුලිබලය දීමේ කටයුතු සිදුවී නැහැ. විදුලිබල දෙපාර්තමේන්තුවේ කටයුතු සතුටුදායක අන්දමට නොකෙරෙන බව කණගාටුවෙන් වුවත් කියන්නට සිදු වී තිබෙනවා.

මේ අරමුදල යොදවා විදුලිබලය බෙදාහැරීමේ කටයුතු කිරීම ගැන අපේ විරුද්ධත්වයක් නැහැ. එහෙත්, මීටවඩා ආදායම් ලබා ගන්නට පුළුවන් වන අන්දමට, මේ යෝජනාවෙන් කියැවෙනවාට වඩා අඩු මිළකට විදුලි බලය නිෂ්පාදනය කොට එය සුළු ආදායම් ඇති අයටත් ලබා ගන්නට පුළුවන් වන අන්දමට, ගඩොළු කැපීම වැනි කර්මාන්ත පවා විදුලි බලයෙන් කරන්නට පුළුවන් වන අන්දමට, අද යෝජනා කර තිබෙන බහු කර්මාන්ත ක්‍රම හා වාරිමාර්ග ක්‍රම, ගංවතුර වැළැක්වීමේ ක්‍රම ආදී සෑම දෙයක් සඳහා විදුලි බලය ප්‍රයෝජනයට ගතහැකි අන්දමට මේ රටේ දැන් පවතින ප්‍රතිපත්ති වෙනස් කිරීම අවශ්‍ය බව මා මතක් කරනවා. ගංගා නිම්න භූමි සංවර්ධන වැඩ පිළිවෙළ ගල්ඔයට උඩවළවේට පමණක් සීමා නොකර, රටේ ජනගහනයෙන් හතරෙන් තුනක් පමණ ජීවත් වන, මීගමු ප්‍රදේශයේ සිට හම්බන්තොට ප්‍රදේශය දක්වා විහිදී යන තෙත් කලාපයේ ප්‍රයෝජනය සඳහාත් එය යොදවා, එම ජනතාවට ගංවතුරෙන් වන හානි වළක්වා ගැනීමටත් වැඩි ජලය වියළි කලාපයට හරවා යැවීමේ ක්‍රම තිබෙන නිසා එය ක්‍රියාත්මක කිරීමටත්, රටේ සංවර්ධනයට හේතු වන වෙනත් නොයෙක් ක්‍රම ක්‍රියාත්මක කිරීමටත් පුළුවන් වන අන්දමට, ලෝක බැංකුවේ යෝජනා ගැන කල්පනා නොකර, අපේ රට දියුණු කිරීමට පුළුවන් වන අන්දමට, විදේශවලින්ද ආධාර ලබාගෙන වැඩ කරන ලෙස මා ගරු ඇමතිතුමාට මතක් කරනවා.

මුළු ලංකාවේම ජලවිදුලි ක්‍රමවලින් ලබා ගන්නට පුළුවන් වන්නේ විදුලියබල කිලෝවෝට් 10 ලක්ෂයක් පමණක් බව 1951 දී ලෝක බැංකු වාර්තාවක් කියා සිටියා. එහෙත්, අද මහවැලි ගඟ යෝජනා ක්‍රමයෙන් පමණක් කිලෝවොට් 10 ලක්ෂයක් ලබා ගනන්ට පුළුවන් බව ඒ පිළිබඳව පළ වී තිබෙන තාවකාලික වාර්තාවක සඳහන් වෙනවා. මේ රටේ ජල විදුලි බලය ලබා ගැනීමේ වැඩ පිළිවෙළට ලෝක බැංකුව මොන තරම් ද්‍රෝහි වී තිබෙනවාද, ජනතාව අධෛර්ය වන අන්දමට එය මොනතරම් කටයුතු කර තිබෙනවාද යන බව මෙයින් පෙනෙනවා. නමුත් අදත් ආණ්ඩුවත් ඇමති මණ්ඩලයත් දෙවියන් වශයෙන් සලකන්නේ මේ ලෝක බැංකුවයි. මේ ආණ්ඩුව අවසාන අවවාදය හැටියට ලෝක බැංකුව කියන දෙය තමයි දොහොත් මුදුන් දී පිළිගන්නේ. නමුත් ලෝක බැංකුවේ 1951 වාර්තාව කියවන [illegible] එය සම්පූර්ණයෙන්ම බොරු වී

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

තිබෙන බව පැහැදිලිවම පෙනෙනවා. එක් ගඟක් සංවර්ධනය කිරීමෙන් පමණක් මුළු ලංකාවටම වුවමනා කරන විදුලි බලය නිෂ්පාදනය කර ගන්නට පුළුවන්ය කියා එක්සත් ජාතීන්ගේ මණ්ඩලයේ විශේෂඥයින් වාර්තා කර තිබෙනවා. අඩු මුදලට, කිසිම මහන්සියක් නැතිව ජල විදුලි බලය නිෂ්පාදනය කළහැකි ක්‍රම ඒ වාර්තාවලින් පෙන්වා දී තිබෙනවා. අන්න ඒ වාර්තාවල සඳහන් වන අන්දමට අපේ රටට වුවමනා කරන විදුලි බලය නිෂ්පාදනය කරන්නට කටයුතු කරන මෙන් මා ගරු ඇමතිතුමාගෙන් ඉල්ලා සිටිනවා.

අ. භා. 5.15

**එම්. අබ්දුල් බකීර් මාකර් මයා.** (බේරුවල)

*(திரு. எம். அப்துல் பாக்கீர் மாக்கார்—வேருவலை)*

(Mr. M. Abdul Bakeer Markar—Beruwala)

Mr. Deputy Speaker, I am happy to follow the learned doctor, the hon. Member for Akuressa (Dr. S. A. Wickremasinghe), because during the course of his speech we were told about the way in which he would handle matters of this nature: the private sector would be completely destroyed and everything would be nationalized.

I remember reading in the newspapers some time back the hon. Member's name as a member of the Shadow Cabinet. I would say to him that if he is returned to power as a member of the ruling party—I do not think it will be in our time—then he can implement those policies about which he has been speaking and re-organize the administrative set-up in the way his government likes it, be it the Moscow way or the Peking way.

The Hon. Minister, following the policies of the National Government, chalked out certain plans by which to improve and develop the country, that is, by supplying electricity to the rural areas. Without stopping at schemes and plans and without confining himself to charts and tables, the Hon. Minister has come before the House and is asking for financial provision to implement his schemes and plans.

We are happy that before long he will be in a position to give the rural areas the electricity that is required. At the same time I would like to point out that in the matter of supplying electricity, the Department of Government Electrical Undertakings has taken on certain duties and functions which were earlier performed by the local authorities. In the past local authorities had their own power plants and power houses and they supplied electricity to their own areas. The local authorities made a profit on the supply of electricity to their areas, and with those profits they were able to develop those areas.

Now that the Department of Government Electrical Undertakings has taken over the entire supply of electricity throughout the Island, the Government must not forget the part played by the local authorities in the past and the part that they can play in the future.

Therefore, whatever may be the present plans and schemes, the Hon. Minister must see to it that the local authorities are given an opportunity to carry on the work of improving schemes in their own areas. Some system should be devised whereby the profits earned by the Department of Government Electrical Undertakings are shared with the local authorities. For example, at the moment local authorities buy electricity in bulk from the Department of Government Electrical Undertakings, and when electricity is supplied to the consumers in the area of the local authority, the profit made must be sufficient for the local authority to effect improvements to the schemes in its own area. Earlier, the Local Loans and Development Fund assisted them by way of loans in order to raise the money necessary for undertaking such development plans, but now that fund is not pre-

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[බකීර් මාකර් මයා.]

pared to give them any loans. Consequently, the local authorities find it difficult to raise the necessary funds to improve their electricity schemes. Now that the Department of Government Electrical Undertakings is making colossal profits on the sale of electricity, I think it is in the fitness of things, and it is their responsibility also, to see that they assist the local authorities to effect improvements and repairs to their electricity schemes. It is no secret that if the necessary repairs are not effected in some of those electricity schemes, the day is not far off when there might be a complete breakdown of the electricity supply in those areas.

The Department of Local Government as well as the Local Loans and Development Fund is not in a position to give the local authorities any funds by way of loans and, therefore, it is very necessary that the Hon. Minister take into consideration what the effect of such an eventuality is going to be. And if any of those electricity schemes fail and there is a breakdown in the supply, it is the department that will suffer financially. I remember asking the Hon. Minister on an earlier occasion too that out of the profits the department earns, the department should set apart a certain amount to be utilized on loans to local authorities to enable them to effect the necessary repairs to their electricity schemes. If that is done, the department, while helping those local authorities, would be able to make more profits on electricity.

There is another point I would like to draw the attention of the Minister to. Many of these local authorities find that their towns are developing; residential houses and factories are coming up. But they are not in a position to extend their schemes to meet the increased demand for electricity, because they do not have the necessary funds. Their revenue does not permit them to spend such large sums of money. If the Department of Local Government or the Local Loans and Development Fund or even the Department of Government Electrical Undertakings is not prepared to help them, how can they effect the necessary improvements in order to provide the necessary facilities for the developing areas? The Hon. Minister should consider that aspect of the matter too. The local authorities are really providnig you the money for your undertakings, and I would ask the Hon. Minister to see that local authorities also come in for assistance.

While extending the supply of electricity to the rural areas, the department must not forget the towns. Towns have to maintain a certain standard. It is well and good to electrify the rural areas; we are all for it. But while doing so, should you forget the development of the towns? If you do not want to do that, then some steps must be taken towards development.

Then, I might draw the attention of the Minister to the Rural Electrification Scheme. We were written to and in my own electorate I was asked to name the priorities from a list of villages that was supplied. We were asked to say in which order they should be taken up. I must point out to the Minister that I did forward my list in which I mentioned the names of some of the villages in order of priorities. But in the list they selected, some of the areas I mentioned were not included. They were not taken on to the final list. But it is very strange that the names of one or two villages that are not in my electorate have got into this list. I do not know whether it is sabotage; you can call it what you like. Of the two names the Hon. Minister gave me, one is not in my electorate. The other does not occupy a high place in the priority list supplied by me. I am afraid something else is happening in the department. They get concurrence only on paper but in practice nothing is done.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

I know in some areas people have wired their houses. For instance, in the Warapitiya area there are people who are prepared to pay the money in advance, but yet those things are not considered. I should like the Hon. Minister to give his attention to it.

Finally, I should like the Hon. Minister to see that out of the profits the department makes the local auhorities are assisted. If you fail to do so there will be a breakdown and if there is a breakdown, the Government will lose. That loss will have to be suffered by your own Ministry.

අ. භා. 5.27

**බී. වයි. තුඩාවේ මයා.** (මාතර)
*(திரு. பி. வை. துடாவ—மாத்தறை)*
**(Mr. B. Y. Tudawe—Matara)**
මේ වදගත් අවස්ථාවෙදී මටත් වචන ස්වල්පයක් කථා කරන්නට අවස්ථාව දෙන මෙන් මා ඉල්ලා සිටිනවා.

ගරු ඇමතිතුමා ගම්බද ප්‍රදේශවලට විදුලි ආලෝකය ලබා දීම ගැන කථා කළා. ගම්වල ලැයිස්තු ඉදිරිපත් කළා. කළ වැඩ ගැන කිව්වා. කරන්නට බලාපොරොත්තු වන වැඩ ගැනත් කිව්වා. නමුත් ඇමතිතුමා කියන මේ දේවල් අප කොහොමද භාර ගන්නෙ? ඇමතිතුමා සෑම අවස්ථාවකදීම යම් යම් කරුණු සටහන් කර ගන්නවා. අයවැය ලේඛන විවාදයේදීත් ගම්වල විදුලි ආලෝකය ගැන දෙපාර්තමේන්තුවේ අඩුපාඩුකම් ගැන අප කථා කරන විට ගරු ඇමතිතුමා යම් යම් දේවල් සටහන් කර ගන්නවා. නමුත් ඒ සටහන් කර ගන්න දේවල් එකක්වත් ක්‍රියාවේ යොදවන්නේ නැහැ. ඒ සටහන් කර ගන්න දේවල් ගැන කිසිම සැලකිල්ලක් දක්වන්නේ නැහැ. ගරු ඇමතිතුමා දැනුත් යම් යම් කරුණු සටහන් කර ගත්තා. නමුත් ඒවා ගැන සැලකිල්ලක් දක්වාවි යයි අපට සිතන්නට බැහැ.

මා තමුන්නාන්සේට දැනුම් දෙන්නට සතුටුයි, මේ අවසථාවේදී ඉඩම් ඇමති කාර්යාලය තුළට වී බිම වාඩි වී සිටින ගොවීන් 55 දෙනා ගැන. දැන් පොරොන්දුවක් කඩ කළ නිසා උඩ වලවෙන් පැමිණි ගොවීන් 55 දෙනෙකු දැන් ඉඩම් ඇමති කාර්යාලය තුළට වී ඉන්නවා. ඉඩම් සංවර්ධන දෙපාර්තමේන්තුවෙන් උඩ වලවේ ගං ඉවුරේ පදිංචි කරවීම සඳහා ගෙන ගිය පවුල් 637 කට ජලය ලබා දෙන තුරු, ජලය ලැබී ගොවිතැන් කරන්නට අවස්ථාවක් ලැබෙන තුරු පඩි දෙනවාය කියා පොරොන්දුවක් දුන්නා. ඒ පොරොන්දුව ඉෂ්ට කර නැහැ. රුපියල් 128 පඩිය රුපියල් 64 ට බැස්සුවා. ඒ ගණනත් දැන් රුපියල් 32 ට අඩු කර තිබෙනවා. දැන් ඒ මිනිසුන්ට ජීවත් වෙන්නට විධියක් නැහැ. රුපියල් 128 පඩිය රුපියල් 32 ට බස්වා තිබෙනවා. ජලයත් නැත්නම්, ජලය නැති නිසා ගොවිතැන් කරන්නටත් බැරි නම් ඒ පවුල් ජීවත් වන්නේ කොහොමද කියා මා ප්‍රශ්න කරනවා. දැන් මොකක්ද එහි තිබෙන තත්ත්වය? තමන්ගේ දරු පැටවුන් ආරක්ෂා කර ගන්නට විධියක් නැතිව ඒ දුප්පත් මිනිසුන් ඔවුන් සතු දේපොළ පවා උගසට තබා සැතපුම් 170 ක් දුර ගෙවා, උඩ වලවේ සිට දැන් කොළඹට ඇවිත් ඉඩම් ඇමතිතුමාගේ කාර්යාලය තුළට වී සිටිනවා. නමුත් ඔවුන්ගේ දුක් ගැනවිල්ල අසන්නට ඇමතිතුමා ගියේ නැහැ.

**ගරු වන්නිනායක**
*(கௌரவ வன்னிநாயக்க)*
**(The Hon. Wanninayake)**
පාර්ලිමේන්තුවෙ ඉන්නට ඕනෑ නොවැ.

**තුඩාවේ මයා.**
*(திரு. துடாவ)*
**(Mr. Tudawe)**
එතුමා කිව්වා 4.30 ට යනවාය කියා.

**ගරු සී. පී. ද සිල්වා**
*(கௌரவ சீ. பீ. டி சில்வா)*
**(The Hon. C. P. de Silva)**
ස්ථිර ලේකම්.

**තුඩාවේ මයා.**
*(திரு. துடாவ)*
**(Mr. Tudawe)**
ස්ථිර ලේකම් ශ්‍රී කාන්ත මහත්මයා ගියා. නමුත් ඒ මහත්මයාට දෙන්නට උත්තරයක් නැහැ. ඒ මහත්මයාත් කියනවා, මේ ගොවීන්ට කර තිබෙන්නේ වැරදි වැඩක්ය කියා. තමුන්නාන්සේලා මහජන

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[තුඩාවේ මයා.]

තාවට වැඩ කරනවාය කියනවා. ගම්බද ගොවි ජනතාවට වැඩ කරනවාය කියනවා. මේ රටේ වගාව දියුණු කරනවාය කියනවා. මේ තමුන්නාන්සේලා දුප්පත් ගොවීන්ට සලකන ආකාරයද? පවුල් 637 ක් මහ කැලෑවකට ගෙන ගොස් දමා තිබෙනවා. ඔවුන්ට කන්නට බොන්නට විධියක් නැහැ. ගොවිතැන් කරන්නට ජලය නැහැ. ජලය සපයන තුරු වැටුප් ගෙවනවාය කිව්වා. ඒ පොරොන්දුවත් ඉෂ්ට කර නැහැ. ඒ දුප්පත් ගොවීන්ට සහනයක් ලබා දීමට ක්‍රියා කරන මෙන් මේ අවස්ථාවේදී මා ගරු ඇමතිතුමාගෙන් ඉල්ලා සිටිනවා. මේ කාරණය සත්‍ය නම් ඒ මිනිසුන්ට නියමිත වැටුප් ලබා දෙන්නට ක්‍රියා කරනවාය කියා ගරු ඇමතිතුමා කිව්වා. නමුත් ඒ පිළිබඳව කිසිවක් කර නැහැ. දෙපාතීමේන්තුව ඒ ප්‍රශ්නය ගැන කිසිම සැලකිල්ලක් දක්වා නැහැ. එම නිසා මේ පවුල් 637 ගැන, මේ දුප්පත් ගොවි පිරිස ගැන, අනුකම්පා කර වහාම සහනයක් සැලසීමට ක්‍රියා කරන මෙන් මා තමුන්නාන්සේගෙන් ඉල්ලා සිටිනවා. ඔවුන්ගේ දුක්ගැනවිල්ලට සවන් දී සහනයක් දෙනවාය කියා පොරොන්දුවක් දෙන තුරු ඔවුන් තමුන්නාන්සේගේ කාර්යාලයෙන් පිට වන්නේ නැත කියනවා. තමුන්නාන්සේ ඔවුන් ගැන අනුකම්පා නොකරනවා නම්, වෙඩි තබා ඔවුන් එළියට ඇද දමන්නටයි සිද්ධ වෙන්නෙ. තමුන්නාන්සේ පොරොන්දුවක් දෙන තුරු ඒ අය පිටතට යන්නට ලෑස්ති නැහැ. තමුන්නාන්සේට ඇයි ඒ අයට මුහුණ දෙන්නට බැරි? මේ කර තිබෙන වරද හරි ගස්සනවාය කියා තමුන්නාන්සේට පොරොන්දුවක් දෙන්නට බැරි ඇයි? ඒ අයගේ දුක්ගැනවිල්ලට සවන් දී දුන් පොරොන්දුව ඉෂ්ට කරන මෙන් මා කරුණාවෙන් ඉල්ලා සිටිනවා. තමන්ගේ රක්ෂාවල් අත්හැර, විශ්‍රාම වැටුප් අත්හැර මහා කැලෑව මැද ජීවත් වෙමින් මේ රටේ ආහාර වගාව දියුණු කරන්නට උත්සාහ කරන මේ කම්කරුවන් ගැන දැන්වත් සැලකිල්ලක් දක්වන මෙන් මා ඉල්ලා සිටිනවා.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ඇමතිතුමා පොරොන්දු දෙනව. මා දැන් මොහොතකට පෙර සඳහන් කළ ගොවීන්ට ඇමතිතුමා දී තිබෙන පොරොන්දුව ඉටු කර නැහැ. ඉතින් මහ ජනතාවට දෙන අනික් පොරොන්දු පිළිගන්නෙ කොහොමද? මේ විධියට පොරොන්දු කඩ කරන්ට දෙපාර්තමේන්තුවට ඉඩ දෙනව නම් මේ වගේ අවස්ථාවලදී ඇමතිතුමා දෙන පොරොන්දු අපි පිළිගන්නෙ කොහොමද?

විදුලි ආලෝකයෙන් ගම් දියුණු කිරීම ගැන කථා කළා. පසුගිය ආණ්ඩු කාලයේ දී මාතර ප්‍රදේශයට ජල විදුලි බලය ලැබුණු බව ඇත්ත. එහෙත් ඒ විදුලි බලය බෙදා හැරීම වර්ධනය කර මාතර නගරයටවත් සම්පූර්ණයෙන් විදුලි බලය ලබා දීමට තවම හැකි වෙලා නැහැ. මාත නගරයේ විදුලි බලය කොයිතරම් දුර්වලද කියතොත්, 33,000 කම්බි ඇද ඇති නමුත් සමහර අවස්ථාවල ගුවන් විදුලි යන්ත්‍රයක්වත් සාමාන්‍ය ටියුබ් ලයිට් එකක්වත් ක්‍රියා නොකරන තරම් දුර්වල තත්ත්වයකයි තිබෙන්නෙ. ඒ නිසා විදුලි පරිවර්තනයක් සපයා විදුලි බලය වර්ධනය කළ යුතුයි. ඒ නගරයේ තත්වයයි. ගම් ප්‍රදේශවල තත්ත්වය කොහොමද? සමහර පළාත්වල ගස් කොළන් කපල කණු ඉන්දුවා. විදුලි කම්බි නැතිව සිටිනව. කිසි වැඩක් කෙරෙන්නෙ නැහැ. 1965 සිට කණු හිටුවා බලා ඉන්නව, විදුලි බලය තවම ලැබී නැහැ. මාතර නගරය අවට ගම්වල විදුලි බලය සැපයීමේ වැඩපිළිවෙළ ඒ තත්ත්වයේයි තිබෙන්නෙ.

ගෘහ කර්මාන්ත දියුණු කරන්ට විදුලි බලය ලබා දෙනවා යයි ගරු ඇමතිතුමා පොරොන්දු වුණා. ගෘහ කර්මාන්ත තබා සාමාන්‍ය කර්මාන්තයක්වත් දියුණු කර ගන්ට පුළුවන් වන අන්දමට ඒ පළාතට විදුලි බලය ලැබී නැහැ. විදුලි බලය උපයෝගී කරගෙන කාර්මික සංවර්ධනයක් ඇති කර ගත හැකි බව ඇත්ත. එහෙත් ඒ බලය ලබා දීමට මේ ආණ්ඩුව පොහොසත් වෙලා නැහැ. විදුලි බලය වර්ධනය කර ගම් ප්‍රදේශවලට විදුලි බලය සැපයීම සඳහා අවශ්‍ය විදුලි පරිවර්තකයන් ලබා ගැනීමට දෙපාර්තමේන්තුව නියම ආකාරයට කටයුතු සංවිධානය කර නැහැ. කර්මාන්ත අතින් දියුණු කරන්ට පුළුවන් ප්‍රදේශ කීපයක් මාතර ජන්ද කොට්ඨාශය අවට තිබෙනව. ඒ කාර්මික සංවර්ධනයට අවශ්‍ය විදුලි බලය තවම

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

ලබා දීමට නොහැකි වී තිබෙන නිසා ඒ සඳහා වහාම පියවර ගන්නා මෙන් ගරු ඇමතිතුමාගෙන් මා ඉල්ලා සිටිනව. මේ සභාවෙදි සටහන් කර ගන්නට මදි; පොරොන්දු වුණාට මදි. පොරොන්දු ඉෂ්ට කර ඒ පළාත්වල කාර්මික සංවර්ධනයට ආධාර දී ඒ පළාත්වල උපදින අමු ද්‍රව්‍යවලින් නියම. ප්‍රයෝජන ලබා ගැනීමට, භාණ්ඩ නිෂ්පාදනය කිරීමට ඉක්මණින් ඒ ප්‍රදේශවල මහජනයාට අවස්ථාව සලසා දෙන ලෙස මා ඉල්ලා සිටිනව.

ගරු ඇමතිතුමා විදුලි බලය සපයා දෙන්ට අදහස් කරනනෙ අවුරුදු 12කින් සම්පූර්ණ වියදම පියවා ගැනීමට පුළුවන් කම ඇති ප්‍රදේවලට පමණයි. ඒක ඉතා අසාධාරණ තත්ත්වයක්. විදුලි සම්ප්‍රේෂණ මාර්ග ගමන් ගන්නා දැනට විදුලි බලය නොමැති ඇතැම් ගම්වල ආරම්භ කළහැකි නොයෙක් කර්මාන්ත තිබෙනව. ඒ ගම් දියුණු කිරීම සඳහා විදුලි බලය සැපයීමේදී ආදායම් ප්‍රශ්නය ගැන තැකීම ඉතාම අසාධාරණයයි මා විශ්වාස කරනව. දැනට විදුලි පරිවර්තකයන් ගෙන්වා ගැනීමට අපහසුකම නිසා, විදේශ විනිමය නැති නිසා, සම්පූර්ණයෙන්ම අත්හිටුවා තිබෙන විදුලි බල මාර්ගවල කටයුතු ඉක්මණින් නිම කර දීමට පියවර ගන්නා මෙන් ගරු ඇමතිතුමාගෙන් මා ඉල්ලා සිටිනව. මේ ගරු සභාව තුළ මා විශේෂයෙන් කියා සිටින්නෙ උඩවලවේ ගොවීන්ගේ ප්‍රශ්නය මාතර ප්‍රදේශයට විදුලිය සැපයීමටත් වඩා වැදගත් බවයි. අද ඒ ගොවීන් හමුවෙලා, ජීවත්වීමට බැරි නිසා තමුන්නාන්සේගේ ළඟට ආව ඒ ගොවීන් කෙරෙහි අනුකම්පා කරල ඔවුන් සමග සාකච්ඡා කර ඒ කාරණය සමථයකට පත් කරන ලෙස ගරු ඇමතිතුමාගෙන් මා ඉල්ලා සිටිනව. මගේ ඉල්ලීම ඒකයි.

අ. භා. 5.36

**ටී. බී. සුබසිංහ මයා.** (කටුගම්පොළ)
*(திரு. ரீ. பி. சுபசிங்க—கட்டுகம்பொல)*
(Mr. T. B. Subasinghe—Katugampola)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, අපේ පළාත්වලදී අත් දැක තිබෙන කරුණු කිහිපයක් ගැන වචනයක් දෙකක් කථා කිරීමට මා බලාපොරොත්තු වෙනවා. මේ විදුලි බල දෙපාර්තමේන්තුවේ වැඩ කටයුතු සම්බන්ධයෙන් කථා කිරීමේදී ගරු ඇමතිතුමා අවුරුදු ගණනාවක් තිස්සේම අපට කියනවා මේ රට විදුලි බලයෙන් ආලෝකමත් කිරීමට පමණක් නොව, කර්මාන්ත දියුණු කිරීමටත් යම් කිසි සැලැස්මක් අනුව කටයුතු කරනවාය කියා. නමුත් මා විශ්වාස කරන හැටියට නම් විදුලි බල දෙපාර්තමේන්තුවේ සංවර්ධන වැඩ කටයුතු—අලුත් අලුත් විදුලි බල ස්ථාන ආරම්භ කිරීම ආදිය—බොහොම ප්‍රමාදයි. ඒ ප්‍රශ්නය සම්බන්ධයෙන් මා වැඩි දුර කථා කරන්න අදහස් කරන්නේ නැහැ. නමුත් අද විදුලි බලය බෙදා දෙන ආකාරය ගැන වචනයක් දෙකක් කියන්න ඕනෑ. ගරු ඇමතිතුමා අද ගම්බද ප්‍රදේශවල විදුලි බලය පැතිර වීමට තැත් කරන්නේ මන්ත්‍රීවරුන්ගේ අදහස් අනුවයි. නමුත් මට සැකයක් තිබෙනවා මේ සම්බන්ධයෙන් මන්ත්‍රීවරුන්ගේ අදහස් පමණක් විමසීම ප්‍රමාණවත්ද කියා.

**ගරු සී. පී. ද සිල්වා**
*(கௌரவ சி. பி. டி சில்வா)*
(The Hon. C. P. de Silva)

නැහැ. එහෙම නොවෙයි කරන්නෙ. පළමුවෙන් දෙපාතර්මේන්තු නිලධාරීන්ගේ අදහස් අනුව අහවල් අහවල් තැන්වලට විදුලි බලය අවශ්‍යය කියා දැන ගන්නවා. ඊට පසුවයි මන්ත්‍රීවරුන්ගෙන් ඒ සම්බන්ධව විමසන්නෙ.

**සුබසිංහ මයා.**
*(திரு. சுபசிங்க)*
(Mr. Subasinghe)

මට පෙනෙන හැටියට, වයඹ පළාතේ හලාවත දිස්ත්‍රික්කයේත් කුරුණෑගල දිස්ත්‍රික්කයේත් පවර් ලයින්ස් කිහිපයක් තිබෙනවා. ඒ වගේම, මේ දිස්ත්‍රික්ක දෙකේම පොල් කර්මාන්තය මුල් කර ගෙන කොහු මෝල්, තෙල් මෝල්, ඩෙසිකේටඩ් මෝල් ආදී කර්මාන්තශාලා කිහිපයක් තිබෙනවා. මගේ සැකයක් තිබෙනවා, මේ මෝල්වලට වවුමනා කරන විදුලි බලය සැපයීමට ව්‍යයමයක්, පරිශ්‍රමයක් දරා තිබෙනවාද කියා. අද දවසේ යන්ත්‍ර සූත්‍ර පිටරටින් ගෙන්වා ගැනීම

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[සුබසිංහ මයා.]

ඉතාමත් අමාරුයි. විශේෂයෙන්ම තෙල් එන්ජින් ගෙන්වීම ඉතාමත් අමාරුයි. ඒ වගේම විදුලි බලය යෙදවීමත් තෙල් එන්ජින්වලින් වැඩ කිරීමත් අතර තිබෙන පරතරය, ප්‍රාග්ධනය අතින් තිබෙන ලාභය ගැන කල්පනා කර බලා, ඒ ඒ කාර්මිකයන් සමග සාකච්ඡා පවත්වා, පුළුවන් තරමින් ඒ මෝල්වලට විදුලි බලය සැපයීමට කටයුතු කර, යන්ත්‍ර සූත්‍ර වලින් හැකි තරම් වැඩ ගන්න මහන්සි ගන්නවා නම් මීට වඩා ප්‍රයෝජන ලබා ගන්න පුළුවන්ය කියා මා විශ්වාස කරනවා. නමුත් එවැනි මහන්සියක් විදුලි බල දෙපාර්තමේන්තු ගෙන තිබෙනවාය කියා මා විශ්වාස කරන්නේ නැහැ. යම්කිසි පුද්ගලයෙක් තමන්ම කල්පනා කර ඇවිත් අහවල් මෝලේ වැඩ කිරීමට විදුලි බලය සපයා දෙන්නය කියා ඉල්ලා සිටියොත් එය කර දීමට නැත් කරනවා මිසක් විශේෂ මහන්සියක් ගෙන කටයුතු කරන බවක් පේන්න නැහැ.

මේ විදුලි බල දෙපාර්තමේන්තුවේ වෙළඳ අංශයක් තිබෙනවා. එම අංශයේ සිටින අය "කොන්සියුමර්ස්ලාට" විදුලි බලය පාවිච්චි කිරීමෙන් ලැබෙන ලාභය, එයින් ලැබෙන ප්‍රයෝජන ආදිය ගැන ප්‍රචාරය කිරීමට ඒ තරම් මහන්සියක් ගන්නවාය කියා අපට විශ්වාස කරන්න බැහැ. මේ විදුලි බල දෙපාර්තමේන්තුවේ වෙළඳ අංශය ඉතාමත් දුර්වලය කියා මා හිතනවා.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මේ කර්මාන්තවලට විදුලි බලය සපයා දීමට හැකි තරම් වැයම් දරන්න ඕනෑ බව මේ අවස්ථාවේදී මා කියන්න ඕනෑ. මේ පොල් වගා කර තිබෙන පළාත් කිට්ටුවෙන්ම ප්‍රධාන පවර් ලයින්ස් කිහිපයක්ම යන නිසා එය කරන්න පුළුවනි. අනික් කරුණ නම්: ගම්බද ප්‍රදේශවලට විදුලි බලය බෙදා හැරීමට සැහෙන මහන්සියක් ගෙන තිබීම ගැන අපි සන්තෝෂ වෙන්න ඕනෑ. නමුත් ගම්බද ප්‍රදේශවල ජීවත් වන අපට පෙනී යනවා මේ විදුලි බලය බෙදා හැරීම පළල් වෙන්න පළල් වෙන්න විදුලි අංශයෙ ක්‍රියාශීලි තත්ත්වය පහළ බසින බව. මට පෙනෙන හැටියට නම් ගම්බද ප්‍රදේශවල විදුලි බලය බෙදා හැරීම හා එය නඩත්තු කිරීම ඉතාමත් නොසැලකිලිමත් ආකාරයටයි—ඕනෑවට එපාවටය—කර ගෙන යන්නෙ. අපේ පළාතේ ගම් කිපයකට විදුලි බලය බෙදා හැර තිබෙනවා. බෝලවත්තේ එප පොළ මගිනුයි බෙදා හරින්නේ. පසු ගිය අවුරුද්ද ඇතුළත හතර පස් වතාවක්ම විදුලි බලය ඇණහිටියා.. එසේ ඇණ හිටියම පැය 24ක්, 48ක් එසේ නැත්නම් දවස් කිපයක්ම යන තුරු යථා තත්ත්වයට එන්නේ නැහැ. පසු ගිය කුණාටුවෙන් පස්සේ දවස් ගණනක්ම විදුලි බලය තිබුණේ නැහැ. එවැනි තත්ත්වයක් නම් තේරුම් ගන්න පුළුවන්. එහෙත් සාමාන්‍ය දෝෂයක් නිසා ඇණහිටීමක් වුණාට පසුව ඒක අලුත්වැඩියා කරන්න පැය 24ක් නැත්නම් පැය 48ක් ගත වෙනවා. නගරයේ නම් මෙය ඒ තරම් බල පවත්වන්නේ නැහැ. කොළඹ එවැන්නක් සිදු වුණොත් ලොකු ලොකු උදවිය ටැලිෆෝන් කර බණිනවා; එනිසා ඉක්මණින් ඒවා හදනවා. අපේ ජනසතුසේවා ඇමතිතුමා සිටින ප්‍රදේශයේ විදුලි බලය නැති වුණොත්—

ගරු වී. ඒ. සුගතදාස (ජනසතු සේවා ඇමති)

(கௌரவ வீ. ஏ. சுகததாச—தேசியமய சேவை அமைச்சர்)

(The Hon. V. A. Sugathadasa—Minister of Nationalized Services)

අපට හුළු අතු තිබෙනවා.

සුබසිංහ මයා.

(திரு. சுபசிங்க)

(Mr. Subasinghe)

—එතුමා විගහට ටැලිෆෝන් කර "ෂෙල්" එකක් දැමූ හැටියෙ මොහොතින් එය හරි ගැස්සෙනවා. එහෙත් ගම්බද තත්ත්වය එසේ නොවෙයි. ඉංජිනේරුවො, ෆෝර්මන්ලා, ලයින්ස්මන්ලා සොයා ගන්න බැහැ. එක දවසක් බෝලවත්තේ කොන්ක්‍රීට් පාලමක් යටින් යන කම්බියක සුළු දෝෂයක් ඇති වී ඒක සොයා ගැනීමට පැය 48ක් ගත වුණා. විදුලි බලය ඇණ හිටි දාට පසුවදා මා ඉංජිනේරු තැනට ටැලිෆෝන් කළා. ඉංජිනේරු තැන හිටියේ නැහැ. කොහේටද ගියේ, බෝලවත්තට ආවාද කියා ප්‍රශ්න කළාම, කොහේ ගියාද

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

දන්නේ නැත කියන උත්තරය ලැබුණා. දැන් පැය 47ක සිට මේ පැත්තට විදුලි බලය නැත කියා මා ඔවුන්ට එවෙලේ දැන් වූ විට "ආ අපි ඒ ගැන දන්නේ නැහැ; මොකක් හරි වෙලා ඇති" කියන උත්තරයයි ලැබුණේ.

නියෝජ්‍ය කථානායකතුමනි, මෙහෙම පිළිතුරු අපට අසන්නට ලැබෙන විට අපට හිතෙනවා නොවේද ඇමතිතුමාගේ කාර්යාලයට ගිනි තියන්න, අර ගොවියන් ඇවිත් රැකගෙන සිටින ඒක පුදුමයක් නොවෙයි. ඒ තරම් හිතට වේදනා ඇති වෙනවා. ඒ නිසා ගම්බදට විදුලි බලය බෙදීමේදී සහ නඩත්තු කිරීමේදී මීට වඩා ක්‍රියාශීලී විධියට කිරීමට තැත් කරන ලෙස මා ඉල්ලා සිටිනවා.

මා දන්නවා, සමහර ලයින්ස්මන්ලා රාත්‍රියට කොහේ හෝ කසිප්පු පොළකට ගිහින් කසිප්පු බී නිදාගෙන සිටින බව. වුවමනාවක් වූ විට ඔවුන් සොයාගන්න බැහැ. ඔන්න ඔය තත්ත්වයයි අද ගම්බද තිබෙන්නේ. එම නිසා ඔය විධියේ ප්‍රශ්න ගැන දෙපාර්තමේන්තුව ක්‍රියාශීලී වුණේ නැත් නම්, දෙපාර්තමේන්තුවේ උසස් වග කිය යුතු නිලධාරීන් ක්‍රියාශීලීව කටයුතු කෙළේ නැත් නම් දෙපාර්තමේන්තුවේ කට යුතු තව තවත් මරක අතට හැරෙන්නට ඉඩ ඇති අතර, ගරු ඇමතිතුමා බලාපොරොත්තු වන ප්‍රයෝජන ලබාගන්නට බැරි වෙන්න පුළුවන්. ඒ නිසා ගම්බද විදුලි බලය බෙදා හැරීමේ සහ නඩත්තු කිරීමේදී එය ක්‍රියාශීලී අන්දමට කිරීමට මාර්ගයක් සලසන ලෙස මා අවසාන වශයෙන් ඉල්ලා සිටිනවා.

අ. භා. 5.44

**ගරු සී. පී. ද සිල්වා**
*(கௌரவ சீ. பீ. டி சில்வா)*
(The Hon. C. P. de Silva)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, අද විවාදයේදී වැදගත් අදහස් කීපයක්ම එළිදරව් වුණා. ඒ වාගේම යම් යම් වැරදි අදහස් කීපයකුත් පළ වුණා. එයින් කරුණු දෙක තුනක් ගැන විස්තර ඉදිරිපත් කිරීමට මා අදහස් කරනවා. වලපනේ ගරු මන්ත්‍රීතුමා කිව්වා, එතුමා විරුද්ධ පක්ෂයේ නිසා එතුමාගේ ඡන්ද කොට්ඨාශයේ ඉල්ලීම් සෑම එකක්ම ප්‍රතික්ෂේප කළාය කියා. ඒ ගැන මා දෙපාර්තමේන්තුවෙන් රපෝර්තුවක් ලබාගත්තා. මා මුලින්ම කිව්වා, මොන ඡන්ද කොට්ඨාශයේ වුණත්, විදුලි බලය විකිණීමෙන් ලැබෙන ආදායම සියයට 12ට අඩු නම් භාරගන්න එපාය කියා. ඒ මන්ත්‍රීතුමාගේ කොට්ඨාශයේ තත්ත්වය මෙසේයි: ඩික්සන්ස් කෝනර් සියයට 3.5යි. අලකෙලවැව සියයට 0.7 යි. මිල්ලෙපිටිය සියයට 0.9යි. මුන්වැල්ල සියයට 2යි. නිල්දන්ඩාහින්න සියයට 3.6යි. කුඹල්ගමුව සියයට 1.2යි. මේවා එතුමාගේ ඉල්ලීම් අනුව පරීක්ෂා කළ ඒවායි. ගල්කඩපතන-සූරියපතන සියයට 2යි. රූපහ සියයට 1.5යි. හරස්බැද්ද සියයට 2.2යි. එගොඩකන්ද සියයට 2.4යි. බටුගොල්ල සියයට .08යි. දෙපාර්තමේන්තුවෙන් පරීක්ෂා කර ඉදිරිපත් කරන ලද රපෝර්තු අනුවයි මේ ගණන් කියන්නෙ. මේ ගණන් සියයට 12ට වඩා හුඟක් අඩුයි. ඒ නිසා ගම් ලැයිස්තුවට ඇතුළත් වුනේ නැහැ. මන්ත්‍රීතුමා සමග තිබෙන විරුද්ධකමක් නිසාවත්, ඡන්ද කොට්ඨාශය සමග තිබෙන විරුද්ධකමක් නිසාවත් නොවෙයි, මේ ගම් ලැස්තුවට ඇතුළත් වුනේ නැත්තෙ.

ලබන වෙසක් උත්සවය සඳහා කොළඹට ලයිට් දෙන්නට පුළුවන්ද කියා ඇහුවා, දෙන්නට පුළුවන් කියා මම කිව්වා. මේ රපෝර්තුව අනුවයි, මා කිව්වෙ. 1966 විසි දෙවැනි සැසි වාර්තාවේ 58 වැනි පිටුවේ සඳහන් වී තිබෙනවා. 1967-68 අවුරුද්දේ මුළු ලංකාවේම පත්තු වන සම්පූර්ණ කිලොවට් අවර්ස් ගණන කෝටි 68.35 ක් බව. එම සැසි වාර්තාවේ 61 වැනි පිටුවේ සඳහන් වී තිබෙනවා, 1967-68 අවුරුද්දේ නිපදවන කිලොවට් අවර්ස් ගණන කෝටි 90.8 ක් බව. ඒ නිසයි, මා කීවෙ දෙන්ට පුළුවන්ය කියා. හැම කෙනෙකුටම දෙන්නට පුළුවන්. දෙන්නට බැරි වුනොත් ඇමතිතුමා බොරු කිව්වය කියා කියන්නට පුළුවනි. කෝටි 90.8 ක් නිපදවනවා. පත්තු වන වැඩිම ගණන 68.35 යි.

විදුලි බලය සඳහා වැඩිම ගාස්තුවක් අය කරන්නේ ලංකාවේ බව අකුරැස්සේ ගරු මන්ත්‍රීතුමා (වෛද්‍යාචාර්ය එස්. ඒ. වික්‍රමසිංහ) කිව්වා. මේ ගැන විශේෂයෙන් සොයා බලා රපෝර්තු කරන්නය කියා මා මණ්ඩලයට දැනුම් දුන්නා. ඒ කීම සම්පූර්ණයෙන් වැරදියි. 1967 විසි වැනි සැසි

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[ගරු සී. පී. ද සිල්වා]

වාර්තාවේ 67 වැනි පිටුවේ සඳහන් වී තිබෙනවා, ලෝකයේ ඒ ඒ රටවල ගෙවල් වල විදුලිය පාවිච්චිය සඳහා අය කරන ගාස්තුව.

යූ. එස්. ඒ. 16. 18 යි ප්‍රංසය—පැරිස් 20.9 යි. ඉතාලිය 17.1 යි. සෝවියට් යුනියන් 21 යි. බටහිර ජර්මනිය 16.4 යි. බටහිර පාකිස්තානය 18 යි. ඉන්දියාව 30.1යි. ලංකාව 16.00 යි.

මීඩියම් ඉන්ඩස්ට්‍රීස්වල අය කරන්නෙ මේ විධියටයි :

යූ. එස්. ඒ. 14.95 යි. රුසියාවේ එහෙම එකක් නැහැ. බටහිර පාකිස්තානය 12 යි. සිංගප්පූරුව 8.6 යි. ඉන්දියාව 13.1 යි. ලංකාව 11 යි.

ලාජ් ඉන්ඩස්ට්‍රීස්වලට—විශාල කර්මාන්තවලට අය කරන්නෙ මේ විධියටයි :

යූ. එස්. ඒ. 11.13 යි. ප්‍රංශය 9.3-10.7 යි. බටහිර පාකිස්තානය 10.8 යි. දකුණු ඉන්දියාව 10.3 යි. ලංකාව 8.7 යි.

මේ ගණන් මා කියන ගණන් නොවෙයි. වගකිව යුතු මණ්ඩලයක් කරුණු පරීක්ෂා කර ඉදිරිපත් කළ රිපෝර්තුවකයි, මේ ගණන් සඳහන් වී තිබෙන්නේ. ලංකාවේ අය කරන තරම් වැඩි ගණනක් වෙන කොහේවත් අය කරන්නෙ නැත කියා හැමදාම කියන නිසයි, මා මේවා ගැන විශේෂයෙන් සොයා රිපෝර්තු කරන්නට කීව්වෙ. සෝවියට් රුසියාව—21. බටහිර ජර්මනිය 16.4. බටහිර පකිස්තානය 18. ඉන්දියාව 30.1. ලංකාව 16. අකුරුස්ස ගරු මන්ත්‍රීවරයාගෙ දැනගැනීම පිණිසයි මා නැවත වරක් එය කියෙව්වෙ. සැසි වාර්තාවෙ පැහැදිලිව මේ පිළිබඳ දීර්ඝ විස්තරයක් සඳහන් වෙනවා. විශේෂයෙන්ම ඒ ගැන සොයා බලා වාර්තා කරන ලෙස මණ්ඩලයට දැන්නුවා. මණ්ඩලය රෙකමදෝරු කර තිබෙනවා අය කිරීමේ ප්‍රමාණය වැඩි කරන ලෙස. වෙනත් රටවල සංඛ්‍යා ලේඛන අනුව බොහෝ වැඩි කර ඇති බව පෙනී යනවා.

බේරුවල මන්ත්‍රීතුමා සඳහන් කළ කාරණා ගැන පළමුවෙන්ම කියන්න යන්නෙ මහවැලි ගඟ උතුරු-මැද පළාතට නැති නම් රජරට හැරවීම ඇමෙරිකානු සමාගම මගින් ඉදිරිපත් කළ පළමුවන පියවර බවයි. එදත් එය පළමුවන පියවර වශයෙන් සැලකුවා, අදත් සලකනවා. 1968-69 අවුරුද්දේදී ඒ සඳහා වැඩ කටයුතු පටන්ගැනීමටයි අදහස් කර ඇත්තෙ. තවත් පියවර ගණනාවක් ඇතත් පළමු වැනි පියවර ඒකයි.

ඊළඟ කාරණය විදුලි බල පනත—ඉලෙක්ට්‍රිසිටි බිල්—කියා පනතක් තිබෙනවා. එම පනත යටතෙ නීතිරීති සකස් කරන්න පුළුවනි, යම් ආයතනයක් හරියාකාර විදුලි බලය පරිහරණය කරන්නෙ නැති නම් අවශ්‍ය විට ආපසු දෙපාර්තමේන්තුවට පවරා ගන්න. දැනට එම බලතල ක්‍රියාවෙ යොදවා නැහැ. දැනට බොහෝ පළාත් පාලන ආයතන විසින් දෙපාර්තමේන්තුවට ගෙවිය යුතු ගාස්තු ගෙවා නැහැ. එම ආයතන මගින් හිඟ මුදල් වශයෙන් ගෙවිය යුතු මුදල රුපියල් 1,74,94,882.47 වෙනවා. මේ මුදල් ලබාගන්න හැකි වුණොත් අනිකුත් ප්‍රදේශවලටත් විදුලි බලය සපයන්න පුළුවනි. වැඩිම හිඟ මුදල් ආ යුත්තේ යාපනේ නගර සභාවෙන්. යාපනේ නගර සභාවෙන් අය විය යුතු හිඟ මුදල දහ අට ලක්ෂය ඉක්මවා තිබෙනවා. මේ අන්දමට පළාත් පාලන ආයතන 142 කින් හිඟ මුදල් අය වීමට තිබෙනවා. දැනට මා වැයමක් කරනවා, පළාත් පාලන ඇමතිතුමාගෙ සහයෝගය ඇතුව, එම පළාත් පාලන ආයතනවලින් අය විය යුතු හිඟ මුදල් අය කර ගැනීමට. මා අදහස් කරන්නෙ අය විය යුතු මුදල් කොටස් වශයෙන් අය කර ගන්නටයි. ලක්ෂ 170 සුළු ගණනක් නොවෙයි.

අනෙක් කාරණය නම්, මුදල් තත්ත්වයෙන් අමාරු පළාත් පාලන මණ්ඩලවලට ප්‍රාදේශීය ණය සහ සංවර්ධන අරමුදලින් ලබා ගන්නවාට වඩා පහසුවෙන් ණය මුදල් ලබා දීමට ක්‍රමයක් සකස් කිරීමයි. මෙය වැදගත් අදහසක්. දැනට විදුලි බලය බෙදා හැරීමට අවසර පත්‍ර ඇති යම් පළාත් පාලන ආයතනයක් අමාරු තත්ත්වයකට මුහුණ පා සිටිනවා නම් මෙම ලාභ මුදලින් ආධාර දීමේ ක්‍රමයක් සකස් කර එය ඇමති මණ්ඩලයට ඉදිරිපත් කරන්න මා අදහස් කරනවා. ගරු මන්ත්‍රීවරුන් කීප දෙනෙක්ම සඳහන් කළා, දෙපාර්තමේන්තුව මගින්

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

විදුලි බල යසපයනවා නම් එය පළාත් පාලන ආයතන මගින් සපයනවාට වඩා ලාභ බව. මෙම සැසි වාර්තාවෙ දැක්වෙන අන්දමට ආණ්ඩුවෙන් විදුලි බලය ලබා ගෙන පළාත් පාලන ආයතන මගින් බෙදා හැරීමේදී වැඩිපුර සියයට දහයක් අය කරන බව පෙනී යනවා. එම නිසා කෙළින්ම දෙපාර්තමේන්තුව මගින් බෙදා හැරීමෙන් ලාභයක් ලැබෙන බව ඇත්තක්. වාර්තාවෙන් දැක්වෙන අදහසත් ඒකයි. කටුගම්පොළ ගරු මන්ත්‍රීතුමා කී කාරණය මට වැටහෙනවා. මම එය භාර ගන්නවා. අලුතින් එකතු වන්නට සිටින පාරිභෝගිකයන් සොයන්නට දෙපාර්තමේන්තුව දැනට වඩා ලොකු උනන්දුවකින් වැඩ කරන්නට ඕනෑ. ඒ ගැන තර්කයක් කරන්නට වුවමනාවක් ඇතැයි මා හිතන්නේ නැහැ. මේ ගැන මා කල්පනා කළා. මා දෙපාර්තමේන්තුවේ උපදෙස් අහනවා. ඉල්ලුම් පත්‍ර කැඳවන්නට නරකදැයි සොයා බලනවා. මෝටර් ගන්නට ඕනෑ අයට ඉඩ දෙන්නට ඕනෑ. අපට දැන් ඩීසල් එන්ජින් වුවමනා කරන්නේ නැහැ. වියදමත් වැඩියි. ඒ වාගේම හුඟක් විදේශ විනිමයත් වැය වෙනවා. එය භාර ගන්නවා. ඒ ගැන දෙපාර්තමේන්තුවේ අදහසක් විමසනවා. ඒ අයගේ අදහස් මොනවාදැයි විපරම් කර බලනවා. එහෙම වුණොත් දෙන්නට පුළුවන් වේදැයි සොයා බලනවා. මෝටර් ගෙන්වන්නට අවශ්‍ය විදේශ විනිමය තිබෙනවාද යන්නත් සොයා බලනවා. ගම්බද විදුලි ක්‍රමයට ටෙන්ඩර් කැඳවන්නා වාගේ මේ සම්බන්ධයෙනුත් කරන්නට පුළුවනි. මෝටර් ණයට දෙන්නටත් පුළුවනි. මෙපමණ අවුරුදු ගණනකින් මෙපමණ ගෙවන්නට ඕනෑයයි නියම කරන්නට පුළුවනි. සියේට මෙපමණ පොළියක් ගෙවිය යුතුය යනුවෙන් නියම කරන්නටත් පුළුවනි. පරීක්ෂා කර බලන්නට එය භාර ගන්නවා.

අනෙක, "මේන්ටෙනන්ස්" ගැනයි. ගම්බද ප්‍රදේශවල ටෙලිපෝන් නැහැ. බොහෝ තැන්වල හුඟක් දුර පයින්ම යන්නට සිදු වෙනවා. ඒකට කරන්නට තිබෙන්නේ එකයි. එවැනි අවස්ථාවල අපි බොහෝම හොඳට පරීක්ෂාවෙන් ඉන්නට ඕනෑ. ඒ කාරණයත් මම දෙපාර්තමේන්තුවට ඉදිරිපත් කරන්නම්.

මා මුලින්ම සඳහන් කළාක් මෙන්, හොඳ අදහස් කීපයක්ම සඳහන් වුණා. ඒ අතර වැරදි ඒවාත් කිහිපයක්ම ඉදිරිපත් වුණා. මේ රටටම සැහෙන යහපතක් මෙයින් ඇති වෙනවා. එහෙත් හැම ගමකටම විදුලිබලය දෙන්නට වැඩ පිළිවෙළක් මේ සැලැස්මේ නැහැ.

සියේට දොළහේ සීමාවක් ඇති කර තිබෙනවා. ඒ නිසා ප්‍රයෝජන ලැබෙන ප්‍රමාණය අඩු වෙනවා. ගරු මන්ත්‍රීතුමන්ලාගෙන් අදහස් විමසුවේ එතුමන්ලා කියන හැටියටම විදුලි බලය දෙන්නට නොවෙයි. දෙපාර්තමේන්තුවෙනුත් අදහස් සහ යෝජනා ඉදිරිපත් කර තිබෙනවා. මට දැනගන්නට වුවමනා කළේ මහජන නියෝජිත මන්ත්‍රීවරුන්ගේ අදහස් කොයි විධියේ ඒවාද යන්නයි. ඒවා පරීක්ෂාකර බලනවා. සියේට දොළහේ සීමාව යටතේ එන ඒවාත්, වැඩි ඒවාත්, දෙපාර්තමේන්තුව කියන ඒවාත් යන හැම දෙයක්ම පරීක්ෂා කර බලනවා. කැබිනට් මණ්ඩලයෙන් බාධාවක් නැහැ.

කලින් අපට ඇති වුණේ විදේශ විනිමය පිළිබඳ ප්‍රශ්නයයි. ඒ ගැන මා කාටවත් දොස් කියන්නේ නැහැ. කොයි වෙලාවෙත් විදේශ විනිමය අඩුකම සම්බන්ධ ප්‍රශ්නය තිබුණා. දැනුත් තත්ත්වය අමාරුයි. ඒ කොයි හැටි වෙතත් මේ ආණ්ඩුවට කොයි තරම් අමාරුවක් තිබුණත්, යම් කාරණයක් නිසා පුළුවන් වුණා ඉස්සරට වඩා ඉහළින් මුදල් වෙන් කරන්නට මේ ව්‍යාපාරය සඳහා.

**ප්‍රශ්නය විමසන ලදින් සභා සම්මත විය.**

வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.

*Question put and agreed to.*

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

## මුදල් සංචිත ආඥාපනත: සම්මතිය

*நிதி ஒதுக்கல் கட்டளைச்சட்டம் : தீர்மானம்*

## FINANCIAL RESERVES ORDINANCE : RESOLUTION

ගරු සී. පී. ද සිල්වා

*(கௌரவ சி. பீ. டி சில்வா)*

(The Hon. C. P. de Silva)

I move,

"That this House authorises under Section 3 (1) of the Financial Reserves Ordinance (Cap. 414) the expenditure from the Special Reserve known as the Department of Government Electrical Undertakings Reserve, Extensions and Renewals Fund a sum of Rupees Seven Million only (Rs. 7,000,000) as set out in Column 6 of the Schedule hereto on the item specified in Column 2 thereof.

SCHEDULE

| 1 *Item No. in Estimates 1967-68* | 2 *Description* | 3 *Total estimated cost Rs.* | 4 *Already approved amount* | 5 *Date* | 6 *Amount now asked for* Rs.* |
|---|---|---|---|---|---|
| 74 .. | Rural Electrification of 510 Villages | 25,210,000.. | — .. | — .. | 7,000,000. " |

ප්‍රශ්නය විමසන ලදින්, සභාසම්මත විය.

*வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*

*Question put, and agreed to.*

## ලංකා රාජ්‍ය ලෝහ භාණ්ඩ සංස්ථාවේ වාර්ෂික වාර්තාව 1964-65

*இலங்கை அரசினர் உலோகப் பொருட் கூட்டுத்தாபனம் : 1964-65 ஆம் ஆண்டுக்கான வருடாந்த அறிக்கை*

## CEYLON STATE HARDWARE CORPORATION : ANNUAL REPORT (1964-65)

ඩී. ෂෙල්ටන් ජයසිංහ මයා. (කර්මාන්ත හා ධීවර ඇමතිගේ පාර්ලිමේන්තු ලේකම්)

*(திரு. டீ. ஷெல்ற்றன் ஜயசிங்ஹ—கைத்தொழில், கடற்றொழில் அமைச்சரின் பாராளுமன்றக் காரியதரிசி)*

(Mr. D. Shelton Jayasinghe—Parliamentary Secretary to the Minister of Industries and Fisheries)

I move,

"That in terms of Section 30 (2) of the State Industrial Corporation Act, No. 49 of 1957, the Report of the Board of Directors of the Ceylon State Hardware Corporation, being a Report incorporating the Auditor's Report, the Auditor-General's Comments the Working Account and the Balance Sheet for the year 1964-65 which was presented on October 21, 1967, be approved."

ප්‍රශ්නය විමසන ලදින්, සභාසම්මත විය.

*வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*

*Question put, and agreed to.*

## ලංකා රාජ්‍ය ලෝහ භාණ්ඩ සංස්ථාවේ වාර්ෂික වාර්තාව 1965-66

*இலங்கை அரசினர் உலோகப் பொருட் கூட்டுத்தாபனம் : 1965-66 ஆம் ஆண்டுக்கான வருடாந்த அறிக்கை*

## CEYLON STATE HARDWARE CORPORATION : ANNUAL REPORT (1965-66)

ෂෙල්ටන් ජයසිංහ මයා.

*(திரு. ஷெல்ற்றன் ஜயசிங்ஹ)*

(Mr. Shelton Jayasinghe)

I move,

"That in terms of Section 30 (2) of the State Industrial Corporation Act, No. 49 of 1957, the Report of the Board of Directors of the Ceylon State Hardware Corporation, being a Report incorporating the

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

Auditor's Report, the Auditor-General's comments, the Working Accounts, Manufacturing and Trading Account and the Balance Sheet for the year 1965-66, which was presented on October 21, 1967, be approved."

ප්‍රශ්නය විමසන ලදින් සභා සම්මත විය.

வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.

*Question put, and agreed to.*

## රාජ්‍ය කාර්මික නීතිගත සංස්ථා පනත: සම්මතිය

அரசாங்கக் கைத்தொழிற் கூட்டுத்தாபனச் சட்டம் : தீர்மானம்

## STATE INDUSTRIAL CORPORATIONS ACT : RESOLUTION

ගරු ඊ. එල්. බී. හුරුල්ලේ (ප්‍රවාහණ ඇමති)

(கௌரவ ஈ. எல். பி. ஹுருல்ல—போக்குவரத்து அமைச்சர்)

(The Hon. E. L. B. Hurulle—Minister of Communications)

I move,

"That in terms of Section 23 (2) of the State Industrial Corporations Act, No. 49 of 1957, this House resolves that the initial capital of the Ceylon State Hardware Corporation amounting to Rs. 16,000,000 as specified in the Incorporation Order under section 2 of the said Act published in Gazette Extraordinary No. 13,737 of August 23, 1963, be increased to Rs. 36,000,000."

ෂෙල්ටන් ජයසිංහ මයා.

(திரு. ஷெல்ற்றன் ஜயசிங்ஹ)

(Mr. Shelton Jayasinghe)

The Ceylon State Hardware Corporation was incorporated on 23rd August 1963 with an initial capital of Rs. 16,000,000 for the establishment of a factory for the manufacture of hardware, small tools, agricultural implements, mammoties, and cutlery including drawing, founding, forging, pressing, casting and allied processes in ferrous and non-ferrous metals. By Cabinet decision of 21st August 1964 the initial capital was increased to Rs. 18,000,000 for the installation of the rolling process for the production of mammoties to enable a turnover of 400,000 mammoties in one shift. By its decision of 31.10.1966 the Cabinet approved the establishment of a Cast Iron Foundry to be set up under the authority of this corporation at an estimated cost of Rs. 18,000,000 for the production of 6,000 tons of castings, including cast iron pipes and fittings. The revised capital of the Corporation now stands at Rs. 36,000,000.

ආචාර්ය එන්. එම්. පෙරේරා (යටියන්තොට)

(கலாநிதி என். எம். பெரேரா—யட்டியாந்தோட்டை)

(Dr. N. M. Perera—Yatiyantota)

What is the item you are moving ?

ෂෙල්ටන් ජයසිංහ මයා.

(திரு. ஷெல்ற்றன் ஜயசிங்ஹ)

(Mr. Shelton Jayasinghe)

I have moved items, 3, 4 ; I am now on item 5, but they could be all discussed, I ask the support of the hon. Member for Yatiyantota (Dr. N. M. Perera) for the Ceylon State Hardware Corporation.

ලෙස්ලි ගුණවර්ධන මයා.

(திரு. லெஸ்லி குணவர்தன)

(Mr. Leslie Goonewardene)

Where is your Minister ?

ෂෙල්ටන් ජයසිංහ මයා.

(திரு. ஷெல்ற்றன் ஜயசிங்ஹ)

(Mr. Shelton Jayasinghe)

He is attending to some work in his constituency. He may be here shortly. Shall we address our comments to the Ceylon State Hardware Corporation and not to the Minister ?

ආචාර්ය එන්. එම්. පෙරේරා

(கலாநிதி என். எம். பெரேரா)

(Dr. N. M. Perera)

We are not interested in the Minister at all.

ප්‍රශ්නය සභාභිමුඛ කරන ලදී.

வினா எடுத்தியம்பப் பெற்றது.

*Question proposed.*

ආචාර්ය එන්. එම්. පෙරේරා

(கலாநிதி என். எம். பெரேரா)

(Dr. N. M. Perera)

I read the report for 1964-65. There is nothing to comment on as it deals with only the preliminary work. The

7——එච 12857 (4/68)

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[ආචාර්ය එන්. එම්. පෙරේරා]

report for 1965-66 is a little more interesting because it raises some interesting questions.

"The Corporation commenced commercial production with effect from April 1, 1966."

The Auditor-General's report says :

"According to the auditor, it had not been possible for the Corporation to carry out a physical verification of stocks at the end of the year 'due to the disorganized condition of the stores'."

That is not very good.

ෂෙල්ටන් ජයසිංහ මයා.
(திரு. ஷெல்ற்றன் ஜயசிங்ஹ)
(Mr. Shelton Jayasinghe)

That is in the year 1964-65.

ආචාර්ය එන්. එම්. පෙරේරා
(கலாநிதி என். எம். பெரேரா)
(Dr. N. M. Perera)

I am reading from page 4 of the 1965-66 report.

What is wrong with your stores? It does not augur well for your new establishment when you cannot have your stores in good condition. They cannot verify the stocks. There must be something wrong. If when you start you get on the wrong foot, then there is something radically remiss in your whole establishment. For, according to the auditor, he could not carry out a physical verification of stock, and without a verification of stock I do not see how you can have an accurate balance sheet.

"Due to the disorganized condition of the stores": that is a very serious charge.

ෂෙල්ටන් ජයසිංහ මයා.
(திரு. ஷெல்ற்றன் ஜயசிங்ஹ)
(Mr. Shelton Jayasinghe)

It is doing well.

ආචාර්ය එන්. එම්. පෙරේරා
(கலாநிதி என். எம். பெரேரா)
(Dr. N. M. Perera)

I do not know what is doing well. It started in April 1966, and the Auditor was unable to verify the position with regard to stocks. I do not see how it could do well in such a situation.

I also want to draw attention to some of the other points raised in this report. There has been, as a matter of fact, a considerable disorganization at the outset. I do not know whose fault it is. I shall read from page 1 of the annual report for 1965-66 :

"Even then, not all the items could be produced, due to the non-arrival of various special tools, dies, jigs and fixtures. Although the entire factory should have been commissioned by April 1966, the Corporation found itself in the position of producing only five items out of a proposed forty six items in the Contract."

So when the hon. Parliamentary Secretary says it is working well—

ෂෙල්ටන් ජයසිංහ මයා.
(திரு. ஷெல்ற்றன் ஜயசிங்ஹ)
(Mr. Shelton Jayasinghe)

It is working well now.

ආචාර්ය එන්. එම්. පෙරේරා
(கலாநிதி என். எம். பெரேரா)
(Dr. N. M. Perera)

You must produce more tangible evience than what is in your report. You are asking us to accept your report, but what does the report say? This is what the report says :

"Delays due to the non-arrival of equipment and special tools were aggravated by the fact that some of the equipment and many of the tools that did arrive had to be modified or defects rectified before use."

So, there has been some disorganization in this whole business. Not only has there been disorganization in your stores, but there has been some disorganization in the whole factory.

Again, this is what is stated in the report :

"Anticipated sales turnover for the year was Rs. 3,325,000. Against this the realized sales amounted to only Rs. 23,000."

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

I think this is something which the Hon. Minister of Finance ought to know. The anticipated sales turnover was Rs. 3,325,000, but they actually realized Rs. 23,000. There is a fairly big gap between these two figures.

ගරු මන්ත්‍රීවරයෙක්
(கௌரவ அங்கத்தவர் ஒருவர்)
(An hon. Member)

The disorganization is due to the Ministry.

ආචාර්ය එන්. එම්. පෙරේරා
(கலாநிதி என். எம். பெரேரா)
(Dr. N. M. Perera)

I think the whole Ministry is disorganized. You had better get rid of the Ministry also.

සිරිමාවෝ ආර්. ඩී. බණ්ඩාරනායක මිය. (අත්තනගල්ල)
(திருமதி சிறிமாவோ ஆர். டீ. பண்டாரநாயக்க—அத்தனகல்ல)
(Mrs. Sirimavo R. D. Bandaranaike—Attanagalla)

The Minister.

ආචාර්ය එන්. එම්. පෙරේරා
(கலாநிதி என். எம். பெரேரா)
(Dr. N. M. Perera)

Then again :

"The loss of profit due to delay in delivery of machinery and equipment amounts to Rs. 750,000 for the period under review. However, the liquidated damages permitted under the Contracts amounted to only Rs. 40,000."

They liquidated the damages but they could realize only Rs. 40,000. So, the net loss on that account is Rs. 710,000.

The report goes on to say :

"It has been our experience that the Supplier has submitted incorrect invoices"—

ෂෙල්ටන් ජයසිංහ මයා.
(திரு. ஷெல்ற்றன் ஜயசிங்ஹ)
(Mr. Shelton Jayasinghe)

Quite right.

ආචාර්ය එන්. එම්. පෙරේරා
(கலாநிதி என். எம். பெரேரா)
(Dr. N. M. Perera)

You think it is quite all right.

ෂෙල්ටන් ජයසිංහ මයා.
(திரு. ஷெல்ற்றன் ஜயசிங்ஹ)
(Mr. Shelton Jayasinghe)

What is stated there in the report is right.

ආචාර්ය එන්. එම්. පෙරේරා
(கலாநிதி என். எம். பெரேரா)
(Dr. N. M. Perera)

We are going to judge you by your actions Mr. Parliamentary Secretary ; we are not going to judge you by your professions. You are saying : "Everything is all right, the factory is doing well. Everything is fine." But, when we get the report we see that everything is wrong.

"....submitted incorrect Invoices both for equipment under the Main Contract and the Low-Voltage Electrical Equipment Contract resulting in the overpayment of Customs Duties. It is doubtful whether the Corporation would ever recover some of these over-payments from the Customs as there have been delays in the re-submission of the amended invoices as promised by the Supplier."

All these things make us a little doubtful about the effectiveness of your functioning in this place. This only shows bad organization, bad supervision and bad management. I think, generally, your ministerial duties are not being properly maintained.

The hon. Parliamentary Secretary has moved three Motions and the last one demands an increase of the initial capital to Rs. 36,000,000. This is more than double the original capital. In point of fact, the original figure of Rs. 16 million was modified and it was increased to Rs. 18 million. Now, you are making a request actually for double that amount. You have not justified it.

ෂෙල්ටන් ජයසිංහ මයා.
(திரு. ஷெல்ற்றன் ஜயசிங்ஹ)
(Mr. Shelton Jayasinghe)

It is for the cast-iron foundry. I told you that.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

ආචාර්ය එන්. එම්. පෙරේරා
(கலாநிதி என். எம். பெரேரா)
(Dr. N. M. Perera)

I am sorry I was not here.

ෂෙල්ටන් ජයසිංහ මයා.
(திரு. ஷெல்றறன் ஜயசிங்ஹ)
(Mr. Shelton Jayasinghe)

I said that it is for a cast-iron foundry at Ederamulla. The parent unit is at Yakkala and both come under the same corporation.

ආචාර්ය එන්. එම්. පෙරේරා
(கலாநிதி என். எம். பெரேரா)
(Dr. N. M. Perera)

What are the economics of it ? Why do you not have it at the same place ? You have sufficient land. I cannot understand this if you are going to have it as a supplement to the existing factory. I hear you are going to have a cast-iron foundry. Why are you locating it in some other place ? You know what the Hon. Minister has done. He has bought seventy acres of the Salawa Rubber Estate, one of the most and perhaps the best run rubber estates in the low-country.

ෂෙල්ටන් ජයසිංහ මයා
(திரு. ஷெல்றறன் ஜயசிங்ஹ)
(Mr. Shelton Jayasinghe)

It is the best site.

ආචාර්ය එන්. එම්. පෙරේරා
(கலாநிதி என். எம். பெரேரா)
(Dr. N. M. Perera)

There are plenty of good places instead of your going in for the most expensive land. The best seventy acres of the Salawa Rubber Estate has been taken over by the Ministry for this additional plywood factory.

සුබසිංහ මයා.
(திரு. சுபசிங்ஹ)
(Mr. Subasinghe)

He wants to have the factory in front of his Walauwa.

ආචාර්ය එන්. එම්. පෙරේරා
(கலாநிதி என். எம். பெரேரா)
(Dr. N. M. Perera)

This is absurd. Here, similarly, you are incurring another additional Rs. 18 million to start an entirely new establishment which means much more overheads and management difficulties. Why do you not locate it in the same place ? This is an allied business, Sir, so far as I can understand. Although I am not a technical man I can say that to ome extent it dovetails into the actual working of the Hardware Corporation. Why do you want to spend such a large sum of money ? Perhaps, you might save a lot of money if you locate it in the same place. They have sufficient land there. If I remember aright, you have purchased more land. Originally you had some twenty-four acres and now, I think, it has expanded into about forty to fifty acres. I am speaking from memory and if I am wrong the hon. Parliamentary Secretary can correct me.

In this situation, why does the Government intend to spend unnecessarily all this Rs. 18 million ? I do not know how much the foreign exchange commitment of it will be, and how much local money will be required. I do think that this matter should have had a much bigger discussion rather than it being brought up in a late stage of the days proceedings. The Hon. Minister ought to justify why they did not deem it desirable to locate it in the same place. It is almost opposite the Tyre Corporation, on the left side. This is, I think, in the Mahara constituency. I am not thinking in terms of constituencies. I am thinking in terms of the meaninglessness of expending so much money to put up an entirely new institution instead of making use of the advantages that you already have in the present establishment. I am not satisfied with the position. The hon. Parliamentary Secretary has stated that the working of the factory has improved. After all, the real test is

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

whether you are producing cheap mammoties and *alavangoes*. If they are more expensive than the imported products, then the position is not better. My complaint against all corporations is that, in point of fact, the local product is much more expensive than the imported article. That is not progress from the point of view of the economy of the country.

ෂෙල්ටන් ජයසිංහ මයා
(திரு. ஷெல்ற்றன் ஜயசிங்ஹ)
(Mr. Shelton Jayasinghe)

Mammoties are cheaper !

ආචාර්ය එන්. එම්. පෙරේරා
(கலாநிதி என். எம். பெரேரா)
(Dr. N. M. Perera)

What is the difference in price ?

ෂෙල්ටන් ජයසිංහ මයා
(திரு. ஷெல்ற்றன் ஜயசிங்ஹ)
(Mr. Shelton Jayasinghe)

The local mammoty is cheaper than the imported one.

ආචාර්ය එන්. එම්. පෙරේරා
(கலாநிதி என். எம். பெரேரா)
(Dr. N. M. Perera)

I will say this. I was told that the quality of the local mammoty is good. I am glad that it is so. But you must also produce them cheaper. There is no point in producing these things locally if you cannot give them to the consumer at cheaper prices than the imported articles. The purpose of establishing industries here is to produce these articles cheaper. From that point of view the hon. Parliamentary Secretary must give us a little more information than what he is giving us now. He says he is satisfied but we are not.

ෂෙල්ටන් ජයසිංහ මයා
(திரு. ஷெல்ற்றன் ஜயசிங்ஹ)
(Mr. Shelton Jayasinghe)

Mr. Deputy Speaker, I should first of all like to explain the matters raised by the hon. Member for Yatiyantota. He wanted to know the reasons for the comments made by the Auditor-General in the annual report. When we took over this corporation, production was scheduled to begin in January 1966 ; but when investigations were made it was found that it was not possible to begin production at that date. The machinery indented was not the machinery that was required.

ආචාර්ය එන්. එම්. පෙරේරා
(கலாநிதி என். எம். பெரேரா)
(Dr. N. M. Perera)

What ?

ෂෙල්ටන් ජයසිංහ මයා
(திரு. ஷெல்ற்றன் ஜயசிங்ஹ)
(Mr. Shelton Jayasinghe)

The machinery indented was not the machinery that was required. So we had to get them changed. Some of the furnaces and the dies had to be changed. All that involved work. The first thing we had to do was to try to get in touch with the original supplier.

සුබසිංහ මයා.
(திரு. சுபசிங்ஹ)
(Mr. Subasinghe)

Who placed the original indent ?

ෂෙල්ටන් ජයසිංහ මයා
(திரு. ஷெல்ற்றன் ஜயசிங்ஹ)
(Mr. Shelton Jayasinghe)

I do not want to cast any aspersions on anyone. We were scheduled to go into production in January 1966 but we could not do so because of these defects.

සුබසිංහ මයා.
(திரு. சுபசிங்ஹ)
(Mr. Subasinghe)

But it is a serious mistake !

ෂෙල්ටන් ජයසිංහ මයා
(திரு. ஷெல்ற்றன் ஜயசிங்ஹ)
(Mr. Shelton Jayasinghe)

I admit it is a serious mistake. I shall tell you how serious the mistake is as I proceed.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

ආචාර්ය එන්. එම්. පෙරේරා
(கலாநிதி என். எம். பெரோ)
(Dr. N. M. Perera)

The same officials are still there and they are the people who would have recommended that machinery.

සිරිමාවෝ බණ්ඩාරනායක මිය.
(திருமதி சிறிமாவோ பண்டாரநாயக்க)
(Mrs. Sirimavo Bandaranaike)

Rampala was the chairman, and he is still the chairman.

ෂෙල්ටන් ජයසිංහ මයා
(திரு. ஷெல்ற்றன் ஜயசிங்ஹ)
(Mr. Shelton Jayasinghe)

When we got the suppliers and wanted them to replace the machinery; they refused. They said they could not do that because the machinery had come here and was idling for a long period although it was not correct machinery. In those circumstances, surely we could expect the suppliers to take the machinery back! There must be a time limit. There must be a check on a stores. The Auditor-General is quite correct. If there had been a correct check on stores they would have found that the machinery was wrongly indented. You keep the macinery hanging about in the stores for a couple of years and go to the suppliers and say, "Take these back." surely, the suppliers are not going to take them back in that way?

After lengthy negotiations I am glad to say that the suppliers agreed to take back the defective macinery and supply fresh machinery or, in the alternative, make adjustments in the payment for the purchase of the required new machinery. My Minister, on his last visit to the East European countries, met the manufacturers in Poland and the matter was satisfactorily settled to a certain extent. There are certain matters still not settled.

ආචාර්ය එන්. එම්. පෙරේරා
(கலாநிதி என். எம். பெரோ)
(Dr. N. M. Perera)

And you are still having the same person as chairman of your board!

ෂෙල්ටන් ජයසිංහ මයා
(திரு. ஷெல்ற்றன் ஜயசிங்ஹ)
(Mr. Shelton Jayasinghe)

The corporation, at the moment, is doing very well. The original estimate, particularly in regard to mammoties—the question was raised in this discussion—was 180,000 per annum, but as a result of renovations and additional machinery we are turining out 350,000 per annum. We can do, I think, a little better than that. The mammoties themselves are of very good quality and are offered at a fair price.

සුබසිංහ මයා.
(திரு. சுபசிங்ஹ)
(Mr. Subasinghe)

What is the annual requirement?

ෂෙල්ටන් ජයසිංහ මයා
(திரு. ஷெல்ற்றன் ஜயசிங்ஹ)
(Mr. Shelton Jayasinghe)

With the new agricultural programme, the anual requirement is going up to 400,000 mammoties. We think that it is possible for us to meet the entire requirement of the country.

Apart from mammoties the corporation is producing things like hinges, bolts, safty taps, chisels, stop valves and so on.

Considering the fact that the work of the corporation had expanded it was found that its one unit at Yakkala was not complete without a foundry. We have every reason for starting a foundry.

Earlier, certain investigations had been made and to some extent progress had been made. Later we got down experts to advise us in this matter. After these technologists had made their investigations they

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

reported that Enderamulla was suitable for a foundry for various reasons. One important reason arises from the volume of raw materials that the corporation has to handle. About 13,000 tons of raw material have to be handled, and this required railway sidings in close proximity. At the unit at Yakkala we do not have that facility.

So you see, Sir, the problem we were faced with. It is true that if the original factory had been sited at a certain point the two units could have been combined. But if the factory was incorrectly sited, or sited at a place which was not suitable for a second project, what do you expect us to do ?—[*Interruption.*] It is well and good for you to shrug your shouldrers. I am telling you the practical difficulties we were confronted with. I am giving you the factual position.

You must not forget that 13,000 tons of raw material have to be hauled for the foundry. Taking that into consideration, when we site it alongside a railway siding, you say, " Do not put it alongside a railway siding." If we had put it away from a railway siding you would have been the first person to say, " Why have you sited this away from a railway siding ? You know you have to handle 13,000 tons of raw material in the first year, which in the next year is bound to rise to 20,000 tons, and end up with 50,000 tons in five years. And yet you do not have sense enough to locate it alongside a railway siding."

You will agree, Sir, that we had to find a site which was suitable for this project irrespective of the fact that the original unit is sited elsewhere, because of the nature of the work that had to be done here. So I do not think that we can be found fault with in regard to the siting of this foundry.

As I have stated earlier, the corporation is doing fairly well. The estimated profits from the corporation for this year is about Rs. 3 million or more. We are working at a profit at the moment and, I am glad to say, very substantial foreign exchange savings are being made—almost Rs. 2 million—by this corporation.

සිරිමාවෝ බණ්ඩාරනායක මිය.
(திருமதி சிறிமாவோ பண்டாரநாயக்க)
(Mrs. Sirimavo Bandaranaike)

Thanks to our Government.

ෂෙල්ටන් ජයසිංහ මයා
(திரு. ஷெல்றன் ஜயசிங்ஹ)
(Mr. Shelton Jayasinghe)

May I congratulate the hon. fair Leader of the Opposition for having started this venture. It is doing very well.

ගරු වන්නිනායක
(கௌரவ வன்னிநாயக்க)
(The Hon. Wanninayake)

But she said it was badly sited.

සිරිමාවෝ බණ්ඩාරනායක මිය.
(திருமதி சிறிமாவோ பண்டாரநாயக்க)
(Mrs. Sirimavo Bandaranaike)

In spite of that you are saving foreign exchange.

ෂෙල්ටන් ජයසිංහ මයා
(திரு. ஷெல்றன் ஜயசிங்ஹ)
(Mr. Shelton Jayasinghe)

Now, with regard to the foundry I must inform the House that we propose to manufacture cast iron. The hon. Member for Yatiyantota will agree with me : what is inductrialization if we do not go in for these things ? And the Hon. Minister should be congratulated for so very early foreseeing the need for a cast iron foundry. He saw the need for it in 1965—[*Interruption*]. I am saying that as in the case of many other industries, he saw the need for contemporary expansion. We hope to bring the cast iron foundry into production very soon, and we propose to manufacture about 6,000 tons of cast iron in the first year. I think the House will not grudge the increased capital asked for because it is a very reasonable request for an industry worthy of its name. I ask hon. Members to give us their approval

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[ෂෙල්ටන් ජයසිංහ මයා.]

for the extra money asked for as well as to accept the annual reports for the years 1964-65 and 1965-66.

**ප්‍රශ්නය විමසන ලදින්, සභාසම්මත විය.**

வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.

*Question put, and agreed to.*

## කොළඹ (පහත් බිම් ප්‍රදේශ) ගොඩ කිරීමේ සහ සංවර්ධනය කිරීමේ මණ්ඩලය පනත් කෙටුම්පත

*கொழும்பு (தாழ்ந்த இடப்பரப்புகள்) மீட்டல், அபிவிருத்தி செய்தற் சபை மசோதா*

## COLOMBO (LOW-LYING AREAS) RECLAMATION AND DEVELOPMENT BOARD BILL

**දෙවන වර කියවීමේ නියෝගය කියවන ලදී.**

இரண்டாம் மதிப்பிற்கான கட்டளை வாசிக்கப்பட்டது

*Order for Second Reading read.*

අ. භා. 6.27

**ගරු සී. පී. ද සිල්වා**
*(கௌரவ சி. பீ. டி. சில்வா)*
(The Hon. C. P. de Silva)

I move,

"That the Bill be now read a Second time."

කොළඹ නගරය මහ මුහුදටත්, මඩ වගුරුවලටත් මැදි වී තිබෙන නිසා ගෙවල් සෑදා ගැනීමට ඉඩම් හොයා ගැනීම අමාරුයි. කොළඹ නගරයේ පමණක් නොව, වැල්ලවත්ත-ගල්කිස්ස ප්‍රදේශයේ තත්ත්වයත් ඒකයි. ඒ ප්‍රශ්නය සම්බන්ධයෙන් ක්‍රියා කළ යුතු ආකාරය පිළිබඳව අදහස් දැක්වීම සඳහා 1965 නොවැම්බර 16 වැනිදා ඇමති අනුකාරක සභාවක් පත් කළා. ඒ ඇමති අනු කාරක සභාවට රාජ්‍ය ඇමතිතුමාත්, ඉඩම්, වාරිමාර්ග හා විදුලි බල ඇමතිතුමාත්, රජයේ වැඩ, තැපැල් හා විදුලි සන්දේශ ඇමතිතුමාත්, පළාත් පාලන ඇමතිතුමාත් ඇතුළත් වුණා. එම අනු කාරක සභාවට රජයේ නිලධාරීන් වශයෙන් ඉඩම් අමාත්‍යාංශයේ ජ්‍යෙෂ්ඨ සහකාර ලේකම්, රාජ්‍ය අමාත්‍යාංශයේ සහකාර ලේකම්, වාරිමාර්ග දෙපාර්තමේන්තුවේ නියෝජ්‍ය අධ්‍යක්ෂ සහ ප්‍රාදේශීය වාරි මාර්ග ඉන්ජිනේරු තැනත් සහභාගි වුණා.

මේ සම්බන්ධයෙන් වාරිමාර්ග දෙපාර්තමේන්තුව සකස් කළ වාර්තාව 1966 26 වැනි සැසි වාර්තාව වශයෙන් මුද්‍රණය කර තිබෙනවා. එම වාර්තාව තිබෙන්නේ ඉංග්‍රීසියෙන්. එම නිසා මා එය ඉංග්‍රීසියෙන් කියවන්නට අදහස් කරනවා. එහි 16 වැනි පිටුවේ මෙසේ සඳහන් වෙනවා:

"D.—LOCATION OF MARSHES

The marshes under review at present are those lying within the area protected by the Kelani Ganga Flood Protection scheme and to the south of Kelani Ganga. These marshes are located in Mutwal—between Prince of Wales Avenue and Bloemendhal Road—and along the banks of San Sebastian Canal North and South, Urugodawatte Canal, Kolonnawa Canal North and South, Kotte Ela, Kirillapone Ela and Heen Ela. The confluence of Wellawatte Canal and Dehiwela Canal North is the southern extremity of the marshes coming within this project."

ඒ ඒ ප්‍රදේශවල ඇති මඩ වගුරු බිම් ප්‍රමාණය මෙසේයි: මෝදර අක්කර 177 යි. ඌරුගොඩවත්ත අක්කර 200 යි. දෙමට ගොඩ තීරු දෙකක් තිබෙනවා. ගොතටුව අක්කර 700 යි. කෝට්ටේ අක්කර 600 යි. හීන්ඇළ අක්කර 500 යි. එකතුව අක්කර 2177 යි. ඇළ වේලි කපා ඒවායේ වතුර බස්සවා පස් පුරවන්නට අදහස් කරනවා. හැබැයි එක වර නොවෙයි, ක්‍රම ක්‍රමයෙන් කරන්නටයි අදහස් කරන්නේ. ඒ පිළිබඳව අත්හදා බලන්නට මෙන් මාළිගාවත්ත ප්‍රදේශයේ පොඩි මඩ වගුරක් ගොඩ කරන්නට පටන් ගෙන තිබෙනවා. වාරි මාර්ග දෙපාර්තමේන්තුවට "ඩ්‍රෙජර්ස්" තුනක් තිබෙනවා. හැබැයි ඒවා පොඩියි, අර මහ මඩ වගුරුවලට සෑහෙන්නේ නැහැ. මාළිගාවත්තේ මඩ වගුරු ගොඩ කරනවා බලන්නට මා ගියා. දැන් එය හාරා, මඩ ඉවත් කර, බොරළු දමා ගොඩ කෙරෙන තත්ත්වයට ඇවිත් තිබෙනවා. ඉන්ජිනේරු මහතුන් කියනවා, ඒ විධියට අර මඩ වගුරු ගොඩ කරන්නට පුළුවන්ය කියා.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

මේ පනත් කෙටුම්පතේ සඳහන් ගොඩ කිරීමේ ප්‍රදේශ අයත් වන්නේ පහත සඳහන් පළාත් පාලන ආයතනවලටයි: කොළඹ මහා නගර සභාව, දෙහිවල-ගල්කිස්ස මහා නගර සභාව, කෝට්ටේ නගර සභාව, කොලොන්නාව නගර සභාව, පෑලියගොඩ නගර සභාව, වත්තල-මාබෝලෙ නගර සභාව, මොරටුව නගර සභාව පිළියන්දල සුළු නගර සභාව, මහරගම සුළු නගර සභාව, හැඳල සුළු නගර සභාව, දළුගම සුළු නගර සභාව, කැළණිය සුළු නගර සභාව, බත්තරමුල්ල-තලංගම සුළු නගර සභාව, මුල්ලේරියාව සුළු නගර සභාව, කොටිකාවත්ත සුළු නගර සභාව, අඹතලෙන් පහළ ගම් සභාව, කොට්ටේ-ගල්කිස්ස ගම් සභාව, මාම්පෙ-කැස්බෑව ගම් සභාව.

මා කලින් සඳහන් කළ ඇමති අනුකාරක සභාව, මේ කටයුත්ත සඳහා මණ්ඩලයක් පත් කළ යුතු යැයි අදහස් කළා. ඒ මණ්ඩලයේ පරමාර්ථ, පනත් කෙටුම්පතේ 8 වැනි වගන්තියේ මෙසේ සඳහන් වෙනවා :

"8. මණ්ඩලයේ පරමාර්ථ—

(අ) 2 වන වගන්තිය යටතේ වූ ආඥාවක් මගින් ප්‍රකාශිත සෑම ගොඩ කිරීමේ සහ සංවර්ධනය කිරීමේ ප්‍රදේශයක් ම ගොඩ කොට සංවර්ධනය කිරීම සහ ඒ ප්‍රදේශය ගොඩනැගිලි ඉදි කිරීමේ කාර්යයන් සඳහා සුදුසු බවට පැමිණවීම ; සහ

(ආ) මෙම පනතේ විධිවිධාන යටතේ මණ්ඩලය වෙත පැවරී ඇති එම ප්‍රදේශයට අඩංගු ඉඩම් එසේ ගොඩ කිරීමට සහ සංවර්ධනය කිරීමට නිබිය දී ඒ ඉඩම්වල භාරය, කළමනාකාරිත්වය සහ පාලනය ඇරීම."

ඊළඟට මණ්ඩලයේ සාමාන්‍ය බලතල පිළිබඳව 9 වැනි වගන්තියේ සඳහන් වෙනවා. මා දැන් එය කියවනවා.

"9. මණ්ඩලය විසින් පහත සඳහන් බලතල සියල්ල හෝ ඉන් කිසිවක් ක්‍රියාවෙහි යෙදවිය හැකිය :—

(අ) යම් දේපළක් අත්කර ගැනීම, ශිම්ව සිටීම හෝ බද්දට ගැනීම නැතහොත් යම් දේපළක් උකස් කිරීම, බඩපනයකට යටත් කිරීම, විකිණීම හෝ අන් ලෙසකින් බැහැර කිරීම ;

(ආ) 2 වන වගන්තිය යටතේ ප්‍රකාශිත ගොඩ කිරීමේ සහ සංවර්ධනය කිරීමේ ප්‍රදේශයන් හි සංවර්ධන යෝජනා ක්‍රම පිළියෙළ කිරීම සහ ක්‍රියාවෙහි යෙදවීම භාර ගැනීම ;

(ඇ) ඒ ප්‍රදේශයන් හි පාරවල් සෑදීමට සැලැස් වීම ;

(ඈ) ඒ ප්‍රදේශයන් හි—

(i) විවෘත කාණු මගින් ජලාපවහනය කිරීම, මලාපවහනය කිරීම සහ කාණුවලින් බැස යන කාණුකසළ බැහැර කිරීම,

(ii) ආලෝක කිරීම, සහ

(iii) ජලය සැපයීම

ඇතුළු පොදු සේවා සැලැස්වීම සඳහා වූ වැඩපළ කිරීමට සැලැස් වීම ;

(ඉ) මණ්ඩලයේ පරමාර්ථ ඉටු කිරීමට සහ එහි බලතල ක්‍රියාවෙහි යෙදවීමට අවශ්‍ය විය හැකි සියලු ම ගිවිසුම්වලට ඇතුළු වී ඒවා ඉෂ්ට කිරීම ;

(ඊ) මණ්ඩලයේ කටයුතුවල පරිපාලනය සම්බන්ධයෙන් ව්‍යවස්ථා පැනවීම ;

(උ) සවකීය පරමාර්ථ මැනවින් ඉටු කිරීම පහසු කිරීම සඳහා මණ්ඩලයේ මතය අනුව අවශ්‍ය වෙනත් සියලු දේ කිරීම."

මා මීට කලින් දෙවැනි වගන්තියේ පළමුවන උපලේඛනය කියෙව්වා. පළාත් පාලන ආයතන කීපයක නම් ඒ උපලේඛනයේ සඳහන් වුණා. ඊළඟට දෙවැනි වගන්තියේ පළමුවැනි කොටසද කියවන්නට කැමතියි.

"2. (1) මෙම පනතෙහි වූ පළමු වන උපලේඛනයෙහි නිශ්චිත ව සඳහන් යම් ප්‍රාදේශිය බල මණ්ඩලයක බල සීමාව තුළ පිහිටි යම් බිම් ප්‍රදේශයක් පහත්, වගුරු, මුඩු හෝ ගොහොරු ප්‍රදේශයක් යැයි ඇමතිවරයා සෑහීමට පත් අවස්ථාවක, පළාත් පාලන ඇමතිවරයා විමසීමෙන් පසු ව, ඒ ප්‍රදේශය මෙම පනතේ කාර්යයන් සඳහා ගොඩ කිරීමේ සහ සංවර්ධනය කිරීමේ ප්‍රදේශයක් විය යුතු යැයි ගැසට් පත්‍රයෙහි ප්‍රසිද්ධ කරනු ලබන ආඥාවක් මගින් ඔහු විසින් ප්‍රකාශ කරනු ලැබිය යුතු ය."

ඊළඟට හතර වැනි වගන්තියේ පළමුවැනි කොටස කියවනවා.

"4. (1) ඉඩම පිහිටියේ යම් ප්‍රාදේශිය බල මණ්ඩලයක බලසීමාව තුළ ද, ඒ ප්‍රාදේශිය බල මණ්ඩලය වෙත පැවරී නොමැති යම් ඉඩමක් 2 වන වගන්තිය යටතේ වූ ආඥාවක් මගින් ප්‍රකාශිත යම් ගොඩ කිරීමේ සහ සංවර්ධනය කිරීමේ ප්‍රදේශයකට අඩංගු වන අවස්ථාවක, ඒ ඉඩම රජය විසින් මණ්ඩලය වෙනුවෙන් ඉඩම් අත්කර ගැනීමේ පනත යටතේ අත්කර ගනු ලැබිය හැකි අතර, ඒ පනතේ විධිවිධාන, 2 වන උපවගන්තිය මගින් අන් ලෙසක් සලසා ඇති පරිදි හැර, ඒ ඉඩම අත්කර ගැනීමේ කාර්යය සඳහා අදාළ විය යුතු ය."



Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[ගරු සී. පී. ද සිල්වා]

මා මේ ඉහතින් කියාවූයේ මේ පනතේ පරමාර්ථවලට සම්බන්ධ කාරණායි. කොළඹ අවට තිබෙන වගුරු ඉඩම්වලින් ප්‍රයෝජනයක් නැහැ. සුළු වශයෙන් ඒවා සමහරක එළවළු ටිකක් වවනවා. ඒ හැර ඒවායින් ගන්නා වෙනත් කිසිම ප්‍රයෝජනයක් නැහැ. මෙම වගුරු ඉඩම්වල වතුර බස්සා ඒවා පස් දමා පුරවා ගත්තොත් ඒවායෙහි ගොඩනැගිලි සාදා ගන්නට පුළුවනි. අගනුවර වෙසෙන බොහෝ පිරිසකගේ ප්‍රයෝජනය සඳහා ඒවායෙහි තට්ටු නිවාස සාදනනට පුළුවනි. මෙවැනි ඉඩම්වල ප්‍රමාණය අක්කර දෙදහසක පමණයි. තව ද, මෙම ඉඩම් පුරවා ගතහොත් කර්මාන්ත ඇරඹීමටද සුදුසුයි. මා මෙම පනතේ තව එක වගන්තියක් කියවන්නට කැමතියි.

"11. (1) මණ්ඩලයේ ආරම්භක ප්‍රාග්ධනය නියෝජිත මන්ත්‍රී මණ්ඩලයේ යෝජනාවක් මගින් නිර්ණය කළ යුතු අතර ඒ ප්‍රාග්ධනයේ මුදල ලංකාවේ ඒකාබද්ධ අරමුදලින් මණ්ඩලයට ගෙවිය යුතු ය."

එම ඇස්තමේන්තුව දැන් සාදාගෙන යනවා. මා පළමුවෙන් කීවේ එකින් එක ගෙන කටයුතු කරන්නටය කියායි. මෝදර, ඌරුගොඩවත්ත, දෙමටගොඩ සහ ගොතමුව යන අන්දමට එකින් එක අවසන් කිරීමේ ක්‍රියා මාර්ගයයි, ඒ. එතකොට කටයුතු කරන්නට පහසුයි. ඉස්සෙල්ලා ගන්නේ මෝදරයි. මෝදර ඉඩම්වල වටිනාකම වැඩියි.

**ඉලංගරත්න මයා.**
*(திரு. இலங்காரத்ன)*
(Mr. Ilangaratne)
මෝදර අක්කර කීයද?

**ගරු සී. පී. ද සිල්වා**
*(கௌரவ சீ. பீ. டி சில்வா)*
(The Hon. C. P. de Silva)
අක්කර 177 යි. ඌරුගොඩවත්ත අක්කර 200 යි. එම මඩවගුරු පුරවනවා. මා විස්තර කරන්නට යන්නේ නැහැ, ඒ පිළිබඳ ටෙක්නිකල් අංශය ගැන. කැළණි ගඟ දිගේ ගලා යන වැලි යන්ත්‍ර මාර්ගයෙන් අරගෙන මෝදර ඉඩම් පුරවන එක පහසුයි. කැළණි ගඟේ වැලි කියුබ් කෝටියක් අවුරුද්දක් තුළදී මුහුදට ගලාගෙන යනවාද කියන එක අපට සිතා ගන්නට පුළුවනි. එම වැලි සම්භාරය මුහුදට ගලාගෙන යන්නට ඉඩ නොදී පොම්ප ක්‍රමයකට අනුව ඒවායින් මෝදර ඉඩම් පුරවන්නට පුළුවනි.

කොළඹ නගරයේ දියුණුවට ඇති විශාල බාධාවක් එම නිසා මගහැරී යනවා. කොළඹ නගරයේ ජනතාවට අවශ්‍ය ගොඩනැගිලි එම ඉඩම්වල සකස් කරන්නට පුළුවනි. ඒ නිසා විශාල සංඛ්‍යාවකට පහසුවෙන් රැකී රක්ෂා සැපයෙනවා ඇති. මේ වායේ වැඩ කටයුතු යන්ත්‍රවලින්ම කරන්නට පුළුවන් ඒවා නොවෙයි. විශාල යන්ත්‍ර යොදවා පස් වැලි ආදිය ඇදීමේදී වුවත් ඉමහත් පිරිසකට රක්ෂාව සපයන්නට හැකි වෙනවා. රටට විශාල සේවයක් සිදු කළ හැකි රක්ෂා බොහොමයක් එම වැඩ පිළිවෙළ යටතේ ලැබෙනවා ඇති. එසේ හෙයින් මෙම පනත මා ඉතා සන්තෝෂයෙන් ඉදිරිපත් කරනවා.

ප්‍රශ්න සභාභිමුඛ කරන ලදී.
வினா எடுத்தியம்பப் பெற்றது.
*Question proposed.*

අ. භා. 6.40

**ඉලංගරත්න මයා.**
*(திரு. இலங்காரத்ன)*
(Mr. Ilangaratne)
පහත් බිම් ප්‍රදේශ ගොඩ කිරීම ඇත්ත වශයෙන්ම ඉතාම අවශ්‍ය දෙයක්. එය අප කාටත් සතුටු විය හැකි වැඩ පිළිවෙළක්. අපේ ලංකාව පුංචි රටක් බව තමුන්නාන්සේලා දන්නවා. මේ රට ටිකෙන් ටික මුහුදු කෑමටද භාජන වන රටක්. එසේ හෙයින් මුහුදු කෑම ආදිය නවත්වන ගමන්ම මුහුදු මට්ටමෙන් පහත පිහිටි ප්‍රදේශවලින් ප්‍රයෝජන ගැනීම සඳහා එම ප්‍රදේශ උස් බවට පත් කිරීමත් වැදගත් වැඩක්. මෙම පනතෙන් අදහස් කරන්නේ කොළඹ ප්‍රදේශයේ පිහිටි පහත් බිම් පමණක් ගොඩනැගීමටයි. ගරු ඇමතිතුමා කිව්වා, පටන් ගැනීමේදී සුළුවෙන් ක්‍රියා කොට ඉන් පසු ටිකින් ටික ව්‍යාප්ත කරන බව. ඒ කෙසේ වෙතත් මෙවැනි කටයුතු

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

සඳහා යම් අන්දමකින් සැලැස්මක් සකස් කරන විට, එසේ නැතිනම් මෙවැනි කටයුතු සඳහා යම් විධියක බලතල ඇති කරන විට, ප්‍රතිපත්තියක් වශයෙන් ලංකාවටම බලපාන අන්දමට දළ වැඩ පිළිවෙළක් සකස් වී තිබුණා නම් තවත් හොඳය කියා අප කල්පනා කරනවා. මෙය වැදගත් ප්‍රතිපත්තියකට මුල පිරීමක් හැටියට අප කවුරුන් විසිනුත් පිළිගන්නවා.

මා සිතන හැටියට මේ සඳහා මණ්ඩලයක් අවශ්‍ය නැහැ. දෙපාර්තමේන්තුවක් ඇතිකොට ඊට මේ පිළිබඳ බලතල පවරා දී කටයුතු කළා නම් සමහර විට එමගින් මීට වඩා ප්‍රතිඵල ලබා ගන්නට පුළුවනි. මා එසේ කියන්නේ මණ්ඩලයකින් කෙරෙන වැඩ ගැන අපට එතරම් පැහැදෙන්නට පුළුවන්කමක් නැති නිසයි. සමහර කටයුතු සඳහා මණ්ඩල පත් කිරීම අවශ්‍යයි. එහෙත් සමහර මණ්ඩල යම් යම් කටයුතුවලදී ක්‍රියා කරන්නේ ඒවා ජාතික වැඩ හැටියට සලකාගෙන නොවෙයි. ජාතික අරමුණක් ඇතුව නොවෙයි, සමහර අවස්ථාවලදී ඇතැම් මණ්ඩල ක්‍රියා කරන්නේ. විශෙෂයෙන් පහත් බිම් ප්‍රදේශ ගොඩකර ඒවා සංවර්ධනය කොට කර්මාන්තශාලා ආදිය ඉදි කරන්නට යන අවස්ථාවේදී දේශපාලන වශයෙන් බොහොම බලපෑම් ඇති වන්නට පුළුවනි. කුමන ආණ්ඩුවක් බලයේ සිටියත්, සංයුක්ත මණ්ඩල කෙරෙහි එක්තරා අන්දමක බලපෑම් ඇති වන බව අප කවුරුනුත් දන්නවා. මීට ඉස්සර තිබුණාට වඩා විශාල අන්දමේ බලපෑම් මේ ආණ්ඩුව යටතේ සංයුක්ත මණ්ඩල කෙරෙහි තිබෙනවා. එම නිසා, යම් වැඩ පිළිවෙළක් සංයුක්ත මණ්ඩල මාර්ගයෙන් ක්‍රියාත්මක කරන්නට යන විට, ඒ වැඩ පිළිවෙළ කොයි තරම් හොඳ වුණත්, එය එතරම් සතුටුදායකව නොකෙරෙන බව අප දන්නවා. මා මේ අවස්ථාවේදී යම් යම් සංයුක්ත මණ්ඩල විවේචනය කරන්නේ නැහැ. ඒවා මේ ගරු සභාව තුළ විවේචනය වුණු අවස්ථාවලදී, ඒවායේ වැඩ කටයුතු කොයි තරම් අසතුටුදායකද යන වග දැනගැනීමේ අවස්ථාව මේ ගරු සභාවට ලැබුණා.

කොලොන්නාවේ සුළු නගර සභා දෙකට අයත් ප්‍රදේශත් මහ නගර සභාවට අයත් ප්‍රදේශයත් මෙම පනතට ඇතුළත් වන නිසා, මෙවැන්නක් ඉදිරිපත් වී තිබීම ගැන මා කොලොන්නාවේ මන්ත්‍රීවරයා වශයෙන් විශේෂයෙන් සන්තෝෂ වෙනවා. මෙවැනි පනතක් ක්‍රියාත්මක කරන විට, දේශපාලන බලපෑම් පැත්තක තිබිය දී වෙනත් නොයෙක් අංශ ගැනත් අප පරිස්සම් විය යුතුයි. විශේෂයෙන්ම, සැලැස්මවල් පිළියෙල කිරීමේදී අප පරිස්සම් විය යුතුව තිබෙනවා. උතුරු කොළඹ ගංවතුරෙන් බේරා ගන්නට යාමෙන් සිදු වුණු දේ මේ අවස්ථාවේදී ගරු ඇමතිතුමාට මා මතක් කරන්නට කැමතියි. දකුණු කොළඹ බේරා ගැනීමටත් එක්තරා විධියක සැලැස්මක් තිබෙනවා. කොළඹ, විශේෂයෙන්ම නගර සභාවට අයත් ප්‍රදේශය, ඉතා වටිනා ඉඩම් තිබෙන කොටසක්. එහෙත්, එහි ජනගහනය ව්‍යාප්ත වී තිබෙන අන්දම ගැන සලකා බලන විට, ඒ අවට ප්‍රදේශ ඊට වඩා වැදගත් බව පෙනෙනවා. කොලොන්නාව ප්‍රදේශය පහත් භූමියක් බවට පත් වී තිබෙන්නේ ස්වභාවධර්මයේ ක්‍රියාකාරිත්වය නිසාම නොවෙයි. උතුරු කොළඹ ගංවතුරෙන් බේරා ගැනීමට ගත් උත්සාහය නිසා, කොලොන්නාව ආසනයට අයත් කොලොන්නා නගර සභා ප්‍රදේශයත් කොටිකාවත්ත සුළු නගර සභා ප්‍රදේශයත් මුල්ලේරියාව සුළු නගර සභා ප්‍රදේශයත් පහත් භූමි බවට පත් වී තිබෙනවා.

මීට පෙර මෙවැනි කරුණු සම්බන්ධව ඇති වුණු වාද විවාදවලදී හාවඩ් බැම්ම ගැන මා කරුණු සඳහන් කර තිබෙන බව මට මතකයි. උතුරු කොළඹ ජලගැල්මෙන් බේරා ගැනීම සඳහා කරුණු සොයා බැලීමට හාවඩ් නමැත්තකුගේ ප්‍රධානත්වයෙන් පත් කරන ලද කොමිටියේ වාර්තාව 1924 සැසිවාර්තාවක් වශයෙන් පළ වී තිබෙනවා. එම වාර්තාව සැපයුණු අවස්ථාවේදී, එවකට පළාතේ මන්ත්‍රීවරයා වශයෙන් සිටි ටී. ඩී. ජයවර්ධන මහත්මයා ඊට විරුද්ධව බොහෝ දුරට කථා කර තිබෙන බව මෙහිදී කෘතඥතා පූර්වකව සඳහන් කරන්නට ඕනෑ. ජයවර්ධන වලව්වට එයින් විශාල පාඩුවක් සිදු වේදෝ යන අදහසක් ඇති වුණා වෙන්නටත්

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[ඉලංගරත්න මයා.]

පුළුවනි. කෙසේ වුවත්, ඒ වැඩ පිළිවෙළින් කොළොන්නා ප්‍රදේශයට විශාල හානියක් සිදු වුණු බව අප දන්නවා.

හාවඩ් බැම්ම නිසා අද කොළොන්නා නගර සභා ප්‍රදේශයත් කොටිකාවත්ත හා මුල්ලේරියාව ප්‍රදේශත් ගංවතුරට ගොදුරු වෙනවා. මේ නිසා වාර්ෂික අලාබ හානිවලට බොහෝ දෙනාට මුහුණ පාන්නට සිදු වනවාත් හැර, හැම වේලාවේම බියෙන් ජීවත් වීමටත් ඒ ප්‍රදේශයේ ජනතාවට සිදු වී තිබෙනවා. එපමණකුත් නොව, තමන් සතු වටිනා දේපල විනාශ වීමෙන් පසුත් තම ගෙවල් සඳහා අයබදු ගෙවන්නටත් ඒ ජනතාවට සිදු වෙනවා. ඔවුන් අද මෙයින් කොරතම් පීඩාවට පත් වී සිටිනවාද කියතොත්, එම ප්‍රදේශය සුළු නගර සභා නොව ගම් සභා ප්‍රදේශයක් බවට පත් කරන ලෙස බොහෝ දෙනා ඉල්ලනවා. මන්ද? සුළු නගර සභා තිබෙන විට වැඩි බද්දක් ගෙවන්නට ඔවුන්ට සිදු වන නිසයි. එම නිසා, මේ පනත අනුව යම් යම් සැලැස්මවල් සකස් කිරීමේදී මෙකී ප්‍රශ්නය ගැනත් සලකා බලා ඒවාට ප්‍රමුඛසථානයක් දී ක්‍රියා කරනවා නම් හොඳ බව මා ගරු ඇමතිතුමාට මතක් කරනවා. එය වැඩි තර්කයක් නැතිව පිළිගන්නට එතුමාට පුළුවනැයි මා විශ්වාස කරනවා.

ඇමතිතුමාගේ කථාවේ හැටියට පළමුවෙන්ම මෝදර අක්කර 170 කින් පටන් ගන්නෙ. මේ මෝදර සංවර්ධන වැඩ කරන විටත් යම් විධියකින් අර හාවඩ් බැම්ම වැනි බැම්මක් ඉදි කළොත් පසුවට විශාල පාඩුවක් වෙන්නට පුළුවනි. එම නිසා පළමුවෙන් මේ කරන්නට යන කාර්යයන් පිළිබඳව පුළුල් පරීක්ෂණයක් කළ යුතුව තිබෙනවා. එවැනි පරීක්ෂණයක් නැතිව වැඩ කළොත් පසුව අනිත් ප්‍රදේශවලට හානියක් පැමිණෙන්නට පුළුවනි. උතුරු කොළඹ බේරා ගන්නට ඉදි කළ හාවඩ් බැම්ම නිසා මුළු කොළොන්නාව ප්‍රදේශයත්, ඒ වාගේම අඹතලෙන් පහළ ප්‍රදේශයත්, කොච්චාව ප්‍රදේශයත් දැන් ජලගැල්මට භාජන වෙනවා. දැන් මෝදර සංවර්ධන වැඩ කිරීමේදීත් එවැනි බැම්මක් එහෙම ඉදි කළොත්, නැත්නම් ජලය බස්වන්නට එවැනි වැඩ පිළිවෙළක් එහෙම ඇති කළොත්, අනිත් ප්‍රදේශවලට පසුව පාඩුවක් වෙන්නට පුළුවනි.

දකුණු කොළඹත් දැන් ගංවතුරෙන් බේරා ගන්නට තවත් යෝජනාවක් තිබෙනවා. ඒ සැලැස්ම අනුවත් මාදිවෙල ඇල පැත්තෙන් ජලය යන්නෙ.

**ගරු සී. පී. ද සිල්වා**
*(கௌரவ சி. பீ. டி சில்வா)*
**(The Hon. C. P. de Silva)**

මාදිවෙල ඇල, බොල්ගොඩ වැව් හා පානදුර ගඟ මාර්ගයෙන් තමයි ජලය මුහුදට බැස යන්නෙ.

**ඉලංගරත්න මයා.**
*(திரு. இலங்கரத்ன)*
**(Mr. Ilangaratne)**

ඔය ලොකු අය සිටින ප්‍රදේශ ගලවා ගන්නට ගියාම පුංචි අය උඩින් ගංවතුර ගලනවාය කියන එකයි කාගේත් භය. කොළොන්නාව, කොටිකාවත්ත, මුල්ලේරියාව, යන ප්‍රදේශවල අද එය සිද්ධ වී තිබෙනවා. දකුණු කොළඹ ඉතාමත්ම වැදගත් ප්‍රදේශයක් වුණත්, ඒ ප්‍රදේශයට ගංවතුරෙන් වන හානි වැළැක්වීමට පියවර ගන්න විටත්, ඒ වාගේම ජලය බැස්වීමට යම් යම් පියවරවල් ගන්න විටත්, අප මුළු රට ගැනම කල්පනා කර බලා වැඩ කළ යුතුයි.

ඒ සමගම, පළාත් පාලන ඇමතිතුමා සමග සාකච්ඡා කර බලා මේ අපේම වරද නිසා—වරදය කියා මා කියන්නේ නැහැ—මේ අපේම ක්‍රියාවක් නිසා, කොයි රජයෙන් හෝ වේවා රජයකින් කළ වැඩක් නිසා, එක කොටසක් බේරා ගන්නට ගොස් තවත් කොටසක් ජලයට යට වන නිසා, විපතට පත් වන මේ අයට එක්තරා විධියක සහනයක් සලසන්නට කටයුතු කරන මෙන් මා ගරු ඇමතිතුමාගෙන් ඉල්ලා සිටිනවා. මේ උදවියත් වෙන උදවිය මෙන්ම බදු ගෙවිය යුතුයි. ගංවතුරක් ඇති වී ගෙවල් දොරවල් කඩා ගෙන ගියත් සීමිත මුදලක් තමයි ලැබෙන්නෙ. අනික් ප්‍රදේශවල අයට සලකන ආකාරයටමයි මේ අයටත් සලකන්නෙ. මසකට රුපියල් 150 ට අඩු ආදායමක් තිබුණොත් තමයි සහනාධාර

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

මුදල් දෙන්නෙ. ජල ගැල්ම නිතරම ඇති වන දෙයක්. දෙවියන්ගේ ආපදුව නැත් නම් දෙවියන්ගේ කිපීම නිසා නොවෙයි, එහෙම ජල ගැලීම් ඇති වෙන්නෙ. ආණ්ඩුව් ගත් පියවරක් නිසයි මේක සිද්ධ වෙන්නෙ.

මෙවැනි ප්‍රශ්න පිළිබඳවත් සොයා බලා ක්‍රියා කරන්නට මේ මණ්ඩලයට බලතල දී යමක් කරනවා නම් හොඳය කියා මා කල්පනා කරනවා. ඇත්ත වශයෙන්ම මේ මණ්ඩලයට බොහොම බලතල තිබෙ නවා. එම නිසා දේශපාලන බලපෑම් උඩ මේ මණ්ඩලයට සාමාජිකයන් පත් කළොත් ඇමති තුමාගේ පරමාර්ථ ඉෂ්ට කර ගන්නට බැරි වේවිය කියා මා කල්පනා කරනවා. මේ මණ්ඩලයට විශාල බලතල පවරා දී තිබෙනවා. මේ පනත යටතේ යම් යම් සැලැස්මවල් ක්‍රියාත්මක කරන විට කොයි ඉඩම් ගත යුතුද, කොයි ඉඩම් අත්හැරිය යුතුද, යන්න තීරණය කිරීමේ බලයත් ඒ මණ්ඩලයට පැව රෙන්නට පුළුවනි. එවැනි අවස්ථාවල දී මා සිතන අන්දමට ඇමතිතුමාටම ගිහින් මේ කටයුතු කරන්නට සිද්ධ වෙයි.

**ගරු සී. පී. ද සිල්වා**
*(கௌரவ சி. பீ. டி சில்வா)*
(The Hon. C. P. de Silva)
ඒක නම් බැහැ.

**ඉලංගරත්න මයා.**
*(திரு. இலங்கரத்ன)*
(Mr. Ilangaratne)
එසේ නම් කළ යුතුව තිබෙන්නේ අපක්ෂපාතව සාධාරණ කටයුතු කරනවා ඇතැයි බලාපොරොත්තු වන උදවිය මේ මණ්ඩලයට පත් කිරීමයි. දැන් මේ මණ්ඩලයට වාරිමාර්ග අධ්‍යක්ෂ පත් කරනවා. වරදක් නැහැ. ඔහු සිටිය යුතුයි. ඒ වාගේම නගර හා ග්‍රාම නිර්මාණ අධ්‍යක්ෂ පත් කරනවා. ඔහුත් සිටිය යුතුයි. ඒ වාගේම ජාතික නිවාස කොමසාරිස් පත් කරනවා. ඒත් වරදක් නැහැ. ඊළඟට "ඇමතිවරයා විසින් පත් කරනු ලබන වෙනත් සාමාජිකයන් හතර දෙනෙකු" යනුවෙන් සඳහන් වෙනවා. ඇමතිවරයා ගැන විශ්වාසය නැතිකම නිසා නොවෙයි, සමහර විට වෙනත් ඇමතිවරයකු සුදුසුකම් ගැන නොබලා, දේශපාලන සුදුසුකම් ගැන පමණක් බලා, මේ මණ්ඩලයට පත්වීම් කරන්නට පුළුවනි. දැන් බොහොමයක් සංස්ථාවල තනතුරුවලට දේශපාලන හිත වාදීන් පත් කර තිබෙන බව අප දන්නවා.

**ගරු වන්නිනායක**
*(கௌரவ வன்னிநாயக்க)*
(The Hon. Wanninayake)
තමුන්නාන්සේලාත් එහෙම කළා.

**ඉලංගරත්න මයා.**
*(திரு. இலங்கரத்ன)*
(Mr. Ilangaratne)
අපි ඉන්න කාලෙත් එහෙම එකක් දෙකක් කළා. තමුන්නාන්සේලා ඒකට විරුද්ධව කොයි තරම් උද්ඝෝෂණය කරන්ට පටන් ගත්තාදැයි කියතොත් අපි ඒක නවත්වා දැම්ම. එහෙත් දැන් ඒක තමයි නීතිය. ඉතාම සුදුසුකම දේශපාලන පක්ෂපාතිත්වය පමණක් නොව මැතිවරණ යකට ඉදිරිපත්ව පරාජය වීමයි. එහෙම වුණු අය ලොකු සුදුසුකමක් තිබෙන උදවිය කියායි භාර ගන්නෙ.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ඉස්සර සාමාන්‍යයෙන් සභාපතිට හෝ එක් අයෙකුට පමණයි වේතනයක් දුන්නෙ. දැන් හැමෝම ක්‍රියාකාරී අධ්‍යක්ෂවරුන්. මෙතරම් ක්‍රියාකාරී අධ්‍යක්ෂවරුන් පත් කළ ආණ්ඩුවක් තවත් නැහැ. හැම එක් කෙනාම ක්‍රියාකාරී අධ්‍යක්ෂවරයෙක්. ගංගා නිම්න භූමි සංවර්ධන මණ්ඩලය දිහා බැලු වත්, සීනි සංයුක්ත මණ්ඩලය දිහා බැලු වත් තත්ත්වය ඒකයි. ක්‍රියාකාරී අධ්‍යක්ෂ වරුන් වශයෙන් වේතන පමණක් නොවෙයි වෙන වෙන දේවලුත් ලබනව. මොලැසස් ආදි බොහොම දේවල් තිබෙනව. දේශපාලන පක්ෂවාදීන්ට ප්‍රයෝ ජනවත් තැන් ඇති වන ආකාරයට මණ්ඩල පිහිටුවන බවයි පෙනී යන්නෙ. නොයෙක් නොයෙක් සංස්ථා ඇති කිරීමට තවත් කෙටුම්පත් කීපයක් ඉදිරිපත් කර තිබෙනව. රැකීරක්ෂා ප්‍රශ්නය විසඳන්ට යන්නෙ දේශපාලන පක්ෂවාදී පාක්ෂික යන්ට මිස සාමාන්‍ය ජනතාවට නොවන බවයි පෙනෙන්නෙ. ඒක තමුන්නාන්සේ ලාගේ වැඩක්. විවේචනවලදී අපට ඒව

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[ඉලංගරත්න මයා.]

මතක් කරන්ට සිදු වෙයි. මේ පත් කරන්ට යන මණ්ඩලයටත් නිල බලයෙන් පත් කරන තුන් දෙනා පත් කළාට වරදක් නැහැ. එහෙත් අනික් අය වෙනුවට ඡන්ද යෙන් තේරී පත්වුණු උදවිය—විශේෂ යෙන් සුළු නගර සභාපතිවරුන්, ගම්සභා පතිවරුන් වැනි අය—පත් කළොත් හුඟක් දුරට වංචකිම් මඟහරවා ගැනීමට පුළුවනි. එසේ නැත්නම්, "මගේ ඉඩම ගන්න; මගේ ඉඩම ගන්ට එපා" ආදි වශයෙන් ඇමතිවරුන්ට හිස ඔසවන්ට බැරි විධියේ ඉල්ලීම් ඉදිරිපත් වෙයි. දැන්මම මෝදර තෝරා ගත්තෙ ඒ අනුව නොවෙයි කියා මා හිතනවා. එහෙත් මේ සඳහා ගොතමුව ඒ වගේම උඟුරුගොඩවත්ත තෝරා ගන්න ඊට වඩා යුතුකමක් තිබෙනවා. මන්ද හාවාඩ් බැම්ම නිසා ඒ පළාත් ගං වතුරින් යටවන නිසයි.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, "කොළඹ පහත් බිම් ප්‍රදේශ ගොඩ කිරීමේ සහ සංවර්ධනය කිරීමේ මණ්ඩලය" යයි මේ කෙටුම්පතේ නාමය වශයෙන් සඳහන් වුණත් කොළඹින් පිට ප්‍රදේශත් මීට ඇතුළත් වෙනවා. ඒ ප්‍රදේශ මේවායි:

කොළඹ මහා නගර සභාව
දෙහිවල-ගල්කිස්ස මහා නගර සභාව
කෝට්ටේ නගර සභාව
කොලොන්නාව නගර සභාව
පෑලියගොඩ නගර සභාව
වත්තල-මාබෝලෙ නගර සභාව
මොරටුව නගර සභාව
පිළියන්දල සුලු නගර සභාව
මහරගම සුලු නගර සභාව
හැඳල සුලු නගර සභාව
දළුගම සුලු නගර සභාව
කැළණිය සුලු නගර සභාව
බත්තරමුල්ල-තලංගම සුලු නගර සභාව
මුල්ලේරියාව සුලු නගර සභාව
කොටිකාවත්ත සුලු නගර සභාව
අඹතලේන් පහළ ගම් සභාව
කෝට්ටේ-ගල්කිස්ස ගම් සභාව
මාම්පෙ-කැස්බෑව ගම් සභාව

මේ අනුව බැලුවාම උපලේඛනයේ තිබෙන ලැයිස්තුව නීතියට පටහැණි බවයි පෙනෙන්නෙ. නීතිය මා හරියා කාර දන්නෙ නැහැ. එම නිසා කොළඹ පහත් බිම් ප්‍රදේශ ගොඩ කිරීමේ සහ සංවර්ධනය කිරීමේ මණ්ඩලයට කොළඹින් පිට ඒවටත් බලය දෙන්ට පුළුවන් දැයි කල්පනා කර බැලුවොත් හොඳයයි මා අදහස් කරනවා. මා මීට වැඩිය කථා කරන්ට අදහස් කරන්නෙ නැහැ. මේ මණ්ඩලයේ වැඩ කටයුතු පටන් ගැනීමේදී ආණ්ඩුවේ යම්කිසි වැඩක් නිසා අනාථවුණු කොටස්වලට ප්‍රමුඛත්වය දෙන ලෙස මා ඉතා ඕනෑකමින් ඉල්ලා සිටිනවා. එවැනි උදවියට අයබදු වශයෙන් හෝ සංවර්ධන වශයෙන් හෝ පහසුකම් දීමේ බලතල මේ මණ්ඩලයට පවරන ලෙසත් මා ඉල්ලනවා. ඒ වගේම ඒ බල මණ්ඩලය පත්කිරීමේදී නිල බලයෙන් පත් වන අය හැර අනික් අය ඡන්ද බලයෙන් පත්වී සිටින උදවිය අතරින් පත් කළහොත් ඔබතුමන්ලාට ලැබිය හැකි චෝදනා හුඟක් දුරට මඟහරවා ගන්ට පුළුවන් වෙයි කියා මා විශ්වාස කරනවා. මේ අදහස් තමුන්නාන්සේ ඉදිරියේ තබනවා.

**බර්නාඩ් සොයිසා මයා.**
*(திரு. பெர்னட் சொய்ஸா)*
(Mr. Bernard Soysa)

Mr. Deputy Speaker, I would like to raise a point of Order. I would like you to give a Ruling on this matter, or else the Hon. Minister can tell us that he would amend the Title of the Bill. The Title of the Bill is "Colombo (Low-Lying Areas) Reclamation and Development Board." Colombo low-lying areas can mean low-lying areas either within Colombo or just on the borders of Colombo. Although a number of local government bodies and the laws relating to those bodies are mentioned in the two Schedules—they go much further than Colombo —the entire conception of the Bill, the powers given to the Hon. Minister and to his Board, can embrace any part of the Island. This is a reclamation board. I am not discussing the merits or demerits of it or any of the other things. But this is a Board which can operate anywhere in the Island. It is therefore not a Colombo (Low-Lying Areas) Development Board. If it is meant to be in respect of low-lying areas in or around Colombo, then the scope of

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

the functions of this Board must be geographically defined.—[*Interruption*].

I hope the Parliamentary Secretary to the Minister of Industries and Fisheries (Mr. D. Shelton Jayasinghe) will listen a bit. He knows what exactly is being said here. This Bill is for the purpose of setting up a body——

නියෝජ්‍ය කථානායකතුමා
(உப சபாநாயகர் அவர்கள்)
(Mr. Deputy Speaker)

How about Clause 2 of the Bill? It states:

"2. (1) Where the Minister is satisfied that any area of land situated within the jurisdiction of any local authority. . . ."

බර්නාඩ් සොයිසා මයා.
(திரு. பெர்னட் சொய்ஸா)
(Mr. Bernard Soysa)

That is my objection. It says, "any local authority". That means anywhere in the Island.

නියෝජ්‍ය කථානායකතුමා
(உப சபாநாயகர் அவர்கள்)
(Mr. Deputy Speaker)

No. . . . . "Local authority specified in the First Schedule to this Act. . . ." That is what Clause 2 says.

ආචාර්ය එන්. එම්. පෙරේරා
(கலாநிதி என். எம். பெரேரா)
(Dr. N. M. Perera)

Clause 2 of the Bill is wider than that.

බර්නාඩ් සොයිසා මයා.
(திரு. பெர்னட் சொய்ஸா)
(Mr. Bernard Soysa)

Clause 2 of the Bill says:

"2. (1) Where the Minister is satisfied that any area of land situated within the jurisdiction of any local authority specified in the First Schedule. . . ."

So why do you call this a "Colombo (Low-Lying Areas) Develpoment Board"? This area covers Mampe, Kesbawa, Moratuwa——

නියෝජ්‍ය කථානායකතුමා
(உப சபாநாயகர் அவர்கள்)
(Mr. Deputy Speaker)

Colombo Revenue District.

ආචාර්ය එන්. එම්. පෙරේරා
(கலாநிதி என். எம். பெரேரா)
(Dr. N. M. Perera)

The Minister will then have to amend the Title.

බර්නාඩ් සොයිසා මයා.
(திரு. பெர்னட் சொய்ஸா)
(Mr. Bernard Soysa)

I do not want to discuss the Bill because there are provisions in it under which the First Schedule can be amended from time to time by adding any number of local authorities. There is a provision here for that purpose.

ගරු සී. පී. ද සිල්වා
(கௌரவ சீ. பீ. டி சில்வா)
(The Hon. C. P. de Silva)

We can bring a new Bill.

බර්නාඩ් සොයිසා මයා.
(திரு. பெர்னட் சொய்ஸா)
(Mr. Bernard Soysa)

That is another matter. But you have now presented a Bill which calls itself the "Colombo (Low-Lying Areas) Reclamation and Development Board Bill" when, in fact, it is not so. Therefore the Hon. Minister can at least tell us that he would amend the Title.

නියෝජ්‍ය කථානායකතුමා
(உப சபாநாயகர் அவர்கள்)
(Mr. Deputy Speaker)

I think the hon. Member can argue this matter later.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

එකල්හි වේලාව ප. ව. 7 වූයෙන් කටයුතු අත්සිටුවා විවාදය කල් තබන ලදී.

**එතැන් සිට විවාදය 1968 අප්‍රේල් 8 වන සඳුදා පවත්වනු ලැබේ.**

அப்போது பி. ப. 7 மணியாகிவிடவே சபையின் நடவடிக்கைகள் இடைநிறுத்தப்பட்டு, விவாதம் ஒத்திவைக்கப்பெற்றது.

1968, ஏப்றில் 8, திங்கட்கிழமை விவாதம் மீள ஆரம்பமாகும்.

*It being 7 P.M., Business was interrupted, and the Debate stood adjourned.*

*Debate to be resumed on Monday, 8th April 1968.*

## කල් තැබීම

ஒத்திவைப்பு

ADJOURNMENT

**යෝජනාව ඉදිරිපත් කරන ලදින් ප්‍රශ්නය සභාභිමුඛ කරන ලදි:**

"මන්ත්‍රී මණ්ඩලය දැන් කල් තැබිය යුතුය"—[ගරු සී. පී. ද සිල්වා].

"சபை இப்பொழுது ஒத்திவைக்கப் பெறுமாக" [கௌரவ சீ. பீ. டி சில்வா] எனும் பிரேரணை பிரேரிக்கப்பட்டு, வினா எடுத்தியம்பப்பெற்றது.

*Motion made, and Question proposed.*

"That the House do now adjourn".—[*The Hon. C. P. de Silva*].

**ආචාර්ය එන්. එම්. පෙරේරා**

(கலாநிதி என். எம். பெரேரா)

(Dr. N. M. Perera)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මා කියන්නට අදහස් කරන කරුණ සම්බන්ධයෙන් අගමැතිතුමාට දැනුම් දී තිබෙනවා. මෙය ඉතාමත් කණගාටුදායක කාරණයක්. මේ ගරු සභාවේ සාමාජිකයෙකු වන කළුතර මන්ත්‍රීතුමාට සිදු වුණ ඇබැද්දිය සම්බන්ධයෙන් මා වචන ස්වල්පයක් කථා කිරීමට අදහස් කරනවා. මා කියන්නේ නැහැ මේ කරුණට අගමැතිතුමා සම්බන්ධ වුණාය කියා. මෙය අගමැතිතුමාගේ දැනීම ඇතිව සිදු වුණ දෙයක්ය කියා මා කියන්නෙත් නැහැ. නමුත් මේ සම්බන්ධයෙන් අගමැතිතුමාට යම්කිසි වගකීමක් තිබෙනවා. ඒ වගකීම හරිහැටියට අගමැතිතුමා ඉෂ්ට කළේ නැහැ. මගේ චෝදනාව එයයි. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, 28 වෙනිදා විශාල පෙරහැරක් ගියා. මෝටර් රථවලින්—නොයෙකුත් ආකාරයේ මෝටර් රථවලින්— විශාල පිරිසක් නුවර දෙසට ගමන් කළා. ඒ බව අපි තමුන්නාන්සේලා කවුරුත් දන්නවා. එය රහසක් නොවෙයි. සමහර විට මේ රටේ කවදාවත් එක් නොවුණ අන්දමේ විශාල සංඛ්‍යාවකින් යුක්ත පෙරහැරක් ගිය බව අපි දන්නවා. ඒ පෙරහැර නොයෙක් පළාත්, නොයෙක් කොට්ඨාශ මැදින් ගමන් කළා. කැළණිය, මහර, ඇදිගම ආදී ඔය පළාත් මැදින් ගමන් කළා. දේශපාලන කටයුත්තක් සම්බන්ධයෙන් මෙවැනි ගමනක් යන විට නොයෙකුත් විධියේ සටන් පාඨ කියන්න සිදු වෙන බව පිළිගන්න ඕනෑ කරුණක්. සමහර විට ඇතැම් උදවියට ඒ සටන් පාඨ ඇසීමෙන් හිත් රිදෙන්න පුළුවනි. මා කියන්න කැමතියි, එක්සත් ජාතික පක්ෂයේ අයත් මෙවැනි ගමන් යන විට අපට පහර ගැසීම සඳහා නොයෙකුත් සටන් පාඨ කියන බව. හොරගොල්ල පාස් කර ගෙන යන විට නොයෙකුත් විධියට හිත රිදෙන අන්දමේ සටන් පාඨ කියා තිබෙනවා. නමුත් එවැනි දේවල් දේශපාලන කටයුතු කිරීමේදී වළක්වන්න පුළුවන්කමක් නැහැ. අපි ඒවා ඉවසන්න පුරුදු වෙන්න ඕනෑ. මා පුද්ගලික වශයෙන් මැදි වී නොයෙක් විධියේ බැණුම් අසා තිබෙනවා. නමුත් අපි ඒවා ඒ තරම් ලොකුවට සලකන්නේ නැහැ. අගමැතිතුමාගේ ප්‍රධානත්වයෙන් උත්සව කිහිපයක්ම එදා ඇදිගම පැවැත්වීමට බලාපොරොත්තුවෙන් සිටි බව අපි පිළිගන්නවා. එම නිසා ඒ ප්‍රදේශයේ ජනතාව යම් උනන්දුවක් ඇතිව සිටියා. මේ පෙරහැර ගමන් කළ පාරේ වරකාපොල විශාල උත්සවයක් තිබුණා. මා හිතන හැටියට නෙලුන්දෙනිය ප්‍රදේශයේ 41 වෙනි කනුව නැත්නම් 42 වෙනි කනුවට කිට්ටුව මහළු මඩමක් සම්බන්ධයෙනුයි ඒ උත්සවය පැවැත්වුණේ. ඒ නිසා ඒ ඇදිගම ආසනයේ උදවිය ඒ සම්බන්ධයෙන් ලොකු පිබිදීමක් ඇතිව සිටියා. ඒ බව මා පිළිගන්නවා. නමුත් නොයෙකුත් සටන් පාඨ කියා කෑ ගසමින් නුවරට ගොස් තමන්ගේ වැඩ කටයුතු අවසන් කර ආපසු එන අපේ පිරිසට බොහොම කැත විධියට පහර දීම ප්‍රජාතන්ත්‍රවාදයට ගැළපෙන දෙයක්ය

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

කියා කාටවත්ම පිළිගන්න පුළුවන්කමක් නැහැ. මා දැක්ක පත්‍රයක, ගරු අගමැතිතුමා විසින් කියා තිබුණා, ඔහුගේ මළකුණ උඩ මිසක් මේ රටේ ප්‍රජාතන්ත්‍රවාදය වළලන්න දෙන්නෙ නැත, ප්‍රජාතන්ත්‍රවාදය නැති කරන්න දෙන්නේ නැත කියා. අපි ඒ ගැන බොහොම සතුටු වෙනවා. මා දැන ගන්න කැමතියි, අපේ අගමැතිතුමාගේ ප්‍රජාතන්ත්‍රවාදයේ නියම අර්ථය මේකද කියා. මේ විධියේ සිද්ධිවලින් ප්‍රජාතන්ත්‍රවාදය රැකෙනවාය කියා මා විශ්වාස කරනානේ නැහැ. අනික් අයගේ මළ මිනී උඩින් ප්‍රජාතන්ත්‍රවාදය රකින්න පුළුවන් ද? මේ සිද්ධිය ගැන මගේ විශෙෂ චෝදනාව මේකයි. අද වන තුරු, මේ මොහොත වන තුරු ඒ සිද්ධිය සම්බන්ධයෙන් තමන්ගේ කණගාටුව ප්‍රකාශ කිරීමට අගමැතිතුමාගෙන් ප්‍රකාශයක් කෙරී නැහැ. ඒ නිසයි මා කියන්නේ අගමැතිතුමා වගකීමක් පැහැර හැරියාය කියා. තමන් සමග එකට වාඩිවී වැඩ කරන මන්ත්‍රීවරයෙකු මෙවැනි සිද්ධියකට මුහුණ පැමේදී එතුමාට තිබුණ පළමුවෙනි යුතුකම එතුමා පැහැර හැරියා. ඒ මන්ත්‍රීතුමාගේ ජීවිතය හානි නොවී බේරුනේ බොහොම ශේෂයෙන්. බාග වෙලාවට ඒ මන්ත්‍රීතුමා සමග එකට ගමන් කළ දකුණු කොළඹ ගරු මන්ත්‍රීතුමා මෙම සිද්ධිය පිළිබඳව විස්තරයක් ඉදිරිපත් කරනවා ඇති.

නියෝජ්‍ය කථානායකතුමනි, මා පැහැදිලි කරන්නට අදහස් කරන්නේ පොලිසිය මේ ගැන දැන සිටි බවයි. මගේ විශ්වාසයේ හැටියට අගමැතිතුමාගේ අවසාන රැස්වීම වරකාපොල තිබුණේ හතහමාරට පමණය කියා.

**ගරු ඩඩ්ලි සේනානායක**
*(கௌரவ டட்லி சேனநாயக்க)*
(The Hon. Dudley Senanayake)
ඊට කලින්.

**ආචාර්ය එන්. එම්. පෙරේරා**
*(கலாநிதி என். எம். பெரேரா)*
(Dr. N. M. Perera)

ඊට කලින් නම් මා කියන දේ තව තවත් තහවුරු වන අතර, මේ සිද්ධිය තවත් බරපතළ වෙනවා. තුන් දෙනකු විසින් අත්සන් කරන ලද ලියවිල්ලක් දකුණු කොළඹ මන්ත්‍රීතුමාට ලැබී තිබෙනවා. අත්සන් කර තිබෙන තුන් දෙනා නම් පී. කේ. ලියනගේ, ඩී. ජී. විලියම්—අපේ කම්කරු සංගමයේ ප්‍රධාන ලේකම්—සහ ගම්පහ පෙරකදෝරු මහතෙකු වන ඈෂ්ලි හේරත් යන තුන් දෙනායි. ඒ ලියමන ඉංගිරිසියෙන් තිබෙන්නෙ මම එය කියවන්නම්:

"29th March 1968

*To :* Bernard Soysa, Esq., M.P.,

D. G. William and his wife, P. K. Liyanage and Ashley Herat left the Coalition rally at about 6.15 p.m. for Colombo. We reached Warakapola round about 7.15 p.m. Passing the Warakapola Police Station and before we came to the bus stand we were surprised to see a crowd of about three to four hundred people standing on both sides of the road and obstructing traffic——

මේ ස්ථානය තිබෙන්නේ වරකාපොළ පොලීසිය ඉදිරිපිටම වාගේ පොලීසියට බොහොම කිට්ටුවෙන්.

' Vehicles could not pass through as the crowd was converging on to the road. We observed five or six police constables standing on the left of the road in front of the crowd. The bus proceeding towards Colombo in front of our car was carrying Coalition supporters and it stopped in the middle of the road as it could not proceed. The crowd jeered and threatened them. It was obvious to us that the Police were conniving at this activity because the constables made no effort to check them while the Police Station itself was only about twenty yards from this menacing crowd. Apperently we came through unhurt because we did not carry any symbol on our car. When we came to Pasayala we were told by some others who had stopped at Pasyala that they too had been threatened and their flag had been snatched. Apprehending serious trouble we stopped at the Nittambuwa Police Station and reported this matter to the Inspector in charge. He made a record of our report and in our presence he booked two telephone calls to the Warakapola Police Station and the Kegalle A.S.P. We deliberately avoided mentioning in the record the fact that the Police were conniving at the conduct of the crowd, through fear that the Nittambuwa Police may not take action. The two calls booked from Nittambuwa Police Station were urgent calls and the telephone message registers of the Warakapola and Kegalle Police Stations should reveal at what times the messages were received. We reported this matter at

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[ආචාර්ය එන්. එම්. පෙරේරා]

the Nittambuwa Police Station at about 8.10 p.m. The record made by the I. P., Nittambuwa mentions the names of P. K. Liyanage, Advocate, and Ashley T. Herat, Proctor, as giving the information.

Sgd. P. K. Liyanage,
D. G. William (General Secretary, C.F.L.)
Ashley T. Herat"

ඒ කියන්නේ වරකාපොළ පොලීසිය ටත් කෑගල්ලේ ඒ. ඇස්. පී. මහතාටත් මේ සම්බන්ධව දැනුම් දී තිබෙනවාලු. රාත්‍රී 8ට පමණ මේ ගොල්ලන් මොන වද කෙළේ? මේ සම්බන්ධව කටයුතු කරන්නට පොලිසියට යුතුකමක් තිබුණේ නැද්ද? ඒ ස්ථානයේ පමණක් නොවෙයි, ඊට පසු අප සෝදිසි කළ විට අපට ලැබුණු ආරංචි අනුව 41 වැනි කණුවේ සිට කලබල සහිත තත්ත්වයක් ඇති වී තිබෙනවා. එතැනින් පහළට දිගටම නොයෙක් නොයෙක් තැන්වල ඔය තත්ත්වය ඇති වී තිබෙනවා. මේ විධියේ ආරංචියක් ලැබුනම මේ සම්බන්ධව පෙට්‍රල් කර අසතුටුදායක උදවිය පාරේ ඉන්නවා නම් ඒ අය ඉවත් කර සාමය ආරක්ෂා කිරීමේ සඳහා යමක් කිරීමට පොලිසියට යුතුකමක් නැද්ද?

මේ සම්බන්ධව අපිත් විභාග කළා. අප දන්නා හැටියට මේ සම්බන්ධව මැදහත් වුණු උදවියගේ නම් අප ළඟ තිබෙනවා. මොහොතකින් මම ඒ නම් කියවන්නම්. පොලිසිය මේ අවස්ථාවේදී තමන්ගේ යුතුකම් පැහැර හැරියාය කියා මා කියනවා.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, අපේ නිකවැරටියේ මන්ත්‍රීතුමා (එම්. තෙන්නකෝන් මයා.) මගේ කොට්ඨාශයේ රැස්වීමක් පැවැත්වුවා. මාවත් ඒ රැස්වීමට කැඳවා තිබුණා. මා ඒකට ගියේ නැහැ. රැස්වීමට සහභාගි වූ ජනයාට වඩා පොලිසිය හිටියා, එතැන. මා ඒ ගැන විරුද්ධ වුනේ නැහැ. එය හරි බව මා කියනවා. මේ උදවිය එහි රැස්වීමක් පවත්වන්නට ගියාම කෝලාහලයක් ඇති වන්නට පුළුවන්ය කියන බයට ඒ තරම් පොලිසිය කැඳවන්නට ඇති. මා ඒ ගැන විරුඩ නැහැ. වැඩිපුර ජනයා සිටියේ නැහැ. කිසිම හැලහොල්මනක් තිබුණේ නැහැ. පොලිසියෙන් හිටපු උදවියට කථා කර ඇවිත් තිබෙනවා. ඉන්තිනි දේවාලය ඉදිරිපිටයි, රැස්වීම තිබුනේ. මගේ කොට්ඨාශයේ මගේ හිතවත් උදවියට මා පැහැදිලි වශයෙන් පණිවුඩයක් ඇරියා, වචනයකින්වත් විරුද්ධ වන්නට එපාය, කැමති නම් කථා ඇහුවට කමක් නැත කියා. ප්‍රජාතන්ත්‍රවාදයේ හැටියට ඕනෑම කෙනකුට අයිතියක් තිබෙනවා, මගේ කොට්ඨාශයේ රැස්වීමක් පවත්වන්නට. එක්සත් ජාතික පක්ෂයේ උදවිය නොයෙක් විධියේ සටන් පාඨ කියාගෙන ඒ පාරවල යනවා. ඒ ගැන අපි විරුද්ධ නැහැ. එහෙත් මේ අවස්ථාවේදී මෙවැනි තත්ත්වයක් තිබෙද්දී පොලිසිය තමන්ගේ යුතුකම පැහැර හැර තිබෙන බවයි, මා කියන්නේ. ඒ ගැනයි, මා කණගාටු වන්නේ. අගමැතිතුමාත් එතුමාගේ යුතුකම පැහැර හැර තිබෙනවා. ආරංචිය ලැබුණු හැටියෙම මා මේ සිද්ධිය හෙළා දකිනවාය, මා මේවාට අනුබල දෙන්නෙ නැත, මේ ගැන පරීක්ෂා කර වැරදි කරුවන්ට දඬුවම් දෙන්නට ලෑස්තිය කියා අගමැතිතුමා ප්‍රකාශ කළා නම් එයින් මේ රටේ මහජනයාට යම්කිසි සැනසිල්ලක් ලැබෙනවා.

අපට ලැබී තිබෙන ආරංචි අනුව පොලිස් කොස්තාපල් සුබ්‍රමනියම් මහත්මයාත්, පොලිස් කොස්තාපල් හේරත් මහත්මයාත් මේ වරකපොල සිද්ධියට අනුබල දී තිබෙනවා. තවත් උදවියගේ නම් මම කියන්නම්. මේ උදවිය ගැන පොලිසිය ක්‍රියා කරන නිසා නොවෙයි, මා මේ නම් කියන්නෙ. අනාගතයේදී දැන ගැනීම සඳහා මේ අයගේ නම් හැන්සාඩ් වර්තාවට ඇතුළු වීම හොඳයි. තෝලන්ගමුව වසම ග්‍රාම සේවක මහත්මයත්, තුල්හිරියේ අළුත් පේෂ කර්මාන්ත ශාලාවේ මුර කාරයත් මෙයට සම්බන්ධ වී තිබෙනවා. ඩී. කේ. සිරිල් මහා හේන, වරකාපොල ඩී. කේ. සිරිල් කව්ද කියා තමුන්නාන්සේ දන්නවා ඇති. එයා අළුත් මුදලාලි කෙනෙක්. එච්. කේ. වර්නේලිස්, පිලාදූව, වරකාපොල. ඩී. පී. ඒක්ක සිංඤෝ, වරකාපොල. ඩී. පී.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

මාටින් සිංඤෝ, වරකාපොල. ඩී. අරුණගිරි, වරකපොල. එම්. ඩී. සිමියොන්, වරකාපොල. බුහාරි, වරකාපොල.

තමුන්නාන්සේ දන්නෙ නැති තව දෙන්නෙක් ඉන්නවා. මිස්ටර් ජයතුංග. තමුන්නාන්සේගේ වැඩ කරන කෙනෙක්. ආරිය උන්නැහේ අගමැතිතුමාගෙන් ඈත් වුණාට පසු දැන් ඒ වැඩය කරන්නේ ජයතුංග මහත්මයයි. ආතර් දිසානායක මහත්මයා. ඩබ්ලිව්. ජී. විජේරත්න—ගරාජ් බාස්. පළාතේ මිනිපත් කව්රුත් මේ අයව දන්නවා. මේ අයගේ නම් අපට ලැබෙන්නෙ ඒ පළාතේ සිටින අපේ සාමාජිකයන්ගෙන්—අපේ හිතවතුන්ගෙන්. ඒ අය පැහැදිලි වශයෙන් මේ විස්තරය දී තිබෙනවා. මේක හරි වන්නට පුළුවන්, වැරදි වන්නට පුළුවන්. අගමැතිතුමාට මේ ගැන සොයා බලන්නට පුළුවන්. අගමැතිතුමා ප්‍රසිද්ධ රැස්වීම්වලදී ප්‍රජාතන්ත්‍රවාදය වර්ණනා කර එය ආරක්ෂා කරන්නට ඕනෑ බව කියනවා. අපේ ජනතාව කවුරුන්වත් එය පිළිගන්න සූදානම් වෙන්නෙ නැහැ, මෙවැනි සිද්ධින් ඇති වන විට. එපමණක් නොවෙයි, මෙවැනි සිද්ධින් ඇති වන විට පොලීසිය ක්‍රියා කරන්නෙ නැතිනම්, අගමැතිතුමා නිහඬව සිටිනවා නම්, ප්‍රජාතන්ත්‍රවාදය රැකීමට මේ අන්දමින්ද කටයුතු කරන්නෙ කියන කුතුහලයක් අපට රට ජනතාව තුළ ඇති වෙනවා.

එක් කාරණයක් ගැන අප සන්තෝෂ වෙනවා. එනම්, සෑම ප්‍රවෘත්ති පත්‍රයක්ම වාගේ මේ සිද්ධිය හෙළා දැක තිබෙනවා. එය එක්තරා විධියකින් සතුටු දායක තත්ත්වයක්. නමුත් මා අද වනතුරු බලාගෙන සිටියා, ගරු අගමැතිතුමා ඒ පිළිබඳව කිසිදු ප්‍රකාශයක් කළේ නැහැ. මේ සම්බන්ධයෙන් පිළිතුරක් දෙන විට මෙයට කලින් ආණ්ඩු තිබුණු වෙලාවේදී අසුවල් තැන අසුවල් අන්දමේ ගල් ගැසීමක් සිද්ධ වුණාය ආදී වශයෙන් කාරණා කීමෙන් වැඩක් වෙන්නෙ නැහැ. මේ කාරණය සම්බන්ධයෙන් කියන්න තිබෙන්නෙ මෙයයි. මෙවැනි සිද්ධියක් ඇති වුණාම ඒ සම්බන්ධයෙන් කෙළින්ම පැහැදිලි ප්‍රකාශයක් කරන්න ලැහැස්ති නැතිනම් ඒ ගැන ක්‍රියා කරන්න සූදානම් නැතිනම්, එයින් මේ රටේ ප්‍රජාතන්ත්‍රවාදය ආරක්ෂා වන්නේත් නැහැ, ආරක්‍ෂා කෙරෙන්නෙත් නැහැ. විශේෂයෙන් අපේ පාක්ෂිකයකු හැටියට නොව මේ ගරු සභාවේ මන්ත්‍රීවරයකු මෙබඳු සිද්ධියකට ගොදුරු වීම ගැන යම්කිසි ප්‍රකාශයක් කිරීම අගමැතිතුමාගෙ යුතුකමක්ව තිබුණා. එහෙත් ඒ යුතුකම නොකිරීම ගැන අපේ බලවත් කනගාටුව මේ අවස්ථාවේදී ප්‍රකාශ කරන්න ඕනෑ. කෙසේ වෙතත් ගරු අගමැතිතුමාගෙන් ඉටුවිය යුතු යුතුකම් ඉටු වේයයි මා අවසාන වශයෙන් බලාපොරොත්තු වෙනවා.

**එස් ඩී බණ්ඩාරනායක මයා** (ගම්පහ)
*(திரு. எஸ். டீ. பண்டாரநாயக்க—கம்பஹா)*
(Mr. S. D. Bandaranayake—Gampaha)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි මා සුළු ප්‍රශ්නයකුයි මතු කරන්න අදහස් කරන්නෙ එනම් ඉතාලි විශේෂඥයකු ඔහු විසින් භාර ගත් රාජකාරිය අවසන් කර, සීගිරි බිතුසිතුවම් සම්පූර්ණයෙන්ම යථා තත්ත්වයට පමුණුවා ඇති බැව් අපට දැන ගැනීමට තිබෙනවා. එය එසේ නම් ඒ සිතුවම් ජනතාව සඳහා නැවත විවෘත කිරීමට ඇති ප්‍රමාදය කුමක්ද කියා දැනගන්න සතුටුයි.

අ. භා. 7,17

**බර්නාඩ් සොයිසා මයා.** (දකුණු කොළඹ)
*(திரு. பெர்னட் சொய்ஸா—கொழும்புத் தெற்கு)*
(Mr. Bernard Soysa—Colombo South)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මේ සිද්ධිය වූයේ මහනුවර සිට ආපසු කොළඹ එන අවස්ථාවේදී වරකාපොලට පැමිණීමට මත්තෙනුයි. වෙලාව රාත්‍රි 11.30 ට පමණ ඇති. අවට තද අඳුරක් පැවතුණා. හදිසියේම යම්කිසි ශබ්දයක් ඇසුණා. කාරයේ යම්කිසිවක් වදින ශබ්දයකුයි ඇසුනෙ. ඉදිරිපස අසුනෙ රථය ධාවනය කරන තැනැත්තාට අසල සිටියෙ අඩු වයස්ගත ළමයෙක්. වීදුරුවට කිට්ටු වන්න සිටියෙ කළුතර ගරු මන්ත්‍රීතුමා (චම්ලී ගුණවර්ධන මයා.) යි. ඒ පැත්තෙ වීදුරුවට ගල් පහරක් වැදී වීදුරුව බිඳී කුඩුවී, කෑලි ඇතුළට වැටුණා වාහනය ඇතුළෙ සිටි කෙනෙක් වාහනය නවත්වන්නටයි කීවා.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[බර්නාඩ් සොයිසා මයා.]
සිද්ධිය ගැන බලන්න. කළුතර ගරු මන්ත්‍රීවරයා කීවා ගලක් වැදුණා, නැවැත්වීමෙන් ප්‍රයෝජනයක් නැහැ ඉක්මනින් ධාවනය කර ගෙන යන්නටය කියා.

විශේෂයෙන්ම මෙහිදී කියන්න තිබෙන්නෙ ගලක් ගැසුවේ කව්ද කියා සොයා බැලීමට අපි කාරය නැවැත්තුවෙ නැති බව යි. වැදුණු ගල පහරේ වේගය නිසා දෙකට කැඩී වාහනය තුළම තිබුණා එය පසුව හදිසි අනතුරු රෝහලේ තිබෙන පොලිස් කාර්යාලයට භාර දුන්නා වරකා පොල පොලිස් නිලධාරියකුගෙන් එම ස්ථානයට ඇතුළුවන දොරටුව ළඟදී කන්දක් නැගීමට ඇති නිසා ඇතුළට යාමට මා අකැමැති වුණ නිසා—රෝහල ඇති ස්ථානය දැනගෙන අප යන්න ගියා. මෙහිදී විශේෂයෙන් සඳහන් කළ යුත්තක් තිබෙනවා. අගමැතිතුමාගෙ කොට්ඨාශයට අයත් වරකාපොල ග්‍රාමීය ආරෝග්‍ය ශාලාවෙ ඒ අවස්ථාවෙදි ප්‍රතිකාරයක් ගැනීමට කවුරුන්වත් සිටියෙ නැහැ මේ නිසා නිට්ටඹුවට ගොස් නිට්ට ඹුවේ අරසරත්නම් පොලිස් පරීක්ෂක මහතාගේ උපකාරයෙන්—ඒ මහතා කෙනෙකු එව්වා වතුපිටිවලට යන්න—වතුපිටිවල විමලරත්න දොස්තර මහතාගෙන් ප්‍රතිකාර ලබාගැනීමට හැකි වුණා. ඒ දොස්තර මහතා ඉතා වුවමනාවෙන් ප්‍රතිකාර කොට ගිලන් රථයකින් චම්ලි ගුණවර්ධන මන්ත්‍රීතුමා කොළඹට එව්වා. එම ගිලන් රථයේම මාත් පැමිණියා. ඉන් පසුව ඒ සිද්ධිය සම්බන්ධයෙන් රෝහලේ පොලිස් කාර්යාලයට මා පැමිණිල්ලක් කළා.

අ. භා. 7.20

**ගරු ඩඩ්ලි සේනානායක**
*(கௌரவ டட்ளி சேனநாயக்க)*
(The Hon. Dudley Senanayake)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මේ ප්‍රශ්නය මේ අවස්ථාවේදී ඉදිරිපත් කිරීම ගැන මා ඉතාමත් කෘතඥ වෙනවා. පත්‍ර වලින් දකින්නට ලැබුණු දේවල් ඇත්තද කියන්නට මා දන්නේ නැහැ. ඒ ගරු මන්ත්‍රීතුමා නොකිව්වාට සමහර උදවිය ප්‍රකාශ කර තිබෙනවා, මගේ අනුබලය ඇතිව—

**ආචාර්ය එන්. එම්. පෙරේරා**
*(கலாநிதி என். எம். பெரேரா)*
(Dr. N. M. Perera)
නැහැ. නැහැ.

**ගරු ඩඩ්ලි සේනානායක**
*(கௌரவ டட்ளி சேனநாயக்க)*
(The Hon. Dudley Senanayake)
ඇයි එහෙම කියන්නේ? "ඇත්ත" පත්‍රයේ කාටූන් එකක්—විකට චිත්‍රයක්—තිබුණා; මම ගල් ගහනවා. ඒ ගැන නැවත උසාවියේදී අහන්නට ලැබේවි. "ඇත්ත" පත්‍රයේ කාටූනයේ තිබුණේ මම ගල් ගහ ගහන විදියටයි. සම්පූර්ණ ඇත්ත මම කියන්නම්. මම කියන්නේ ඒ "ඇත්ත" නොවෙයි. මම කියන්නේ සම්පූර්ණ ඇත්ත. සම්පූර්ණ ඇත්ත කියන්නට මම මේ අවස්ථාවේදී බලාපොරොත්තු වෙනවා.

ඒ ගරු මන්ත්‍රීවරුන් හොඳටම දන්නවා, එතුමන්ලාගේ මහනුවර රැළිය කලින් කල කල් දමා තිබුණු බව. මීට මාස දෙකකට පමණ ප්‍රථම—ඒ උදවිය රැළියේ දිනය නියම කර ගන්නට ප්‍රථම—ගිය මාසයේ 28 වැනිදාට මගේ කොට්ඨාශයේ සංචාරක ගමනක් පිළියෙල කර තිබුණා. එසේ කර තිබුණේ ඒ කොට්ඨාශයේ කෙරෙන වැඩ බලන්නටයි. පාරවල් කොයි විධියට හදාගෙන යනවාද, නොයෙක් නොයෙක් ගොඩනැගිලි හදන්නට තිබෙන ඒවා කෙරෙන්නේ කොයි විධියටද ආදි වශයෙන් බලන්නට තිබුණා. ඒ සඳහා සම්පූර්ණ දවසම යොදා ගන්නට වුවමනා කළා. උදේ අටහමාරේ සිට හැන්දෑවේ හත, හත හමාර දක්වා විශාල වැඩ පිළිවෙළක් යොදා ගෙන සිටියා. ඒ තරම්ම රැස්වීම් තිබුණේ නැහැ. අන්තිම වශයෙන් උත්සව දෙකක් තිබුණා. තෙලුම්දෙනියේ මහලු මඩමක් විවෘත කරන්නට තිබුණා. අන්තිමට කරන්නට තිබුණු දෙය වරකාපොළ විදුලි එළිය ආරම්භ කිරීමයි.

**ආචාර්ය එන්. එම්. පෙරේරා**
*(கலாநிதி என். எம். பெரேரா)*
(Dr. N. M. Perera)
මල්ගල් නැබීම.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

**ගරු ඩඩ්ලි සේනානායක**
*(கௌரவ டட்ளி சேனநாயக்க)*
(The Hon. Dudley Senanayake)

ඒ අන්තිම සිද්ධියයි. මම දැක්කා කොහේදෝ කියලා තිබුණා මේ දිනයෙ මම මේ කත් යොදා ගත්තේ—

**ආචාර්ය එන්. එම්. පෙරේරා**
*(கலாநிதி என். எம். பெரேரா)*
(Dr. N. M. Perera)

නැහැ. නැහැ.

**ගරු ඩඩ්ලි සේනානායක**
*(கௌரவ டட்ளி சேனநாயக்க)*
(The Hon. Dudley Senanayake)

ගරු මන්ත්‍රීතුමා නැහැ, නැහැ කියලා හරි යන්නේ නැහැ. එතුමා නම් කියල නැහැ. එහෙත් මම දන්නවා එතුමාට යාව ඉන්න මන්ත්‍රීතුමෙක් නොයෙක් නොයෙක් දේවල් කියලා තිබෙන බව. මට ඒ ගැන පත්‍ර වලින් දැන ගන්නට ලැබුණා. පත්‍රවල ප්‍රසිද්ධවෙලා තිබුණා. මම කල්පනා කළා මේ 28 වැනිදාට නියම කළ දේට එදාට යන්නද නැද්ද කියලා. මොකද, ඊට පස්සේ එදාට නුවර රැළිය නියම කර තිබුණා. කොහොම වුණත් මම ගියා.

එදා මගේ සංචාරක වැඩ කටයුතු අවසන් වන විට වේලාව සවස හතට කාලක් තරම වන්නට ඇතැයි මා කල්පනා කරනවා. වරකාපොළ ඉදල මම ඒ වේලාවට ආවා. මුළු කොට්ඨාශයේම එදා මා සංචාරය කළත් කලබලකාරී තත්ත්වයක් හෝ කලබලදායක දෙයක් මට දකින්නට ලැබුණේ නැහැ. වරකාපොළට ඇවිත් ගලපිටමඩ පාර දිගේ යනකොට තමයි තමුන්නාන්සේලා නුවරට ගිය බව මට ආරංචි වුණේ, එදා උදේ. ඒක කියන්නට කැමතියි.

පසුවදා පත්‍රයේ පළ වී තිබුණු ආරංචිය දුටු මා පුදුමයට පත් වුණා. දැදිගමදී ගලක් ගහලා මේ ඉතාමත් කණගාටුදායක සිද්ධිය වුණාය කියා පත්‍රයෙන් දකිනතුරු මා ඒ ගැන කිසිවක් දැනගෙන සිටියේ නැහැ. කොහොම හරි මේ ගැන සොයා බලා, මෙය කළේ කවුරු දැයි සොයා ගැනීමට කටයුතු කළ යුතුයි කියා මා වහාම මගේ සථිර ලේකම්වරයාට නියම කළා. මගේ ප්‍රකාශය කින් කියා සිටිනවාට වඩා මගෙන් ඉටු විය යුතු දේ ගැන මා කල්පනා කළා. ඉතාමත් අසාධාරණ, නොකළයුතු, නින්දිත දෙයක් තමයි කර තිබෙන්නේ. වහාම මේ ගැන ක්‍රියා කරන්නැයි මේ පුවත දුටු හැටියේම මගේ ස්ථිර ලේකම්වරයාට මා නියම කළා. ඒ වාගේම පොලීසියත් මේ ගැන ක්‍රියා කරගෙන යනවා. මට දැනටමත් පොලීසියෙන් වාර්තාවක් ලැබී තිබෙනවා. ඒ වාර්තාව මම කියවන්නම් :

"On 28.3.68, four complaints were made by the supporters of the Coalition parties returning from the Kandy rally. One complaint was that the people gathered at the Warakapola Bazaar were jeering at the Coalition supporters passing the area. The other three complaints were of stone throwing at vehicles between the 41st and the 35th mileposts. According to one of these, Mr. Cholmondeley Goonewardene, M.P., was injured in the head by a stone thrown at the car in which he was travelling. This had occurred between 11.20 and 11.30 p.m. The complainants were not able to identify any of the assistants."——

Naturally, they will not be able to identify any of the assailants.——

"Police inquiries were made on these complaints. The first of these complaints was made at 8.05 p.m. and the last at 12.05 a.m.

On the same day three complaints were made at the Warakapola Police Station by the residents of the area against the conduct of the Coalition supporters returning in vans and cars. These were made at 9.30 p.m., 9.55 p.m. and 10.15 p.m. Van No. CN 845 was identified by them as one of the vehicles in which these supporters travelled. Police on duty had noticed one vehicle moving slowly and the occupants of the vehicle abusing the people. When the police moved up to the vehicle, this van moved away. The people of the area were annoyed and greatly provoked by this incident.

It was after these acts of provocation that the stone-throwing incident where Mr. Cholmondeley Goonewardene was injured had occurred.

Along the entire road as well as at the meeting at Kandy, adequate police patrols and static police had been provided. However, no amount of police could have prevented sporadic stone throwing especially in the night.

Inquiries are being made to find out who were responsible for these incidents."

මා ස්ථාන කීපයකට ගියා. එහෙත් රැස්වීම් තිබුණේ, දෙකයි. එනම් නෙළුන් දෙනිය හා වරකපොළ යන ස්ථානවලයි.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[ගරු ඩඩ්ලි සේනානායක]

ඒ රුස්වීම් අමතමින් තමුන්නාන්සේලාගේ රැළිය ගැන මා එක වචනයක්වත් කථා කළා දැයි අහන්න කැමැතියි. අර වගේ සිද්ධියකට අනුබල දීමක් තබා, තමුන්නාන්සේලාගේ රැළිය ගැනවත් මා වචනයක්වත් කථා කළේ නැහැ. "අර රජය මේක කළා, අරක කළා" කීම සුදුසු පිළිතුරක් නොවේ යැයි ගරු මන්ත්‍රීතුමා කීවා. එය සුදුසු පිළිතුරක් නොවන බව මාත් පිළිගන්නවා.

ඔයිට වඩා භයානක සිද්ධියවලට මුහුණ පාන්නට මට සිදු වී තිබෙනවා. ජේ. ආර්. ජයවර්ධන මහත්මයාගේ නුවර පයින් ගමන ගැනත් මට හොඳට මතකයි. අර ඉන්නෙ, "ඉඹුල්ගොඩ වීරයා". එදා කවුදෝ මට විශාල ගලකින් ගැහුවා. මගේ වාසනාවකට වාගේ වෙන මිනිහෙක් ඉස්සරහට පැන්නා. ඒ ගල ඔහුගේ පපුවේ වැදී ලේ ගැලුවා. ජේ. ආර්. ජයවර්ධන මහතා සහ ඒ පිරිස කඩවත හිටියා. මා ඒ අය බලන්න ගියා. ඒ වෙලාවේ හැම තැනින්ම ගල් ගැහුවා. එදා එහි හිටි අයට ඒවා මතක ඇති. අන්තිමේදී පාරේ නිදා ගත්තා. මේවා, මගේ නිදහසට කියන කරුණු නොවෙයි. ඒ අවස්ථාවේදී රජයේ අනුබලයත් ඒවාට ලැබුණා.

**ඉලංගරත්න මයා.**
*(திரு. இலங்கரத்ன)*
(Mr. Ilangaratne)
ඒකත් වැරදියි.

**ගරු ඩඩ්ලි සේනානායක**
*(கௌரவ டட்ளி சேனநாயக்க)*
(The Hon. Dudley Senanayake)
ඒ අවස්ථාවේදී කළ ගුවන් විදුලි කථාව මට මතකයි. එදා ගල් ගැහුවේ ප්‍රසිද්ධියේ. මේ ගල් ගැහීම සිදු වී තිබෙන්නේ රාත්‍රියේ.

**එස්. ඩී. බණ්ඩාරනායක මයා.**
*(திரு. எஸ். டீ. பண்டாரநாயக்க)*
(Mr. S. D. Bandaranayake)
එදා පයින් ගමන ගියේ තුවක්කු හා ගල් මුල් ඇතුවයි.

**ගරු ඩඩ්ලි සේනානායක**
*(கௌரவ டட்ளி சேனநாயக்க)*
(The Hon. Dudley Senanayake)
එහෙම නම් එදා ඒ ගමන වළක්වන්න ගිය එක් කෙනකුටවත් මොකවත් වුණාද? බුදියාගෙන හිටිය බෝනික්කාටවත් මොකවත් වුණාද? [බාධා කිරීම්]

**එස්. ඩී. බණ්ඩාරනායක මයා.**
*(திரு. எஸ். டீ. பண்டாரநாயக்க)*
(Mr. S. D. Bandaranayake)
මගදී අර කාර් එකට වෙඩි තිබ්බෙ? [බාධා කිරීම්]

**ආචාර්ය එන්. එම්. පෙරේරා**
*(கலாநிதி என். எம். பெரேரா)*
(Dr. N. M. Perera)
You are straying from the main thing.

**ගරු ඩඩ්ලි සේනානායක**
*(கௌரவ டட்ளி சேனநாயக்க)*
(The Hon. Dudley Senanayake)
We are not straying.

So, as far as you are concerned, what I am most annoyed about is that some people are trying to say that I was at the bottom of this. That is a diabolical lie.

In fact what is the use of making statements ? What I have to do is find out who did it. And the first thing I did when I got the informaton was to give instructions to try and see who did this and to take appropriate action. It is useless my making a big statement and doing nothing about it. You would have got statements about various things from various people, and you have read them, but are you sure about these things ?

**ආචාර්ය එන්. එම්. පෙරේරා**
*(கலாநிதி என். எம். பெரேரா)*
(Dr. N. M. Perera)
No. I am only asking you to check on them.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

ගරු ඩඩ්ලි සේනානායක
(கௌரவ டட்லி சேனநாயக்க)
(The Hon. Dudley Senanayake)

At Warakapola, no doubt, there was a huge crowd. I was going for the function to switch on the lights for Warakapola Town. There was a big crowd which had collected. Some of your supporters would have got annoyed when they were going past Warakapola. I saw all along the route various flags, red and blue flags ; but at Warakapola I saw nothing but green flags. That would have been a source of annoyance undoubtedly, when your people were passing Warakapola. I myself was surprised : I thought there would be at least one blue flag or red flag ; but when I came to Warakapola myself in the morning on my tour, I saw nothing but green flags. Please do not think that they were meant for you ; the green flags were meant for me.

ආචාර්ය එන්. එම්. පෙරේරා
(கலாநிதி என். எம். பெரேரா)
(Dr. N. M. Perera)

That does not matter. That is all right.

සුබසිංහ මයා.
(திரு. சுபசிங்ஹ)
(Mr. Subasinghe)

Perhaps our people did not want to provoke your people by putting up our flags.

ගරු ඩඩ්ලි සේනානායක
(கௌரவ டட்லி சேனநாயக்க)
(The Hon. Dudley Senanayake)

Whatever it is, from what I heard, evidently there was the usual shouting that the flags should be pulled down, and it may be that the people got annoyed. I am not in any way defending the incident that occurred. I say that it is reprehensible. I say that the offender must be brought to books. But do not bring innocent people into this. I am not sure that those people whose names the hon. Member for Yatiyantota (Dr. N. M. Perera) mentioned would have joined in this incident. Up to almost 7 o'clock I was in the electorate. Between, shall I say, half past five and 7 o'clock I was on the Kandy road, and there was not even a semblance of trouble. Nothing. There was absolute peace and quiet. I can vouch for that because I was there. I arrived at my residence at 8 o'clock.

I am extremely sorry that this incident should have occurred, but I am still more sorry that an endeavour should have been made to make political capital out of an incident like this, trying to show that I had had something to do with this stone-throwing incident. References have been made that it is strange that I had a rally on the same day. I never had a rally at all. My tour was arranged long before you arranged your Kandy meeting. There was the function to switch on the lights at Warakapola. Naturally there was a crowd. Please do not think that that crowd collected to throw stones. The crowd came for that function. Your people returning after the rally may have been full of exuberance. They may have offered provocation, but I do not say that that justifies the stone-throwing.

I can assure hon. Members that the Police will do everything possible. It is a difficult job for the police because, as you admit, it was night. A person throws a stone at night, and how can the police find who threw the stone ?

**එකල්හි වේලාව අ. භා. 7.30 වූයෙන්, නියෝජ්‍ය කථානායකතුමා විසින් ප්‍රශ්නය නොවිමසා මන්ත්‍රී මණ්ඩලය කල් තබන ලදී.**

**මන්ත්‍රී මණ්ඩලය ඊට අනුකූලව, 1968 අප්‍රියෙල් 8 වන සඳුදා අ. භා. 2 වන තෙක් කල් ගියේ ය.**

பி. ப. 7.30 மணியாகிவிடவே உபசபாநாயகர் அவர்கள் வினா விடுக்காமலேயே சபையை ஒத்திவைத்தார்.

அதன்படி, சபை 1968, ஏப்ரில் 8 திங்கட் கிழமை பி. ப. 2 மணிவரை ஒத்திவைக்கப் பெற்றது.

*It being 7.30* P.M., MR. DEPUTY SPEAKER *adjourned the House without Question put.*

*Adjourned accordingly until 2* P.M. *on Monday, 8th April 1968.*

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

**සැ. යු.**

මෙම වාර්තාවේ අවසාන මුද්‍රණය සඳහා සවකීය කථාවල ශුද්ධ කළ යුතු තැන් දක්වනු රිසි මන්ත්‍රීන් මින් පිටපතක් ගෙන එහි වැරදි හරිගස්සා එම පිටපත හැන්සාඩ් සංස්කාරක වෙත

**1968 අප්‍රේල් 18 වන බ්‍රහස්පතින්ද**

**නොඉක්මවා ලැබෙන සේ එවිය යුතුයි.**

---

**குறிப்பு**

அங்கத்தவர்கள் இறுதிப் பதிப்பிற் செய்ய விரும்பும் பிழை திருத்தங்களை அறிக்கையிற் றெளிவாகக் குறித்து பிழை திருத்தங்களைக் கொண்ட பிரதியை பிரதிநிதிகள் சபை ஹன்சாட் பதிப்பாசிரியருக்கு

**1968, ஏப்றில் 18, வியாழக்கிழமைக்குப் பிந்தாமற்**

கிடைக்கக்கூடியதாக அனுப்புதல் வேண்டும்.

---

**NOTE**

Corrections which Members suggest for the final Print should be clearly marked in this Report, and *the copy containing the corrections must reach the* Editor of HANSARD, House of Representatives,

**not later than**

**Thursday, 18th April 1968**

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

දායක මුදල් : මුදල් ගෙවන දිනෙන් පසුව ඇරඹෙන මාසයේ සිට මාස 12ක් සඳහා රු. 32.00යි. අශෝධිත පිටපත් සඳහා නම් රු. 35.00යි. මාස 6කට ගාස්තුවෙන් අඩක්. පිටපතක් ශත 30යි. තැපෑලෙන් ශත 45යි. මුදල්, කොළඹ ගාලු මුවදොර, මහලේකම් කාර්යාලයේ රජයේ ප්‍රකාශන කාර්යාංශයේ අධිකාරී වෙත කලින් එවිය යුතුය

சந்தா : பணம் கொடுத்த தேதியை யடுத்துவரும் மாதம் தொடக்கம் 12 மாதத்துக்கு ரூபா 32.00 (திருத்தப்படாத பிரதிகள் ரூபா 35.00). 6 மாதத்துக்கு அரைக்கட்டணம். தனிப்பிரதி சதம் 30, தபால்மூலம் 45 சதம், முற்பணமாக அரசாங்க வெளியீட்டு அலுவலக அத்தியட்சரிடம் (த. பெ. 500, அரசாங்க கருமகம், கொழும்பு 1) செலுத்தலாம்.

Subscriptions : 12 months commencing from month following date of payment Rs. 32.00 (uncorrected copies Rs. 35.00). Half rates for 6 months. Each part 30 cents, by post 45 cents, payable in advance to the SUPERINTENDENT, GOVERNMENT PUBLICATIONS BUREAU, P. O. Box 500, Colombo 1

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org